Thus, taking into consideration all the facts and circumstances urged in the submissions made by the Deputy Solicitor-General, we are of the view that the benefits granted to tax defaulters in exchange of voluntary disclosure of their total wealth and paying the *one percent* tax on the total income or the market value of the movable or immovable property is proportionate. Hence, the benefits that are offered to tax defaulters are not violative of Article 12(1) of the Constitution.

***Applicability of the Doctrine of 'the Constitution as a Living Organ/Document'***

When considering the constitutionality of legislation that are being brought in at a time where a country is facing severe economic crisis, financial hardships and calamities or to meet the requirements of an evolving society etc, the court should not confine itself to traditional interpretations that are used to interpret the Constitution.

It is pertinent to note that, the concept of equality set out in Article 7 of the Universal Declaration of Human Rights was enshrined in Article 18(1) of the 1972 Constitution and it was once again enshrined as Article 12(1) of the 1978 Constitution. However, during the recent past the needs and circumstances of the people and the country as a whole have adversely affected due to COVID-19.

It is a fact that presently the country is facing severe economic and financial hardships which warrants immediate remedial action to grant redress to the people of this country. In such

circumstances, the court should not apply the traditional principals of interpretation of the Constitution and give a restrictive interpretation to Articles enshrined in the Constitution. The facts brought to the notice of the court by the learned Deputy Solicitor-General and the petitioner who appeared in person warrants the court to interpret the Constitution taking into consideration the harsh realities that the country is undergoing at present.

The outbreak of COVID-19 in Sri Lanka is an unprecedented event in our country. Thus, it is vital that the Constitution be interpreted as a 'living document' to meet the aforementioned situation in our country and thereby allowing the adoption of a more liberal interpretation of the Constitution when considering the present Bill.

At the core of living constitutionalism is the idea that while constitutional guarantees remain static, the application is dynamic. Living constitutionalism prevents the interpretation of the Constitution from being anchored to the specific interpretation at all times and it offers the flexibility that is required to face unprecedented events or to meet the requirements of an evolving society. As such, it would be pragmatic to apply such an approach to interpret the constitutional issues that have arisen at present.

The flexibility offered by living constitutionalism is tied to the idea that the Constitution is not a law but an amalgamation of concepts that are fundamental to the governance of society. Hence, the Constitution should be interpreted to meet unexpected situations or to meet the requirements of an evolving society while maintaining these fundamental concepts.

When taking into consideration the aforementioned circumstances we are of the view that the benefits offered to tax defaulters by the government are proportionate in view of the aforementioned stringent conditions that are imposed on them. Thus, the enactment of legislation to grant a tax amnesty and the benefits offered to tax defaulters in exchange of voluntary disclosure and payment of the aforementioned sum to be collected do not violate Article 12(1) of the Constitution.

***Secrecy Clause***

Learned counsel for the petitioners submitted that Clause 7(1) of the Bill seeks to provide absolute secrecy in respect of the identity of a declarant and 'any matter or thing' contained in a declaration

made under Clause 5(1) of the Bill. Further, Clause 7(2) of the Bill provides for punishment for breach of secrecy.

It was further submitted that giving a defaulter the same level of secrecy is arbitrary, irrational and discriminatory against the rights of the honest citizens of this country who comply with the revenue laws and pay their taxes on time, and thereby the said Clause violates Article 12(1) of the Constitution.

Furthermore, it was submitted that the level of secrecy sought to be granted by Clause 7 of the Bill will undermine the power of Parliament to have full control over public finance and thus, violates Articles 148 and 4(d) read with Article 3 of the Constitution.

Moreover, it was submitted that the wording in Clauses 7(1) and 7(2) of the Bill requires the said two sub-Clauses to be read independently of each other. Further, it was submitted whilst sub-Clause (1) provides absolute secrecy, sub-Clause (2) refers to 'official' secrecy and the punishment for breach of secrecy. Hence, Clause 7 of the Bill is ambiguous. Further, the word 'absolute' in Clause 7(1) of the Bill violates the Right to Information guaranteed under Article 14A of the Constitution.

Learned Deputy Solicitor-General submitted that Clause 7 of the Bill states that the provisions of the Inland Revenue Act, No. 24 of 2017 in respect of 'official secrecy' and penalties for the breach of secrecy shall apply *mutatis mutandis* to a declaration made under this Bill. Hence, the secrecy provisions under section 100 of the said Inland Revenue Act will apply with equal force to declarants under the Bill. Accordingly, the declarants under the Bill will be entitled to the same degree of confidentiality that is applicable to an ordinary taxpayer.

He further submitted that Article 14A permits to impose restrictions by law in respect of the instances set out in Article 14A(2), which includes '"preventing the disclosure of information communicated in confidence Moreover, the information furnished to the Department of Inland Revenue under the Bill falls within the said exception as the information provided under the Bill would be 'information communicated in confidence'. In addition to the above, he submitted that the said same 'secrecy' is offered to any taxpayer.

Learned Deputy Solicitor-General further submitted that the said Clause in the Bill is almost a reproduction of section 5 of the Inland Revenue (Regulation of Amnesty) Act, No. 10 of 2004,

which was approved by this court after anxious scrutiny. Hence, the question of considering the constitutionality of the said Clause will not arise. In this regard he cited the relevant determination in the ***Inland Revenue (Regulation of Amnesty) Bill,*** **S.C. (S.D.) No. 26/2004**.

Responding to the above submission of the learned Deputy Solicitor-General, counsel for the petitioners submitted that the existence of a law which contains a provision that is inconsistent with the Constitution is not a justification to enact similar legislation.

In this regard, counsel for the petitioners cited ***In Re: Proscribing of Liberation Tigers of Tamil Eelam and Other Similar Organisations (Amendment) Bill*** **S.C. (S.D.) No. 5/1979** where the court observed;

> *"The Bill seeks to extend the period of operation of Law No. 16 of 1978 for the period of another year. It was therefore necessary for us to consider the provisions of the original Law, in as much as* ***if the provisions of the original law is inconsistent with the Constitution, this Bill too would be inconsistent with the Constitution."*** [Emphasis added]

Further, in ***Re: New Wine Harvest Ministries (Incorporation) Bill*** **S.C. (S.D.) No. 2/2003** the court observed;

> *"...... In exercising jurisdiction under Article 123 of the Constitution* ***we cannot examine the validity of past legislation Nor, can we take their content as a standard of consistency with the provisions of the Constitution.*** *Our task is to examine the provisions of the bill challenged by the Petitioner and to determine whether they are inconsistent or not with the provisions of the Constitution."* [Emphasis added]

Moreover, it was submitted by counsel for the petitioners that Article 14A did not exist when the aforementioned determination cited by the learned Deputy Solicitor-General was made by this court. Thus, it is necessary to consider the provisions of the Bill afresh in determining its constitutionality.

We are inclined to agree with the submissions made by counsel for the petitioners in respect of the issue that the Clauses in the instant Bill are required to be considered by this court in terms of Article 121(1) read with Article 123 of the Constitution.

In this regard, this court observed the following in ***Inland Revenue (Amendment) Bill*** **S.C. (S.D.) No. 01-03/2021**;

*"..... In terms of Article 80(3) of the Constitution, once a Bill becomes law, the validity of an Act or a provision of the Act, cannot be inquired into, pronounced upon or called into question by a court or tribunal.*

*However, the said sub-Article 80(3) of the Constitution does not act as a bar in examining the constitutionality of a section in an Act already passed by Parliament when such a section is proposed to be amended, as such an amendment could change the entire complexion and effect of the existing section in an Act. Nevertheless, such an approach does not extend to amendments relating to typographical or grammatical errors."*

Thus, it is necessary to consider Clause 7 of the Bill with a view to make a determination in respect of the constitutionality of the said Clause.

Article 14A of the Constitution states;

*"14A (1). Every citizen shall have the right of access to any information as provided for by law, being information that is required for the exercise or protection of a citizen's right held by: -*

*a) the State, a Ministry or any Government Department or any statutory body established or created by or under any law;*

*b) any Ministry of a Minister of the Board of Ministers of a Province or any Department or any statutory body established or created by a statue of a Provincial Council;*

*c) any local authority; and*

*d) any other person, who is in possession of such information relating to any institution referred to in sub-paragraphs (a) (b) or (c) of this paragraph.*

*(2). No restrictions shall be placed on the right declared and recognized by this Article, other than such restrictions prescribed by law as are necessary in a democratic society, in the interests of national security, territorial integrity or public safety, for the prevention of disorder or crime, for the protection of health or morals and of the reputation or the rights of others, privacy, prevention of contempt of court, protection of parliamentary privilege, for preventing the disclosure of information communicated in confidence, or for maintaining the authority and impartiality of the judiciary.*

*(3) in this Article, "citizen" includes a body whether incorporated or unincorporated, if not less than three-fourths of the members of such body are citizens."*

We have examined the provisions of the Bill, particularly, Clause 7 of the Bill, and are of the view that the disclosure of information by a declarant under the Bill is carried out in confidence and therefore, the legislature is entitled to enact laws to prevent such information being shared with others. Thus, enacting Clause 7 is not inconsistent with the Constitution.

However, we agree with the submissions made by counsel for the petitioners, that sub-Clauses 7(1) and 7(2) give two different and distinct meanings. The rules of interpretation are required to give a meaning to each and every word in a Statute and it is presumed that the legislature does not waste words in enacting legislation.

Further, where a word is used more than once in an Act, principles of interpretation require such a word to be given the same meaning wherever it appears in the Act, unless there are compelling reasons to give different interpretations to the same word. Similarly, when different words are used in an Act, such words are required to be given different and distinct meanings.

Thus, we are of the view that the words 'absolute' and 'official' gives two different meanings which leads to ambiguity and thereby, may lead to arbitrary enforcement of the said Clause. Hence, Clause 7 as presently constituted, violates Article 12(1) of the Constitution.

However, learned Deputy Solicitor-General submitted that the word 'absolute' in Clause 7(1) of the Bill will be substituted with the word 'official' to harmonise the said Clause with Clause 7(2) of the Bill at the Committee stage. Hence, the said sub-Clause will read as follows;

*of the identity of a declarant and any matter or thing contained in a declaration made under subsection (1) of section 5 of this Act."*

Therefore, we are of the view that if the said amendment is effected at the committee stage, the aforementioned inconsistency with Article 12(1) of the Constitution will cease.

Further, as stated above, learned Deputy Solicitor-General informed court and the counsel for the petitioners that Clause 17 of the Bill would be deleted at the committee stage. Hence, determining the constitutionality of the said Clause does not arise. A similar view was expressed in the determination of ***'Equal Opportunity Act'* S.C. (S.D.) No. 14/99.**

We have examined all the provisions of the Bill and determined upon the suggested amendments being effected, neither the Bill nor any of the Clauses in the Bill are inconsistent with the Constitution. In the circumstances, the Bill can be passed by a simple majority in Parliament.

We wish to place on record our deep appreciation of the assistance given by the learned Deputy Solicitor-General, counsel for the petitioners and the petitioner who appeared in person in the consideration of the Bill.

Priyantha Jayawardena PC,
*Judge of the Supreme Court*

K.Kumudini. Wickremasinghe,
*Judge of the Supreme Court*

A.L. Shiran Gooneratne,
*Judge of the Supreme Court*

## II

### කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2021 අගෝස්තු 16 දින මවිසින් "සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

### මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
மனித உரிமைகள் அமைப்பு (கூட்டிணைத்தல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
HUMAN RIGHTS ORGANIZATION (INCORPORATION) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ)" නමැති පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව-

- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XV කොටස; සහ
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVII හා XXVIII කොටස්, සිව්වැනි කාණ්ඩයේ XIII කොටස සහ හයවැනි කාණ්ඩයේ XXIV හා XXV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අටවැනි කාණ්ඩයේ-

- ශ්‍රී ලංකාවේ අපජල කළමනාකරණයේ කාර්යක්ෂමතාව ඇගයීම සම්බන්ධ විශේෂ විගණන වාර්තාවේ - IV කොටස; සහ
- නැව් මගින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක මාර්පෝල් සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාවේ - V කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

2020 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රේගුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍ය, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, ඔබතුමා මීට මොහොතකට පෙර මුදල් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ගැන සඳහන් කළා. මෙම නඩු තීන්දු අපට ලබා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි, ගරු කථානායකතුමනි. මේ ප්‍රශ්නය මීට කලිනුත් මේ ගරු සභාවේදී මතු කළා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ අධිකරණ තීන්දුව අපට ලබා දුන්නෙත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත පිළිබඳ අධිකරණ තීන්දුව ලබා දුන්නෙත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි. එය මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීමක්. මේ කාරණය සම්බන්ධයෙන් ගරු යදාමිණී ගුණවර්ධන මන්ත්‍රීතුමා අධිකරණ ඇමතිතුමාට පසුගිය වසරේ දෙසැම්බර් මාසයේ දීත් ප්‍රශ්නයක් යොමු කළා. එහිදී එතුමා ඉල්ලා සිටියා, වගකිව යුතු ලෙස, එම නඩු තීන්දුවල සිංහල භාෂා පරිවර්තනයක් - මව් භාෂාවෙන් කරන ලද පරිවර්තනයක් - ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමනි, අධිකරණ ඇමතිතුමා මෙම කාර්යය ඉෂ්ට කරන්නේ නැත්නම් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, පාස්කු කොමිෂන් සභා වාර්තාව මෙන්, "සිංහල භාෂා පරිවර්තනය ගැන අපි වග කියන්නේ නැත" යනුවෙන් කියන්නේ නැතිව, කරුණාකර වගකීමක් ඇතිව මෙම නඩු තීන්දුවල පිටපත් සිංහල භාෂාවෙන්ද ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීමට කටයුතු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සාමාන්‍යයෙන් අපි කරන්නේ උසාවියෙන් අපට ලබා දෙන නඩු තීන්දුව ඒ ආකාරයෙන්ම තමුන්නාන්සේලාට ඉදිරිපත් කිරීමක්.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්නම්, පාර්ලිමේන්තුව හැටියට හෝ මැදිහත් වෙලා මෙම නඩු තීන්දුවල පිටපත් සිංහල භාෂාවෙනුත් ලබා දීමට කටයුතු කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු ගෙවිඳු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ කාරණය සම්බන්ධව අධිකරණ ඇමතිතුමා කලින් පිළිතුරක් ලබා දී තිබෙනවා.

ගරු කථානායකතුමනි,සම්ප්‍රදායානුකූලව,ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දෙන තීන්දුව ඔබතුමා විසින් ප්‍රකාශයට පත් කරනවා. නමුත්, මේ පිළිබඳව රජයේත් අවධානය යොමු වෙලා තිබෙනවා. අපි දෙගොල්ලන්ම සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් යම් තීන්දුවක් ගන්න පුළුවන්. - [බාධා කිරීමක්]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 13 යටතේයි මම මේ ප්‍රශ්නය මතු කරන්නේ. ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා මතු කළේ වැදගත් කාරණයක්. ගරු කථානායකතුමනි, 2021 ජූලි 06වැනි දා 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය පාර්ලිමේන්තුවේ සභාගත කළා. අපේ ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා කියපු ආකාරයට, මේ හැම නඩු තීන්දුවක්ම අපට ලබා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි. දැන් මේ පනත් කෙටුම්පත හොර පාරෙන්ම අධිකරණයට ගිහිල්ලා එනතුරුම අපි දන්නේ නැහැ, මොකක්ද වෙන්නේ කියලා. මේ රටේ ජනතාවගෙන් වැඩි දෙනෙක් පරිහරණය කරන්නේ සිංහල භාෂාව නේ. මේ පනත් කෙටුම්පතට සඳහා ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය තුළත් කරුණු ගණනාවක් තිබෙනවා; තුනෙන් දෙකක ඡන්දයකින් සම්මත කිරීම සහ ජනමත විචාරණයකට යන්න කියලාත් තිබෙනවා. නමුත් වැරදි විදියට, යම් යම් දේවල් සඟවලා අධිකරණ ඇමතිවරයාට ඕනෑ ගේම් ටික ගහගන්න ඉඩ දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 13 යටතේ පැහැදිලිව සඳහන් කර තිබෙන පරිදි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ වරප්‍රසාදයක් තමයි තමන් භාවිත කරන භාෂාවෙන්, තමන්ට කැමැති භාෂාවකින් ඒ ලිපි ලේඛන ඉල්ලන්න පුළුවන් කියන කාරණය. ඇයි, මේ කොරෝනා වසංගතය අස්සේ ආණ්ඩුව වෙන ගේම් ගහන්නේ? ඒ නිසා මේ විදියට ගේම් ගහන එක නතර කරලා කරුණාකර මෙම නඩු තීන්දුවේ පිටපත් සිංහල භාෂාවෙනුත් අපට ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කියැවීම ගැන නොවෙයි අපි කියන්නේ. අපි කියන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය ගැනයි. ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ඉංග්‍රීසි, සිංහල, දමිළ කියන භාෂා තුනෙන්ම මේ ලිපිලේඛන මන්ත්‍රීවරුන්ට ලබා දිය යුතුයි. ගරු කථානායකතුමනි, ඔබතුමාත් මෙම පනත් කෙටුම්පත තුළ තිබෙන භයානකකම අවබෝධ කරගන්න ඕනෑ. අපි දන්නවා, අධිකරණ ඇමතිතුමා Bar එකටත් විශාල party එකක් දීලා ඒක අනුමත කළා. හැබැයි, ගරු අධිකරණයට පින් සිද්ධ වෙන්න මේ සම්බන්ධයෙන් තුනෙන් දෙකක් ඡන්දයක් ලබාගන්න සහ ජනමත විචාරණයකට යන්න කියන කාරණය එම තීන්දුව තුළ තිබෙනවා.

මේ ආණ්ඩුවේ ඉදිරි ගමන වෙනුවෙන්, 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පතට ඉතාම භයානක කරුණු ගණනාවක් ඇතුළත් කර තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පත හොර රහසේ සම්මත කරන්න ඉඩ දෙන්න එපා. මේක ජනතාවට බලන්න, කියවන්න අවස්ථාව සලසා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන මම අවධානය යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අධ්‍යාපන ඇමතිතුමා. ලිපි ලේඛන පිළිගැන්වීම.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින් ප්‍රදානය කරන උපාධි සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 පෙබරවාරි 27 දිනැති අංක 2216/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.- [ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2020 වර්ෂය සඳහා ධීවර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.- [ධීවර අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මහාමාර්ග අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - நெடுஞ்சாலைகள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Highways and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019 වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් රෙගුලාසි ඉදිරිපත් කරමි.

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි;

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(iii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජුනි 11 දිනැති අංක 2231/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි.

මෙම රෙගුලාසි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2020 වර්ෂය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවට ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாபா)
(The Hon. Anura Priyadharshana Yapa)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on -

- Notification under the Excise Ordinance (Chapter 52);
- Orders under the Excise (Special Provisions) Act, No. 13 of 1989;
- Orders under the Special Commodity Levy Act, No. 48 of 2007;
- Order under the Foreign Exchange Act, No. 12 of 2017;
- Orders under the Ports and Airports Development Levy Act, No. 18 of 2011;
- Regulations under the Foreign Exchange Act, No. 12 of 2017; and
- Resolutions under the Customs Ordinance (Chapter 235)

which were referred to the Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு)
(The Hon. Karunadasa Kodithuwakku)

ගරු කථානායකතුමනි, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara)

ගරු කථානායකතුමනි, පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)

ගරු කථානායකතුමනි, අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

(i) 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව;

(iii) 2019 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2019 වර්ෂය සඳහා උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගාමිණී ලොකුගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොලොන්නරුව, ඇල්ලේවැව, ඉහළ ඇල්ලේවැව, අංක 213 දරන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. සෝමලතා කාන්ති මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කොළඹ 15, මට්ටක්කුලිය, විස්වයික් පාර, අංක 206/5 දරන ස්ථානයෙහි පදිංචි එම්.වයි.එම්. සකීර් මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)

ගරු කථානායකතුමනි, කුරුණෑගල, කවුඩාවත්ත, සහබන්දු වත්ත, අංක 272/2 දරන ස්ථානයෙහි පදිංචි පී.ජී.ඒ.ටී. චම්පිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අශෝක් අබේසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු උද්දික ප්‍රේමරත්න මහතා**
(மாண்புமிகு உத்திக பிரேமரத்ன)
(The Hon. Uddika Premarathne)

ගරු කථානායකතුමනි, හොරොව්පොතාන, මරදන්කඩවල, අලුත්වත්ත, සමාධි මාවත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ආර්. ජීවකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)

ගරු කථානායකතුමනි, වේයන්ගොඩ, අලවල, රජමහ විහාර පාර, අංක 142 දරන ස්ථානයෙහි පදිංචි ඊ.ඩී. සෝමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු මධුර විතානගේ මහතා**
(மாண்புமிகு மதுர விதானகே)
(The Hon. Madhura Withanage)

ගරු කථානායකතුමනි, කොළඹ 06, වැල්ලවත්ත, පීටර්සන් පාර, අංක 43, 5/1 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත උදය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු යදාමිණී ගුණවර්ධන මහතා**
(மாண்புமிகு யதாமினீ குணவர்தன)
(The Hon. Yadamini Gunawardena)

ගරු කථානායකතුමනි, අවිස්සාවේල්ල, කොළඹ පාර, සීතාලෙන මාවත, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි එච්. දම්මිකා ජේමානන්ද මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව: විස්තර
### வரையறுக்கப்பட்ட லங்காபுத்ர அபிவிருத்தி வங்கி: விபரம்
### LANKAPUTHRA DEVELOPMENT BANK LIMITED: DETAILS

35/2020

1. **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
මුදල් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය, සංචිත ප්‍රමාණය, කොටස් මත ලද ආදායම, වත්කම් මත ලද ආදායම, සමස්ත සේවක සංඛ්‍යාව, එක් සේවකයෙකු වෙනුවෙන් වැය කළ මුදල, පුනරාවර්තන නොවන වියදම, බදු ලෙස රජයට ගෙවන ලද මුදල, සහ ලාභය හෝ අලාභය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி அமைச்சரைக் கேட்ட வினா:

(அ) வரையறுக்கப்பட்ட லங்காபுத்ர அபிவிருத்தி வங்கி ஆரம்பிக்கப்பட்ட திகதி முதல் இன்று வரையில் ஈடுபடுத்தப்பட்ட மொத்த மூலதனம், ஒதுக்குத் தொகையின் அளவு, பங்குகள் மீதான கிடைக்கப்பெற்ற வருமானம், சொத்துக்கள் மீதான கிடைக்கப்பெற்ற வருமானம், மொத்தப் பணியாளர்களின் எண்ணிக்கை, பணியாளர் ஒருவருக்காக செலவிடப்பட்ட தொகை, மீண்டெழாத செலவுகள், வரியாக அரசாங்கத்திற்குச் செலுத்தப்பட்ட தொகை மற்றும் இலாபம் அல்லது நட்டம் எவ்வளவு என்பதை அவர் தனித்தனியாக இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance:

(a) Will he inform this House in regard to Lankaputhra Development Bank Ltd., from the date of its establishment up to now, the total capital invested, the amount of reserves, income received on shares, income received on assets, the total number of employees, the amount spent per employee, non-recurrent expenditure, the amount paid to the Government as taxes and profit or loss on per year basis, separately?

(b) If not, why?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව ආරම්භ කළ දිනයේ සිට මේ දක්වා වූ කාලය තුළ එම බැංකුව සම්බන්ධයෙන් විවිධ තොරතුරු ගරු මන්ත්‍රීතුමා විසින් අසා තිබෙනවා. මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

2019.04.01 දින සිට බල පැවැත්වෙන පරිදි මෙම බැංකුව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඒකාබද්ධ කරන ලදී. එම නිසා 2006 සිට 2018.03.31 දක්වා විගණනය කරන ලද තොරතුරු මෙහි සඳහන් කර ඇත.

යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය:
එක් එක් වර්ෂ අවසානයේ තිබූ ප්‍රාග්ධනය පහත පරිදි වේ.

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | 1,500 |
| 2007 | 1,500 |
| 2008 | 3,616 |
| 2009 | 3,671 |
| 2010 | 3,671 |
| 2011 | 3,671 |
| 2012 | 3,671 |
| 2013 | 3,671 |
| 2014 | 3,671 |
| 2015 | 3,671 |
| 2016 | 3,671 |
| 2017 | 3,671 |
| 2018 | 3,671 |

**සංචිත ප්‍රමාණය:**

එක් එක් වර්ෂ අවසානයේ තිබූ සංචිත ප්‍රමාණය පහත පරිදි වේ.

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | 23 |
| 2007 | 46 |
| 2008 | 178 |
| 2009 | 185 |
| 2010 | 205 |
| 2011 | 252 |
| 2012 | 537 |
| 2013 | 847 |
| 2014 | 989 |
| 2015 | 1,146 |
| 2016 | 1,270 |
| 2017 | 1,527 |
| 2018 | 1,713 |

**කොටස් මත ලද ආදායම:**

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | - |
| 2007 | - |
| 2008 | - |
| 2009 | - |
| 2010 | - |
| 2011 | 30 |
| 2012 | 18 |
| 2013 | 36 |
| 2014 | 36 |
| 2015 | 36 |
| 2016 | 36 |
| 2017 | 41 |
| 2018 | 41 |

**වත්කම් මත ලද ආදායම:**

| වර්ෂය | ප්‍රතිශතය (බදු පෙර) |
|---|---|
| 2006 | සියයට 2.99 |
| 2007 | සියයට 2.41 |
| 2008 | සියයට 5.46 |
| 2009 | සියයට 4.47 |
| 2010 | සියයට 3.33 |
| 2011 | සියයට 2.26 |
| 2012 | සියයට 4.99 |
| 2013 | සියයට 5.76 |
| 2014 | සියයට 2.39 |
| 2015 | සියයට 2.87 |
| 2016 | සියයට 3.54 |
| 2017 | සියයට 4.23 |
| 2018 | සියයට 4.05 |

**සමස්ත සේවක සංඛ්‍යාව:**

| වර්ෂය | සංඛ්‍යාව |
|---|---|
| 2006 | 62 |
| 2007 | 114 |
| 2008 | 165 |
| 2009 | 167 |
| 2010 | 168 |
| 2011 | 168 |
| 2012 | 152 |
| 2013 | 154 |
| 2014 | 147 |
| 2015 | 202 |
| 2016 | 181 |
| 2017 | 170 |
| 2018 | 165 |

**එක් සේවකයෙකු වෙනුවෙන් වැය කළ මුදල:**

| වර්ෂය | වටිනාකම (රුපියල්) |
|---|---|
| 2006 | 392,446 |
| 2007 | 528,511 |
| 2008 | 550,699 |
| 2009 | 541,800 |
| 2010 | 550,152 |
| 2011 | 591,676 |
| 2012 | 661,300 |
| 2013 | 667,655 |
| 2014 | 879,386 |
| 2015 | 842,408 |
| 2016 | 866,256 |
| 2017 | 937,283 |
| 2018 | 1,041,054 |

**පුනරාවර්තන නොවන වියදම:**

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | 61 |
| 2007 | 83 |
| 2008 | 111 |
| 2009 | 126 |
| 2010 | 122 |
| 2011 | 130 |
| 2012 | 124 |
| 2013 | 123 |
| 2014 | 142 |
| 2015 | 144 |
| 2016 | 137 |
| 2017 | 122 |
| 2018 | 147 |

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

**බදු ලෙස රජයට ගෙවන ලද මුදල:**

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | 40 |
| 2007 | 53 |
| 2008 | 216 |
| 2009 | 235 |
| 2010 | 202 |
| 2011 | 71 |
| 2012 | 119 |
| 2013 | 73 |
| 2014 | 42 |
| 2015 | 41 |
| 2016 | 44 |
| 2017 | 79 |
| 2018 | 149 |

රජයට ගෙවන ලද බදු, මූල්‍ය සේවා සඳහා ගෙවන ලද බදු සහ ආදායම් බදු යන දෙකෙහිම එකතුව වේ.

**ලාභය හෝ අලාභය:**

| වර්ෂය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| 2006 | 23 |
| 2007 | 22 |
| 2008 | 76 |
| 2009 | 62 |
| 2010 | 20 |
| 2011 | 77 |
| 2012 | 218 |
| 2013 | 345 |
| 2014 | 178 |
| 2015 | 192 |
| 2016 | 258 |
| 2017 | 298 |
| 2018 | 227 |

(ආ) පැන නොනඟී.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මගේ මේ අතුරු ප්‍රශ්නයට ගරු රාජ්‍ය ඇමතිතුමා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙයි කියා මම හිතනවා. මම මේ ප්‍රශ්නය අහන්න ප්‍රධාන හේතුවක් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුව කාලයේ හොඳයි, ඉස්සර කාලයේත් හොඳයි කියලා මම කියන්නේ නැහැ. මේ බැංකුව දේශපාලනඥයන් වෙනුවෙන් ණය ලබාදීම, මූල්‍ය පහසුකම ලබාදීම මූලික කරගත් බැංකුවක් කියන කථාව මේ රටේ සාමාන්‍ය බැංකුවක් ගැන අවබෝධයක් තිබෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා. ඔබතුමාත් යම් විධියකට ඒ කාරණයට එකඟ වෙයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා එකඟ නැත්නම් "නැහැ" කියන්න. මොකද, මෙම බැංකුවේ ඉතිහාසය ගත්තාම, මේකේ හිටපු සභාපතිවරු සුදුසුකම් තිබුණු කට්ටිය නොවෙයි. දේශපාලනඥයන්ගේ හිතවතුන් තමයි මෙම බැංකුවට පත් කර තිබෙන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඉතිහාසයේ මේ බැංකුව ණය ලබාදෙන කොට ණය ලබාදීමේ සියලු කොන්දේසි උල්ලංඝනය කර තිබෙනවා. ඔබතුමාගේ පිළිතුරේදී නිවැරදි විධියට කරුණු ටික මතු වෙලා ආවා නම්, මෙන්න මේකට හේතුව මේකයි කියලා මට කියන්න තිබුණා. මම ඔබතුමාට උදාහරණයක් කියන්නම්. පසුගිය පාර්ලිමේන්තුව නියෝජනය කළ, වර්තමාන පාර්ලිමේන්තුවේ නොමැති, ඔබතුමන්ලාගේ හිටපු අමාත්‍යවරයෙක් කෝටි 5ක -මිලියන 50ක- ණය මුදලක් මෙම බැංකුවෙන් ලබාගෙන තිබෙනවා, පන්සලක ඉඩමක් ඇපයට තියලා. එතුමා එවකට මන්ත්‍රීවරයෙක්. මම මේ උදාහරණයක් කියන්නේ. අද මේ බැංකුවට ඒ මුදල අය කරගන්න විධියක් නැහැ. ඒ සියලු තොරතුරු මා ළඟ තිබෙනවා. මම මේ උදාහරණය ඔබතුමාට කියන්නේ, දේශපාලනඥයන් අපේ රටේ මූල්‍ය ආයතන කඩා වට්ටන තැනට තල්ලු කළේ මෙන්න මෙහෙමයි කියන කාරණය පෙන්වන්නයි. ඔබතුමා මේ විෂය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් තිබෙන රාජ්‍ය ඇමතිවරයෙක්. දේශපාලනඥයන්ගේ හිතවතුන්, බිරින්දෑවරු, සහෝදරයන් මෙම බැංකුවෙන් ලබාගත් ණය මුදල් නැවත අය කර ගත්තා නම් මේ බැංකුව කවදාවත් කඩා වැටෙන තත්ත්වයකට පත් වන්නේ නැහැ. එහෙම වුණා නම් මේ බැංකුව වෙනත් බැංකුවකට එකතු කරන්න අවශ්‍ය වෙන්නේත් නැහැ. එහෙම කළා නම් මේ බැංකුව අපට ඉදිරියට ගෙනයන්න තිබුණා. එහෙම නම් දේශපාලනඥයන්ට උදව් කිරීමේ අරමුණින් මේ බැංකුව ආරම්භ කළාට, රටේ ජනතාවට උදව් කරන තැනට එය අරගෙන යන්න තිබුණා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ බැංකුවෙන් ණය ගත් දේශපාලන හිතවතුන්ගේ සහ දේශපාලනඥයන්ගේ ණය කපා හැරීමට කටයුතු කිරීම, ඒවා බොල් ණය විධියට පැත්තකට දැමීම, ඒ වෙනුවෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම පසෙක ලා තැබීම යන කාරණා සම්පූර්ණයෙන් නවත්වා, අඩුම තරමේ ඉදිරි දවසක මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තාවක් ලබා දෙන්න පුළුවන්ද? අපේ පක්ෂය පැත්තේ අයත් මේ අතර ඉන්න පුළුවන්. නමුත්, "මෙන්න මේ කට්ටිය මේ ණය ගෙවීම් පැහැර හැර තිබෙනවා, මේ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරනවා" කියා වාර්තාවක් ලබා දෙන්න පුළුවන් ද? වෙන මොනවත් නැතිව, දේශපාලනඥයන්ගේ කොළවලට විතරක් 530 දෙනෙකුට මෙම බැංකුව රුපියල් ලක්ෂය ගණනේ ණය දීලා තිබෙනවා. ඒ සියල්ල ගැන හෙළිදරව්වක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම ඔබතුමාගෙන් ඒ ගැන උත්තරයකුත් බලාපොරොත්තු වනවා.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණාව අපි හැමෝම දන්නවා. විවිධ අවස්ථාවලදී ඕක සිදුවෙලා තිබෙනවා. අපි එවැනි

සිද්ධි දැකලාත් තිබෙනවා. මම ඔබතුමාට බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, මම ඒ ගණයේ නොවන බව. මම කිසි විටෙක කිසිම ණයක් දෙන්න කියලා කිසිම කෙනෙකුට කියලා නැහැ. ඔබතුමා කළ ප්‍රකාශයට මම එකඟයි. ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවා නොවෙයි, ප්‍රකාශයක් කළේ.

විවිධ අවස්ථාවලදී ඕනෑම රජයක් විසින් එවැනි කාර්යයන් කර තිබෙන බවට වූ තොරතුරු මතු කළොත් අපට ඒ ගැන විශේෂ විග්‍රහයක් කරන්නත් පුළුවන්, අපට ඒ ගැන වාර්තාවක් ලබා දෙන්නත් පුළුවන්. අපි එක පාරට ගිහිල්ලා ඔක්කෝම check කරනවාට වඩා, ලැබිලා තිබෙන තොරතුරු අනුව ඒක කරනවා නම් හොඳයි කියන එක තමයි මගේ මතය. ගරු මන්ත්‍රීතුමනි, එවැනි අවස්ථා තිබෙනවා නම් අපට ඒ තොරතුරු ඉදිරිපත් කරන්න. එතකොට අපිට ඒ ගැන පරීක්ෂණයක් කර ඔබතුමාට තොරතුරු දැනුම් දෙන්න පුළුවන්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, default list එක ගත්තා නම් කවුද ඉන්නේ කියලා හොයා ගන්න පුළුවන්නේ? ඒකත් පොඩ්ඩක් බලන්න.

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමාට නම් පොඩි හිනාවක් ගියා. එතුමා මේ සම්බන්ධයෙන් මොන යම් හෝ කාරණා දන්නවා ඇති.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගෙන් අසන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා තිබෙන, වාණිජ බැංකු හැටියට කටයුතු කරන සියලු බැංකුවල සියලු ගනුදෙනු විගණනයට ලක්වනවා. ඒ විගණනයට ලක්වීම තුළ මේ කියන බැංකුවත් සිදු කරපු මූල්‍ය ගනුදෙනු පිළිබඳව දිගින් දිගටම විගණනයට ලක්වන බව අපි දන්නවා. ඒ සම්බන්ධ විගණන වාර්තාත් තිබෙනවා. අලාභ, ණය දීම විකෘතිකරණය, ණය දීමෙන් සිදු වූ අලාභ ආදී සියලු විස්තර ඒ විගණන වාර්තා මඟින් දිගින් දිගටම වාර්ෂිකව වාර්තා කරනවා. හැබැයි, විගණනය තුළ ඒ දේ තිබුණත්, ඒ හා සමාන ගනුදෙනුවලට එක් එක් කාල වකවානු තුළ ඉඩ ලැබී තිබෙනවා. එසේ සිදු වන්නේ නිලධාරින් යම් ගිජුකමක් දැක්වීම නිසාද, නිලධාරින්ගේ යම්කිසි සම්බන්ධයක් තිබීම නිසාද, එහෙම නැත්නම් අපේ හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, නිලධාරින්ගේ රාජකාරියට දේශපාලන අධිකාරියෙන් සිදුවන බලපෑමක් අනුව ද? මේ සියලු දේ නතර කළ හැකි වැඩ පිළිවෙළ විගණන විමසුම් තුළ තිබියදී නැවත නැවතත් එය සිදුවීම තුළ රටේ බදු මුදල්වලට, මහා භාණ්ඩාගාරයට විශාල පාඩුවක් සිදු වන බව පෙනෙන්න තිබෙනවා. එහෙම නම් ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙයට ප්‍රධාන හේතුව දඬුවම් ලබා නොදීමයි. ඔබතුමන්ලා මේ කියන දේ හඳුනාගෙන තිබෙනවා ද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ඒ සඳහා ලබා දිය යුතු දඬුවම් මොනවාද කියලාත් අපට කියන්න පුළුවන්ද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, මෙතැනදී අපි බැලිය යුතු දෙයක් තිබෙනවා. යම්කිසි අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා නම්, අපි ඒ ගැන කටයුතු කරන්න අවශ්‍යයි. ණය දීමේදී තිබෙන එක අවදානමක් තමයි සමහරවිට ඒ ණය නොගෙවෙන්න පුළුවන් කියන තත්ත්වය. ඕනෑම බැංකුවක් bad debtsවලට provisions තියන්නේ, ඒ මුදල නැවත වරක් ලබා ගන්නම පුළුවන් කියලා සහතික කරන්න බැරි නිසායි. විවිධ හේතූන් නිසා සමහර විට මුදල ලබා ගන්න බැරි වෙයි. ඒ වුණත්, යම්කිසි පුද්ගලයෙකුට ගෙවන්න capacity එකක් නැත්නම්, ගෙවීමට හැකි තත්ත්වයක් නැත්නම් ඒ අයට ණය මුදල් ලබා දීම සම්පූර්ණයෙන්ම වැරැදියි. අපි ඒ පිළිබඳව කටයුතු කරන්න අවශ්‍යයි. නමුත්, සාමාන්‍ය බැංකුවකින් ණයක් ලබා දෙනකොට, එය සද්භාවයෙන් ලබා දෙනවා නම්, වෙනත් හේතු නිසා ඒක අය කර ගැනීමට අපහසුතාවක් තිබෙනවා නම්, අපට ණය දුන් අය පිට ඒ බර පටවන්න බැහැ. ණය දීමේදී අක්‍රමිකතාවක් සිදු වෙලා තිබෙනවා නම්, සුදුසු නැති වේලාවක ණයක් ලබා දී තිබෙනවා නම් එතැන වැරැද්දක් සිදු වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ වැරැද්දට දඬුවම් කරන්න අවශ්‍යයි. ඒ නිසා මේ පිළිබඳ පරීක්ෂණයක් කරද්දී, ඒ කෝණයෙන් බලන්නට පුළුවන් අය ගැන එහෙම කරන්නට අවශ්‍යයි. එවැනි අවස්ථා තිබෙනවා නම් -තිබෙන්න බැරි නැහැ.- විගණකාධිපතිතුමාගේත් අනුමැතිය ඇතිව ඒ ගැන කටයුතු කළ යුතුයි කියන මතයේ තමයි මම සිටින්නේත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -139/2020- (2), ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -170/2020- (2), ගරු එස්.එම්. මරික්කාර් මහතා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, ගරු අජිත් නිවාඩ් කබ්රාල් රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මම ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව ඊයේ ඇමෙරිකානු ඩොලරයක වටිනාකම රුපියල් 203යි. හැබැයි, ආනයනය කළ බඩු සඳහා කොළඹ කොමර්ෂල් බැංකුවලින් ඩොලර් නිදහස් කිරීමේදී ඩොලරයකට රුපියල් 212ක් - [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය මෙතැනට අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ගරු රාජ්‍ය ඇමතිතුමාට කියන්න ඒකට උත්තරයක් දෙන්න කියලා. ඒක ජාතික ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒ කාරණය වෙනම අහන්න.

ප්‍රශ්න අංක 4 -325/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -416/2020- (1), ගරු මොහොමඩ් මුසම්මිල් මහතා.

**ගරු මොහමඩ් මුසම්මිල් මහතා**
(மாண்புமிகு மொஹமட் முஸம்மில்)
(The Hon. Mohamad Muzammil)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால்)
(The Hon. Ajith Nivard Cabraal)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -580/2020- (1), ගරු චාල්ස් නිර්මලනාදන් මහතා.

**ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. Charles Nirmalanathan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -621/2020- (1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා නව අමාත්‍යාංශය භාර ගත්තේ ඊයේ නිසා පිළිතුර ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ, ඒක සාධාරණයි. අභිනව සෞඛ්‍ය ඇමතිවරයා හැටියට පත්වීම භාර ගත් ඔබතුමාට මම සුබ පතනවා.

ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමකට මට අවස්ථාවක් දෙනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කරන්න දෙයක් නැහැ. ගරු ඇමතිතුමා ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා කල් ඉල්ලුවා නේ.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -733/2020- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මහජන ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -800/2020- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -1800/2021- (1), ගරු රෝහණ දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 4 -325/2020- (1), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබාගත් වාහනය: විස්තර
### தொழில் அமைச்சின் செயலாளரால் பெறப்பட்ட வாகனம்: விபரம்
### VEHICLE OBTAINED BY SECRETARY TO MINISTRY OF LABOUR: DETAILS

**9. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ භාවිතය සඳහා මාසික කුලී පදනම මත වාහනයක් ලබා ගෙන තිබෙන බව එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, එම වාහනය ලබා ගෙන ඇති දිනය කවරේද;

(ii) ඒ සඳහා ගෙවනු ලබන මාසික කුලී මුදල කොපමණද;

(iii) වාහනය ලබා ගත් ආයතනයේ නම කවරේද;

(iv) එම ආයතනයේ ලිපිනය කවරේද;

(v) එම වාහනයේ හිමිකරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) ශ්‍රී ලංකාව විදේශ විනිමය පිළිබඳ ගැටලු රාශියකට මුහුණ දී තිබෙන මෙවැනි අවස්ථාවක වාහන කුලී පදනමින් ලබා ගැනීම අනුමත කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தொழில் அமைச்சின் செயலாளரது பயன்பாட்டுக்காக மாதாந்த வாடகை அடிப்படையில் வாகனமொன்று பெற்றுக்கொள்ளப்பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) அவ்வாறாயின், அவ்வாகனம் பெற்றுக்கொள்ளப் பட்டுள்ள திகதி யாதென்பதையும்:

(ii) அதற்காகச் செலுத்தப்படும் மாதாந்த வாடகைத் தொகை எவ்வளவென்பதையும்;

(iii) வாகனம் பெற்றுக்கொள்ளப்பட்ட நிறுவனத்தின் பெயர் யாதென்பதையும்;

(iv) அந்த நிறுவனத்தின் முகவரி யாதென்பதையும்;

(v) அவ்வாகனத்தின் உரிமையாளரது பெயர் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இலங்கையானது அந்நியச்செலாவணி தொடர்பான பல சிக்கல்களை எதிர்நோக்கியுள்ள இத்தகைய சந்தர்ப் பத்தில் வாகனங்கள் வாடகைக்குப் பெற்றுக்கொள்ளப் படுவதை அங்கீகரிக்கின்றாரா என்பதையும் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Labour:

(a) Is he aware that the Secretary to the Ministry of Labour has obtained a vehicle on monthly-rent basis for his use?

(b) Will he inform this House of -

(i) the date the said vehicle had been obtained;

(ii) the monthly rent paid for it;

(iii) the name of the institution from which the vehicle was obtained;

(iv) the address of that institution; and

(v) the name of the owner of that vehicle?

(c) Will he also inform this House whether he approves the obtaining of vehicles on rent basis at a time like this when the country is faced with a lot of problems in terms of foreign exchange?

(d) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (කම්කරු අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - தொழில் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Labour)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) කම්කරු අමාත්‍යාංශය විසින් ලේකම්වරයාගේ භාවිතය සඳහා මාසික කුලී පදනම මත වාහනයක් ලබාගෙන නොමැත.

එසේ වුවද, ලේකම්වරයාට රාජකාරි කටයුතු සඳහා නිල වාහනයක් නොමැති වාතාවරණයක එතුමා කලින් ලේකම් ධුරය හෙබවූ කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ නිල රාජකාරි සඳහා භාවිත කළ WP CAV 9584 අංක දරන ටොයොටා ලෑන්ඩ් කෲෂර් - Toyota Land Cruiser - ජීප් රථය කම්කරු අමාත්‍යාංශය වෙත 2020 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දී ඇත.

(ආ) (i) පැන නොනඟී.

ඉහතින් සඳහන් කළ පරිදි පවරා දී ඇති මෙම ජීප් රථය යහ පාලන රජය සමයේ එනම් 2018 වර්ෂයේ එවකට සිටි මුදල් අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟ පෙන්වීම් අනුව "මාසික කුලී ගෙවීමේ පදනම මත රජයේ වාහන ලබා ගැනීමට" හඳුන්වා දුන් ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2016 (i) හි සඳහන් සීමාවන්ට යටත්ව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2018 ඔක්තෝබර් 22 දින **"මෙහෙයුම් කල්බදු ක්‍රමය"** යටතේ වසර 05ක කාලයකට රාජගිරිය ටුවර්ස් සහ ට්‍රාන්ස්පෝර්ට් පුද්ගලික සමාගම වෙතින් රුපියල් 425,000/- (වැට් රහිත) මාසික බදු මුදලක් ගෙවීමේ පදනම මත ලබාගෙන ඇත.

මෙසේ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ රජයේ අවශ්‍යතා සඳහා වාහන ලබා ගැනීමේදී වසර 05ක ගිවිසුමක් අත්සන් තබන අතර එම ගිවිසුමේ කොන්දේසි කඩ නොකර පවත්වාගෙන යා යුතු බව එහි දැක්වේ. (එම **ගිවිසුමෙහි** පිටපත්* මේ සමඟ අමුණා ඇත.)

එසේම, රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීමේදී පෙර පැවති ක්‍රමවලට වඩා මෙම මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම පිරිවැය අතින් වඩා ප්‍රතිඵලදායක බව පවසමින් එවකට යහ පාලන රජයේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සිදු කළ මෙම වාහන ලබා ගැනීම පිළිබඳව මෙවන් ප්‍රශ්නයක් යොමු කිරීම පිළිබඳව ස්තුතිවන්ත වන අතර, එමඟින් මෙම වාහනය ලබා ගැනීම සම්බන්ධව සත්‍ය තොරතුරු ජනතාවට දැන ගැනීමට අවස්ථාව ලැබී ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(v) පැන නොනඟී.

(ඇ) ඉහතින් සඳහන් කළ පරිදි මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් මෙම ජීප් රථය සම්බන්ධයෙන් බදු ගිවිසුම වසර 05ක් යනතුරු අවලංගු කළ නොහැකි බැවින් එවකට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා අන්තර්ජාතික වෙළඳාම හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තනතුරට පත්වීමත් සමඟ මෙම ජීප් රථය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් එම අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. තවද, එම ජීප් රථය පවරා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතියද ලබා දී ඇත. ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අන්තර්ජාතික වෙළඳාම හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට මෙම ජීප් රථය පවරා දීමේදී අමාත්‍යාංශ නාමය වෙනස් වීම මත ගිවිසුම සංශෝධනය කර ඇති නමුත්, එහිදී පෙර කී ගිවිසුම් කොන්දේසි කිසිවක් වෙනස් කිරීමක් සිදු කළ නොහැකි බැවින් මාසික කුලිය ගෙවීම සහතික කිරීම සඳහා අමාත්‍යාංශයේ නම පමණක් සංශෝධනය කර තිබිණි.

2019 ජනාධිපතිවරණයෙන් පසු අමාත්‍යාංශ විෂය පථය සංශෝධනය වීම මත ඉහතින් සඳහන් කළ අමාත්‍යාංශයේ නාමය කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වශයෙන් නම් කිරීම අනුව එහි ලේකම්වරයාගේ රාජකාරි ගමන් සඳහා මෙම ජීප් රථය වෙන් කළ ද මෙම ජීප් රථය සඳහා මාසිකව රුපියල් 425,000/-ක් සහ සියයට 15 වැට් බදු මුදලක් ද ඇතුළුව රුපියල් 488,750/-ක බදු කුලියක් ගෙවා ඇති බව අනාවරණය වීම හේතුවෙන්, මෙම වාහනය භාවිත කිරීම ආර්ථික වශයෙන් ඵලදායි නොවන බව පෙන්වා දෙමින් ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශයේ වාහන ඇණියේ පවතින WP KY 7723 දරන ටොයොටා ජීප් රථය කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත පවරා දීමට වාචික එකඟතාව ලැබී ඇති බව දන්වමින් WP CAV 9584 අංක දරන ටොයොටා ජීප් රථය ඉවත් කර අංක WP KY 7723 දරන ටොයොටා ජීප් රථය ලබා දීමට කටයුතු කරන මෙන් එවකට කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයා වන වත්මන් කම්කරු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිපියකින් කොම්ප්ට්‍රොලර් ජෙනරාල්වරිය වෙත දන්වා ඇත. (**පිටපත*** අමුණා ඇත.)

ඊට පිළිතුරු ලෙස කොම්ප්ට්‍රොලර් ජෙනරාල්වරිය ජීප් රථයේ හිමිකාරිත්වය සමඟ එළඹ ඇති ගිවිසුම අවසන් වන දිනය හා එම ගිවිසුම් අවසන් කිරීමට ගෙවීමට ඇති මුදල් සහ එහි නීතිමය තත්ත්වය පිළිබඳ විස්තර ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී තිබිණි. (**පිටපත*** අමුණා ඇත.)

ඊට අදාළ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජෙනරාල්වරිය වෙත යොමු කරනු ලැබුවද නිසි පිළිතුරක් නොලැබුණු බැවින් හා පෙර පැවැති ගිවිසුම් අවලංගු කළ නොහැකි බැවින් හා වෙනත් විකල්පයක් නොමැති බැවින් එම ජීප් රථය එතුමා විසින් තම නිල රථය වශයෙන් රාජකාරි කටයුතු සඳහා භාවිත කර ඇත.

කම්කරු අමාත්‍යාංශයේ පෙර සිටි ලේකම්වරයා රාජකාරි කටයුතු සඳහා භාවිත කරනු ලැබූ නිල රථය නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සතු රථයක් වූ බැවින් වත්මන් ලේකම්වරයා පැමිණීමට පෙර එම ජීප් රථය එම අමාත්‍යාංශය විසින් රැගෙන ගොස් තිබුණි. එබැවින්, කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයාට රාජකාරි සඳහා සුදුසු නිල වාහනයක් නොවූයෙන් කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට වෙන් කර තිබූ නිල රථය වන WP CAV 9584 අංක දරන ජීප් රථය එම අමාත්‍යාංශයේ එකඟතාව මත කම්කරු අමාත්‍යාංශය වෙත පවරා දී ඇත. ඒ අනුව, වෙනත් අමාත්‍යාංශයක නමින් වූ වාහනයක් පාවිච්චි කළ ද ඒ සඳහා කුලී ගෙවීමේදී කම්කරු අමාත්‍යාංශය නමින් වූ වාහනයක ගෙවීම සනාථ කිරීම සඳහා එම වාහනය පවරා ගැනීම සඳහා අමාත්‍යාංශයේ නාමය පමණක් සංශෝධනය කරමින් මුල් කොන්දේසිවලට අනුකූලව ගිවිසුම්ගත වන ලෙස වාහනය ලබා දී තිබූ ආයතනය දන්වා තිබූ බැවින්, එම රථයේ හිමිකාරිත්වය දරන රාජගිරිය ටුවර්ස් සහ ට්‍රාන්ස්පෝර්ට් පුද්ගලික ආයතනයත් සමඟ කම්කරු අමාත්‍යාංශයේ අරමුදල් නීත්‍යනුකූලව ගෙවීම සහතික කිරීම සඳහා අමාත්‍යාංශයේ නාමය පමණක් සංශෝධනය කර ඇති අතර එහිදී පෙර ගිවිසුමේ කොන්දේසි මෙන්ම ගිවිසුම අවසාන වන දින වකවානු කිසිවක් සංශෝධනය කර නොමැතිව ගිවිසුම යාවත්කාලීන කර ඇත. එබැවින්, ඔබතුමිය විසින් විමසා ඇති පරිදි නාස්තිකාර ගිවිසුම්වලට කම්කරු අමාත්‍යාංශ ලේකම්වරයා එළඹ නොමැති බැවින් ඔබතුමියගේ ප්‍රශ්නයේ යොමු ගත කරුණු මීට අදාළ කරගත නොහැකි බව දන්වමි.

(ඈ) පැන නොනඟී.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වඳුරන්ගෙන් සහ රිළවුන්ගෙන් සිදුවන හානි: වැළැක්වීම

மந்திகள் மற்றும் குரங்குகளால் ஏற்படும் தீங்குகள்: தடுத்தல்

DAMAGE CAUSED BY MONKEYS AND MACAQUES: PREVENTION

1800/2021

**10.ගරු ශාන්ත බණ්ඩාර මහතා (ගරු රෝහණ දිසානායක මහතා වෙනුවට)**

(மாண்புமிகு சாந்த பண்டார - மாண்புமிகு றோஹண திஸாநாயக்க சார்பாக)

(The Hon. Shantha Bandara on behalf of the Hon. Rohana Dissanayaka)

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ස්වාභාවික පරිසරයේ නිදැල්ලේ හැසිරෙන රිළවුන් සහ වඳුරන් විසින් වී, එළවලු, පලතුරු, පොල් හා බඩ ඉරිඟු ආදී වගාවලට සහ නිවාස ආදී දේපළවලටත් ලේනුන්, ගිරවුන් ආදී සතුන්ටත් හානි කරනු ලබන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට වගකීම පැවරෙන ආයතනයේ නම කවරේද;

(iii) නිදැල්ලේ හැසිරෙන රිළවුන් හා වඳුරන් අල්ලා නිශ්චිතව හඳුනා ගන්නා ලද උද්‍යානවලට මුදා හැරීමේ වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வன சீவராசிகள் மற்றும் வனப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இயற்கையான சூழலில் சுதந்திரமாக நடமாடும் மந்திகள், குரங்குகளால் நெல், மரக்கறி, பழங்கள் மற்றும் சோளம் ஆகிய பயிர்களுக்கும் வீடுகள் போன்ற சொத்துகளுக்கும் அணில், கிளி போன்ற பிராணிகளுக்கும் தீங்கு விளைவிக்கப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) இவ்விடயம் தொடர்பில் நடவடிக்கை எடுக்கும் பொறுப்பு ஒப்படைக்கப்பட்டுள்ள நிறுவனம் யாது என்பதையும்;

(iii) சுதந்திரமாக நடமாடும் மந்திகளையும் குரங்கு களையும் பிடித்து துல்லியமாக இனங்காணப் பட்ட பூங்காக்களில் விடுவிக்கும் வேலைத்திட்ட மொன்று உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Wildlife and Forest Conservation:

(a) Will he inform this House-

(i) whether he is aware that the monkeys and macaques (Rilavas) roaming in the natural environment damage the crops like paddy, vegetables, fruits, coconut and maize, assets like houses and harm animals like squirrels and parrots;

(ii) the name of the institution that is responsible for taking measures in that regard;

(iii) whether there is a programme to catch roaming monkeys and macaques (Rilavas) and release them into identified wildlife parks?

(b) If not, why?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**

(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)

(The Hon. Johnston Fernando)

ගරු කථානායකතුමනි, වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාල වෙත නිරන්තරයෙන් එකී හානි සම්බන්ධයෙන් පැමිණිලි ලැබෙන අතර, එම හානි මැඩ පැවැත්වීමට අවශ්‍ය කටයුතු එකී කාර්යාලවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

(ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වන ජීවීන්ගෙන් සිදු වන හානි මැඩලීම පිළිබඳ සෘජු වගකීමක් ඇත. කෙසේ නමුත්, අනෙකුත් පාර්ශ්වකාර ආයතන රාශියක සෘජු දායකත්වය නොමැතිව මෙම කටයුතු සාර්ථක කර ගත නොහැක.

(iii) නිදැල්ලේ හැසිරෙන රිළවුන් හා වඳුරන් අල්ලා නිශ්චිතව හඳුනා ගන්නා ලද උද්‍යානවලට මුදා හැරීම ප්‍රායෝගික ක්‍රියාවක් නොවන අතර, ඊට පහත සඳහන් කරුණු බලපානු ලබයි.

1. ඕනෑම රක්ෂිතයක වඳුරන් හා රිළවුන් වැනි සතුන් සඳහා සීමිත ගහණ ඝනත්වයක් පවතින බැවින් මෙලෙස සතුන් අල්ලා රක්ෂිත තුළට මුදා හැරීමෙන් එම රක්ෂිත තුළ එම සතුන්ගේ ගහණ ඝනත්වය ඉක්මවා යන අතර, එමගින් එම රක්ෂිතවල සිටින සතුන් නැවතත් ආහාර සොයා රක්ෂිත ආසන්නයේ පවතින කෘෂි කාර්මික බිම් හා ගෙවතු වෙත පැමිණෙනු ඇත.

2. වඳුරන් හා රිළවුන් වැනි සතුන් කෘෂි කාර්මික බිම් හා ගෙවතු වගා මුල් කර ගනිමින් තම ආහාර අවශ්‍යතා පහසු ක්‍රමවේද ඔස්සේ සපුරා ගැනීමට හුරු වී සිටින බැවින්, යම් රක්ෂිතයක එම සතුන්ගේ ගහණ ඝනත්වය නො ඉක්මවුව ද ආසන්නයේ පවතින වගා බිම් හා නිවෙස් කරා පැමිණීමට කලක සිට මෙම සතුන් පුරුදුව සිටී.

3. මෙම සත්ව කොට්ඨාසවල උප විශේෂ කිහිපයක් සිටින අතර, එම සතුන් විවිධ දේශගුණික කලාපවලට අයත්ව ජීවත් වන බැවින්, එක් දේශගුණික කලාපයකට අයත් සත්ව කොට්ඨාසයක් තවත් දේශගුණික කලාපයකට අයත් උද්‍යානයකට නිදහස් කිරීම තුළින් මෙම සතුන් ජීවිත අවදානමකට මුහුණ පානු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අධිකරණයේ ස්වාධීනත්වය
*நீதித்துறைச் சுதந்திரம்*
INDEPENDENCE OF THE JUDICIARY

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 (2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා. මෙයට පිළිතුර ලබා දෙන්න ගරු අධිකරණ ඇමතිතුමා සූදානම්ව ඇතැයි මා සිතනවා.

අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් සිදු වීම හේතුවෙන් විනිසුරුවරුන්ට මුහුණ පෑමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වයක් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මා කැමැතියි.

විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ප්‍රධානම කුලුනු තුනයි. ඒවා සංවරණය හා තුලනය මඟින් එකිනෙක පාලනය වන බැවින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා වන බවට පොදුවේ පිළිගැනීමක් තිබෙනවා. කෙසේ වුවද, පසු ගිය දා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කැඳවන ලද සම්මන්ත්‍රණයකදී විධායකයේ වුවමනාව අනුව පොලීසිය විසින් අධිකරණයෙන් කරනු ලබන ඉල්ලීම්වලදී මහේස්ත්‍රාත්වරුන් විසින් ලබා දුන් තීන්දු පිළිබඳව අදහස් පළ කරනු ලැබ ඇති බවටත්, ලබා දිය යුතු තීරණ පිළිබඳව බලපෑම් සිදු වී ඇති බවටත් එයින් අධිකරණයේ ස්වාධීනත්වයට අනිසි බලපෑමක් සිදු වී ඇති බවටත් කරුණු වාර්තා වනවා. ගරු ඇමතිතුමනි, එම රැස්වීම් පිළිබඳව ඔබතුමාත් මේ වන විට දන්නවා ඇති.

පසුගිය 09 වැනි දා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වන සංජීව සෝමරත්න මහතාගේ අත්සනින් යුතුව 2021.08.13වන දින පෙරවරු 9.30 සිට පස්වරු 1.00 දක්වා විනිසුරුවරුන් පුහුණු කරන ආයතනයේ දේශන ශාලාවේදී සියලු මහේස්ත්‍රාත්වරුන් වෙනුවෙන් සම්මන්ත්‍රණයක් පැවැත්වෙන බවට දැනුම් දී තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ලිපිය මා **සභාගත** කරන්න බලාපොරොත්තු වෙනවා.

මහේස්ත්‍රාත්වරුන්ට යැවූ එම ලිපියේ ඇතුළත් කොටස් කීපයක් ගැනයි මා කියන්නේ. එසේම, ඉහත සම්මන්ත්‍රණය සඳහා සහභාගි වීම අනිවාර්ය බවත් එසේ සහභාගි නොවුණහොත් සේවා උසස්වීම්වලදී වාර්ෂික වැටුප් වැඩි කිරීම්වලදී විදේශ පුහුණු කිරීම්වලට තෝරා ගැනීමේදී, ඉහළ අධිකරණවලට උසස් කිරීමේදී ඒ පිළිබඳව සැලකිල්ලට ගන්නා බවත් එහි 03වන ඡේදයේ සඳහන් කොට තිබෙනවා. ඒ කියන්නේ, එම රැස්වීමට සහභාගි නොවනවා නම් ඔවුන්ට ඉහළ අධිකරණවලට උසස්වීම් ලබා ගන්න, විදෙස් පුහුණුව ලබා ගන්න, වැටුප් වර්ධක ලබා ගන්න බාධා වන බව තමයි මෙම ලිපියේ සඳහන් කරන්නේ. මහේස්ත්‍රාත්වරුන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් යවන ලද ලිපියේ අඩංගුව මෙයයි. එය අධිකරණයට බලපෑමක් වෙන්නේ නැද්ද? මෙම සම්මන්ත්‍රණයේදී මහේස්ත්‍රාත්වරුන් අපේක්ෂාවෙන් සිටියේ, මෙහිදී කොවිඩ් වසංගත තත්ත්වය මධ්‍යයේ රාජකාරි කිරීමේදී ඇති වී තිබෙන ගැටලුකාරී තත්ත්වය පිළිබඳව සාකච්ඡාවක් සිදු වනු ඇති බවටයි. විශේෂයෙන්ම එම බාධාකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින් කටයුතු කරන්නේ කෙසේද යන්න පිළිබඳව උපදෙස් ලැබෙනු ඇති බවටයි. මොකද, කොවිඩ් වසංගත තත්ත්වය නිසා අධිකරණ පද්ධතිය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් යම් ගැටලුවකට මුහුණ දී සිටිනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා ඒ පිළිබඳ දැනුවත් කිරීම සහ ඒ පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම තමයි මෙම සාකච්ඡාවේ අරමුණ කියන එකයි මහේස්ත්‍රාත්වරුන්ගේ කල්පනාව වෙලා තිබුණේ.

කෙසේ වුවද, වාර්තා වන අන්දමට, එම මූලික අරමුණින් වෙනස්ව, එහිදී රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ අධිකරණයේ ස්වාධීනත්වයට බලවත් තර්ජනයක් වන ආකාරයෙන්ද කරුණු පළ වී ඇති බව දැනගන්නට ලැබෙනවා. විශේෂයෙන්ම සෞඛ්‍ය අංශයන්ගෙන් කෙරුණු දැනුවත් කිරීම්වලින් අනතුරුව, පසුගිය කාලයේ විවිධ මහජන විරෝධතා අරභයා පොලීසිය විසින් කරන ලද ඉල්ලීම්වලට අදාළව මහේස්ත්‍රාත්වරුන් විසින් ලබා දුන් තීන්දු පිළිබඳව සහ එවැනි තීන්දු නිසා ඔවුන්ගේ වෘත්තිය ජීවිතයට අනිසි බලපෑම් ඇති විය හැකි බවට අදහස් දක්වා තිබෙනවා. අපි කවුරුත් දන්නවා, පසුගිය දවස්වල විවිධ කරුණු මත අත්අඩංගුවට අරගෙන, රිමාන්ඩ් භාරයට පත් කරන්නය කියා අපේ මහේස්ත්‍රාත් අධිකරණ ගණනාවකදී පොලීසිය ඉල්ලා සිටියත්, මහේස්ත්‍රාත්වරුන් එය ප්‍රතික්ෂේප කර තිබුණු බව. බොහෝ අධිකරණවල එය සිදු වුණා. මට මතකයි, එක තැනකදී නීතිපති දෙපාර්තමේන්තුවේ සොලිසිටර් ජනරාල්වරයකු ඇවිල්ලා පැහැදිලි කර කිව්වා, "මොහු රිමාන්ඩ්ගත කරන්න" කියලා. හැබැයි, මහේස්ත්‍රාත්වරයා තමන් මත තිබෙන සාක්ෂි අනුවත්, ඒ වාගේම තමන්ට තිබෙන නීතිමය බලතල අනුවත් එය ප්‍රතික්ෂේප කර තිබුණා. එය අධිකරණයේ ස්වාධීනත්වය. ඒ නිසා මහේස්ත්‍රාත්වරුන් ගණනාවක් මහේස්ත්‍රාත් අධිකරණවලදී පසුගිය දා එසේ ලබා දුන් තීන්දු පිළිබඳව මෙම සාකච්ඡාවේදී සාකච්ඡා කොට තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ විතරක් නොවෙයි, ඉල්ලීම්වලට අදාළව මහේස්ත්‍රාත්වරුන් ලබා දුන් තීන්දු පිළිබඳව සහ එවැනි තීන්දු නිසා ඔවුන්ගේ වෘත්තිය ජීවිතයට බලපෑම් ඇති විය හැකි බවටද අදහස් දක්වනවා. "ඔබලා එවැනි ආකාරයේ තීන්දු ලබා දෙනවා නම්, ඔබලාගේ වෘත්තිමය ජීවිතයට බලපෑම් ඇති වෙනවා" කියලා මේ කරුණු ඉදිරිපත් කරනවා.

විශේෂයෙන් අධිකරණ පද්ධතියේ ප්‍රධානම වගකීම දරන්නා, ඒ කියන්නේ වර්තමානයේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා - ඔබතුමන්ලා දන්නවා, ඒ කවුද කියලා. නිල බලයෙන් සභාපති වෙන්නේ කවුද කියලා ඔබතුමන්ලා දන්නවා.- ඇතුළු දේශකයින් කිහිප දෙනෙකු විසින් පොලීසිය විසින් ඉල්ලා සිටිනු ලබන, උද්ඝෝෂණ පැවැත්වීම සම්බන්ධයෙන් තහනම් නියෝග ලබා දීමට කටයුතු කළ යුතු බවට අවධාරණය කොට තිබෙනවා. මම දන්නේ නැහැ, අධිකරණයේ කුමන ඉහළ බලතල දැරුවත්, යම් විනිශ්චයකාරවරයෙකුට අයිතියක් ලැබෙනවාද කියා මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට තිබෙන නඩු නිමිත්තකට තීන්දුව ලබා දිය යුත්තේ කවර ආකාරයෙන්ද කියලා කරුණු ඉදිරිපත් කරන්න. ඔහු අධිකරණ පද්ධතියේ ඉහළම නිලධාරියෙක් වෙන්න පුළුවන්; ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයෙක් වෙන්න පුළුවන්. හැබැයි, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තකදී තීන්දුව ලබා දුන් ආකාරය වැරදි බවත්, මෙන්න මේ ආකාරයෙන් තීන්දුව ලබා දිය යුතු බවත් ඔහුට ප්‍රකාශ කළ හැකිද? ඒ සම්බන්ධයෙන් ඔහුට බලපෑම් කළ හැකිද, ගරු කථානායකතුමනි?

එහිදී, ඒ වෙනුවෙන් ව්‍යවස්ථාව තුළ අඩංගු විවිධ වගන්ති උපයෝගී කරගත හැකි බව දන්වා තිබෙනවා. එසේම, මෙතෙක් ලබා දී ඇති තීන්දු වැරදිසහගත බව ඒත්තු ගැන්වීමට උත්සාහ දරා තිබෙනවා. ව්‍යවස්ථාවේ තිබෙන විවිධ වගන්ති උපුටා දක්වමින් "මෙන්න මේ අනුව ඔබට කටයුතු කළ හැකිය, මේ අනුව රිමාන්ඩ් භාරයට පත් කළ හැකිය" කියන කරුණු ඉදිරිපත්කොට තිබෙනවා. ලබා දී තිබෙන තීන්දු වැරදි බව ප්‍රකාශකොට තිබෙනවා. අධිකරණ පද්ධතියට, මහෙස්ත්‍රාත්වරුන්ට මෙවැනි ආකාරයෙන් බලපෑම් කිරීම සාධාරණද, යුක්ති සහගතද, ගරු කථානායකතුමනි? එතැන තිබෙන්නේ කවර ප්‍රජාතන්ත්‍රවාදයක්ද? ඒ, අධිකරණයේ කවර ස්වාධීනත්වයක්ද? කාලයක් තිස්සේ අධිකරණය තුළ කටයුතු කරන නීතිඥ මහත්වරුන් මෙම ගරු සභාවේත් සිටිනවා. මා දැන ගන්න කැමැතියි, ඔබතුමන්ලා මෙය අනුමත කරනවාද කියලා.

අධිකරණ සේවා කොමිෂන් සභාවට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකුට පහළ අධිකරණ විනිසුරුවරුන්ගේ ස්වාධීන තීන්දු ගැනීමේ අයිතියට බලපෑම් සිදු කළ නොහැකියි. එසේම එම තීන්දු ගැනීම තුළ වෘත්තීය ජීවිතයට බලපෑමක් එල්ල වීමට ඉඩ ඇති බවට අනියම් තර්ජනයක් සිදු කළ නොහැකියි. අවම වශයෙන් දුරකථනයෙන් හෝ ලිපියක් මඟින් හෝ පවතින නඩු සම්බන්ධයෙන් කිසිම ආකාරයක බලපෑමක් පහළ අධිකරණයක විනිශ්චයකාරවරුන් වෙත සිදු කළ නොහැකි බවත්, එය සෘජුව අධිකරණයේ ස්වාධීනත්වයට අත පෙවීමක් බවත් පැහැදිලි වෙනවා, ගරු කථානායකතුමනි. මෙය මුළුමනින්ම අධිකරණයේ ස්වාධීනත්වයට බලහත්කාරී අත පෙවීමක් හැටියට තමයි අපට පෙන්නුම් කරන්නේ.

මෙම තත්ත්වය තුළ සම්මන්ත්‍රණයේදී පළ කරන ලද අදහස් සහ විශේෂයෙන්ම විධායකයේ ඉල්ලීම්වලට අනුගත වන ලෙසට කරන ලද ඉල්ලීම හුදු සමස්ත රටේම මහෙස්ත්‍රාත්වරුන්ට සිදු කළ බලපෑමක් පමණක් නොවෙයි. මහෙස්ත්‍රාත්වරුන් කැඳවා තමයි මෙය කියන්නේ. හැබැයි, ඒ සංඥාව යන්නේ මහෙස්ත්‍රාත්වරුන්ට පමණක් නොවෙයි, ගරු කථානායකතුමනි. එය රටේ අධිකරණයේ ස්වාධීනත්වය කෙලෙසා දැමීමක් මෙන්ම ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට කරන ලද අනියම් තර්ජනයක්ද වෙනවා. මේ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදය රකින අධිකරණයේ ස්වාධීනත්වය නමැති කුලුන තමා විසින්ම කඩා බිඳ දමා විධායකයට අවශ්‍ය පරිදි අධිකරණය සකස් කිරීමට උත්සාහ දැරීමක්. ස්වාධීනත්වය පිළිබඳව නියාමනයන් සකස් කළ යුතු වන, මැදිහත් විය යුතු වන ආයතනය තමන් විසින්ම, තමන්ට පැවරී තිබෙන බලතල සුනු විසුනුකොට දැමීම සඳහා දරන ලද උත්සාහයක් මේ තුළ ගැබ් වී තිබෙනවා, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම මහෙස්ත්‍රාත්වරුන් කැඳවන ලද ලිපියේ අඩංගුව, ඒ වාගේම විධායකයට අනුරූප වන පරිදි තීන්දු ලබා දෙන්න කියලා එම සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කරන ලද අදහස් මුළුමනින්ම අපේ මහෙස්ත්‍රාත් අධිකරණවලට කරන ලද අනිසි බලපෑමක් සහ අධිකරණ ක්ෂේත්‍රයම විශාල තර්ජනයකට ලක්කිරීමක්.

මෙම තත්ත්වය තුළ මතුවන පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි මා අපේක්ෂා කරනවා.

01. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මහෙස්ත්‍රාත්වරුන් වෙනුවෙන් පවත්වන ලද සම්මන්ත්‍රණයකදී පසුගිය කාලයේ ඔවුන් විසින් ලබාදුන් තීන්දු පිළිබඳව සහ පොලීසිය විසින් තහනම් නියෝග ලබා දීමේදී ක්‍රියා කළ යුතු අන්දම පිළිබඳව අදහස් දැක්වීමට හේතු කවරේද?

මහෙස්ත්‍රාත්වරුන් කැඳවා, ලබා දුන් තීන්දු වැරදි බවටත්; මේ ආකාරයෙන් තීන්දු ලබා දිය යුතු බවටත්; ඉදිරියේදී මෙන්න මේ තීන්දු ගත යුතු බවටත් ඒ අයව දැනුවත් කිරීම සඳහා එවැනි කටයුත්තක් - සම්මන්ත්‍රණයක් - සූදානම් කළේ ඇයිද කියා මා දැනගන්න කැමැතියි.

02. මෙම අදහස් දැක්වීම පහළ අධිකරණ විනිසුරුවරුන්ගේ තීරණවලට බලපෑම් සිදු කළ නොහැකි බවට වන පිළිගැනීම උල්ලංඝනය කිරීමක් බව පිළිගනු ලබන්නේද?

03. පොලීසියේ ඉල්ලීම අනුව තහනම් නියෝග ලබා දීමට බලපෑම් කිරීම ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට කරන ලද අනියම් තර්ජනයක් බව පිළිගනු ලබන්නේද?

පොලීසිය ගිහිල්ලා යම් උද්ඝෝෂණයක්, යම් පෙළපාළියක් තහනම් කරන්න කියා ඉල්ලීම් කළාම, මහෙස්ත්‍රාත්වරුන් - අධිකරණය- විසින් ඒවා ප්‍රතික්ෂේප කොට තිබෙනවා. හැබැයි, දැන් එම නියෝග ලබා දෙන්න කියා බල කරනවා. එය ජනතාවගේ ස්වාධීන සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උල්ලංඝනය කිරීමක් නොවන්නේ කෙසේද කියා මම ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

04. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් මහෙස්ත්‍රාත්වරුන් අමතා යවන ලද ඉහත සඳහන් ලිපියේ 03වැනි වගන්තිය -මා කලින් සඳහන් කළ, මේකට සහභාගි නොවෙන්නේ නම්, ඔවුන්ගේ උසස්වීම්වලට, විදේශීය පුහුණුවීම්වලට, ඒ වාගේම ඔවුන්ගේ වැටුප් වර්ධකවලට මෙය බලපාන බව- අධිකරණ සේවා කොමිෂන් සභාවේ බලතල හා ගැටෙන බව පිළිගනු ලබන්නේද?

කොමිෂන් සභාවට, ඔවුන්ගේ රැස්වීමකට සහභාගි නොවන්නේ නම් වැටුප් වර්ධක ලබා නොදෙන බවටත්, උසස්වීම් ලබා නොදෙන බවටත්, විදෙස් පුහුණුවලට නිර්දේශයන් නොකරන බවටත් සඳහන් කළ හැකිද?

05. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විධායකයට අනුගත වන ලෙසට මහෙස්ත්‍රාත්වරුන්ට සිදු කර ඇති මෙම බලපෑම් සහගත සිදුවීම් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ස්ථාවරය කුමක්ද?

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, අධිකරණ සේවා කොමිෂන් සභාව කියන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ස්වාධීන ලෙස ස්ථාපිත කර තිබෙන ආයතනයක් බව. එම ආයතනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන්නේ ස්වාධීනවයි. ඒකට බලපෑම් කිරීමට අධිකරණ ඇමතිවරයාට හෝ රජයට කිසිසේත්ම හැකියාවක් නැහැ. එහෙම කරන්න අපේ බලාපොරොත්තුවකුත් නැහැ, අපි කිසිසේත්ම ඒ විධියට කටයුතු කරලාත් නැහැ. ඒ අනුව, මේ සිදුවෙලා තිබෙන්නේ මොකක්ද, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කියන ආකාරයේ දෙයක් සිදුවෙලා තිබෙනවාද, ඒ සම්බන්ධයෙන් තිබෙන තොරතුරු මොනවාද කියන කාරණා පිළිබඳව සම්පූර්ණයෙන්ම පිළිතුරු ලැබෙන්නට ඕනෑ අධිකරණ සේවා කොමිෂන් සභාවෙන්. එම නිසා එතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. මෙය අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත නීත්‍යානුකූලව යොමු කර, එතුමන්ලා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කරුණු මොනවාද කියා බලා මම එම තොරතුරු මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Speaker -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Rauff Hakeem?

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
Sir, the Hon. Minister of Justice has asked for two weeks' time to answer that Question. In the meantime, I read in the newspapers that the Bar Association of Sri Lanka is also due to look into this matter and issue a statement shortly. Sir, it is a very serious matter that the Hon. Anura Dissaanayaka has raised, particularly the issues pertaining to the duress that is supposed to be brought on the lower Judiciary in this country. I know, Sir, that, sometimes, when it comes to Executive policy, judicial decision-making and the rights of the citizens, there is unnecessary interference through such circulars and - [*interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Minister clarify at the time he replies. Thank you very much, Hon. Member.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
There needs to be a very balanced approach. Otherwise, it would be the end of -[*Interruption.*]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let the Hon. Minister clarify at the time he replies.

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම, ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2021 සැප්තැම්බර් 06 සඳුදා පාර්ලිමේන්තුව රැස්වන දිනයක් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2021 සැප්තැම්බර් 06 දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2021 සැප්තැම්බර් 06 සඳුදා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පිළිබඳ වැඩකටයුතු පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 35හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
## COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල සහ 2020 අගෝස්තු 27 දින සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසිඑක් දෙනෙකුගෙන් (21) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2021 සැප්තැම්බර් 06 සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත
## கொரோனா வைரஸ் தொற்று (கொவிட்-19) (தற்காலிக ஏற்பாடுகள்) சட்டமூலம்
## CORONA VIRUS DISEASE 2019 (COVID - 19) (TEMPORARY PROVISIONS) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[පූ.භා. 10.43]

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி - நீதி அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry - Minister of Justice)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ දිනට නියමිත කටයුතුවලට අදාළ අංක 2, 3, 4 සහ 5 දරන යෝජනා ද මම ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙහිදී 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමටයි මා බලාපොරොත්තු වෙන්නේ. මුලින්ම මෙම පනත් කෙටුම්පත පිළිබඳව අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ ශ්‍රී ලංකා නීතිඥ සංගමයයි. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ එවකට හිටපු සභාපති කාලිංග ඉන්ද්‍රතිස්ස මහතාත්, ජනාධිපති නීතිඥවරුන් වන සංජීව ජයවර්ධන මහතාත්, ජනාධිපති නීතිඥ ඉක්‍රම් මොහොමඩ් මහතාත් එකතු වෙලා මේ ගැන සංකල්පයක් වශයෙන් අදහසක් ඉදිරිපත් කරනු ලැබුවා. එම අදහසට අනුව තමයි, 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබුවේ. අනෙක් රටවල තිබෙන ආකාරයට, එසේ කටයුතු කිරීමේදී අපි කරුණු 4ක් බලාපොරොත්තු වුණා. ඒ අනුව, යම්කිසි කාලයක් තුළ යම්කිසි දෙයක් නීත්‍යනුකූලව කළ යුත්තේ නම් එම කාලය දීර්ඝ කරන්නේ කොහොමද, කොවිඩ් - 19 වසංගතය හේතුකොටගෙන අධිකරණ කටයුත්තකට බාධා වෙලා තිබෙනවා නම් වෙනත් විකල්ප අධිකරණයක් ලබා දෙන්නේ කොහොමද, කොවිඩ් -19 වසංගත කාලය තුළත් නීතියේ පාලනය සහ නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යාම සඳහා අන්තර්ජාලය හරහා අධිකරණ කටයුතු පවත්වාගෙන යන්නේ කොහොමද, ලෝකයේ රටවල් තුනක -ඇමෙරිකාවේ, එංගලන්තයේ, සිංගප්පූරුවේ- විතරක් තිබුණු යම් යම් ගිවිසුම් නීත්‍යනුකූලව කරගන්නට බැරි වෙනකොට ඒකෙන් පීඩා විඳින අයට වැඩිපුර කාලයක් ලබා දෙන්නේ කොහොමද කියන කාරණා හතර සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා තමයි අපි අද මෙම පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ.

ඒ කාරණාවලට අමතරව මෙම පනත් කෙටුම්පතේ වෙනත් කිසිම දෙයක් නැහැ. මේ පනත තුළින් අපි බලාපොරොත්තු වන්නේ පීඩා විඳින, දුක් විඳින සාමාන්‍ය ජනතාවට ආරක්ෂාව ලබා දෙන එකයි. විපක්ෂයේ මන්ත්‍රීවරු කිසිම තේරුමක් නැතිව මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නොයෙක් කරුණු ඉදිරිපත් කළා. ඕනෑම පනත් කෙටුම්පතක් හදන ක්‍රමයක් තිබෙනවා. අපට ඕනෑ විධියට පස්සා දොරෙන් පනත් කෙටුම්පතක් ගෙනෙන්න බැහැ. පනත් කෙටුම්පතක් ගෙනෙන කොට ඒකේ සංකල්ප පත්‍රිකාවක් ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනවා. ඉන් පසු අමාත්‍ය මණ්ඩලය ඒ පිළිබඳව තීරණය කරලා ඒ සංකල්පය අනුමත කරනවා. ඒ සංකල්පය අනුමත කළාට පසු එය නීති කෙටුම්පත් සම්පාදකවරයා වෙත ඉදිරිපත් කර ඒ අදාළ කරුණු අනුව පනත් කෙටුම්පතක් හදන්නය කියන්න ඕනෑ. එකී පනත් කෙටුම්පත හැදුවාට පසු ඒ පනත් කෙටුම්පතේ තිබෙන කරුණු ලංකාවේ නීතියට ගැළපෙනවාද, නැද්ද, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව සරල බහුතරයකින්, නැත්නම් තුනෙන් දෙකක ඡන්දයකින් හෝ වෙනත් ආකාරයකින් සම්මත කර ගත යුත්තේද යන්න පිළිබඳව ගරු නීතිපතිතුමාගේ සහතිකය ලබා ගන්න ඕනෑ. ඒ සහතිකය ලබා ගත්තාට පසු එය නැවත කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන්න ඕනෑ. කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාට පසු එය නැවත ගැසට් කරන්න ඕනෑ. එය ගැසට් කරන කොට සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ කියන භාෂා තුනෙන්ම ගැසට් කරන්න ඕනෑ. ඒ අනුව මේ පනත් කෙටුම්පත භාෂා තුනෙන්ම තිබෙනවා.

මොහොතකට පෙර ගරු මන්ත්‍රීවරයෙකු කිව්වා, එවැන්නක් නැහැයි කියලා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයක්. එහෙම මට ඕනෑ දේවල් කරන්න පුළුවන්ද? මටත් තිබුණා, මේ පනත් කෙටුම්පත ගෙන එන්නේ නැතිව පැත්තකට වෙලා නිකම් ඉන්න. අපි මේ රටේ මිනිසුන්ට යම් කිසි උදව්වක් කරන්නයි හදන්නේ. භාෂා තුනෙන්ම මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කොට තිබෙනවා. ඒකෙන් කවුරු හරි පීඩාවට පත්වනවා නම්, නැත්නම් ඒ සම්බන්ධයෙන් කාට හරි අභියෝග කරන්න ඕනෑ නම්, ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා අභියෝග කරන්න පුළුවන්. ඒ අනුව මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කළා. ඔවුන් කරුණු දෙකක් පිළිබඳව අභියෝගයට ලක් කර තිබුණා. පළමුවෙනි කරුණ තමයි, කොවිඩ් තත්ත්වය - COVID-19 circumstances - පිළිබඳව තීරණය කරන්නේ කොහොමද කියන එක. යම් කිසි පුද්ගලයකු කොවිඩ් තත්ත්වයෙන් පීඩාවට පත්වෙලා සිටිනවා නම්, ඔහුට තමයි මේ ප්‍රතිපාදනවලින් සහයෝගය ලබා දෙන්න ඕනෑ; සහනය ලබා දෙන්න ඕනෑ. ඒක තීරණය කිරීම සඳහා කරුණු රාශියක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන්ම වෙනත් රටක නීතියක් හේතුකොටගෙන කොවිඩ් රෝගයෙන් පීඩා විඳින කෙනකු සම්බන්ධයෙන් මෙහි සඳහන් වනවා. උදාහරණයක් ගත්තොත්, කවුරු හෝ කෙනෙකු සිංගප්පූරුවට ගිහිල්ලා සිටින විට සිංගප්පූරුවේ නීතියක් හේතුකොටගෙන ඔහුට ලංකාවට ඒමට

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

බැරි නම්, ඒ කාලය තුළ තමන්ගේ ගිවිසුම ඉෂ්ට කර ගන්න බැරි වුණා නම්, කොවිඩ් වසංගතයක් තිබෙන අවස්ථාවක ඒක සලකා බලන්න ඕනෑය කියලා සඳහන් කරලා තිබෙනවා. ඒ පිළිබඳව විවිධ අර්ථකථන තිබෙනවා. නඩු තීන්දු දෙකක් ලබා දීලා තිබෙනවා. එක නඩු තීන්දුවක පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, ඒකේ ප්‍රශ්නයක් නැහැ කියලා. තව නඩු තීන්දුවකින් කියනවා, වෙනත් රටක නීතියක් සලකා බැලීම පවා කරන්න බැහැ කියලා. ඒ අනුව අපි ඒ සංශෝධනය කරලා තිබෙනවා.

දෙවැනි කාරණය මෙයයි, ගරු කථානායකතුමනි. කොවිඩ් තත්ත්වය හේතු කොටගෙන පීඩාවට පත් අය වෙනුවෙන් ක්‍රියා කිරීමට ගිවිසුම් 35ක් තෝරා ගෙන තිබෙනවා. ඒ ගිවිසුම් 35 තෝරා ගෙන තිබෙන්නේත් පිට රටවල තිබෙන මේ හා සමාන නීති අධ්‍යයනය කිරීමෙනුයි. [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා, මොකක්ද කාරණය?

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
ගරු කථානායකතුමනි, ගරු අධිකරණ ඇමතිතුමා උසාවියේ තීන්දු ගැන කිව්වා. නමුත් Supreme Court එකේ තීන්දුව සිංහල භාෂාවෙන් නැතිව අපි බලන්නේ කොහොමද? කරුණාකර ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. අපට ඒ තීන්දුව සිංහල භාෂාවෙන් ඕනෑ.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙන්න ඕනෑ.

**ගරු කුමාර වෙල්ගම මහතා**
(மாண்புமிகு குமார வெல்கம)
(The Hon. Kumara Welgama)
අපට සිංහල භාෂාව තමයි තේරෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු කථානායකතුමනි, අපි අද උදෑසන මතු කළේත් අධිකරණ තීන්දු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී අවම වශයෙන් එහි පිළිගත හැකි සිංහල පරිවර්තනයක් ඉදිරිපත් කරන්න කියන කාරණයයි. අධිකරණය කෙසේ කටයුතු කළත්, පාර්ලිමේන්තුවට එම පරිවර්තනය අවශ්‍යයි. අපේ ඉල්ලීම ඒකයි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
ඒ කාරණය පිළිබඳව සලකා බලන්න, ගරු කථානායකතුමනි. ශ්‍රේෂ්ඨාධිකරණය ඉංග්‍රීසියෙන් තමයි නඩු තීන්දු ලබා දෙන්නේ. ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන නඩු තීන්දුව සිංහලට හා දෙමළට පරිවර්තනය කළ හැකි නම් ඒ පිළිබඳව සලකා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දුව තමයි අපි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ගරු ඇමතිතුමනි, අධිකරණය නඩු තීන්දුව ලබා දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණයි කියන එක පිළිතුරක් නොවෙයි. අපට අයිතිය තිබෙනවා, සිංහල භාෂාවෙන්, නැත්නම් තම මව් භාෂාවෙන් ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙන්න. අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලුවේ ඒකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කාරණය ගරු ඇමතිතුමා තේරුම් ගත්තා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)
මම එහෙම දෙයක් කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ශ්‍රේෂ්ඨාධිකරණයෙ ලබා දීලා තිබෙන තීන්දුව -Determination එක- තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ප්‍රධාන වශයෙන් අපි මේ පනත් කෙටුම්පතින් කරුණු හතරක් ඉටු කරන්න බලාපොරොත්තු වුණා. ඉන් පළමුවැනි කරුණ මෙයයි. මම උදාහරණයක් කියන්නම්. අභියාචනයක් කරනවා නම් එය දවස් 42ක් ඇතුළත කරන්න ඕනෑ කියලා නීතියක් තිබෙනවා. හැබැයි, ඒ කාලය තුළ අභියාචනයක් කරන්න හැකියාවක් නැහැ. මොකද, කොවිඩ් වසංගතය හේතුකොටගෙන පළාතේ පවතින තත්ත්වය නිසා. අන්න එතකොට ඔවුන්ට අවස්ථාවක් ලබා දෙනවා. අපි එයට ඉංග්‍රීසි භාෂාවෙන් කියනවා, "Appeal notwithstanding lapse of time" කියලා; කාලය පිළිබඳව සලකා බලන්නේ නැතුව, සුදුසු පහසුකම් අනුව කාලය අනුරූපිකව ලබා දෙන්න ඕනෑ කියලා. එයින් කරන්නේ පීඩාවට පත් පුද්ගලයෙකුට කාලය වැඩියෙන් ලබාදීමයි.

දෙවැනි කාරණය, අධිකරණයක් යම්කිසි කාලයක් තුළ පවත්වාගෙන යාමට බැරි තත්ත්වයක් ඇති වෙනවා නම්, ඒ කියන්නේ කොවිඩ් වසංගතය හේතුවෙන් අධිකරණය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඒ කාලය තුළ අන්තර්ජාලය හරහා කටයුතු කරන්නට හැකියාව ලබාදීම. පසුගිය කාලයේදී අපි ඒ කටයුත්ත කළා. බොහෝ අවස්ථාවලදී ඇප ලබා දීම් සඳහා අන්තර්ජාලය උපයෝගි කර ගත්තා. විශේෂයෙන්ම සිරකරුවන්ට ඇප ලබා ගන්න බැරි වුණාම, ඒ නඩු කැඳවන්න බැරි වුණාම, ඔවුන්ට ඇප ලබා දීම සඳහා අන්තර්ජාලය හරහා, ස්කයිප් හරහා, එහෙම නැත්නම් වට්ස්ඇප් හරහා ඒ නඩු කථා කිරීමට අවස්ථාව ලබාදීමයි මෙමඟින් කරන්නේ. මෙකෙන් කරන්නේත් පීඩාවට සහ අගතියට පත් මහ ජනතාවට තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණය ඉදිරියට යෑමට හැකියාව ලබාදීමයි.

ගරු කථානායකතුමනි, ඊළඟට අපි කල්පනා කළා, අධිකරණය වසා තිබෙනවා නම්, ආසන්න අධිකරණයකට ගිහිල්ලා යම් ක්ෂේත්‍රයකට සහන ලබා ගැනීමේ හැකියාව ඇති කරන්න. එය තමයි, තුන්වන කරුණ. උදාහරණයක් ගත්තොත්, නඩත්තු නඩුවක් පිළිබඳව යම්කිසි පුද්ගලයෙකුට හදිසි අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ දරුවා වෙනුවෙන් නඩත්තු ලබා ගන්නට හැකියාවක් නැත්නම්, ඒ දරුවාගේ දෙමාපියන් සිටින පළාතේ අධිකරණය වසා තිබෙන අවස්ථාවක, ඊට අනුරූප ළඟම අධිකරණයට ගිහිල්ලා ඒ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා අවස්ථාවක් ලබාදීම තමයි අපේ උත්සාහය වන්නේ.

කොවිඩ් වසංගතය හේතුකොටගෙන පීඩා විඳින, වඩාත්ම බලපෑමට ලක් වූ, ගිවිසුම්වලට සම්බන්ධ යම් යම් පාර්ශ්වයන්ට

සහන ලබා දෙන්නත් මේ තුළින් අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි හතරවැනි කාරණය. එහිදී සියලුම ගිවිසුම්වලට අවස්ථාව ලබා දුන්නොත් උසාවිවල සම්පූර්ණයෙන්ම නඩු අහන්න කාලයක් යන නිසා සහ ආර්ථිකයට සිදුවිය හැකි බලපෑම පිළිබඳවත් සලකා බලා අපි යෝජනා කළා, තෝරා ගත් ක්ෂේත්‍ර 35කට සහන ලබා දෙන්නට ඕනෑ කියලා. ඒ සම්බන්ධව අපි විවිධ ක්ෂේත්‍ර සමඟ සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් ලැබුණු වාර්තාව මම **සභාගත*** කරනවා. ඒ වාගේම, ලංකා වාණිජ මණ්ඩලයෙන් ලැබුණු වාර්තාවත් මම **සභාගත*** කරනවා.

විශේෂයෙන්ම ලංකා වාණිජ මණ්ඩලය ඒ සම්බන්ධයෙන් මේ ආකාරයට සඳහන් කර තිබෙනවා:

> "In particular, it is noticed that the above piece of legislation is going to create major issues with respect to contracts. Hence, one of the main submissions we are making is that "contracts" be removed from its scope. Accordingly, we request the Hon. Minister of Justice to consider withdrawing Part IV of the Bill and all sections that cross-refer to sections in Part IV in the first instance and thereafter to set these out in greater detail in another statute dedicated to contracts.
>
> The adverse repercussions of the current formulation, broadly, are; ................ (b) Burdening of courts (c) Delays in giving decisions under this statute due to the case load of courts."

මෙහිදී ඔවුන් විශේෂයෙන්ම අපේ අවධානය යොමු කරවා තිබෙනවා, සියලුම ගිවිසුම්වලට අවස්ථාව ලබා දුන්නොත් අධිකරණයේ නඩු ඇසීමේ ප්‍රමාදය හේතුකොටගෙන, අධිකරණ ක්‍රියාත්මක නොවීම හේතුකොටගෙන මේ සියලුම දේවල් අධිකරණවලට ගියාට පස්සේ කාලය ගතවෙලා එය ආර්ථිකයට වැරදි ලෙස බලපාන්න පුළුවන් කියලා. ඒ කාරණා සඳහන් ලිපියත් මම **සභාගත*** කරනවා.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයත් - Sri Lanka Banks' Association (Guarantee) Limited එකත් - මේ පිළිබඳව ඔවුන්ගේ නිරීක්ෂණ ලබා දීලා තිබෙනවා. ඒ හා සමානවම මහ බැංකුවේ අධිපතිවරයා එතුමාගේත් නිරීක්ෂණ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිරීක්ෂණ සියල්ල සලකා බලා අපට ගන්න තිබෙන්නේ තොරතුරු දෙකයි. ඒවා තමයි, කොවිඩ්-19 බලපෑම හේතුකොටගෙන දැඩිව අභියෝගයට ලක්වී තිබෙන ක්ෂේත්‍ර තෝරා ගෙන ඔවුන්ට සහන ලබා දෙන්න ඉඩ දෙනවාද කියන කාරණයත්, නොඑසේ නම් ශ්‍රේෂ්ඨාධිකරණය යෝජනා කර ඇති ආකාරයට සියලු ම ගිවිසුම්වලට මෙම කාලය ලබා දීම දීර්ඝ කිරීමට ඉඩ දෙනවාද කියන කාරණයත්. ඔවුන් කියා තිබෙනවා, තෝරා ගත් ක්ෂේත්‍ර සඳහා සහන ලබා දෙනවා නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයකින් මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න ඕනෑ කියලා. ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් majority සහ minority කියලා තීරණ දෙකක් ලබා දීලා තිබෙනවා. Majority එකෙන් කියන්නේ තුනෙන් දෙකක ඡන්දයකින් මෙය සම්මත කර ගන්න ඕනෑ කියලා. Minority එකෙන් කියන්නේ සාමාන්‍ය ඡන්දයකින් සම්මත කර ගන්න පුළුවන් කියලා. මේ අර්බුදය නිසා වැඩියෙන්ම පීඩාවට පත්වන්නේ කුමන ක්ෂේත්‍රයක්ද, වැඩියෙන්ම සහන ලබා දිය යුත්තේ කාටද කියන එක ගැන policy decision එකක් ගත යුතු බවත් කියා තිබෙනවා. Policy decision එකක් ගැනීමේ බලය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයට නොවෙයි, අමාත්‍ය මණ්ඩලයටයි. එම නිසා තමයි එම decision එක අපි අරගෙන තිබෙන්නේ. එනමුත් ඒ පිළිබඳව ලැබුණු සියලු තොරතුරු සලකා බලා, ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දුව පිළිබඳවත් අවධානය යොමු කර, මම මුලින් කිව්ව ආකාරයට ශ්‍රී ලංකා නීතිඥ සංගමය, වාණිජ මණ්ඩලය, මහ බැංකුව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය ඇතුළු සියලුදෙනාගේ අදහස් විමසා බලා තමයි අපි මේ සම්බන්ධයෙන් තීරණයක් ගත්තේ.

ශ්‍රේෂ්ඨාධිකරණය කියන ආකාරයට සියලු දෙනාටම අවස්ථාව ලබා දුන්නොත් උසාවිවල නඩු පිරිලා, ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා අරාජිකත්වයට යන්න ඉඩ තිබෙනවාය කියන එක තමයි ඔවුන් මේ ලිපිවලින් කියලා තිබෙන්නේ. ඒක යම් කිසි විධියකින් පිළිගන්න අපට සිද්ධවනවා. අපේ උසාවිවල නඩු දැම්මොත් ඒවා අවසන් කරන්න අවුරුදු ගණනාවක් ගතවනවා. මේ කාලය තුළ ආර්ථිකය කඩා වැටීමකට ලක්වීමට ඉඩ දෙන්න අපට බැහැ.

ඒ අනුව, මේ කරුණු සියල්ල සලකා බලා, ගිවිසුම් සම්පූර්ණයෙන්ම මේකෙන් ඉවත් කිරීමට අපි තීරණය කළා. ගිවිසුම් සඳහා සහන ලබා දී තිබෙන්නේ ලෝකයේ රටවල් තුනයි. ඒ, ඇමෙරිකාව, එංගලන්තය, සහ සිංගප්පූරුවයි. අපි ඒ ප්‍රගතිශීලී පැත්තට ගිහින් තමයි සහනය ලබා දෙන්න උත්සාහ කළේ. නමුත් සියලුදෙනාටම සහනය ලබා දුන්නොත් ආර්ථිකය කඩා වැටෙනවා. මේ දෙකේ සංකලනයක්, සම්මිශ්‍රණයක්, එහෙම නැත්නම් තුලනයක් ඇති කර ගන්නට ඕනෑ. එම නිසා අපි තීරණය කර තිබෙනවා, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය අපට ලබා දුන් තොරතුරුවලට අනුව, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය අපට ලබා දුන් උපදෙස්වලට අනුව කටයුතු කරලා සාමාන්‍ය සරල බහුතරයකින් සම්මත කරගන්න පුළුවන් විධියට සියලු ම සංශෝධන ගෙනැත් 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගන්න. අවසාන වශයෙන් මේ පනත තුළින් අපි උත්සාහ කරන්නේ මහ ජනතාව වෙනුවෙන් පහසුවක් ඇති කරන්නයි. ඒ තමයි කොවිඩ් වසංගතය හේතුකොටගෙන තමන්ගේ නඩු කටයුතු, ව්‍යවස්ථාපිත වගකීම්, සාධාරණ හේතු මත නියමිත කාලය තුළ ඉෂ්ට කර ගැනීමට බැරි අයට අධිකරණය මැදිහත් වෙලා කාලය දීර්ඝ කර ලබා දෙන්න. මීට පෙර කාලාවරෝධ පනතට තාවකාලික සංශෝධනයක් ගෙනැත් උතුර, නැඟෙනහිර පළාත්වල ජනතාවට මේ පහසුකම ලබා දුන් ආකාරය අපි දැක්කා. 2004 සුනාමි ව්‍යසන කාලයේත් මෙවැනි පහසුකම් ලබා දුන්නා. ඒකෙන් එක තර්කයක් ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා කියූ ආකාරයට, රටේ අධිකරණ ස්වාධීන විය යුතුයි කියා අපි විශ්වාස කරනවා. අධිකරණ තමයි මේ රටේ ජනතාවගේ අවසාන bastion එක. ඔවුන්ට ප්‍රශ්නයක් තිබුණොත් යා හැකි එකම තැන තමයි අධිකරණය. ඒ නිසා මොන බාධක තිබුණත්, මොන ප්‍රශ්න තිබුණත්, මොන අභියෝග තිබුණත් අධිකරණ නොනැවතී ක්‍රියාත්මක විය යුතුයි කියන එක අපි දැඩිව විශ්වාස කරනවා. එම නිසා තමයි අධිකරණයට අන්තර්ජාලය ඔස්සේ නඩු ඇසීමට හා නඩු කටයුතු කරගෙන යාමට අවස්ථාව ලබා දිය යුතුයි කියා අපි යෝජනා කරන්නේ. ඒක ඊළඟ වගකීම.

යම් කිසි කාලයක යම් පළාතක අධිකරණයක් වසා දැමුවත්, lock down වෙලා තිබුණත් මිනිසුන්ට තිබෙන ප්‍රශ්න lock down කරගෙන ඉන්න බැහැ නේ. Domestic violence සිදු වෙනවා. සමහර වෙලාවට ගෙදර සිටින කාන්තාවට පහර දීම් සිදු වෙනවා කියලා අපි දන්නවා. දැන් නම් සමහර අවස්ථාවල මහත්වරුන්ටත් ගහනවා. කාන්තාවට පහර දීම් සිදු වෙනවා; කුඩා දරුවන්ට පහර දීම් සිදු වෙනවා. පළාතේ අධිකරණය වැසුවාම ඒ අයට තමන්ගේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

නඩත්තු නඩුව කරගෙන යන්න බැහැ. දැන් මේ අනුව එවැනි අවස්ථාවක ඒ උසාවිය විවෘත කරනතුරු බලාගෙන ඉන්නේ නැතිව ඊට යාබදව තිබෙන උසාවියට ගිහින් තමන්ගේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මෙතැන කිසිම යටි අරමුණක් නැහැ. මේ තුළින්, තෝරා ගත්ත කිහිපදෙනෙකුට විතරක් සහන ලබා දෙන්නේ නැහැ. හැම දෙයක් දෙසම කුමන්ත්‍රණකාරී ඇසකින් බලන්නට එපා. සමහර වෙලාවට දුකත් හිතෙනවා. සම්පූර්ණයෙන් ප්‍රගතිශීලී ලෙස, ලෝකයේ විවිධ රටවල තිබෙන කරුණු අධ්‍යයනය කරලා මගේ හැකියාව අනුව සහ මට තිබෙන ශක්ති ප්‍රමාණය අනුව යම් කිසි දෙයක් කරන්න ගියාම ඒක කුමන්ත්‍රණයක් කියනවා. කාට විරුද්ධවද අපි කුමන්ත්‍රණ කරන්නේ? මොනවාද මේ දේවල්වලින් ඒ අය බලාපොරොත්තු වෙන්නේ? සිංහල භාෂාවෙන් නැහැ කියනවා; දෙමළ භාෂාවෙන් නැහැ කියනවා. නොයෙක් දේවල් කියනවා. එහෙම මට ඕනෑ විධියට මේවා ගැසට් කරන්න බැහැ. මට ඕනෑ විධියට නීති ගෙනෙන්න බැහැ. නීතියක් ගෙනෙනකොට ඉතාම විවෘතව, පාරදෘශ්‍යභාවයෙන්, විනිවිදභාවයෙන් යුතුව තමයි ගෙනෙන්න ඕනෑ. සමහර අයට එකඟ වෙන්න පුළුවන්, එකඟ නොවී ඉන්නත් පුළුවන්.

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් නඩු තීන්දු දෙකක් තිබෙනවා. විනිශ්චයකාරවරු දෙදෙනෙක් එකතු වෙලා එක නඩු තීන්දුවක් දීලා තිබෙනවා. තවත් විනිශ්චයකාරතුමෙක් නඩු තීන්දුවක් දීලා තිබෙනවා. Dissenting judgment එක ලබා දුන් විනිශ්චයකාරතුමා කියනවා මේකේ කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. නීතිපතිතුමාත් ඒක කියනවා; නීති කෙටුම්පත් සම්පාදකතුමාත් ඒක කියනවා; අපට උපදෙස් ලබා දුන් විශේෂඥ මණ්ඩලයත් ඒක කියනවා. මමත් එහෙම හිතනවා. නමුත් දෙදෙනෙක් ඊට විරුද්ධ විධියට හිතනවා. එහෙම තමයි රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ. හැබැයි, අපි ඒ අධිකරණ තීන්දුවට හිස නමනවා. අපි එකඟ වෙන්නේ නැහැ, නමුත් එයට හිස නමනවා. ඒ විධියටයි නීතිය ක්‍රියාත්මක වෙන්නේ; නීති හදන්නේ. ඒ නිසා හැම දෙයටම, "මේවා කුමන්ත්‍රණ" කියන්න එපා. හැම දෙයටම, සිදු වෙන්නේ නැහැ කියමින් අසත්‍ය වචන දමන්න එපා. අපට මේ දේ කරගෙන යන්න ඉඩ දෙන්න. නමුත් සාධාරණ විවේචන තිබෙනවා නම්, අපට ඒවා පෙන්වා දෙන්න. අපේ වැරදි තිබෙනවා නම් හදාගන්නම්. මේ කාරණයේදී වුණත් එහෙමයි. ශ්‍රේෂ්ඨාධිකරණය කියූ කරුණු අපි සැලකිල්ලට ගත්තා. ඒ වාගේම වාණිජ මණ්ඩලය කියපු කරුණුත්, නීතිඥ සංගමය කියපු කරුණුත් අපි සැලකිල්ලට ගත්තා.

ඊළඟට, Sri Lanka Banks' Association (Guarantee) Limited එකෙන් කියපු කරුණුත් අපි සැලකිල්ලට ගත්තා. ඒ වාගේම මහ බැංකුවේ අධිපතිතුමා කියූ කරුණුත් අපි සැලකිල්ලට අරගෙන තිබෙනවා. විශේෂයෙන් කථානායකතුමාගේ නායකත්වය යටතේ පැවැත්වූ Committee on Parliamentary Business එකේදී, -පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී- එතුමන්ලා මේක හරියට තේරුම් අරගෙන තිබුණා. මම එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. එතුමන්ලා මේ පනත් කෙටුම්පත study කර තිබුණා. එතුමන්ලා කිව්වා, "මේකේ කිසි වරදක් නැහැ, මේ ගැන තර්ක කරන්න කිසි දෙයක් නැහැ, මේක පොදුවේ රටට හොඳ දෙයක්, ඒ නිසා එකතුවෙලා ඉදිරිපත් කරමු" කියලා. එම නිසා මේ ගරු සභාවේ සිටින සියලු දෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා මේ පනත් කෙටුම්පත හොඳට කියවා බලන්න කියා. කවුරුන් හෝ කියන නිසා නොවෙයි, ඔබතුමන්ලා ස්වේච්ඡාවෙන්ම මෙය කියවා බලන්න. කොවිඩ් -19 පනත් කෙටුම්පත තුළින් විදේශ නීතියක් ගේන්න හදනවා කියලා සමහරු කියනවා. විදේශ නීති ගේන්න බැහැ, මේ විධියට. කොවිඩ් - 19 තත්ත්වය -COVID-19 situation - තීරණය කිරීමේදී -determine කිරීමේදී- guidelines කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා, මොනවාද ඒ සඳහා උපයෝගී කර ගත හැක්කේ කියලා. ඉන් එක guideline එකක තිබෙනවා යම්කිසි විදේශ රටක නීතියක් අනුව යම්කිසි පුද්ගලයකුට තමන්ගේ වැඩ කටයුතු කර ගන්නට බැරි වුණා නම්, ඒ ගැන සැලකිල්ලට ගන්න කියලා. උදාහරණයක් හැටියට, පුද්ගලයෙකු සිංගප්පූරුවට ගියා කියලා අපි හිතමු. ඔහු බලාපොරොත්තු වෙනවා සතියකින් ලංකාවට එන්න. නමුත්, සිංගප්පූරුවේ lockdown එකක් තිබිලා ලංකාවට එන flights මාසයක් තිස්සේම නැති වුණොත් බලාපොරොත්තු වුණු කාලය ඇතුළත ඔහුට ලංකාවට එන්න බැරි වෙනවා. එතකොට ඒ රටේ නීතිය හේතු කොටගෙන තමයි මේ රටේ පුද්ගලයා පීඩා විඳින්නේ. ඒ වාගේ කාරණා සැලකිල්ලට ගන්න කියන එක විතරයි යෝජනා කළේ. මම ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. Dissenting Judgment එකේදී ඒ විනිශ්චයකාරතුමා ඒ පිළිබඳව ඉතාම පැහැදිලිව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. එම Judgment දෙකත් මම **සභාගත*** කරනවා, ගරු කථානායකතුමනි.

එහිදී විනිශ්චයකාරතුමා ඉතාම පැහැදිලිව මෙසේ සඳහන් කරනවා:

> "The gravamen of the Petitioner's complaint was that the operation of or compliance with any law of another country or territory would intrude on the sovereignty of the People as adumbrated in Article 3 read with Article 4 of the Constitution. It is not as if the decision-making process of the Sri Lankan judiciary or tribunal is intruded upon or affected by an extraterritorial law or order but on the contrary the import of the definition (b) only means that the Sri Lankan courts which have to take into account a Covid-19 circumstance for the purpose of granting reliefs to litigants under the Act if enacted, will also take cognizance of a factual consequence brought about by a Covid related law or order of an overseas country. In my view there is nothing unconstitutional in such a provision."

ගරු කථානායකතුමනි, එතුමාත් තීරණය අරගෙන තිබෙන්නේ ඒ විධියටයි. නීතිපතිතුමා තේරුම් අරගෙන තිබෙන්නෙත් ඒ විධියටයි. අපි තේරුම් අරගෙන තිබෙන්නෙත් ඒ විධියටයි. කැබිනට් මණ්ඩලය තේරුම් අරගෙන තිබෙන්නෙත් ඒ විධියටයි. නීති කෙටුම්පත් සම්පාදකතුමා තේරුම් අරගෙන තිබෙන්නෙත් ඒ විධියටයි. නමුත්, විනිශ්චයකාරවරු දෙදෙනෙක් ඊට වඩා වෙනස් විධියට තේරුම් කරනවා. එතුමන්ලාට ඒ බලය තිබෙනවා. ඒ අනුව, ඒකට ගැළපෙන ආකාරයට අපි මේ නීතිය සංශෝධනය කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, එ් නිසා majority decision එකට ගැළපෙන ආකාරයට කාරක සභා අවස්ථාවේදී සංශෝධන ඉදිරිපත් කිරීමට මා සූදානම්ව සිටිනවා. ඒ අනුව, 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා පක්ෂ, විපක්ෂ සියලුදෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[පූ.භා. 11.06]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු කථානායකතුමනි, අද දින අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව අපට විරුද්ධ මතයක් නැහැ. එතුමා කිව්වා, එක උසාවියක් lockdown වුණොත් ආසන්නයේ තිබෙන වෙනත් උසාවියකට යන්න පුළුවන් කියලා. නමුත් ගරු අධිකරණ ඇමතිතුමනි, මේ යන තත්ත්වයේ හැටියට එක උසාවියක්වත් එහෙම තියා ගන්න පුළුවන් වෙයිද දන්නේ නැහැ. එම නිසා ඔබතුමා ඒ ගැනත් කල්පනා කරන්න. ඒ කියන්නේ, එවැනි තත්ත්වයක් ඇති වුණොත් අධිකරණ ක්‍රියාවලියේදී මිනිසුන්ට සාධාරණය ඉෂ්ට කරන්නේ කෙසේද කියන එක ගැන.

අද කොරෝනා වසංගතයේ ඇත්ත තත්ත්වය මම කියන්නම්. මම මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක බැංකුව මුළු ලෝකයම අරගෙන කරපු සංගණනයේ වාර්තා අනුවයි. මට ලැබී තිබෙන්නේ ඉතා කෙටි කාලයක් නිසා කෙටියෙන් ඒ ගැන විස්තර කරන්නම්.

එම වාර්තාව අනුව, "Number of deaths per day by 14th August per one million population, Sri Lanka's rank, two". ඒ කියන්නේ, ජනගහනය මිලියනයකට දෛනික මරණ අනුපාතය ගත්තොත් ලංකාව ඉන්නේ දෙවැනි ස්ථානයේ. ඊළඟට, සඳහන් වනවා, "Number of deaths per week ending 14th August, 2021 per one million population, Sri Lanka's rank, four" කියලා. ඒ කියන්නේ, ජනගහනය මිලියනයකට සතියකට සිදු වන මරණ සංඛ්‍යාව ගත්තොත් ලංකාව ඉන්නේ හතරවන ස්ථානයේ. එය බරපතළ තත්ත්වයක්. ඊළඟට සඳහන් වනවා, "Percentage change in deaths per week ending 14th August, 2021 per one million population, Sri Lanka's rank, one" කියා. ජනගහනය මිලියනයකට මරණ සංඛ්‍යාවේ වැඩි වීම අරගෙන බැලුවොත්, ලංකාව ඉන්නේ ලෝකයේ රටවල් අතරින් නරකම තත්ත්වයක. ගරු කථානායකතුමනි, මේ සියලු සංඛ්‍යා ලේඛන සහිත දීර්ඝ වාර්තාවක් මා ළඟ තිබෙනවා. එම වාර්තාව මා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලය කියන්නේ, ලෝකයේ පිළිගත්, ඉහළ පෙළේ විශ්වවිද්‍යාලයක්. එම විශ්වවිද්‍යාලය මේ කොරෝනා වසංගතය ආරම්භයේ ඉඳලාම ඒ ගැන පර්යේෂණ කරපු විශ්වවිද්‍යාලයක්. ඒ අය කියනවා, "Daily new confirmed COVID-19 deaths per million people by 13th August, 2021, Sri Lanka, 5.72" කියලා. ඒ වාගේම "United States, 1.95; U.K., 1.33; France, 0.76; India, 0.35; Canada, 0.16; Germany, 0.15" මිය යනවා කියලා. මේ වනකොට අපි කොරෝනා තුන්වන රැල්ලේ ඉන්දියාව සිටි මට්ටම වාගේ පහළොස් ගුණයකින් නරක තැනකයි ඉන්නේ. නමුත්, මේ වසංගතයේ ඇත්ත තත්ත්වය හෙළිදරව් කරන්නේ නැතුව අද ව්‍යාජ අන්දමින් සංඛ්‍යා ලේඛන සකස් කරනවා. ඒක අපි නොවෙයි, කියන්නේ. තමුන්නාන්සේලාටම සහයෝගය දෙන "දෙරණ" රූපවාහිනී නාළිකාවෙන් පෙන්නුවා. සතියකදී ගම්පහ දිස්ත්‍රික්කයේ ආසාදිතයන් සංඛ්‍යාව 3,629ක් කියා වාර්තා කළත් එහි ඇත්ත සංඛ්‍යාව 12,555යි කියලා. ඒ කියන්නේ, ආසාදිතයන්ගේ සංඛ්‍යාව 8,926ක් අඩුවෙන් තමයි සඳහන් කර තිබෙන්නේ. තත්ත්වය ඒ තරම් භයානකයි.

ගරු කථානායකතුමනි, මා ළඟ තිබෙනවා මේ කොවිඩ් වසංගතය සම්බන්ධව රජයෙන් නිකුත් කරපු දත්ත සහ නැඟෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ඉදිරිපත් කරපු දත්ත. මේ දෙක අතර වෙනස බලන්න. මඩකලපුව දිස්ත්‍රික්කය ගත්තොත්, ආණ්ඩුව කියන්නේ එම දිස්ත්‍රික්කයේ කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව 45යි කියලා. නමුත්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කියනවා, ඒ වාගේ අට ගුණයක්, ඒ කියන්නේ ආසාදිතයන් 342ක් ඉන්නවා කියලා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආසාදිතයන් සංඛ්‍යාව 71යි කියා ආණ්ඩුව කියන කොට, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කියනවා, ආසාදිතයන් සංඛ්‍යාව 163යි කියලා. ඒ කියන්නේ, දෙගුණයකටත් වැඩියි. අම්පාර දිස්ත්‍රික්කයේ ආසාදිතයන් සංඛ්‍යාව 78යි කියා ආණ්ඩුව කියන කොට, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කියනවා, අසාදිතයන් සංඛ්‍යාව 332යි කියලා. ඒ කියන්නේ, පස්ගුණයකටත් වැඩියි. කවුද, මේ සංඛ්‍යා ලේඛන වෙනස් කරන්නේ? මම ඒ කාරණයට පසුව එන්නම්.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයත් බොහොම කාලයකට පස්සේ මේ පිළිබඳව කථා කර කියනවා, "රජය ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන සියල්ල අසත්‍යයි. දවසකට මිනිසුන් 250ක් මැරෙනවා. රජයේ රෝහල්වල ඉන්න වෛද්‍යවරුන්ගෙන් ගත්ත දත්ත හා සංඛ්‍යා ලේඛන අනුව දවසකට 250කට වැඩි පිරිසක් මිය යන බව දැනගන්න තිබෙනවා" කියලා. එහෙම නම් කවුද, මේ සංඛ්‍යා ලේඛන වෙනස් කරන්නේ? පුවත් පත්වල කිව්වා, "එක්තරා මේජර් ජෙනරාල්වරයෙක්" කියලා. අද සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් අපට තොරතුරු දෙනවා, කවුද ඒ පුද්ගලයා කියලා. නම් ගම් පිටින්ම දෙනවා. එයා තමයි මේ සංඛ්‍යා ලේඛන එකතු කරන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නොවෙයි. මේ සංඛ්‍යා ලේඛන දෙන්නේ හමුදාවෙන්. කෙනෙක් මැරුණාම ඒ ගෙවල්වලට යවා ඒ ගෙදර ඉන්න මිනිසුන්ගෙන් කට උත්තර ගන්නවා. ඒ ගෙවල්වලට ගිහින් අහනවා, "එයාට දියවැඩියාව තිබුණා නේද, එයාට heart disease තිබුණා නේද, එයාට kidney disease තිබුණා නේද, එයාට පිළිකා තිබුණා නේද?" කියලා. ඒ අනුව ඒවා එක ගොඩකට දානවා. එහෙම කරලා, 180ක් විතර වන මරණ සංඛ්‍යාව 150ට විතර අඩු කරනවා. ආසාදිතයන් සංඛ්‍යාව ගැන වෙනම සංඛ්‍යා ලේඛන හදනවා. ඊට පස්සේ ඒවා භවසට දෙනවා. තමුන්නාන්සේලා මේ ගැන හොයන්න. ඒ මේජර් ජෙනරාල්වරයා කවුද කියලා හොයා ගන්න එක මට වඩා තමුන්නාන්සේලාට ලෙහෙසියි. ඔහු කවුද කියා අපි දන්නවා. නමුත්, අපි අද නම කියන්නේ නැහැ. ඉදිරියේදී ඔහුගේ නමත් එළියට එයි. මොකද, මේ වනකොට බෙහෙවින් විශ්වාස භංගත්වයට පත්ව සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරින් අද කර කියා ගන්න දෙයක් නැතිව, "මේ වැරැද්ද මෙන්න මෙතැනින් සිදු වෙන්නේ" කියලා හෙළිදරව් කරනවා.

බලන්න, අද ඇති වෙලා තිබෙන දරුණු තත්ත්වය දිහා. තමුන්නාන්සේලා, අප කාටත් මේ දරුණු තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙන්න පුළුවන්. හෙට මට වෙන්න පුළුවන්. මෙකේ victims කියන්නේ අපි හැමෝම. මේක වසංගතයක්. මේක කාටවත් තෝර තෝරා දෙන්නේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා, මහාචාර්ය සුනෙත් අගම්පොඩි මහත්මයා ගැන. නොයෙක් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කරමින් මුල ඉඳලාම කොරෝනා වසංගතය සම්බන්ධයෙන් කථා කළ කෙනෙක්, එතුමා. එතුමාගේ වාර්තා මෙච්චර කාලයක් වැරැදිලා නැහැ. "ඇඳිරි නීතිය නොදැමීමෙන් අතිරේක මරණ 1,200ක්. ඒවා මනුෂ්‍ය ඝාතන ලෙස සැලකිය යුතුයි." යනුවෙන් එතුමා සඳහන් කරනවා. නිසි තීන්දු නොගැනීම තුළ මේවා මනුෂ්‍ය ඝාතන විධියට සලකන්න කියලායි කියන්නේ. ශ්‍රී ලංකාවට වහා ඇඳිරි නීතිය පැනෙව්වොත්, ඉදිරි දින 20 තුළ සිදු විය හැකි අතිරේක මරණ 1,200ක් වළක්වා ගත හැකි බවත් එතුමා කියනවා. මේ කියන ඇඳිරි නීතිය තමුන්නාන්සේලා අපි හිතන විධියේ රාත්‍රියට පනවන

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඇඳිරි නීතිය නොවෙයි. එතුමා කියන්නේ lockdown එකක් වාගේ තත්ත්වයක් ගැනයි; එහෙම නැත්නම් පසු ගිය කාලයේ පැනවූවා වාගේ දවස පුරා පනවන ඇඳිරි නීතිය ගැනයි. එතුමා වැඩිදුරටත් සඳහන් කර තිබෙන්නේ, "එම මරණ කැමැත්තෙන් තොරව සිදු කළ මනුෂ්‍ය ඝාතනයක් වනු ඇත." කියලායි.

ඊළඟට, විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය - AMS, Association of Medical Specialists - කියා තිබෙන දෙය බලන්න. ඒ අය කියන සියලු කාරණා මම කියන්නේ නැහැ. මා ඉන් කොටසක් පමණක් කියන්නම්. ඉතා ඉක්මනින් මෙන්ම දැඩිව සංවරණ සීමා ක්‍රියාත්මක නොකළහොත්, අප විසින් මීන් පෙර අත් නුදුටු දරුණු ප්‍රතිඵල අපට අත් විඳීමට සිදු වන බව අවධාරණය කරන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ, හැකි ඉක්මනින් දැඩි සංවරණ සීමා පනවා වසංගතය මැඩ පැවැත්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙසයි. AMS එක තමයි මෙසේ ඉල්ලා සිටින්නේ.

ගරු කථානායකතුමනි, Sri Lanka Medical Association එකත් අද මේ ගැන කථා කරනවා. එය ලංකාවේ තිබෙන වෛද්‍ය සංගම්වල umbrella organization එක; ලංකාවේ තිබෙන පැරණිම වෘත්තීය සංවිධානය. ඒ විතරක් නොවෙයි, ඒ ගොල්ලන්ගේ medical colleges තිබෙනවා College of Physicians, College of Surgeons and College of Obstetricians and Gynaecologists ආදී වශයෙන්. තමුන්නාන්සේලා ඒ ගැන දන්නවා. ඒ සියලු collegesවල එකතුවක් වන Intercollegiate Committee එක එකතු වෙලා ගන්නා තීන්දුව ජනාධිපතිතුමාට යවා තිබෙනවා. ඒකේ තිබෙන එක වැදගත් කරුණක් මා කියන්නම්. The letter of the SLMA states, I quote:

"…urgent action to introduce movement restrictions.

All hospitals that provide services for the care of COVID-19 patients have exceeded their full capacity and are left with no vacant beds available for any new COVID-19 patients."

එතුමන්ලා ඉල්ලනවා, හමු වෙන්න වෙලාවක්. ඒකට අවස්ථාවක් නැහැ. එතුමන්ලා කියන්නේත් වහාම ඉතාම දැඩි සංවරණ සීමා පැනවීම්වලට යන්න කියායි.

ගරු කථානායකතුමනි, මම මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා, පස්වැනි ස්වාධීන විශේෂඥයන්ගේ කණ්ඩායමේ -අපේ සහ WHO එකේ විශේෂඥයන්ගේ- රැස්වීමේදී ගත් තීන්දු කීපයක්. එහිදී විශේෂඥවරුන් 30 දෙනෙක් රැස් වෙනවා. අපේ 14 දෙනෙකු සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ 16 දෙනෙකු ඒකට ඇතුළත් වුණා. ඒ ගොල්ලන් ගත් තීන්දුවල වැදගත්ම කරුණු ටික පමණක් මම කියන්නම්. WHO Projection 1හි මෙසේ සඳහන්ව තිබෙනවා:

"1. At current levels of mobility restrictions, the number of cases would increase up to mid-September at 6,000 cases/ day ..."

Mid-September නොවෙයි, මේ වෙනකොටම 6,000 පන්නලා ඉවරයි. It further states, I quote:

"...deaths up to early October coming to a peak at around 220 deaths/day."

ඒ කියන්නේ, ඔක්තෝබර් වන විට තත්ත්වය.

"ICU admission will peak at around 275 by early October with cumulative deaths around 30,000 by Jan. 2022. But note that since we have not yet achieved the vaccine coverage assumed in the model, the projections are an under-estimate.

2. At increased levels of stringency (similar to May-June 2021) for 4 weeks, the country will have less numbers of cases of around 1,000 /day..."

මේ කියන්නේ මොකක්ද? දවසකට 6,000ක් පමණ වන ආසාදිතයන් සංඛ්‍යාව, lockdown එකක් කළොත් 1,000කට අඩු කර ගත හැකියි කියන එක.

Then, Projection 2 goes on to state, I quote:

"...deaths less than 25/ day ."

මේකෙන් කියන්නේ, දවසකට 225ක් වන මරණ සංඛ්‍යාව 25කට අඩු කර ගත හැකියි කියලා.

"...and ICU care to less than 25/ day (by October 2021) and avert 18,000 deaths..."

දැනට ICU bedsවලට යන 275ක සංඛ්‍යාව 25කට අඩු කර ගත හැකියි. ඒ අනුව 18,000ක් දෙනා අපට මරණයෙන් බේරා ගත හැකියි. මේකයි ඇත්ත තත්ත්වය.

Then, the WHO recommendations state, I quote:

"We need to ACT NOW.

Our urgent priority is to SAVE LIVES. Sri Lanka will avert about 18,000 deaths by Jan, 2022 if the level of stringency is immediately increased similar to May, 2021 for 4 weeks."

මෙහි තවත් කාරණයක් සඳහන්ව තිබෙනවා. Under more detailed recommendations, it states, I quote:

"Strictly enforce movement restrictions, including inter-district travel except for essential services."

අනෙක් කාරණය මේකයි. I quote:

"Accurate reporting of both cases and deaths to get a better picture of the ground situation."

ව්‍යාජ තොරතුරු සපයන්නේ නැතිව සත්‍ය තොරතුරු සැපයුවොත්, එමඟින් අපට නිවැරැදි තීන්දු ගන්න පුළුවන් බව කියා තිබෙනවා.

මේ විශේෂඥ කමිටුවේ සාමාජිකයෙකු වන මහාචාර්ය අර්ජුන ද සිල්වා මහත්මයා මෙසේ කියනවා. Reporting what Senior Professor Arjuna de Silva said during a TV programme, the Newswire website states, I quote:

"The Government must take necessary measures to curtail the movement of the public as the next two weeks are crucial for Sri Lanka with regard to the coronavirus pandemic,Academic and Physician, senior Professor Arjuna de Silva said. He further explained that if a lockdown cannot be imposed due to certain reasons then at least a lock-up should be implemented with managements of institutions being vested with powers to impose their own restrictions"

මේ සියලු දෙනාම කියන්නේ එක කථාවක්, ගරු කථානායකතුමනි. මොනවා වුණත්, අපේ විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ රාජ්‍ය ඇමතිතුමියට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමිය කියන දේවල් අහන්නේ නැති නිසාද කොහේද එතුමිය ජනතාවට මෙන්න මේ නිවේදනය නිකුත් කරනවා: "My opinion does not matter. Decision-makers will make decisions. But the country is at risk. Do not wait for the Government and the Ministry of Health. The value of your life is yours. Protect your family. So, don't wait

until a lockdown is imposed or someone makes rules. Learn to protect yourself." මේ ආණ්ඩුවත්, සෞඛ්‍ය අමාත්‍යාංශයත් මේවා කරන කල් බලාගෙන ඉන්න එපා, තමුන්නාන්සේලා හෝ කළ යුත්ත කරගන්න, තමන්ගේ ජීවිතයත්, තමන්ගේ පවුලේ අයගේ ජීවිතත් බේරා ගන්න කියලා එතුමිය කියනවා. සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් රාජ්‍ය අමාත්‍යාංශයක් භාර රාජ්‍ය ඇමතිතුමිය අද මොන තරම් අසරණ වෙලාද කියලා මේකෙන් තේරෙනවා. ඉතින් අපට හිතා ගන්න පුළුවන්, මේ ගන්නා තීන්දු අනුව ඉතිරි අය කොච්චර අසරණ වෙලා ද කියලා.

ආචාර්ය චන්දිම ජීවන්දර මහතා කියන්නේ මොකක්ද? දැන් දිනකට රෝගීන් 30,000ක් සමාජයෙන් බිහි වනවා කියා පරීක්ෂණවලින් අනාවරණය වන බවයි එතුමා කියන්නේ. වාර්තා වන සංඛ්‍යාවට වැඩියෙන් ආසාදිතයන් සංඛ්‍යාවක් සමාජයේ සිටිය හැකි බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් මහත්මයා කියනවා. සෞඛ්‍ය මාර්ගෝපදේශ ලිහිල් කළේ ඉහළ නියෝගයකින් බව කියන්නේ, මහජන සෞඛ්‍ය සේවා සම්බන්ධව කටයුතු කරන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමියයි. කොවිඩ් වයිරසයේ මාරාන්තික ඩෙල්ටා ප්‍රභේදය රටේ ප්‍රදේශ කිහිපයකින් වාර්තා වී තිබියදී සෞඛ්‍ය මාර්ගෝපදේශ ලිහිල් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ වුවමනාව මත සිදු වූවක් නොව, ඉහළින් ආ නියෝගයක් මත සිදු වූවක් බව නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (මහජන සෞඛ්‍ය සේවා) විශේෂඥ වෛද්‍ය සුසී පෙරේරා මහත්මිය සඳහන් කර තිබෙනවා. මෙන්න මේ විධියටයි අද සෞඛ්‍ය අමාත්‍යාංශය අසරණ වෙලා තිබෙන්නේ. මේක තමයි, සෞඛ්‍ය අංශයේ රාජ්‍ය ඇමතිතුමියගේ සහ සෞඛ්‍ය නිලධාරින්ගේ අසරණකම. මේ විධියේ තත්ත්වයක් තිබියදීත් රට lock down කරන්නේ නැහැ. එහෙත්, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය ඇමතිවරයා කියනවා, "නිල උපදෙස් ලැබුණොත් රට lock down කරන්න අපි සූදානම්" කියලා. රට lock down කිරීම සඳහා වෛද්‍යවරු නිර්දේශ ලබා දෙන්නේ නම්, එය සිදු කිරීමට රජය සූදානම් බව රාජ්‍ය අමාත්‍ය මහාචාර්ය චන්න ජයසුමන මහතා වැඩි දුරටත් පවසනවා. රජය විසින් සියලු තීන්දු තීරණ ගනු ලබන්නේ වෛද්‍ය විශේෂඥයන්ගේ උපදෙස් අනුව බවත්, ඒ අනුව කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රට lock down කිරීමට වෛද්‍යවරු මෙතෙක් නිර්දේශ කර නොමැති බවත් එම රාජ්‍ය අමාත්‍යවරයා සඳහන් කර තිබෙනවා. කවුද මේ "වෛද්‍යවරු" කියන්නේ? කොවිඩ් වසංගතය හමුවේ ස්වයං සංවරණ සීමා පනවා ගන්නා ලෙස එතුමා ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. "ඒ සීමා පැනවීම අපි කරන්නේ නැහැ. එය තම තමන් කර ගන්න" කියලා එතුමා කියනවා. මේක පුදුම සෞඛ්‍ය අමාත්‍යාංශයක්! එතුමා කියන වෛද්‍යවරු කවුද? "රට වහන්න" කියලා ලෝක සෞඛ්‍ය සංවිධානය ද ඇතුළුව විශේෂඥ වෛද්‍යවරු 30 දෙනෙක් කියනවා. ඊළඟට, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය ඇතුළු සියලුම Colleges කියනවා; සියලු විශේෂඥ වෛද්‍යවරුන් සාමාජිකත්වය දරන විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය - AMS එක - කියනවා. ඒ ඔක්කොම එහෙම කියද්දී එතුමා කියනවා, රට වහන්න කියලා වෛද්‍යවරු කියන්නේ නැති බව. "ලංකාවේ තත්ත්වය දරුණුයි, ඒක හංගන්න දෙයක් නැහැ" කියලා චන්න ජයසුමන රාජ්‍ය අමාත්‍යවරයාම කියනවා. ඒ කියන්නේ, තත්ත්වය දරුණුයි; හැබැයි, lock down කරන්නේ නැහැ කියන එකයි. Lock down කරන්නේ නැත්තේ එහෙම කරන්න කියා කවුරුවත් කියා නැති නිසා ලු. එතකොට "රට වහන්න" කියලා තිබෙන්නේ කවුද?

මේ තත්ත්වය යටතේ දැන් මිනිසුන්ට කරන්න සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? අද මිනිසුන් විසින්ම තමාගේ ආරක්ෂාව සලසාගන්නට සංවරණ සීමා පනවා ගන්න ක්‍රියා කරනවා. "නගර රැසක් හෙට සිට ස්වයංව ලොක් ඩවුන්" කියා වාර්තා වනවා. "හෙට රාත්‍රි 9.00 සිට -ඒ කියන්නේ, 16 වැනි දා රාත්‍රී 9.00 සිට- සතියක කාලයක් මරදගහමුල සියලු කඩ සාප්පු වසා දැමීමට මරදගහමුල ව්‍යාපාරික සංගමය තීරණය කර තිබේ" කියා වාර්තා වනවා. "වේයන්ගොඩ, දිවුලපිටිය ආදී ප්‍රදේශවල ව්‍යාපාරිකයන් සිය ව්‍යාපාරික ස්ථාන හෙට දිනයේ සිට වසා දැමීමට පියවර ගෙන ඇති බව පැවසේ." කියා වාර්තා වනවා. "අම්බලන්තොට නගරයේ සියලු කඩ සාප්පු වසා දැමීමට අම්බලන්තොට වෙළඳ සංගමය ඊයේ තීරණය කර තිබුණි" කියා වාර්තා වනවා. මෙහි "ඊයේ" කියන්නේ, 15 වැනි දා. "මාතලේ පලාපත්වල නගරයේ වෙළෙඳ සැල්වල සේවකයන් හැටහත්දෙනෙකුට වයිරසය ආසාදනය වී ඇති බව අනාවරණ වීමෙන් පසු එම නගරයේ වෙළෙඳ සැල් සතියක කාලයක් සඳහා වසා දැමීමට තීරණය කර තිබුණි" කියාත් වාර්තා වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මට තව විනාඩි දෙකක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

"දින 14ක් සඳහා සේරුනුවර නගරයේ වෙළෙඳ සැල් වසා දැමීමට එම වෙළෙඳ සංගමය පසුගිය දා පියවර ගත්තේය" කියා සහ "ඌව පරණගම, ලුණුවත්ත නගරයේ වෙළෙඳ සැල් ද ඉකුත් 13 වැනි දා සිට දින තුනක කාලයක් සඳහා වසා දැමීමට ලුණුවත්ත එක්සත් වෙළෙඳ සංගමය පියවර ගෙන තිබේ" කියලාත් වාර්තා වනවා.

බලන්න! අද රජයක් නැහැ. රජය ගත යුතු තීන්දු ගැනීමට ජනතාවටම සිදු වෙලා තිබෙනවා.

දැන් රට lock down කරන්නේ නැත්තේ මොකද ? ආර්ථිකය වැටෙනවා ලු. මා කියන්නම්, මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහත්මයා කියන කාරණය. ආර්ථිකය රැකගන්න ජීවිත බිලි දුන්නොත් වෙන දේ එතුමා කියා තිබෙනවා. ඌරෙකුට වෙළෙඳ පොළ තුළ මිලක් නියම කළ හැකි වුවත්, මිනිස් ජීවිතයකට වෙළෙඳ පොළ තුළ මිලක් නියම කළ නොහැකි නිසා ටික කාලයකට රට වසා නොදැමුවහොත්, ගොවීන්ගේ, වෛද්‍යවරුන්ගේ සිට විද්‍යාඥයින් දක්වා වටිනා ජීවිත රටට අහිමි වෙන බව එතුමා කියා තිබෙනවා. ආර්ථිකය පිළිබඳව දන්නා අය තමයි මෙසේ කියන්නේ. මේ සියලු මිනිසුන් මරා ආර්ථිකය බේරා ගෙන වැඩක් වෙයිද?

මට මතකයි, එදා අපේ ජනාධිපතිතුමා කිව්වා, "ඡන්දය දවසේ උදෙන්ම ඡන්ද පොළට ගිහින් ඔබේ යුතුකම ඉටු කරන්න. මගේ යුතුකම මම ඉටු කරන්නම්" කියලා. "මෙතෙක් තිබුණු ප්‍රශ්න යළිත් අහන්න නොතබන රටක් මම ගොඩනගනවා" කියලා තමයි එතුමා කිව්වේ. ඒ කියපු කාරණාවලට තමයි ලක්ෂ 69ක් ඡන්ද හම්බ වුණේ.

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලාගේ පැත්තේ හිටපු ඇමතිවරයකු වන, අපේ දිස්ත්‍රික්කයේ සිටින බොහොම වැදගත් දේශපාලනඥයෙකු වන මා මිත්‍ර නිර්මල කොතලාවල මහතා මුහුණු පොතේ මෙසේ සටහන් කර තිබුණා:

"අතීත කථාව:
'වැදුණු පසු රථය කඩ පළේ සිටි අයෙක් කීය කථාව මෙලෙස
ඕවා මහත්තයෝ, යකඩ. බේරුණු ජීවිතයි වැදගත්'

වර්තමාන කථාව:
'ජීවිතයට කොහේද අගයක්?
ආර්ථිකය තමයි වැදගත්
මරණය කියන්නේ තවත් එක ඉලක්කමක්' "

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

මේක තමයි අද සත්‍ය කථාව. අද මරණයට වඩා රූපියල්-ශත වැදගත් වුණු තත්ත්වයකට මේ සමාජය ඇදගෙන ගිහින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, විමුක්තිය වෙනුවෙන්, ජාත්‍යන්තරවාදය වෙනුවෙන් මිය ගිය ලෝකයේ සිටි විප්ලවවාදියෙකු වන චේ ගුවේරාගේ කියමනකින් මගේ කථාව අවසන් කරනවා. ඔහු කියා තිබෙනවා, "පෘථිවියේ ධනවත්ම මිනිසාගේ දේපොළවලට වඩා තනි මිනිසෙකුගේ ජීවිතය වටිනවා" කියා. එම නිසා අපි කියනවා, මේ ජීවිත බේරා ගැනීම වෙනුවෙන් දේශපාලන භේදයකින් තොරව තමුන්නාන්සේලා සියලු දෙනා බලපෑම් කරලා යම් කිසි තීරණයකට එන්න කියලා. එහිදී අපිට දේශපාලන වාසි වැඩක් නැහැ. මිනිසුන්ගේ ජීවිත බේරා ගැනීමේ සම්පූර්ණ වාසිය අවසානයේදී ලැබෙන්නේ තමුන්නාන්සේලාටයි. මම මීට මාස දෙකකට කලින් කිව්වා, අගෝස්තු, සැප්තැම්බර් කියන්නේ මේ රට විසාලා මහනුවරක් වන කාලයක්; දවසකට 200 දෙනෙකුට වඩා මිය යනවා කියලා. එම නිසා ඒ සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ග ගන්න කිව්වා. නමුත්, එවැනි ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. එම නිසා, අද ලෝකයේ තිබෙන සියලු දත්ත, සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය කර බලලා මේ මිනිස් ජීවිත බේරාගන්න කියලා අපි කියනවා. එය තමුන්නාන්සේලාට දේශපාලන වශයෙනුත් වාසි සහගත වෙයි.

ස්තුතියි.

[පූ.භා. 11.25]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon.Maithreepala Sirisena)

ගරු කථානායකතුමනි, අපි වාගේම මුළු ලෝකයම මුහුණ දී තිබෙන කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් අපි කාටත් අද යම් අවබෝධයක් තිබෙනවා. මේ රටේ වෛද්‍යවරයාගේ සිට පාසල් දරුවා දක්වා -මේ පිළිබඳව තිබෙන අවබෝධයේ යම් යම් වෙනස්කම් සහිතව- මුළු මහත් සමාජයම අද මේ ගැන පූර්ණ අවබෝධයකින් සිටිනවා කියා මම විශ්වාස කරනවා. මෙවැනි අවස්ථාවක අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා විශේෂයෙන්ම කොරෝනා වසංගත තත්ත්වය හමුවේ අධිකරණ කටයුතු සම්බන්ධයෙන් තිබෙන ඇතැම් ගැටලු නිරාකරණය කරගෙන, එම වසංගත තත්ත්වය හමුවේ අධිකරණ ක්ෂේත්‍රයේ කටයුතු සාර්ථකව කරගෙන යාමට අවශ්‍ය අවකාශය සලසා ගැනීම සඳහායි අද දිනයේ ඒ සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. කාලානුරූපීව ගත් විට මෙය ඉතාම වැදගත් පනත් කෙටුම්පතක්.

ලෝකයේ මුළු මහත් මානව සමාජය ආරම්භයේ සිටම මෙවැනි තත්ත්වයන්ට මුහුණ දුන්නේ කොහොමද කියලා අපි දන්නවා. එක් එක් යුග ගතහොත්, එය ගල් යුගය වෙන්න පුළුවන්, වනචාරී යුගය වෙන්න පුළුවන්, අද දක්වා ගත් විට ඉහළම තාක්ෂණික යුගය වෙන්න පුළුවන්. පාලකයින්, ජනතාව, සමාජය බලාපොරොත්තු නොවූ ආකාරයේ ප්‍රශ්නවලට ලෝකයේ සෑම රටකටම, සෑම සමාජයකටම මුහුණ දෙන්න සිද්ධ වෙනවා. බලාපොරොත්තු නොවුණු එම ප්‍රශ්න අතරේ බොහෝ වෙලාවට ස්වාභාවිකව ඇති වන ගැටලු, ව්‍යසන ප්‍රමුඛත්වය ගන්නවා. අපි දන්නවා, ගංවතුර, සුළි සුළං, නාය යාම්, සුනාමි වැනි ව්‍යසන බොහෝ වෙලාවට රටක පවතින තත්ත්වයන් වෙනස් කරන බව.

විශේෂයෙන්ම හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයකු විධියට මම කියන්න ඕනෑ, අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉතිහාසය ගත් විට අපේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට තිබෙන දීර්ඝ කාලීන අත්දැකීම් අනුව අපේ සෞඛ්‍ය සේවයේ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන පිරිස වසංගත රෝග සම්බන්ධයෙන් ඉතාම හොඳ අත්දැකීම් තිබෙන පිරිසක් බව. 1930 ගණන්වල සිට, 1940 ගණන්වල සිට ප්‍රධාන වශයෙන්ම වසංගත රෝගවලට මුහුණ දීමේ දී අපේ සෞඛ්‍ය සේවයේ වෛද්‍යවරයාගේ සිට එහි සේවය කරන කම්කරුවා දක්වා, ඒ වාගේම අද තත්ත්වය ගත්තොත්, අද තිබෙන තත්ත්වයට මුහුණ දෙන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු සියලු අංශවල අය මේ සම්බන්ධයෙන් පුළුල් අවබෝධයකින් සිටිනවා. අපි දන්නවා, අද වන විට ලෝකයේ සමස්ත කොවිඩ් ආසාදිතයන් සංඛ්‍යාව මිලියන 280කට ආසන්න වෙලා තිබෙන බව. ඒ වාගේම ලෝකයේ කොවිඩ් මරණ සංඛ්‍යාව ලක්ෂ 44 ඉක්මවා තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වන තොරතුරු සහ දත්ත මත ලෝකයේ රටවල් 222ක් කොවිඩ් - 19 වසංගත තත්ත්වයට මුහුණ දී තිබෙනවා. ඒ වාගේම අපි කවුරුත් දන්නා පරිදි ආර්ථිකයෙන්, තාක්ෂණයෙන් ලෝකයේ මහා බලවතා වූ, සියලු අංශවලින් ප්‍රබලයා වූ ඇමෙරිකා එක්සත් ජනපදයේ අද විශාල වශයෙන් කොවිඩ් මරණ සිද්ධ වෙනවා. ඒවා පාලනය කර ගැනීමේ අපහසුතාවකට ඔවුන් මුහුණ දී තිබෙන බව අපි දන්නවා.

රුසියාව, චීනය, ඇමෙරිකාව, එංගලන්තය යන රටවල් ලෝක මහා බලවතුන්. ඒවා සියලු අංශවලින් ශක්තිමත්, සියලු ක්ෂේත්‍රවලින් ශක්තිමත්, සෞඛ්‍ය විද්‍යාව පිළිබඳව ඉහළම සම්පත් සහ දැනුම තිබෙන රටවල්. නමුත් මේ ප්‍රශ්න නිරාකරණය කර ගැනීමේ දී ඔවුන්ටත්, මුළුමහත් මානව සමාජයටත් බරපතළ අභියෝග තත්ත්වයක් ඇති වී තිබෙන බව අප කවුරුත් පිළිගත යුතුයි. කොවිඩ් - 19 වසංගතය පැතිරී තිබෙන රටවල් 222න් රටවල් 157ක් යම් යහපත් පාලන තත්ත්වයක් ඇති කරගෙන තිබෙනවා. අද වන විට ලෝක ජනගහනයට සාපේක්ෂව මරණ අනුපාතය 1.5ක් පමණ වන බව අපි දන්නවා. නමුත් අපේ ජාතික දර්ශක අනුව, අපේ රට තුළ එම තත්ත්වය ඉක්මවා ගිහින් තිබෙන එක ගැන අපි කනගාටු විය යුතුයි. සාමාන්‍යයෙන් පැයකට පස් දෙනෙක්, හය දෙනෙක් මිය යන තත්ත්වයක් අපේ රට තුළ දැන් ඇති වෙලා තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය මෙම වසංගතයට විසඳුම් වශයෙන් පැහැදිලිව සඳහන් කළා, මූලික වශයෙන්ම එන්නත්කරණය සහ සංචරණ සීමා යෙදීමේ වැදගත්කම ගැන. අපේ රටේ ජනගහනයෙන් ලක්ෂ 45කට ආසන්න පිරිසක් අද වන විට වැක්සින් දෙකම ලබාගෙන තිබෙනවා. අපි කොරෝනා වසංගත තත්ත්වය වැඩියෙන්ම වාර්තා වන රටවල් අතර එන්නත්කරණය අරගෙන බලමු. ඊයේ දිනය වන විට ඇමෙරිකාවේ එන්නත්කරණය සියයට 55යි; ඉන්දියාවේ සියයට 30යි; බ්‍රසීලයේ සියයට 55යි.

මූලික වශයෙන්ම ගෙවුණු සතියේදී ගෝලීය තත්ත්වය සැලකිල්ලට ගත් විටත්, ලංකාවේ කොවිඩ් ආසාදිතයන්ගේ සහ මරණවල වර්ධනය සැලකිල්ලට ගත් විටත් දෛනිකව වාර්තා වන කොවිඩ් ආසාදිතයන් සහ එම මරණ අනුපාතය ඉහළ යෑම සම්බන්ධයෙන් අපි කවුරුත් ඉතා වගකීමෙන් කටයුතු කළ යුතු වෙනවා. ඉන්දියාව සහ ඇමෙරිකාව වැනි බලවත් රටවල එවැනි තත්ත්වයක් තිබුණත් අපේ රටේ මේ තිබෙන තත්ත්වය තවදුරටත් ඉහළ යෑම පාලනය කර ගැනීම සඳහා අප සෑම කෙනෙකුගේම සහයෝගයෙන් යුතු සුහදශීලී වැඩ පිළිවෙළක අවශ්‍යතාව මා දකිනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය අපේ රටට ඉතා හිතවත් සංවිධානයක්. එම නිසා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගය මීට වඩා අපේ රටට ලබාගත හැකියි කියා මා විශ්වාස කරනවා. මා සෞඛ්‍ය ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේත්, ජනාධිපතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේත් ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ තිබූ සුහදතාවෙහි සහ මිත්‍රශීලීභාවයෙහි පසුබිම අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මීට වඩා බොහෝ උදවු ලබා ගන්න අපට පුළුවන් කියා මා විශ්වාස කරනවා.

කොවිඩ් ප්‍රශ්නයේදී අද ලෝකයේ සෑම බලවතෙකුම සෙලවී තිබෙනවා. එම තත්ත්වය කොතෙක්ද කිව්වොත්, චීනයේ තිබෙන විශාලතම වරාය පවා අද වසා දමා තිබෙනවා. එය ජාත්‍යන්තර වෙළෙඳාමට බලපෑ තිබෙනවා. අනෙකුත් රටවල තිබෙන ප්‍රශ්නය වාගේම අපිත් කල්පනා කරන්න ඕනෑ, සීමිත සම්පත් ප්‍රමාණයකින් අසීමිත සේවාවක් සැපයීමේදී එය කළමනාකරණය කර ගන්නේ කොහොමද කියලා. සීමිත සම්පත් ප්‍රමාණයකින් අසීමිත වැඩ කොටසක් කරන්නේ කොහොමද කියන කාරණය කළමනාකරණ විද්‍යාවේදී උගන්වන දෙයක්. එය, අධ්‍යාපනයට ඇතුළත් දෙයක්. අපි සාමාන්‍ය විධියට කථා කරන, හැම දාම කථා කරන ඇඳන්වල හිඟය, දැඩි සත්කාර ඒකකවල - ICUවල- ප්‍රශ්නය, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන සම්පත් හිඟය වැනි තත්ත්වයන් අපේ රට විතරක් මුහුණ දෙන ප්‍රශ්න නොවෙයි.

අපි කවුරුත් දන්නවා, මේ තත්ත්වය තුළ ලෝකයේ බොහෝ රටවල් සම්පත් හිඟයකට මුහුණ දී තිබෙන බව. ඒකට හේතුව මෙයයි, ගරු කථානායකතුමනි. ලෝකයේ කිසිම රටක් මෙවැනි වසංගත තත්ත්වයක් හෝ මේ විධියේ ව්‍යාප්තියක් බලාපොරොත්තු වුණේ නැහැ. විශේෂයෙන් පසුගිය දශක කිහිපය තුළ සාම්ප්‍රදායිකව ලැබූ අත්දැකීම් තුළ තමයි ලෝකයේ සියලු රටවල් තමන්ගේ රටවල ඒ සියලු අංශවලට අවශ්‍ය සම්පත් සොයාගෙන තිබෙන්නේ. අපේ රට ගත් විට, මේ කොවිඩ් ප්‍රශ්නය නිසා අපේ ජාතික ආදායම පහළ වැටීම, නිෂ්පාදන ක්‍රියාවලිය දුර්වල වීම, අපනයන ආදායම් පහළ වැටීම, කෘෂි කර්මාන්තයේ සහ අධ්‍යාපනයේ ඇති වී තිබෙන ප්‍රශ්න යනාදී වශයෙන් ගැටලු රැසකට අපි මුහුණ දී සිටිනවා. මෙවැනි අවස්ථාවක මේ තත්ත්වයෙන් ගොඩ එන්නේ කොහොමද කියා අපි කල්පනා කරන්න ඕනෑ. මෙහිදී අපගේ අධිෂ්ඨානය සහ කැපවීම වැදගත් වෙනවා.

විශේෂයෙන්ම විදේශ රැකියාවලට යාමට සිටින අපේ ශ්‍රමිකයන්ට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් එන්නතක් ලබා දීමේ අවශ්‍යතාව මතුව තිබෙනවා. එම නිසා දැනට විදේශ රැකියාවලට යාමට බලාපොරොත්තුවෙන් සිටින සහ එසේ යාමට තෝරාගෙන සිටින අයට ෆයිසර් එන්නත වාගේ ජාත්‍යන්තරව පිළිගන්නා එන්නතක් ලබා දිය යුතුයි. ඒ නිසා විදේශ රැකියා සඳහා යාමට බලාපොරොත්තුවෙන් අපගේ රටේ සිටින, ඒ පිළිගත් එන්නත නොලැබුණු පිරිසට -මූලික වශයෙන්ම ඒ අයගේ මුදල් අපේ විදේශ වත්කම්වලට, අපේ ආදායමට බලපාන නිසා- ඒ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය දී ජාත්‍යන්තරව පිළිගන්නා ෆයිසර් වැනි එන්නතක් ලබා දීම ඉතාම අවශ්‍යයි කියා මා විශ්වාස කරනවා. වැරදි සොයනවාට වඩා, මෙවැනි වෙලාවක අප මූලික වශයෙන්ම කළ යුත්තේ තිබෙන ප්‍රශ්නය විසඳා ගැනීමයි. ජනතා ශුභ සිද්ධිය වෙනුවෙන් අප සෑම කෙනෙකුගේම කැපවීමයි අවශ්‍ය වන්නේ.

කොවිඩ් -19 වසංගත තත්ත්වයට ගොදුරු වී අපේ රටත් අවුරුදු එකහමාරක පමණ කාලයක් තිස්සේ පීඩා විඳිනවා. ලෝකයේ අනෙක් රටවල තත්ත්වයත් ඒ වාගෙයි. දැනට තිබෙන තත්ත්වය පිළිබඳව ප්‍රධාන වශයෙන්ම අප රටේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුරෝකථන වාගේම විදේශීය විශේෂඥයන්ගේ පුරෝකථන යනාදිය සැලකිල්ලට ගත් විට මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා මූලික ලෙසම ඒ අදහස් සැලකිල්ලට ගැනීම ඉතාම අවශ්‍ය බවයි මා විශ්වාස කරන්නේ. මූලික වශයෙන්ම අද වන විට කොවිඩ් වසංගතය උත්සන්න වීම තුළ එක පැත්තකින් රෝහල්වල එම රෝගීන් ප්‍රතිකාර ගන්නවා; තවත් පැත්තකින් නිරෝධායන මධ්‍යස්ථාන තිබෙනවා; රෝහල්වල තදබදය නිසා මෙම රෝගීන්ට නිවාසවල සිට ප්‍රතිකාර කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් වෙලා තිබෙනවා. නමුත්, නිවෙස්වල සිට ප්‍රතිකාර ලබා ගැනීමේදී ඇති වී තිබෙන ප්‍රශ්නවලට විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමු වීම අවශ්‍යයි. මොකද, නිවෙස්වල තිබෙන තත්ත්වයන් තුළ ඔවුන්ට ලැබෙන වෛද්‍ය පහසුකම්වල අඩුපාඩුකම් සකස් කර ගැනීම ඉතාම අවශ්‍යයි කියා මා විශ්වාස කරනවා. මූලික වශයෙන්ම මේ කරුණුවලදී රජයත්, විපක්ෂයත් ඒකාබද්ධ වී එක් වැඩ පිළිවෙළකට යා යුතුයි කියා මා විශ්වාස කරනවා. අපි මේ ප්‍රශ්නයේදී මූලික වශයෙන්ම සැම දෙනාටම සවන් දීම, ඒ වාගේම සුබනම්‍ය වීම, නම්‍යශීලී වීම අවශ්‍යයි. මිනිසුන්ට ඔවුන්ගේ ජීවිත පිළිබඳව ඇති වී තිබෙන භය නැති කරන්නේ කොහොමද කියා අප මෙහිදී කල්පනා කරන්නට ඕනෑ. එසේ ඔවුන්ගේ භය නැති කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කරන්නේ කොහොමද? මේ කටයුතුවලදී වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ අපි අගය කරන්නට ඕනෑ.

මෙහිදී මූලික වශයෙන්ම කළ යුත්තේ ජනතාවගේ මානසික තත්ත්වය සකස් කිරීමයි. එය රජයක් විධියට අපේ වගකීමක් වෙනවා. මොකද, ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කළ යුතුයි. හැම පුද්ගලයෙකුටම ඕනෑම ප්‍රශ්නයක් උසුලා ගන්න පුළුවන්කම ලැබෙනවා, ඔවුන්ට ජීවත් වීමට හේතුවක් පෙන්නුවාම. මනෝ විද්‍යාත්මකව අපි ඒ පැත්ත දෙස බැලිය යුතුයි. ධෛර්යයෙන් පිරිහී ගිහිල්ලා, අපේක්ෂා භංගත්වයට පැමිණෙන මිනිසුන්ගේ ශරීරයේ ප්‍රතිශක්තිය අඩු වනවාය කියා මනෝ විද්‍යාත්මක මතයක් තිබෙනවා. ඒ නිසා මේ කරුණුවලදී මූලික ලෙසම ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගය ලබා ගැනීමත් අවශ්‍ය වනවා.

ගරු කථානායකතුමනි, මම නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කොවිඩ් රෝගීන් සිටින මධ්‍යස්ථාන අටක් පමණ තිබෙනවා. එම මධ්‍යස්ථාන අටේ සියයට 90ක්ම ඉන්නේ ලංකාවේ වෙනත් ප්‍රදේශවල රෝගීන්. එන්නත් ලබාදීමේදී පොළොන්නරුව, මොනරාගල වැනි ප්‍රදේශවල අඩුපාඩුකම් සිදුවෙලා තිබෙනවා. මේ කරුණු සැලකිල්ලට ගැනීම ඉතා අවශ්‍යයි. අපි මූලික අදහස් තුළ සිටිමින් කටයුතු කළ යුතු වනවා. සෞඛ්‍ය බලධාරින්, මාධ්‍යය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, රාජ්‍ය නිලධාරින්, දේශපාලන අංශ -මේ සෑම කෙනෙකුම වාගේ- ආගමික නායකයන්ගේ මැදිහත් වීම යටතේ රටේ ජනතාවට අද මානසික වශයෙන් ශක්තියක්, ධෛර්යයක් ලබා දීම අවශ්‍ය වනවා. ජනතාව තුළ අනාගත බලාපොරොත්තු ඇති කිරීම සඳහා කටයුතු කිරීම අත්‍යවශ්‍යයි. එමෙන්ම ඔවුන්ගේ මානසික තත්ත්වය සකස් කිරීමත් ඉතා වැදගත් වනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ අදහසක් ඉදිරිපත් කරනවා. මේ පවතින තත්ත්වය තුළ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විශේෂයෙන්ම පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන්ගේ සාකච්ඡාවක් කැඳවීම වැදගත් කියා මම හිතනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇතුළු මේ සම්බන්ධයෙන් කටයුතු කරන සියලු අංශවල සෑම කෙනෙකුටම මේ සියලු කටයුතු කිරීමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි කියා මම පතනවා. ඒ අයට මම ආශීර්වාද කරනවා. අපි සෑම කෙනෙකුම දේශපාලන පක්ෂ භේද සහ අනිකුත් මතවාද අමතක කර එක පිරිසක් ලෙස මේ ජාතික ව්‍යසනයට මුහුණ දිය යුතුයි. මේ ජාතික ව්‍යසනයට විසඳුම් ලබාගෙන, මේ වසංගතය පරාජය කරලා, අපි යහපත් රටක් විධියට ඉදිරියට යන්න කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

[පූ.භා. 11.43]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ජාතික ව්‍යසනයක්, ජාතික ඛේදවාචකයක් පවතිද්දී අද අපි පාර්ලිමේන්තු විවාදය පවත්වාගෙන යනවා. Hon. Speaker, right at this very juncture, we are experiencing a national catastrophe and a national tragedy. මේ අමාරු වෙලාවේ, මෙම ජාතික ව්‍යසනයෙන් රට ගලවා ගන්නා ආකාරය පිළිබඳව අද නොයෙක් අදහස්, යෝජනා ඉදිරිපත් වෙනවා. ගරු කථානායකතුමනි, මාර්ටින් ලූතර් කිං මැතිතුමාගේ ප්‍රකාශයක් සඳහන් කරමින් මගේ කථාව ආරම්භ කරන්න කැමැතියි. "සැලකිල්ලට ගත යුතු වන කරුණු පිළිබඳ නිහඬ වන දිනය අපගේ ජීවිතවල අවසානය ආරම්භ වන දිනයයි" - "Our lives begin to end the day we become silent about things that matter" - කියා මාර්ටින් ලූතර් කිං මැතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා.

කොවිඩ් වසංගතය නිසා අද අපේ රටේ ආසාදිතයන් වැඩිවෙලා, මරණ සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. ලෝක දත්ත සමඟ සංසන්දනය කරනකොට අපේ රටේ සංඛ්‍යා ලේඛන ඉතා නරක තත්ත්වයකයි තිබෙන්නේ. අපේ රටේ රෝහල්වල තදබදය වැඩිවෙලා, පහසුකම් අඩුවෙලා තිබෙනවා. රට මුහුණ දෙන මේ අභියෝගය තුළ, මහා ඛේදවාචකය තුළ, අපි පක්ෂ, විපක්ෂ, ජාති, ආගම්, කුලමල, පන්ති භේදයෙන් තොරව එකට එකතු වෙලා මේ සියලු ප්‍රශ්නවලට විසඳුම් සෙවීම අවශ්‍යයි කියා මම විශ්වාස කරනවා. ඒ විසඳුම් නිර්මාණය කිරීමේදී අපට වැරදුණු තැන් මොනවාද කියා අවබෝධ කර ගන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, වර්තමාන දේශපාලන සංස්කෘතිය තුළ, "අපට වැරදුණා; අපට බැරි වුණා" කියන වචන කවුරුවත් පිළිගන්න ලෑහැස්ති නැහැ. ඒක වැරැදියි. ඒක මදිපුංචිකමක් හැටියට හිතන්නට හොඳ නැහැ. "ඔව්, අපට අඩුපාඩුවක් සිද්ධ වුණා; අපට බැරි වුණා; අපට ගැටලු ආවා" කියා පිළිගෙන ඒවායින් පාඩම් ඉගෙන ගෙන රට මුහුණ දෙන මේ බරපතළ ප්‍රශ්නවලට විසඳුම් ලබාදිය යුතුමයි.

ගරු කථානායකතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය කියන ආකාරයට, ඉදිරියේදී බොහොම බරපතළ තත්ත්වයක් නිර්මාණය වෙනවා. ඉදිරියේදී අපේ රටෙන් දිනකට කොවිඩ් ආසාදිතයන් 6,000ක් බිහි වෙන්න පුළුවන්, දිනක මරණ සංඛ්‍යාව 220ක් වෙන්න පුළුවන්. හැබැයි, යම්කිසි කාල පරිච්ඡේදයකට, තාවකාලිකව දැඩි සීමාවලට ලක් වුණොත්; ආරම්භයක් හැටියට තාවකාලිකව සති දෙකකට shutdown එකකට, lockdown එකකට ගියොත් අපට පුළුවන්කම ලැබෙනවා, ඒ සංඛ්‍යාව 6,000 සිට 1,000 දක්වා අඩු කරන්න. ඒ වාගේම, WHO එක කියන ආකාරයට මරණ සංඛ්‍යාවත් 25 දක්වා අඩු කරන්න. 2022 වෙනකොට සමස්ත කොවිඩ් මරණ සංඛ්‍යාව 30,000ක් වෙනවා කියා WHO එක කියන තත්ත්වය තුළ අපට අවස්ථාව තිබෙනවා, අඩුම ගණනේ එයින් මරණ 18,000ක් වළක්වා ගන්න. ජීවිත බේරා ගන්නා වූ ක්‍රියාදාමයට අපි රටක් හැටියට සූදානම් ද? විපක්ෂයේ අපි සූදානම්. ආණ්ඩුවත් එයට සූදානම් ද? අපි විශ්වාස කරනවා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ පක්ෂ භේදයක් තිබුණත්, හැමෝටම හිතක් පපුවක් -හදවතක්- තිබෙනවා කියලා; ඒ හදවත උණු වෙනවා කියලා. මේ හැමෝම බොහොම සංවේදී පුද්ගලයන් හැටියට අපි දකිනවා. එතකොට ජීවිත 18,000ක් බේරා ගන්නවා කියන කාරණාව පිළිබඳව සංවේදී වෙන්න අපට බැරි ද? මානුෂීය වෙන්න අපට බැරි ද? බොහොම තද හිතකින්, සෙලවෙන්නේ නැතුව, බොහොම inflexible විධියට, නම්‍යශීලී නොවන ආකාරයට මේ ප්‍රශ්නය ගැන හිතන එක මානුෂීය ගතියක් ද? ගරු කථානායකතුමනි, WHO එක පමණක් නොවෙයි, මේ රටේ විවිධ විශේෂඥ සංවිධාන කියන්නේ මොකක්ද? විශේෂඥ වෛද්‍ය සංගමය, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය, රජයේ හෙද නිලධාරින්ගේ සංගමය, ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය කියන හැමෝම සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඉමහත් දායකත්වයක් ලබා දෙමින් ජීවිත බේරා ගන්නා වූ සාමාජිකයන්ගෙන් සමන්විත වූ සංගම්. මොනවාද ඒ අය කියන්නේ? ඒ අය කියනවා, තාවකාලිකව සති දෙකකට රට වහන්න කියලා. ගරු කථානායකතුමනි, ඇයි, එහෙම කියන්නේ? අද කවුරු මොන දේ කිව්වත්, රෝහල් පද්ධතිය දැඩි පීඩනයකට ලක් වෙලා තිබෙන්නේ. රෝහල් පද්ධතිය තුළ ප්‍රතිකාර අංශය, ඉන් පිටත නිවාරණ අංශය ක්‍රියාත්මක කරන සෞඛ්‍ය නිලධාරින් ඉතාම අමාරු තත්ත්වයක් තුළයි කටයුතු කරගෙන යන්නේ. There might be a system breakdown. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කඩා වැටීමක් සිද්ධ වුණොත් මුළු රටේම දැවැන්ත විනාශයක් සිදු වෙනවා. ජීවිත බේරාගන්න තමයි මෙහෙම shut down, lock down කරන්න කියන්නේ. සෞඛ්‍ය පද්ධතිය ආරක්ෂා කරගන්නයි එහෙම කියන්නේ.

මමත් කොවිඩ් ආසාදනය වූ පුද්ගලයෙක්. මම ලෙඩ වූ වෙලාවේ මගේ ජීවිතය පිළිබඳව ලොකු අවදානමක් තිබුණා. මම ඒ ගැන කියන්න බය නැහැ. එහෙම කියන එක ලජ්ජාවක් කියා මම හිතන්නේත් නැහැ. මම ජීවත් වෙයිද, නැද්ද කියලා මට ලොකු බයක් තිබුණා. ඒ මරණ බිය මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට තිබෙන මොහොතක, අපේ යුතුකම හා වගකීම වන්නේ මානුෂීය හැඟීම් තුළින් මේ ජීවිතවලට වටිනාකමක් ලබා දීලා මේ ජීවිත පිළිබඳව සංවේදීත්වයක් ඇති කර ගෙන තීන්දු, තීරණ ගැනීමයි.

අද කන්ටේනර්වල දමා ආදාහනාගාරවලට මළ මිනී ගෙන යාම කාටවත් උහුලා ගෙන ඉන්න පුළුවන්ද? මෙය කෙතරම් දුකට පත්වන කාරණාවක්ද? අද දරුවන්, ගැබිනි මව්වරු, ළදරුවන්, වැඩිහිටියන් ඇතුළු පොදු ජනතාව කොවිඩ් ආසාදිතයන් බවට වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේක උහුලන්න බැරි සිද්ධියක්, දැඩි සංවේගජනක කාරණාවක්. මේක ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් වාගේම ජනතා ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයේදී මම බොහොම අවංකව හා පිරිසිදුව යෝජනාවක් කරනවා, මේ ජීවිත බේරා ගැනීම වෙනුවෙන් අපි හැමෝම එකතුවෙලා ගරු ජනාධිපතිතුමාට පණිවුඩයක් ලබා දෙමු, සති දෙකක කාලයකට lockdown එකක්, එහෙම නැත්නම් shutdown එකක් කරන්න කියලා. මොනයම් හෝ හේතුවකට ඒ ක්‍රියාදාමය අසාර්ථක වුණොත්, අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමයේ යෝජනාව පරිදි, ස්වයං ලෙස ජීවිත ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේදයකට අවතීර්ණ වෙන්න කියලා. රජය -ආණ්ඩුව- ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්නේ නැත්නම් තමන්ටම සිද්ධ වනවා, තමන්ගේ ජීවිතය ආරක්ෂා කර ගැනීමට. ස්වයං ලෙස ජීවිත ආරක්ෂා කරගැනීමේ එවන් ක්‍රමවේදයකට අවතීර්ණ වන්න කියලා රටේ ජනතාවගෙන් මම ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමනි, ඒ අපේ පළමුවැනි යෝජනාවයි.

ගරු කථානායකතුමනි, අද කවුරු මොන දේ කිව්වත්, මේ දත්තවල සත්‍යතාව පිළිබඳව ගැටලුවක් තිබෙන බව මම කියන්න කැමැතියි. දත්තවල සත්‍යතාව පිළිබඳ ගැටලුවක් තිබෙනකොට මොකක්ද වෙන්නේ? ජනතා විශ්වාසය කඩා වැටෙනවා. එහෙම නැත්නම් ජනතාව තුළ රජය කෙරෙහි තිබෙන credibility එක කඩාගෙන වැටෙනවා. මේ සංඛ්‍යා ලේඛන වෙනස් කරන්න යනකොට - when you go to doctor figures - මොකක්ද

වෙන්නේ? People lose faith in the Government. ආණ්ඩුව සහ පාලකයන් කෙරෙහි තිබෙන ජනතා විශ්වාසය නැතිවනවා. එම නිසා අපි ඉල්ලීමක් කරනවා, මේ දත්ත වෙනස් කරලා යම් කිසි පෞද්ගලික සැනසීමක් - a feel-good factor එකක් - ඇති කර ගන්න හදනවා නම්, කරුණාකර ඒකෙන් ඉවත්වන්න කියලා. අපි රටේ ජනතාවට ඇත්ත කියමු; නිවැරැදි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමු; සත්‍යය අවබෝධ කරගනිමු; සත්‍ය දත්ත මත පදනම් වෙලා අපි භේදයකින් තොරව එකට එකතු වෙලා මේ ප්‍රශ්නයට විසඳුම් සොයමු.

ගරු කථානායකතුමනි, අපේ තවත් යෝජනාවක් තමයි, දැනුම තිබෙන විශේෂඥවරුන්ට, මේ ක්ෂේත්‍රය පිළිබඳව හැකියාවක් තිබෙන අයට - expertsලාට - ප්‍රතිපත්ති සම්පාදනය කරන්න අවස්ථාව ලබා දෙන්න කියන එක. ජර්මනියේ මර්කල් කියන චාන්සලර්තුමිය කිව්වා, "මට නම් කොවිඩ් ගැන මොනවත් තේරෙන්නේ නැහැ, මම සෞඛ්‍ය පිළිබඳ විශේෂඥයකු නොවෙයි. හැබැයි, ගතයුතු සෞඛ්‍යමය තීන්දු, තීරණ ගැනීම මම සෞඛ්‍ය ක්ෂේත්‍රයට භාර දීලා, නායිකාව හැටියට දෙන්න පුළුවන් උපරිම ප්‍රතිපාදන, සහයෝගය, පහසුකම් ලබා දෙනවා" කියලා. ගරු කථානායකතුමනි, අපේ රටත් එතැනට එන්න ඕනෑ. අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුදෙනාටත්, ඒ වාගේම ආරක්ෂක ක්ෂේත්‍රයේ සියලු දෙනාටත් අපි ස්තුතිවන්ත වනවා. අවශ්‍ය උපදෙස් දුන්නාම ඒ අය ඒ වැඩ ටික කරගෙන යනවා.

අපේ රටේ එන්නත්කරණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී සෞඛ්‍ය අංශත්, ඒ වාගේම ආරක්ෂක අංශයත් ලොකු වැඩ කොටසක් කරන බව අපි දන්නවා. ඒ ගැන අපි ඔවුන්ට ස්තුතිවන්ත වනවා. හැබැයි, මහ ජනතාවට එන්නත් ටික ලබා දෙන්න නම්, ආණ්ඩුව විසින් ආරක්ෂක අංශයට, සෞඛ්‍ය අංශයට එන්නත් ටික ගෙනැවිත් දෙන්න ඕනෑ. ඒකයි ආණ්ඩුවේ වගකීම. අපි එතැනට එන්න ඕනෑ. මේ මරණ සිදුවන වේගය බලලා, ඒ මළ කඳන් දැක දැක, ඒ මිනී පෙට්ටි දැක දැක හිතක්, පපුවක් තිබෙන කිසිම කෙනෙකුට අහක බලාගෙන නම් ඉන්න බැහැ. මේ මිනිස් ජීවිත ආරක්ෂා කර ගන්නට අපි පියවර ගන්නට ඕනෑ. ඒ වාගේම එන්නත්කරණ ක්‍රියාවලිය වේගවත් කරන්න ඕනෑ කියාත් අපි යෝජනා කරනවා. මේ යන වේගය ප්‍රමාණවත් මදි. එන්නත්කරණ වැඩසටහන පටන් ගත්තේ පහුවෙලා බව අපි හැමෝම දන්නවා. මම මේ වෙලාවේ ඒ විවේචනවලට යන්න ලැහැස්ති නැහැ. මොකද, අපි යෝජනා කරන්නේ මේ ඇති වී තිබෙන තත්ත්වයට විසඳුම්.

දැන් එන්නත්කරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට තිබෙන ලොකුම ගැටලුව එන්නත් හිඟය නම්, ඒකට මුදල් ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සඳහා බොහොම ලෙහෙසි විසඳුමක් තිබෙනවා. මේ රජය බලයට ආපු අවස්ථාවේ කෝටි-ප්‍රකෝටි ගණන් බදු සහන ලබා දුන්නා. රාජ්‍ය ආදායම රුපියල් බිලියන 600කට වැඩි ප්‍රමාණයකින් නැති කරගත්තා. ආණ්ඩුවට මුදල් ප්‍රශ්නයක් තිබෙනවා නම් මේ එන්නත් ටික ගෙන්වා ගැනීමට තමන්ගේ සමාජ සත්කාරක වැඩසටහන් හරහා උදව් කරන්න කියලා ඒ දානපතියන්ට කියන්න ඕනෑ. අපි එතැනට යන්නට ඕනෑ. මට මතකයි, මුල් කාලයේ පෞද්ගලික ආයතන ගණනාවක් ජනාධිපතිතුමාට ප්‍රකාශ කළා, "අපි ලැහැස්තියි රුපියල් බිලියන 50ක් මේකට වෙන් කරන්න" කියලා. ඒ, ආණ්ඩුවේ සල්ලි නොවෙයි. පෞද්ගලික අංශවල සල්ලි; පෞද්ගලික ආයතනවල සල්ලි. එහෙම නම් අපි ඒ දේ කරන්න ඕනෑ.

ඊළඟට, ජනතාවට එන්නත් මාත්‍රා දෙකක් ලබා දීම ප්‍රමාණවත්ද කියලාත් අපි සොයා බලන්නට ඕනෑ. අපි තුන්වැනි මාත්‍රාවට යා යුතුයි නේද? ඊශ්‍රායලයේ වයස අවුරුදු 60ට වැඩි හැමෝටම කොවිඩ් එන්නතේ තුන්වැනි මාත්‍රාවත් ලබා දෙනවා. ඒ මොකද? ඊශ්‍රායලයේ සෞඛ්‍ය අංශ නිගමනයකට ඇවිත් තිබෙනවා, අලුත් ප්‍රභේදවලට මුහුණ දීමට එන්නත් මාත්‍රා දෙකක් පමණක් ප්‍රමාණවත් නැහැ, මාත්‍රා තුනකට යන්න ඕනෑ කියලා. අපි හැමෝම දන්නවා, - මම මේ කියන්නේ ඉදිරිය ගැන හිතලා. - "Lambda" කියලා variant එකක් තිබෙන බව. මම දන්නා විධියට ඒක තවම ලංකාවේ නැහැ. ඒ අතින් අපි දැනට වාසනාවන්තයි. ඊළඟට, "Epsilon" කියලා variant එකක් තිබෙනවා, පාකිස්තානයේ. දැනට ලංකාවේ නැහැ. ගරු කථානායකතුමනි, මේ variants දෙකම දැනට පවතින "Delta" variant එකට වඩා ප්‍රබලයි. තවත් ජීවිත ගණනාවක් බිලි ගන්නට පුළුවන්. එහෙම නම් අපි රටක් හැටියට සූදානම් වෙන්න ඕනෑ.

දැන් රජයේ යෝජනාවක් තිබෙනවා, -යෝජනාවක් නොවෙයි, ඒක දැනටත් ක්‍රියාත්මක වෙනවා.- රෝහල්වල තිබෙන තදබදය නිසා කොවිඩ් රෝගීන්ට නිවෙස්වල සිට ප්‍රතිකාර ලබා ගන්න කියා. ගරු කථානායකතුමනි, අපේ රටේ කොවිඩ් ආසාදිතයන්ට නිවෙස්වල සිට ප්‍රතිකාර ලබා ගන්නට නම්, තමන්ට ප්‍රශ්නයක් තිබෙනවා කියන එක ඒත්තු ගන්වන උපකරණ ටික ඒ ආසාදිත ජනතාවට ලබා දෙන්න ඕනෑ. බලන්න, මගේ අතේ තිබෙනවා, pulse oximeter එකක්. මේකෙන් තමයි ඔක්සිජන් ප්‍රමාණය දැන ගන්නේ. ආසාදිත පුද්ගලයා ගෙදර තියනවා නම්, රජයේ අනුග්‍රහයෙන් මේක ලබාදෙන්න ඕනෑ. තමන් පවත්වා ගෙන යායුතු ඔක්සිජන් ප්‍රමාණය; 97, 98, 99, 100 යන ප්‍රමාණ අඩු වෙනකොට වහාම රෝහලේ වෛද්‍යවරයාට කථා කරන්න ඕනෑ. ඒ වාගේම, blood pressure monitor එකක් තිබෙන්න ඕනෑ; temperature gauge එකක් තිබෙන්න ඕනෑ. ඒ නිසා ගෙවල්වල ඉන්නකොට අමාරු වුණොත් රෝගීන්ට රෝහල්වලට එන්න කියන කාරණාව විතරක් කියලා හරියන්නේ නැහැ. රෝගී තත්ත්වයට පාත්‍ර වන අයට මේ මූලික පුංචි උපකරණ ටිකවත් - pulse oximeter, blood pressure monitor යනාදිය - ලබා දෙන්නට රජය සැලසුම් කරන්න ඕනෑ.

අපේ ඊළඟ යෝජනාව තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ - විශේෂයෙන් හෙද, දැඩි සත්කාර ඒකක වැනි සේවාවල- විශ්‍රාම ගිය නිලධාරින් නැවත සේවයට කැඳවන්න කියන එක. අපි අහනවා, මේ රටේ ජනගහනයට ප්‍රමාණවත්, ප්‍රබුද්ධ සෞඛ්‍ය සේවාවක් සැපයීමට දැන් සිටින PHIවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත්ද කියලා. ඇත්ත වශයෙන්ම නැහැ. ඒ නිසා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියලා, අවශ්‍ය නම් වෛද්‍යවරු, හෙදියන් ආදී අත්‍යවශ්‍ය හැම ක්ෂේත්‍රයකම විශ්‍රාම ගිය කණ්ඩායම් ටික නැවත කැඳවලා මේ ජාතික ව්‍යසනකාරී අවස්ථාවේ ප්‍රයෝජනයට ගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අපට තානාපති සේවාවක් තිබෙනවා. අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන යම් යම් ඌනතා ඒ තානාපති සේවාව හරහා පිට රටවලින් සපුරා ගන්න අපට හැකියාව තිබෙනවා. අපේ ambassadorsලාට target එකක් දෙන්න ඕනෑ, 'මෙච්චර මුදලක් වටිනා මේ මේ උපකරණ මාසයකට අවශ්‍යයි. ඒ ටික අපේ රටට ගෙන්වා දෙන්න' කියලා. ඒවා තමයි තානාපති කාර්යාලවල වගකීම. සිංහල, දමිළ, මුස්ලිම් ඩයස්පෝරාව ලැහැස්තියි උදව් කරන්න. ගරු කථානායකතුමනි, අපේ රටට high-flow oxygen therapy machines, CPAP and BiPAP machines, ventilators, hemodialysis machines ආදී රෝහල් උපකරණවල දැඩි අවශ්‍යතාවක් තිබෙනවා. හැම තානාපති කාර්යාලයකටම target එකක් දෙන්නට ඕනෑ, හැම මාසයකම ඒ ඒ රටවල සිටින සිංහල, දෙමළ, මුස්ලිම් හැමෝම, එනම් ශ්‍රී ලාංකීය ප්‍රජාව -ශ්‍රී ලාංකේය ඩයස්පෝරාව- එක්කාසු කරගෙන මාසික වැඩසටහනක් සකස් කරලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න කියලා. විපක්ෂය හැටියට මම සතුටින් කියන්නට කැමැතියි, "විපක්ෂයෙන් හුස්මක්" වැඩසටහන යටතේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වට 22ක දී රුපියල් ලක්ෂ 640ක් වටිනා උපකරණ මේ රටේ රෝහල් පද්ධතියට අප ලබා දී තිබෙන බව. එපමණක් නොවෙයි, මම ආඩම්බරයෙන් කියනවා, සමගි ජන බලවේගයේ සෑම මන්ත්‍රීවරයෙකු විසින්ම තමන්ගේ මන්ත්‍රී වැටුපෙන් කරනු ලබන මූල්‍ය පරිත්‍යාගවලින් තවත් අත්‍යවශ්‍ය රෝහල් උපකරණ ගණනාවක් ලබා දෙන්නට අප බලාපොරොත්තු වන බව.

ගරු කථානායකතුමනි, ආණ්ඩුව මෙන්න මේ කාරණාවත් පොඩ්ඩක් ඔළුවට ගන්න ඕනෑ. 2021 මැයි 04වන දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 81 ගෙනහැර දක්වමින් මා මේ කාරණය කියන්නේ. මම 2021 මැයි මාසයේ 04වෙනි දා මේ ගරු සභාවේදී එවකට සෞඛ්‍ය ඇමතිතුමියට කිව්වා, Tocilizumab කියන බෙහෙත - drug එක - ගැන. මේක, කොවිඩ් රෝගය ප්‍රවර්ධනය වන කොට, වැඩි වන කොට ලබා දිය යුතු බෙහෙතක්. බෙහෙත් ගැන කථා කරන කොට - Tocilizumab ගැන කථා කරන කොටත් - මේ ගරු සභාවේදී සමහරු මට හිනා වුණා; ඔච්චම් කළා; විහිළු කළා. අද ඒ විහිළුව මරණය බවට පත් වෙලා. අද අපේ රටේ Tocilizumabවල බරපතළ හිඟයක් තිබෙනවා. අද Tocilizumab නැහැ. මැයි මාසයේදී මා මේ ගැන කියන කොට ගණන් ගත්තේ නැහැ. අද මේ රටේ ඒ ඖෂධය ගන්න නැහැ. වෛද්‍ය සැපයුම් අංශයට - Medical Supplies Division එකට - කථා කරලා අහන්න. මම ඊයේත් ඒ අයට කථා කරලා කිව්වා, රෝගීන් ගණනාවක් මේ බෙහෙත ඉල්ලුම් කරනවා, මේ බෙහෙත ලබා දෙන්න කියලා කරුණාකර ආණ්ඩුවට කියන්න කියලා. ගරු කථානායකතුමනි, අද ඒ බෙහෙත මේ රටේ නැහැ. මැයි මාසයේ මා මේ ගැන කියන කොට ප්‍රමාණවත් පරිදි stocks ගෙන්වාගෙන තිබුණා නම් අද අපට මිනිස් ජීවිත බේරා ගන්නට තිබුණා; මරණ සංඛ්‍යාව අවම කර ගන්නට තිබුණා. එම නිසා මම මේ අවස්ථාවේදී නැවත වරක් ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මම දන්නවා, අද රෑ ඉඳලාම සමාජ මාධ්‍ය troll farms හරහා එක එක ඇත්තන් Tocilizumab ගෙන්වන එක විහිළුවට ලක් කරන්නට පටන් ගන්නා බව. නමුත්, එදා කළ විහිළුව අද මරණයට පරිවර්තනය වෙලා තිබෙන බව මම කියනවා. අද කරන්නට යන විහිළුවත් එසේම වේවි. මේක විහිළුවට ගන්න එපා. මේ බෙහෙත ගෙන්වන්නට හදිසි වැඩ පිළිවෙළක් කරුණාකර ක්‍රියාත්මක කරන්න.

ගරු කථානායකතුමනි, දැන් හරි පුදුමාකාර තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. මෙච්චර ව්‍යසනයක් සිදු වෙලාත් ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව කැඳවලා නැහැ නේ. දැන් අවුරුදු කීයක්ද? අවුරුදු එකහමාරකටත් වැඩියි. පසු ගිය මාසයේ අපෙනුත් ඒ සභාවට නම් ඉල්ලුවා. අපි ඒ නම් ටිකත් යැව්වා. මේ වාගේ ජාතික ව්‍යසනකාරී තත්ත්වයක් තිබෙන කොට ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව කැඳවන්න ඕනෑ. අප හැමෝටම කථා කරලා -සාකච්ඡා කරලා- ආණ්ඩුවෙන් කෙරෙන්නට ඕනෑ කාර්ය භාරය මෙයයි, විපක්ෂයේ අපි මේ දේ භාර ගන්නම්, අපි දෙගොල්ලන්ම එකතු වෙලා මේ රටේ රෝහල් පද්ධතියේ ඌනතා සපුරන්න පුළුවන් ආකාරයෙන් උදව් කරමු කියලා ජාතික මෙහෙයුමක් ක්‍රියාත්මක කරන්න පුළුවන් තැනක් නේද, ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව කියන්නේ?

නමුත්, එය අදටත් කැඳවා නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, එම ජාතික සභාව කැඳවන්න කියලා.

ගරු කථානායකතුමනි, කොවිඩ්-19 මර්දන ක්‍රියාන්විතය තුළ සේවයේ නියුතු සෞඛ්‍ය අංශයේ සියලු දෙනාත්, ආරක්ෂක අංශයේ සියලු දෙනාත්, ඒ වාගේම රාජ්‍ය අංශයේ අනෙකුත් සියලු දෙනාත් විශේෂ ඇගයීමකට ලක් කරන්න ඕනෑ. ඒ අයගේ මානසික තෘප්තිය වර්ධනය කරන්නට ඕනෑ. ඒ අයගේ මානසික ශක්තිය වර්ධනය කිරීම තුළින් අපට පුළුවන්, දැවැන්ත ජාතික මෙහෙයුමක් ක්‍රියාත්මක කරන්න. අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය හෝ ආරක්ෂක අංශය කිසිම ආකාරයකින් විවේචනය කරන්නට යන්නේ නැහැ. දැඩි අවදානමක් තුළ තමන්ගේ ජීවිත ආශාව පැත්තකින් තියලා, තමනුත් ජීවිතයත් මරණයත් අතර සටනක් කරමින් තමයි ඒ අය මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගන්නේ. එහෙම නම් මතක තබා ගන්න, shut down, lock down නොකිරීම හේතුවෙන් ආරක්ෂක අංශවලටත්, සෞඛ්‍ය අංශවලටත් දැඩි අවදානමකට මුහුණ දීමට සිදු වන බව. ඒ දැඩි අවදානම තුළ රෝහල් පද්ධතිය ඇතුළු මුළු සෞඛ්‍ය පද්ධතිය - health sector එක - කඩා වැටුණොත්, කවුද මේ රටේ ජනතාව ජීවත් කරවන්නේ? අපි ඒ අංශවල සියලුදෙනා මහත් පැසසුමට ලක් කරනවා.

ගරු කථානායකතුමනි, මා තවත් කාරණයක් කියන්න කැමැතියි. අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වාගේම ආර්ථික ක්ෂේත්‍රයේත් මර උගුල් ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. අපේ රටේ ණය මර උගුල තිබෙනවා. රට සංවර්ධනය නොවීමේ මර උගුල තිබෙනවා. අපේ රටේ දැන් stagflation කියන සංකල්පය ක්‍රියාත්මක වනවා. එක පැත්තකින්, බඩු මිල වැඩි වෙනවා; තවත් පැත්තකින්, ආර්ථික වර්ධනය කඩා වැටෙනවා. මේ ණය මර උගුලට විසඳුම මොකක්ද? අපි සූදානම්, විපක්ෂයක් හැටියට ඒ සඳහා සහයෝගය ලබා දෙන්න. අපි හැමෝම අපේකම, රටේකම, අපේ අනන්‍යතාව සුරැකගෙන ජාත්‍යන්තර මූල්‍ය ආයතන එක්ක සාකච්ඡා කරලා ණය කළමනාකරණ වැඩසටහනකට - debt management programme එකකට - අනිවාර්යයෙන් යන්නට ඕනෑ; ණය ටික reschedule කර ගන්නට ඕනෑ. ඒක මදිකමක් කියා සිතන්න එපා. මේ රට බංකොලොත් වෙන්න දෙන්න බැහැ. මේ රට බංකොලොත් කරලා ආණ්ඩු බලය ලබා ගන්න සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂය සූදානම් නැහැ. පක්ෂ දේශපාලනය කිරීමට පෙර අපි රට රැක ගන්න ඕනෑ; රට ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා විපක්ෂයේ ප්‍රධාන පක්ෂය වන අපේ සමගි ජන බලවේගය විපක්ෂයේ අනෙකුත් කණ්ඩායම් එක්ක එක්කාසු වෙලා රටටත්, රජයටත් සහයෝගයක් ලබා දෙන්න සූදානම්. ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කරලා, අපේ ණය කළමනාකරණය සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා, මේ ණය ටික reschedule කරගෙන, ප්‍රතිව්‍යුහගත කරගෙන අපේ ආර්ථිකයට නව පණක් පොවන්න අපි ලැහැස්තියි.

ගරු කථානායකතුමනි, මම කැමැතියි මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය තවත් කාරණයක් වෙත යොමු කරවන්න. "එක්සත් රාජධානියේ බුද්ධි උපදේශන මණ්ඩලය" කියා think tank එකක් තිබෙනවා. ඒ අය study එකක් කර තිබෙනවා. එම study එක තුළින් ඒ අය කියනවා, රටේ ජනතාව තමන්ගේ ආදායමෙන් සියයට 66ක් තම ආහාර සඳහා වැය කරනවා කියලා. පවුලේ සාමාජිකයන්ගේ වියදම නොවෙයි, මේ. තනි ගෘහ මූලිකයාගේ ආහාර සඳහා සියයට 66ක් වියදම් කරන කොට, පවුලේ සාමාජිකයන්ටත් වෙනම මුදලක් වියදම් කරනවා. මේ තත්ත්වය තුළ අද food poverty හෙවත් ආහාරය කේන්ද්‍ර කරගත් දුප්පත්කමක් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. සමස්තයක් හැටියට ගත්තොත්, COVID poverty කියන ප්‍රශ්නය, බරපතළ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව 2020 මුල් භාගයේදී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 600ක් අහිමි කරගත්තා, කෝටි ප්‍රකෝටිපතියන්ට බදු සහන ලබා දීලා. ඒ නිසා රාජ්‍ය ආදායමක් නොමැතිකම තුළ මේ ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා, මූල්‍ය උත්තේජක පැකේජ් එකක් - fiscal stimulus package එකක් - රටේ ජනතාවට ලබා දෙන්න. එවැන්නක් ඇමෙරිකාව ලබා දීලා තිබෙනවා; එංගලන්තය ලබා දීලා තිබෙනවා; අනෙක් රටවල් ද - ආර්ථික අතින් බොහොම අමාරු රටවල් පවා- ලබා දීලා

තිබෙනවා. බංග්ලාදේශයත් එවැන්නක් ලබා දීලා තිබෙනවා. බංග්ලාදේශය තමන්ගේ ජනතාවට එවැනි පැකේජයක් ලබා දුන්නත් අපේ රටට බැරි වෙලා තිබෙනවා, අපේ රටේ ජනතාවට එවැන්නක් ලබා දෙන්න. ඒ නිසා රාජ්‍ය ආදායම නැවත වරක් ශක්තිමත් කරන ක්‍රමවේදයකට අපි යන්නට ඕනෑ. Export-led growth -අපනයන කේන්ද්‍ර කරගත් ආර්ථික වර්ධනය - macroeconomy එක වාගේම microeconomy එක කේන්ද්‍ර කරගත් ආර්ථික සංවර්ධන මොඩලයක් හරහා ගමන් කිරීම යනාදී වශයෙන් සංකල්ප ගණනාවක් තිබෙනවා. මේ යෝජනා සියල්ල රජයට ඉදිරිපත් කරලා, දෙගොල්ලන්ම එකට එක්කාසු වෙලා හැමෝටම ඉන්න පුළුවන් සෞභාග්‍යසම්පන්න රටක් නිර්මාණය කරන්නත්, ඒ රට ආරක්ෂා කරන්නත් අපි සූදානම්. අපි ඒ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑ. දැන් විහිළු තහළු කළා ඇති; අසත්‍ය චෝදනා කරගත්තා ඇති. දැන් මේ රටට අවශ්‍ය වන්නේ විසඳුම්. එම විසඳුම් ලබා දීමට අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ශක්තිමත් කශේරුකාවක් -කොඳු නාරටියක්- තිබෙනවා. තමන්ගේ මුදල් පසුම්බියට අත දමා මුදල් අරගෙන වෙනම මන්ත්‍රී අරමුදලක් පිහිටුවා මේ රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීමේ ප්‍රයත්නයට ශක්තිය ලබා දෙන්න විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ටත් පුළුවන්කම තිබෙනවා.

ගරු කථානායකතුමනි, ජෝන් එෆ්. කෙනඩි ජනාධිපතිතුමා කළ ප්‍රකාශයක් සඳහන් කරලා මගේ කථාව අවසන් කරන්නම්. "Let us not seek the Republican answer or the Democratic answer, but the right answer. Let us not seek to fix the blame for the past. Let us accept our own responsibility for the future". "රිපබ්ලිකන් හෝ ඩිමොක්‍රටික් පිළිතුර නොව, නිවැරැදි පිළිතුර සොයා අපි යමු" කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. අපි පොහොට්ටුව ලකුණ පක්ෂයේ පිළිතුර, සමගි ජන බලවේගයේ පිළිතුර නොව, නිවැරැදි පිළිතුර, නිවැරැදි විසඳුම, නිවැරැදි වැඩ පිළිවෙළ සොයා බලමු; සොයා බලා එය ක්‍රියාත්මක කරමු; අතීතයට දොස් පැවැරීමෙන් වැළකී සිටිමු; අනාගතය වෙනුවෙන් අප සතු වගකීම් පිළිගනිමු. සමගි ජන බලවේගයේ අපි සූදානම්, රට දැය වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, අපේ මාතෘ භූමිය වෙනුවෙන් එම යුතුකම ඉෂ්ට කරන්න. අපි වර්තමාන රජයට ආරාධනා කරනවා, අප සමඟ අත් වැල් බැඳගෙන දේශය ගොඩ නඟන, දේශය ආරක්ෂා කරන, මේ රටේ ජනතාවගේ ජන ජීවිත ආරක්ෂා කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියලා. ඒ වාගේම, මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, අපි සති දෙකකට විතරක් රට lock down කර බලමු කියලා. එහෙම කරලා, කොවිඩ් ආසාදිත වන, කොවිඩ් නිසා මැරෙන සංඛ්‍යා අඩු වන කොට, අපට පුළුවන් ක්‍රමානුකූලව රට විවෘත කරන්න. අපි මේ මොනවා කරන්නත් ඉස්සෙල්ලා, රුපියල් ශත පැත්තකට දමා, ජීවිතවලට වටිනාකමක් ලබා දීලා කරුණාකර ජීවිත ටික බේරා ගනිමු.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Prasanna Ranatunga. Order, please! Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු රංජිත් සියඹලාපිටිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிட்டிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. RANJITH SIYAMBALAPITIYA] *took the Chair.*

[අ.භා. 12.14]

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - சுற்றுலாத்துறை அமைச்சர்)
(The Hon. Prasanna Ranatunga - Minister of Tourism)

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ නියම දෙකක් හා රේගු ආඥා පනත යටතේ වූ යෝජනා දෙකක් අද මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම ගොඩක් අය කථා කළේ 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳවයි. අද රටේ පවතින තත්ත්වයත් එක්ක මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම ඉතාම අත්‍යවශ්‍ය කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා. ප්‍රධාන කාරණා හතරක් මුල් කරගෙන මේ පනත් කෙටුම්පත ගෙනෙන්න අධිකරණ ඇමතිතුමා කටයුතු කර තිබෙනවා. ඒ පිළිබඳව අධිකරණ ඇමතිතුමාට මේ අවස්ථාවේ දී අපේ ස්තුතිය පුද කරනවා. ආර්ථික, සමාජයීය වශයෙන් විතරක් නොවෙයි, ඒකට බලපාන නෛතික ගැටලු විසඳා ගැනීම සඳහාත් මේ පනත තුළින් හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවාදයේදී සමහර මන්ත්‍රීවරුන් මේ කොරෝනා වසංගත තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කරන දත්ත සම්බන්ධයෙන් එතුමන්ලාගේ අදහස් ප්‍රකාශ කළා. රජය විසින් දත්ත යට ගහලා කරුණු වසන් කරන්නට උත්සාහයක යෙදෙනවාය කියලා උලුප්පා දක්වන්න ඒ අය ලොකු උත්සාහයක් දැරුවා. ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති ගරු සහන් ප්‍රදීප් විතාන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වපු රැස්වීමේදී ගම්පහ දිස්ත්‍රික්කයේ දත්ත ටික RDHS Office එකෙන් ඉදිරිපත් කළා. එහෙම හංගන්න වුවමනාවක් තිබුණා නම්, අපට එදා ඒ දත්ත ඉදිරිපත් නොකරන්න තිබුණා. ඒ දත්ත ඉදිරිපත් කළාට පසුව රජය විසින් ඉදිරිපත් කළ දත්ත සමඟ වූ වෙනස සම්බන්ධව දිගින් දිගටම ලොකුවට කථා වුණා. ඒ සම්බන්ධව මම වෛද්‍ය අසේල ගුණවර්ධන මැතිතුමාට - Director Generalට - කථා කරලා ඇහුවා, මෙහෙම වෙන්නේ කොහොමද කියලා. එතුමා ඒ වෙලාවේදී එතැන තිබුණු ප්‍රායෝගික ගැටලුව පෙන්වා දුන්නා. "ගම්පහින් එවපු දත්තවල නම් ගම් තිබුණේ නැති ඒවා අපි ඇතුළත් කළේ නැහැ. ඒ නිසා තමයි ඒ දත්ත ටික ඇතුළත් නොවුණේ. අනෙක් ටික පුරවලා එවන්න ආපසු යැව්වා, ඒ වෙනස තමයි මේ පෙන්වා තිබෙන්නේ" කියා එතුමා කිව්වා. ඒ නිසා එය යම් ප්‍රායෝගික ගැටලුවක් නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරින් අතින් සිදුවුණු දෙයක් මිස රජය විසින් යට ගහන්න කළ දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය නිවැරදි කළේ නැත්නම් වැරදි අර්ථ කථනයක් ජනතාව අතරට යන්න ඉඩ තිබෙනවා. පස්සේ, ඒ දත්ත යාවත්කාලීන කළාට පසුව ඒ සම්බන්ධව පැහැදිලි තත්ත්වයක් ඇති වුණා. මේ පැහැදිලි කිරීම තමයි සෞඛ්‍ය අංශවලින් අපට ලබා දුන්නේ. ඒ නිසා, හමුදාවේ නිලධාරියෙක් මැදිහත් වෙලා දත්ත එක්කාසු කරනවාය කියන කාරණාව සම්පූර්ණයෙන් වැරදියි. සමහර විට මේ සඳහා බුද්ධි අංශ මැදිහත් වෙනවා. මොකද, එක අවස්ථාවක ලබා දීපු දත්තවල ඊට මාස ගණනකට ඉස්සර වෙලා මැරුණු අයත් හිටියා. මමත් කොවිඩ් මර්දන කමිටුවට යන නිසා මේ ගැන දන්නවා. ඒ නිසා බුද්ධි අංශ යවලා මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගන්නවා. මොකද, දත්ත වැරදුණොත් අපට අපේ සැලසුම් ක්‍රියාත්මක කරන්න බැරි වන නිසා. මමත් කොවිඩ් මර්දන කමිටුවේ රැස්වීම් වාර කිහිපයකට සහභාගි වුණා. සිකුරාදා දිනයේදී කොවිඩ් මර්දන කමිටුව රැස් වෙලා කරුණු සාකච්ඡා කරනකොට, ඒක තමයි ඒ අවස්ථාවේදී සෞඛ්‍ය අංශ විසින් ලබා දුන් පැහැදිලි කිරීම.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

අද මෙතැනදී කථා වුණා, කන්ටේනර්වල මිනී ගෙනිච්ච එක ගැන. ඒ මැරිලා සිටි සියලුදෙනාම කොවිඩ් ආසාදිතයන් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු ඇමතිතුමනි, ඔබතුමා පසුගිය සතියේ පුවත් පත් අරගෙන බලන්න. ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ම කියනවා, ආණ්ඩුවේ දත්ත වැරදියි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ඉන්න, මම කියනතුරු. මම ඒ කාරණාව පැහැදිලි කළා. ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය ඇමතිතුමියත් එදා ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ හිටියා. ඒක හංගලා කථා කරන්න දෙයක් නොවෙයි. ඒ වාගේම අයිතිකරුවන් හොයා ගන්න බැරි මරණ ගොඩ ගැහිලා තිබුණා. අධිකරණයෙන් අවසරය අරගෙන දින දෙකක් ඇතුළත ඒවායේ අවසන් කටයුතු කරන්නත් අපට ඒ රැස්වීමෙන් පසුව පුළුවන්කම ලැබුණා. හැම දෙයක් ගැනම වැරදි විධියට බලන්න එපා. කොළ පාට කණ්ණාඩි දමාගෙන, වෙනත් පාට කණ්ණාඩි දමාගෙන මේක ගැන බලන්න එපා. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ, අපි එකතු වෙලා මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න ඕනෑ.

මට මතකයි, කොවිඩ්-19 වසංගතයේ මුල්ම අවස්ථාව එනකොට ආර්ථික විශේෂඥයන් සහ සෞඛ්‍ය අංශයේ විශේෂඥයන් කැඳවා ජනාධිපතිතුමා සාකච්ඡාවක් පැවැත්වූ බව. එම සාකච්ඡාවේදී ජනාධිපතිතුමා එදා පවතින තත්ත්වය ගැන පැහැදිලි කරන්න කිව්වාම, සෞඛ්‍ය අංශයේ විශේෂඥයන් ඔවුන්ගේ පැත්තෙන් කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම ආර්ථික විශේෂඥයන් කිව්වා, "රට වැහුවොත් ආර්ථික වශයෙන් බලපානවා, රටට අහේනියක් සිද්ධවෙන්න පුළුවන්" කියලා. ජනාධිපතිතුමා ඒ අවස්ථාවේ කිව්වේ මොකක්ද? "ආර්ථිකය කඩාගෙන වැටුණොත් ගොඩගන්න පුළුවන්, හැබැයි මිනිස්සු මැරුණොත් මට පණ දෙන්න බැහැ. එම නිසා සෞඛ්‍ය අංශ කියන විධියට කටයුතු කරන්න ඕනෑ" කියලා. ඒ අනුව එතුමා අවස්ථා කිහිපයකදීම රට වැහුවා. අද ඇමෙරිකාව ඇතුළු අනෙකුත් රටවල් කටයුතු කරන ආකාරය ගැන කථා කරනවා. එදා අපේ රට වැහුවා විතරක් නොවෙයි, මුල්ම අවස්ථාවේ විශාල පිරිසකට රුපියල් පන්දහසේ දීමනාව ලබා දෙන්නත් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අගමැතිතුමා මැදිහත්වෙලා කටයුතු කළා. ගුරුවරුන්ට, වෛද්‍යවරුන්ට, දේශීය වෛද්‍යවරුන්ට, ඉල්ලපු හැමෝටම රුපියල් 5,000 ගණනේ ලබා දෙන්න අපි කටයුතු කළා. දෙවැනි අවස්ථාවේත් රුපියල් පන්දහස දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිරෝධායනය වන පවුල්වලට රුපියල් 10,000 ගණනේ ලබා දෙන්නත් අද කටයුතු කරනවා.

එන්නත්කරණ වැඩ පිළිවෙළ අපි අද ආරම්භ කර තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම බස්නාහිර පළාතේ ජනතාවට ඒ එන්නත් ලබා දෙන්න අපි කටයුතු කළා. අන්තිමටම එන්නත ලබා ගන්නවා කියපු සමහර අය, අපටත් හොරෙන් ගිහිල්ලා හොඳම එන්නත ලබාගෙන තිබෙන ආකාරයත් අපි දැක්කා. අපි ඒවාට විරුද්ධ වෙන්නේ නැහැ; ඒවා දෝෂාරෝපණයට ලක් කරන්නේත් නැහැ. හැබැයි, කථාවෙන් විතරක් නොවෙයි ක්‍රියාවෙනුත් ඔප්පු කරලා පෙන්වන්න ඕනෑ, අපි එකතුවෙලා වැඩ කරන්න ඕනෑ කියලා. අද රට වහන්න කියලා කියනවා. රට වහන එක හොඳයි. ඒක අපිත් පිළිගන්නවා. හැබැයි, මේ රටේ එදිනෙදා හම්බකරලා ජීවත්වෙන මිනිස්සු ඉන්නවා. කඩවල් වහනකොට ඒ කඩවල වැඩ කරන මිනිසුන්ට ආදායමක් නැති වෙනවා, ජීවත් වෙන්න මාර්ග නැති වෙනවා.

පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට වර්ෂ 200ක් පිරීම නිමිත්තෙන් ඊයේ පෙරේදා පවත්වපු උත්සවයේ ආරම්භක අවස්ථාවට මමත් සහභාගි වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දරුවෙක් වඩාගත් අම්මා කෙනෙක් එතැනට ඇවිත් හිටියා, අපිව හමුවෙන්න. සංචාරක ක්ෂේත්‍රයට මුළු සේසතම වියදම් කරලා ඇය අද අසරණවෙලා ඉන්නවා. ඇය එතැනට ඇවිල්ලා අපිට කිව්වා, "ඇමතිතුමා, අපි අසරණවෙලා ඉන්නවා, සංචාරක ක්ෂේත්‍රයෙන් ජීවනෝපාය ගෙනියන්න අපට වැඩ පිළිවෙළක් හදලා දෙන්න" කියලා. අවස්ථා ගණනකදී SLTDA එක සම්බන්ධ වෙලා, ඒ වාගේම රජය මැදිහත් වෙලා සංචාරක ක්ෂේත්‍රයේ අයට උදව් උපකාර කළා. නමුත්, ඒවා පැළැස්තර විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා තමයි අපි තීන්දු කළේ, ඒ අයට ස්ථිර පිළිසරණක් වෙන්න නම් සංචාරක ව්‍යාපාරයේ කටයුතු ආරම්භ කරන්න ඕනෑ කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරු මාධ්‍ය ප්‍රකාශ තියලා සංචාරක ක්ෂේත්‍රයේ නියැලෙන ජනතාව ගැන කියමින් කිඹුල් කඳුළු හෙළනවා, මම දැක්කා. ඒ අය වෙනුවෙන් කථා කරපු එක හොඳයි. හැබැයි, අද සමහර අය මාධ්‍යයට ඇවිල්ලා කියනවා, පසුගිය කාලයේ සංචාරක ක්ෂේත්‍රය හරහා මේ රටට ගෙන්වපු අය නිසා කොවිඩ් වසංගතය පැතිරුණා කියලා. මම ඉතාම වග කීමෙන් මේ කාරණය කියනවා. මම මේ සම්බන්ධයෙන් මාධ්‍ය ප්‍රකාශයකුත් කළා. අපි 2020 දෙසැම්බර් 23වැනි දා නියාමන ව්‍යාපෘතියක් රටට හඳුන්වා දුන්නා. ඒ අනුව ජෛව බුබුල යටතේ සංචාරකයෝ 2,257දෙනෙක් ආවා. එයින් 9දෙනෙකුට විතරයි කොරෝනා ආසාදනය වී තිබුණේ. ඒ අයට සමාජගත වෙන්න ඉඩ නොදී අපි සමාජය ආරක්ෂා කළා. සියයට 0.39කටයි කොරෝනා හැදුණේ. ඊට පස්සේ 2020.12.28වන දා සිට 2021.08.12වන දා දක්වා සංචාරකයන් 21,915දෙනෙකු අපේ රටට ඇවිල්ලා තිබෙනවා. එයින් කොවිඩ්-19 හැදුණු අය සිටියේ 220දෙනායි. ඒ කියන්නේ, සියයට 1යි. හැබැයි, සෞඛ්‍ය අංශවල උපදෙස් අනුව කටයුතු කරපු නිසා ඒ අයටත් සමාජගත වෙන්න ඉඩනොදී ආරක්ෂා කරගන්න අපට පුළුවන්කම ලැබුණා. සමහර අය, තවත් සමහර අයගේ නම් සඳහන් කරමින් "මුදල් ඇමති බැසිල් රාජපක්ෂ මහත්මයා ඒ අයව ගෙන්නුවා, අත්හදා බැලීමක් කළා" කියන්න උත්සාහ කළා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සංචාරක අමාත්‍යාංශය හැටියට අපි දීර්ඝ කාලීනව සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක සාකච්ඡා කරලා තමයි සංචාරකයන් ගෙන්වන්න තීන්දු කළේ. ඒ අයගේ උපදෙස් පරිදි තමයි සංචාරකයන් ගෙන්වන ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න කටයුතු කළේ. ඒ නිසා අපට මඩ ගහන චේතනාවෙන් මෙවැනි දේවල් කියන්න එපා.

දැන් රට වහන්න කියනවා. අද රට වහන්න කියන අය පසුගිය සති දෙක තුනේ මොනවාද කළේ? පාරවල්වලට බැහැලා උද්ඝෝෂණ කළා. සෙනඟ ගෙනැල්ලා ජනතාව අතර මෙම රෝගය සමාජගත කළා. අපට සැකයක් තිබෙනවා, මේ අය ඕනෑකමින් මේ දේ කළාද කියලා. මේ රට මේ තත්ත්වයට පත් කරගන්න ඒ දේ කළාද කියන සැකය අපට තිබෙනවා. එම නිසා විපක්ෂ නායකතුමා රට වහන්න කියනවා වාගේම, රට වහන්න කියන හැමෝම පරිස්සම් වෙනවා නම් හොඳයි. අපි පිළිගන්නවා, රටක් වහන්න කියන එක ලෙහෙසියි. නමුත්, රටක් වහනකොට, එසේ රට වසා දැමීම නිසා ආර්ථික වශයෙන් ගැටලුවලට මුහුණ දෙන මිනිසුන්ට උත්තර දෙන්නේ කවුද? අද ගමේ කඩයක් වහනකොට එහි සේවය කරන අයට පඩි නඩි ගෙවන්නේ

කොහොමද? ඒ මිනිස්සු ජීවත් වෙන්නේ කොහොමද? ඒ අයට හැම දාම රුපියල් 5,000 බැගින් දෙන්න මේ ආර්ථිකය ශක්තිමත්ද?

ලොකු මිනිසුන්ට යැපෙන්න අපි බදු සහන ලබා දුන්නාය කිව්වා. කොරෝනා වයිරසය පැතිරයාමට ඉස්සෙල්ලා තමයි එම බදු සහන ලබා දුන්නේ. පසුගිය ආණ්ඩුව ගෙන ගිය වැරදි ආර්ථික වැඩ පිළිවෙළ නිසා විනාශ වුණු ආර්ථිකය ගොඩ ගන්න බලාගෙන හදපු ක්‍රමවේදය තමයි අපි ඒ ක්‍රියාත්මක කළේ. අවාසනාවකට වාගේ, මේ කොවිඩ් - 19 වසංගත තත්ත්වයත් එක්ක අපි බලාපොරොත්තු වුණු ඉලක්කවලට අපට යන්න බැරි වුණා. මහ බැංකු හොරකම සහ වැරදි මූල්‍ය පරිපාලනය නිසා ඇති වුණු ගැටලු හේතුවෙන් තමයි අද මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. රටේ විදේශ සංචිත අඩු වෙලා තිබෙනවා. අද සමහර අය මහ ලොකුවට කියනවා එන්නත් ගෙනෙන්න ඕනෑ කියලා. එන්නත් ගෙනෙන්න ඕනෑ තමයි. හැබැයි, ඒවාට මුදලුත් සොයන්න ඕනෑ. මුදල් සොයන්න නම් මේ රටේ ආර්ථිකය ඉදිරියට යන්න ඕනෑ. ඒවාට වැඩ පිළිවෙළවල් හදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පත් වෙන්න කලින් මේ වාගේ තත්ත්වයක් ඇති වුණා නම් ඒකට මුහුණ දෙන්න කොයි රජයද වැඩ පිළිවෙළක් හදලා තිබුණේ? ගරු විපක්ෂ නායකතුමනි, අපි සන්තෝෂයෙන් ඔබතුමාට කියන්න ඕනෑ, මෙම වසංගත තත්ත්වයට මුහුණ දෙන්න ජනාධිපතිතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙන බව. අපි එන්නත් ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා. පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තම පක්ෂයේ අරමුදල්වලින්, සාමාජිකයන්ගේ අරමුදල්වලින් මුදල් ලබාගෙන 50දෙනෙකුට ඉන්න පුළුවන් IC Centres 13ක් ආරම්භ කළා. ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ, වතුපිටිවල සහ මීරිගම කියන රෝහල් තුනේම IC Centres හැදුවා. ඒ වාගේම, වැරැල්ලවත්තේ වහලා තිබුණු factory එකක් ඒ අයිති අය සමඟ කථා කරලා ලබාගෙන, තරුණ සංවිධාන සම්බන්ධ කරගෙන, 2,500කට ඉන්න පුළුවන් විධියට අඳන් ටික දමලා ඒකේ කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම 1,000කට 1,250කට ඉන්න පුළුවන් තවත් කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් සීදුවේ ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම 1,000දෙනෙකුට ඉන්න පුළුවන් තවත් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් කටුනායක ආරම්භ කර තිබෙනවා. බියගම ආසනයේත් කොවිඩ් - 19 නිරෝධායන මධ්‍යස්ථානයක් අපි ආරම්භ කළා. හැබැයි, අපට කනගාටුයි. පසුගිය රජයන්වල සෞඛ්‍ය සේවයේ විධිමත් වැඩ පිළිවෙළක් තිබුණේ නැති නිසා ඒවායේ වැඩ කරන්න අද වෛද්‍යවරු යොදවන්න විධියක් නැහැ. නර්ස්ලාගේ හිඟයක් තිබෙනවා; කම්කරුවන්ගේ හිඟයක් තිබෙනවා. රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගත්ත අය තමයි කම්කරුවන් හැටියට ඒවායේ සේවයට යොදවන්නේ. ඒ නිසායි මා කිව්වේ, මේ වාගේ ව්‍යසනයක් එනකොට කිසිම රජයක් එයට මුහුණ දෙන්න සෞඛ්‍ය අංශ සූදානම් කරලා තිබුණේ නැහැ කියලා. කෙටි කාලයක් තුළ තමයි මේ සූදානම ඇති කරගෙන, මේ රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න මෙම රජයට පුළුවන්කම ලැබුණේ.

තමුන්නාන්සේලා පාරවල්වල උද්ඝෝෂණ පවත්වමින්, කෑ ගහමින් ගිහිල්ලා මේ වසංගතය මිනිසුන් අතර බෝ කරලා මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කියනවා, "රට වහන්න ඕනෑ" කියලා. පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, "රට වහන්න ඕනෑ" කියලා. ඒ වාගේ වගකීමකින් තොරව කටයුතු කරන විපක්ෂයක් එක්ක තමයි අපි මේ කටයුතු කරන්නේ. ජාතික වගකීමක්, ජාතික ව්‍යසනයක් හැටියට සලකා -මේක දේශපාලන ගැටලුවක් නොවෙයි, මුළු ලෝකයම මුහුණ දෙන ප්‍රශ්නයක්.- මෙම කොරෝනා මර්දන වැඩසටහනට සහයෝගය ලබා දීලා රටේ ජනතාව වෙනුවෙන් තීන්දු-තීරණ ගන්න උදව් කරන්න කියා විපක්ෂයෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பි.ப. 12.26]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் கொரோனா வைரஸ் தொற்று (கொவிட்-19) (தற்காலிக ஏற்பாடுகள்) சட்டமூல விவாதம் நடைபெறுகின்றது. இந்தப் பெருந்தொற்றினால் எமது நாட்டு மக்கள் எதிர்கொள்கின்ற விடயங்கள் தொடர்பில் இந்த உயர் சபை ஆராய்கின்றது. மிகமுக்கியமாக, மக்கள் இன்று துன்பத்தின் பிடியிலே வாழ்கின்றார்கள். தெருக்களிலே விழுந்து சாகின்ற மக்களை இந்த நாடு சந்திக்கின்றது. இப்படி ஒரு கொடிய நோயினால் மக்கள் தெருவிலே விழுந்து சாவார்கள் என்றோ, குடும்பங்குடும்பமாக கொரோனாத் தாக்கத்துக்கு உள்ளாகி தனிமைப்படுத்தலுக்கு மக்கள் ஆளாவார்கள் என்றோ யாரும் எதிர்பார்க்கவில்லை. அந்தளவுக்கு கொரோனா இந்த நாட்டு மக்களைத் தாக்கிக்கொண்டிருக்கின்றது.

நான் வாழுகின்ற கிளிநொச்சி மாவட்டத்திலே இருக்கின்ற வைத்தியசாலைகளில், கொரோனா தடுப்பு நிலையங்களில், உருவாக்கப்பட்ட தற்காலிக வைத்தியசாலைகளில் நோயாளர்களைப் பராமரிப்பதுற்கு இடமில்லை; அவை கொரோனா தொற்றாளர்களால் நிரம்பி வழிகின்றன. வைத்திய சாலைகளிலே இருக்கின்ற அவர்களைப் பார்க்கக் கூடிய அளவுக்கு வைத்தியர்களுக்கும் தாதியர்களுக்கும் நேரமில்லை. அத்துடன், ஏனைய நோயாளிகளைப் பார்வையிட முடியாத நிலைமையும் காணப்படுகின்றது. அருகிலேயிருக்கின்ற முல்லைத்தீவு மாவட்டத்திலே உள்ள அனைத்து கொரோனாத் தடுப்பு நிலையங்களும்கூட நிரம்பி வழிகின்றன. இவ்வாறு மட்டக்களப்பு, மன்னார், வவுனியா, யாழ்ப்பாணம் என்று அங்குள்ள அனைத்து மாவட்டங்களிலும் மக்கள் பாரிய அசௌகரியங்களைச் சந்திக்கின்றார்கள். இவ்வாறான ஒரு சூழ்நிலை இந்த நாட்டிலே ஏற்படுமென்று ஏற்கெனவே பலரும் எச்சரித்திருந்தார்கள். சுகாதாரத் துறையைச் சார்ந்தவர்கள் எச்சரிக்கை விட்டிருந்தார்கள்; வைத்தியர்கள் அழுதழுது சொன்னார்கள்; தாதியர்கள் கண்ணீர் மல்க சொன்னார்கள். இன்னும் பலர் முன்னெச்சரிக்கை விடுத்தார்கள். ஆனால், இந்த அரசாங்கம் இதுவரை அதனைச் செவிசாய்க்கவில்லை.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கொரோனாப் பரவல் எற்பட்டு கிட்டத்தட்ட 2 வருடங்களாகப் போகின்றது. "ஜனாதிபதி அவர்களே, எல்லாக் கட்சிகளையும் அழைத்துப் பேசுங்கள்" என்று முன்னாள் ஜனாதிபதி அவர்கள் இன்று குறிப்பிட்டார். அதற்கு இப்பொழு பச்சைக்கொடி காட்டப் படுவதாக நாங்கள் அறிகின்றோம். கொரோனா தொடர்பான ஒரு சரியான சட்டம் இல்லை. நியாயமான ஒரு சட்டத்தின்படி இந்த விடயம் கையாளப்படுவதில்லை. கொரோனா தொடர்பாக இராணுவம் அறிவிப்பதுதான் சட்டம் என்று இந்த நாட்டிலே கொள்ளப்படுகின்றது. சுற்றுலாத்துறை அமைச்சர் பிரசன்ன ரணதுங்க அவர்கள் சற்றுமுன்னர் இங்கே பேசுகின்றபொழுது, இந்த நாட்டிலே இருக்கின்ற அனைத்து கொரோனாத் தொற்றாளர்களது குடும்பங்களுக்கும் 10,000 ரூபாய் என்ற அடிப்படையில் உணவுப் பொதிகளை வழங்குவதாகக் குறிப்பிட்டார். கௌரவ அமைச்சர் அவர்களே,

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

எத்தனைக் குடும்பங்களுக்கு இது சென்றடைந்திருக்கின்றது? அந்த விபரங்கள் உங்களுக்குத் தெரியுமா? நான் வசிக்கின்ற மாவட்டமாக இருக்கட்டும், அல்லது அம்மாவட்டத்திற்கு அருகிலே இருக்கின்ற மாவட்டங்களாக இருக்கட்டும், அம்மக்களுக்கு கொரோனாவுக்கான உதவித் தொகையோ அல்லது 10,000 ரூபாய் பெறுமதியான உணவுப்பொதியோ சென்றடைவதில்லை. வேண்டுமென்றால் நான் அவர்களுடைய பெயர்களையும் தொலைபேசி இலக்கங்களையும் தருகிறேன். அவர்களைத் தொடர்புகொண்டு கேளுங்கள்! தற்பொழுது, 17 நாட்கள் கடந்துவிட்டன. ஆனால், அவர்களுக்கு எந்தவித உதவியும் கிடைக்கவில்லை. காரணம், அரசாங்கத்திடம் எந்த இருப்பும் இல்லை; அவற்றை வழங்குவதற்கு அரசாங்கத்திடம் காசு இல்லை. இவ்வாறுதான் இந்த நாட்டினுடைய நிலைமை சென்றுகொண்டிருக்கின்றது. கொரோனா தொற்றுக்கு ஆளான சிறைக்கைதிகளை பிணையிலே விடுதலை செய்யுமாறு சொல்லப்படுகிறது. பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்ட தமிழ் அரசியல் கைதிகள் நீண்ட காலமாக சிறையிலே இருக்கிறார்கள். அவர்களிலே பலருக்கு எத்தனையோ தடவை கொரோனா தொற்று ஏற்பட்டிருக்கிறது. அவர்களைப் பிணையிலே விடுதலை செய்யுங்கள் என்று நாங்கள் பல தடவை இந்த உயர் சபையிலே கேட்டிருக்கிறோம். ஆனால், இந்தச் சபையினூடாகவோஅல்லது சம்பந்தப்பட்ட -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! දිවා ආහාර විවේකය සඳහා පස්වරු 1.30 දක්වා සභාවේ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

ගරු මන්ත්‍රීතුමාට දිවා භෝජනයෙන් පසුව විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමාගේ* (ගරු අංගජන් රාමනාදන් මහතා) *සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Shritharan, please continue. You have nine minutes more.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, சிறையிலே இருக்கின்ற அரசியல் கைதிகளை விடுதலை செய்யுங்கள் என்று பல தடவை இந்தச் சபையினூடாக நாங்கள் கோரிக்கைகளை முன்வைத்திருக்கிறோம். தற்போதைய கொவிட் சூழலைக் கருத்திலேகொண்டு, பயங்கரவாத தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்ட அரசியல் கைதிகளை தயவுசெய்து பிணையிலாவது விடுதலை செய்யுங்களென்று நாங்கள் மீண்டும் மீண்டும் அரசாங்கத்தை வலியுறுத்துகின்றோம்.

இந்த நாட்டு மக்களுக்கு தடுப்பூசி ஏற்றப்படுகின்ற அதேவேளை, குறிப்பிட்ட ஒருவகைத் தடுப்பூசிகளை சில நாடுகள் ஏற்றுக்கொள்வதில்லை. குறிப்பாக, "சினோபாம்" தடுப்பூசியை 15இற்கும் மேற்பட்ட நாடுகள் இன்னும் ஏற்றுக் கொள்ளாத காரணத்தால், அந்தத் தடுப்பூசியை ஏற்றிக் கொண்ட பலரால் திருமணத்துக்காக அல்லது வேறு தேவைகளுக்காக அந்நாடுகளுக்குப் போகமுடியாத ஒரு சூழல் காணப்படுகின்றது. எனவே, இதற்கான ஒரு மாற்று ஒழுங்கை அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென்பதையும் நான் இந்த இடத்திலே வலியுறுத்துகின்றேன். ஏனென்றால், இது மிக முக்கியமான ஒரு விடயமாகும். கல்விக்காக, திருமணத்துக்காக மற்றும் வேறு அத்தியாவசியத் தேவைகளுக்காக வெளிநாடு செல்பவர்கள் என்று பலருடைய பயணங்கள் தடைப்பட்டிருக்கின்றன.

நாட்டிலே கொவிட் பரவல் தீவிரமடைந்திருக்கின்ற இந்தச் சூழலிலும்கூட, பயங்கரவாத குற்றத்தடுப்புப் பிரிவு பல்வேறுபட்ட விசாரணைகளை மேற்கொள்கின்றது. குறிப்பாக, பச்சிலைப்பள்ளி பிரதேச சபையினுடைய கௌரவ உறுப்பினர் திருமதி அருட்செல்வி கணகராசா அவர்களுடைய வீட்டில் வெடிபொருட்கள் இருப்பதாகவும் மாவீரர் தின நினைவேந்தலுக்கான ஆயத்தங்கள் மேற்கொள்ளப்படுவதாகவும் கூறி, 2020.11.26ஆம் திகதி இரவு 10.00 மணி முதல் 27ஆம் திகதி அதிகாலை 2.00 மணிவரை நூற்றுக்கும் மேற்பட்ட இராணுவத்தினரால் அவருடைய வீடு சுற்றிவளைக்கப்பட்டு, மிக மோசமான தேடுதல் வேட்டை யொன்று மேற்கொள்ளப்பட்டது. அதனைத் தொடர்ந்து, "P2P " - பொத்துவில் தொடக்கம் பொலிகண்டி வரையான போராட்டத்தில் பங்குபற்றியமை குறித்து 2021.02.19ஆம் திகதி காலை 9.40இலிருந்து மதியம் 1.00 மணிவரை பச்சிலைப்பள்ளி பொலிஸ் நிலையத்தில் அவர் விசாரணைக்குட்படுத்தப் பட்டார்.

அதேபோல, கரைச்சி பிரதேச சபையின் வன்னேரிக்குளம் வட்டாரத்தினுடைய கௌரவ உறுப்பினர் நாகேந்திரம் செல்வநாயகம் அவர்கள், கடந்த 2021.03.09ஆம் திகதி கொழும்பு 4ஆம் மாடிக்கு அழைக்கப்பட்டு பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் 6 மணிநேர விசாரணைக்குட்படுத்தப்பட்டார். கரைச்சி பிரதேச சபையின் பரந்தன் வட்டாரத்தினுடைய கௌரவ உறுப்பினர் திருமதி கிருஷ்ணவேணி விக்டர் லோகநாதன் அவர்கள், 2021.07.15ஆம் திகதி கிளிநொச்சி, பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் காலை 9.00 மணியிலிருந்து பி.ப. 12.30 மணிவரை 3½ மணித்தியாலங்கள் விசாரணைக்குட்படுத்தப்பட்டார். கரைச்சி பிரதேச சபையினுடைய உதயநகர் வட்டார கௌரவ உறுப்பினர் திருமதி லலிதகுமாரி சத்தியமூர்த்தி அவர்கள், 2021.08.05ஆம் திகதி காலை 9.00 மணி முதல் ந.ப. 12.00 மணிவரை 3 மணித்தியாலங்கள் கிளிநொச்சி, பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் விசாரணைக்குட்படுத்தப்பட்டார். அதேதினம் பூநகரி பிரதேச சபையின் பொன்னாவெளி வட்டார கௌரவ உறுப்பினர் திருமதி ஜெயசித்திரா தயானந்தன் அவர்கள், மதியம் 1.30 தொடக்கம் மாலை 5.00 மணிவரை 3½ மணித்தியாலங்கள் கிளிநொச்சி பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் விசாரிக்கப்பட்டார். அதனைத் தொடர்ந்து, கரைச்சி பிரதேச சபையினுடைய கோணாவில் வட்டார கௌரவ உறுப்பினர் சின்னையா சுப்பையா அவர்கள், 2021.08.06ஆம் திகதி காலை 9.00 மணி முதல் 11.30 மணிவரை 2½ மணி நேரம் கிளிநொச்சி, பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் விசாரிக்கப்பட்டார். அதேதினம் கரைச்சி பிரதேச சபையினுடைய கௌரவ தவிசாளர் அருணாசலம் வேழமாலிகிதன் அவர்கள், மதியம் 1.30

இலிருந்து 4.00 மணிவரை 2½ மணி நேரம் கிளிநொச்சி, பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் விசாரணைக்குட் படுத்தப்பட்டார். இறுதிப் போருக்கு முன்னரான அவர்களது செயற்பாடுகள், கட்சி அங்கத்துவம், அரசியல் பிரவேசம், நினைவேந்தல் நிகழ்வுகளில் பங்குபற்றியமை மற்றும் இலங்கை தமிழரசுக் கட்சியினுடைய நடவடிக்கைகள் தொடர்பாகவும் இவர்களிடம் விசாரிக்கப்பட்டிருக்கிறது.

இவர்களைத் தவிர, எங்களுடைய கிளிநொச்சி, கோணா வில் மகாவித்தியாலயத்தில் ஆசிரியராகப் பணியாற்றுகின்ற எங்களுடைய கட்சியின் பரந்தன் வட்டாரக் கிளையினுடைய தலைவர் திரு. சின்னராஜா சிவேந்திரன் அவர்கள் 2021.03.18ஆம் திகதி காலை 9.15 மணி முதல் மாலை 3.50 மணிவரை 5 மணித்தியாலங்களுக்கும் மேலாக கொழும்பு பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரவினரால் 4ஆம் மாடியில் விசாரணைக்குட்படுத்தப்பட்டார். அவரது தொலைபேசி முதல் முகநூல், மின்னஞ்சல் வரை அனைத்தினதும் கடவுச்சொற்கள் மிரட்டிப் பெறப்பட்டுள்ளன. இவர்களைத் தொடர்ந்து 2021.08.07ஆம் திகதி பச்சிலைப்பள்ளி பிரதேச சபையினு டைய கௌரவ தவிசாளர் சுரேன் சுப்பிரமணியம் அவர்களும், 2021.08.08ஆம் திகதி பூநகரி பிரதேச சபையின் கௌரவ உறுப்பினர் சிவகுமாரன் ஸ்ரீ ரஞ்சன் அவர்களும் கிளிநொச்சி பயங்கரவாதக் குற்றத்தடுப்புப் பிரிவினரால் விசாரணைக்கு அழைக்கப்பட்டார்கள். பின்னர் இவர்கள் இருவருக்குமான விசாரணை நடைபெறவில்லை.

இந்த நாட்டிலே ஜனநாயகம் இருக்கிறது; கொவிட் தொற்று பரவியிருக்கின்றது; இந்த நாடு மிகவும் அபாயகரமான சூழலுக்குள் இருக்கிறது என்றெல்லாம் பேசப்படுகின்றது. ஆனால், குருந்தூர் மலையிலே பிக்குகளும் இராணுவத்தினரும் பொலிசாரும் சென்று பாரிய ஒரு விகாரையைக் கட்டிக் கொண்டிருக்கிறார்கள். நேற்று முன்தினம், அதாவது, 15ஆம் திகதி இரவு பொன்னாலையிலே சிறிய குழுக்களுக்கிடையே நடைபெற்ற பிரச்சினையின்போது பொன்னாலை இராணுவ முகாமிலிருந்த 50இற்கும் மேற்பட்ட இராணுவத்தினர் அங்கு சென்று அவர்களுக்கு அடித்திருக்கிறார்கள். இவ்வாறு தாக்குவதற்கு உங்களுக்கு உரிமை தந்தது யார் என்று அங்கிருந்த பொதுமக்கள் கேட்டதற்கு எந்தப் பதிலும் சொல்லாமல் அவர்கள் அந்த இடத்தை விட்டகன்றிருக் கின்றனர். எங்கு பார்த்தாலும் இராணுவம் குவிக்கப் பட்டிருக்கின்றது. அவ்வாறான இராணுவச் சூழலுக்குள் இருக்கின்ற மக்களிடையே இராணுவ அச்சம் தொடர்ந்தும் பிரயோகிக்கப்படுகின்றது. இந்த நாட்டிலே கொவிட் தாக்கம் இருக்கிறது. அதனால் மக்கள் பாதிக்கப்பட்டிருக்கிறார்கள். பாதிக்கப்பட்டவர்களுக்கு நிவாரணம் சரியாகச் சென்றடைவ தில்லை. இவ்வாறான விசாரணைகள், நிலப்பறிப்புக்கள் மற்றும் தமிழ் மக்களை அந்நியப்படுத்துகின்ற, அவர்களை அச்சுறுத்துகின்ற நடவடிக்கைகள் இந்த அரசாங்கத்திலே தொடர்ந்தவண்ணமிருக்கின்றன. இவ்வாறான நடவடிக்கை களுக்கு எப்பொழுது முற்றுப்புள்ளி கிடைக்கும்? இவை எப்போது நீதியான முறையிலே நடைபெறும்?

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இந்த நாட்டிலேயிருக்கின்ற தமிழர்கள் இந்த மண்ணுக்குரிய தனித்துவமான அடையாளத்துடன் கூடிய ஒரு தேசிய இனமாகும். பாருங்கள்! உலகத்திலே 21ஆம் நூற்றாண்டில் தலிபான் இயக்கம் தன்னுடைய நாட்டை ஆயுத வழியிலே வென்றிருக்கின்றது. நாங்கள் ஆயுதம் பற்றிப் பேசவில்லை. ஆயுதப் போராட்டம் மௌனிக்கப்பட்டு 12 ஆண்டுகள் கடந்துவிட்டன. அமெரிக்கா விட்டுச்சென்றதனாலோ, ரஷ்யா விட்டுச்சென்றதனாலோ அவர்கள் அந்த நாட்டைப் பிடிக்கவில்லை. அவர்களின் கொள்கையும், தொடர் போராட்டமும், இலக்கு நோக்கிய பயணமுமே அவர்களைத் தாய் நாட்டை அடையவைத்திருக்கின்றது. தங்களுடைய நாட்டை அவர்கள் மீட்டெடுத்திருக் கிறார்கள். நாங்கள் இந்த நாட்டிலே கேட்பது ஆயுத ரீதியான ஒரு போராட்டத்தையல்ல. அதனை நாங்கள் செய்து பார்த்தோம்; நாங்கள் மௌனித்திருக்கிறோம். மக்கள் அதனைக் கைவிட்டிருக்கிறார்கள். இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற தமிழ் மக்களின் பிரச் சினைகள் தொடர்பாக அதியுத்தம ஜனாதிபதி அவர்களாக இருக்கட்டும், கௌரவ பிரதமர் அவர்களாக இருக்கட்டும் அல்லது சிங்களத் தலைவர்களாக இருக்கட்டும், சற்று சிந்தியுங்கள்!

இன்று உலக ஒழுங்குகள் மாறி வருகின்றன. உலகத் தினுடைய சூழல் மாறியிருக்கின்றது. எத்தனையோ சுதந்திர இயக்கங்களுக்கும் சுதந்திரத்திற்காகப் போராடு கின்ற இனங்களுக்கும் தலிபான்களுடைய விடுதலைப் போராட்டம் ஒரு மாற்றத்தினைத் தந்திருக்கின்றது. தலிபான்களுடைய விடுதலைப் போராட்டமானது சரியா, பிழையா என்பது முக்கியமல்ல. ஆனால், அவர்களால் தங்களுடைய நாட்டை மீட்டெடுக்க முடிந்திருக்கின்றது. அது, இந்த உலகப் பந்தில் ஏற்பட்டிருக்கின்ற இராணுவ ரீதியான - ஆயுத ரீதியான ஒரு மாற்றமாகும். ஏற்கெனவே, ஒருமுறை அவர்கள் அந்த ஆப்கானிஸ்தான் நாட்டைப் பிடித்து பின்னர் தோற்றுப் போனவர்கள். இம்முறை இரண்டாவது தவவையாக அந்த நாட்டைப் பிடித்திருக் கிறார்கள். இனி, அவர்கள் செய்யப் போகின்ற ஆட்சியானது, அந்த மக்களின் நலன் சார்ந்ததா என்பதைக் காலம்தான் தீர்மானிக்க வேண்டும்; அவர்களுடைய நடவடிக்கைகள்தான் தீர்மானிக்க வேண்டும். உலகப் பந்திலே எந்தவோர் இனமும் தன்னுடைய சுயத்தோடு வாழ்வதற்கான உரிமையைக் கோரி நிற்பதில் எந்தத் தவறுமில்லை. அந்தவகையில், தமிழர்களாகிய நாங்களும் எங்களுடைய உரிமைகள் தொடர்பிலே இப்பொழுதும் ஒரு நிலையான கொள்கையோடு இந்த அரசிடம் நீதிக்காகக் கேட்கிறோம். தயவுசெய்து, அரசியல் கைதிகளையாவது நீங்கள் நல்லெண்ண அடிப்படையில் பிணையில் விடுதலை செய்ய முதலில் நடவடிக்கை எடுங்கள் என்று கூறி நிறைவுசெய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Next, the Hon. (Prof.) Channa Jayasumana. You have 18 minutes.

[අ.භා. 1.39]

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා (ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன - ஔடத உற்பத்திகள், வழங்குகைகள் மற்றும் ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Prof.) Channa Jayasumana - State Minister of Production, Supply and Regulation of Pharmaceuticals)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුලින්ම, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා පැවසූ කාරණයට මම පිළිතුරක් ලබා දෙන්නම්.

[ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා]

The Kurundi Temple, which is located in the Nagacholai Forest Reserve in Mullaitivu District, is a heritage of the Sinhalese Buddhists built during the 5th and 6th Centuries AD. We all should protect that heritage and I hope you all will also contribute to protect the heritage of Kurundi Temple. Hon. Member, I must also mention that the speech you made here is not relevant to today's Debate.

2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත ඇතුළු නියමයන් හා යෝජනා කිහිපයක් පිළිබඳව සාකච්ඡා වන මේ වෙලාවේ, මම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. අද වනකොට අපේ රට තුළ මූලික වශයෙන් දක්නට ලැබෙන්නේ කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදයේ පැතිරීමයි. ඒ පිළිබඳව පර්යේෂකයන් තහවුරු කර තිබෙනවා. එය, මීට පෙර තිබුණු ප්‍රභේදවලට වඩා සියයට 60ත්, 70ත් අතර ප්‍රමාණයක වේගයෙන් පැතිරෙන, ඉහළ රෝග ලක්ෂණ ප්‍රමාණයක් මතු කරන, ඔක්සිජන් මත යැපෙන රෝගීන් සංඛ්‍යාව ඉහළ නංවන ප්‍රභේදයක්. ඒ විතරක් නොවෙයි ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වනකොට පර්යේෂකයන් විසින් මූලික වශයෙන් අනාවරණ කරගෙන තිබෙනවා, ලංකාවේ පැතිරෙන කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදයේ තවත් විකෘති කිහිපයක් මේ වන විට ඇති වී තිබෙන බව. එහි ප්‍රධාන විකෘති 3ක් පිළිබඳව අප මේ වනකොට දැනුවත් වෙලා තිබෙනවා. SA 222-V, SA 701-S සහ SA 1078-S නමින් හඳුන්වන, spike mutations එහෙම නැත්නම් ස්පයික් ප්‍රෝටීනය ඇති වීම සඳහා හේතුවන ජාන කේතයන්හි යම්කිසි වෙනසක් අපේ රටේ තිබෙන ඩෙල්ටා ප්‍රභේදය තුළ ඇති බව මේ වනකොට මූලික වශයෙන් අනාවරණය කරගෙන තිබෙනවා. එය ඇතැම්විට මේ රෝගය පැතිරී යාම වැඩි වීමට එක හේතුවක් වෙන්නත් ඉඩ තිබෙනවා.

අප එන්නත්කරණය කෙරෙහි විශ්වාසය තබා, එය වේගවත්ව සිදු කිරීම මඟින් මූලික වශයෙන් උත්සාහ දැරුවේ මේ රෝගය පැතිර යාම වැළැක්වීම සහ රෝගයෙන් මිය යන ප්‍රමාණය අවම කරගැනීමටයි. විශේෂයෙන් මේ වනකොට අපි මේ රටේ ලක්ෂ 219ක් වන ජනගහනයෙන්, ලක්ෂ 119කට - සියයට 54කට- කුමන හෝ එන්නතක එක් මාත්‍රාවක් හෝ ලබා දී තිබෙනවා. ඒ වාගේම, එම පිරිසෙන් ලක්ෂ 46කට එන්නතේ දෙවැනි මාත්‍රාවත් අපි ලබා දී තිබෙනවා. රටේ සමස්ත ජනගහනයෙන් සියයට 21ක් එන්නත් මාත්‍රා දෙකම ලබාගෙන තිබෙනවා. අවුරුදු 30ට වැඩි ජනගහනයෙන් එක එන්නත් මාත්‍රාවක් හෝ ලබා ගත් සංඛ්‍යාව සියයට 95ක් වෙනවා; මාත්‍රා දෙකම ලබා ගත් සංඛ්‍යාව සියයට 40ක් වෙනවා. මේ වනකොට අපේ රටට එන්නත් මාත්‍රා එක්කෝටි අනූපන්ලක්ෂ විසිපන්දහස් හත්සියයක් ලැබී තිබෙනවා. සයිනොෆාම් එන්නත් මාත්‍රා ලක්ෂ එකසිය හතළිස්හතක්, මොඩර්නා එන්නත් මාත්‍රා පහළොස්ලක්ෂ එකසියයක්, ෆයිසර් එන්නත් මාත්‍රා හාරලක්ෂ එකළොස්දහස් දෙසියවිස්සක්, ස්පුට්නික් එන්නත් මාත්‍රා එක්ලක්ෂ අනූපන්දහසක් සහ ඇස්ට්‍රාසෙනිකා වර්ගයේ එන්නත් මාත්‍රා විසිහත්ලක්ෂ දහනවදහස් තුන්සියඅසූවක් ලැබී තිබෙනවා. කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදයේ මෙවැනි ශීඝ්‍ර පැතිර යාමක් පිළිබඳව මූලික වශයෙන් අපිට තොරතුරු ලැබෙන්න පටන් ගත්තේ; වෛද්‍ය විශේෂඥයන්, වසංගත රෝග විශේෂඥයන් අපි දැනුවත් කළේ ජූලි මාසයේ 15වන දාත්, 18වන දාත් අතර කාලයේදීයි.

මේ සම්බන්ධයෙන් මා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් ජූලි මාසයේ 19වන සඳුදා මේ රටේ ජාතික පුවත් පතක පළමු පිටුවේ සඳහන් වුණා. මේ මා අතේ තිබෙන්නේ එම පුවත්පත, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. "ඩෙල්ටා වයිරසය රට පුරා පැතිර යාමේ අවදානමක්" යන සිරස්තලය යටතේ තමයි එය සඳහන් වන්නේ. ජූලි මාසයේ 19 වැනිදා සිට දැන් අද වන විට මාසයකට ආසන්නයි. ඒ දිනවලම තමයි මේ රටේ උද්ඝෝෂණ රැල්ලක් ඇති කරලා, ජනතාව පාරට බැස්සවීමේ වැඩ පිළිවෙළක් දියත් වුණේ. ඒ වන විට පාර්ලිමේන්තු වට රවුමට සිය දහස් ගණනක් ජනතාව ගෙනැල්ලා, සමගි ජන බලවේගය මඟින් සංවිධානය කළ උද්ඝෝෂණයක් පැවැත්වෙන ආකාරය අපි දැක්කා. ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෘත්තීය සමිති මඟින් රටේ විවිධ ස්ථානවලට ජනතාව දහස් ගණනක් කැඳවා, උද්ඝෝෂණ පවත්වනවා අපි දැක්කා. එමෙන්ම, බස්වලින් වාගේම විවිධ ආකාරයෙන් ජනතාව ඒ උද්ඝෝෂණවලට අරගෙන එන ආකාරයත් අපි දැක්කා. "ඩෙල්ටා ප්‍රභේදය භයානකයි, ඒ නිසා මේ අවස්ථාවේ උද්ඝෝෂණ කරන්න එපා" කියන ඉල්ලීම අපි කළා. නමුත්, ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ විතරක් නොවෙයි, අපි විවිධ සංචරණ සීමා පනවන්න හදනකොටත්, "මේවා කරන්න හදන්නේ උද්ඝෝෂණ නවත්වන්න" කිව්වා. උද්ඝෝෂණ නවත්වන්න සංචරණ සීමා පනවන්න හදනවා කියලායි අපිට චෝදනා කළේ. එදා එහෙම උද්ඝෝෂණ සංවිධානය කරපු අය අද මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා අපිට චෝදනා කරනවා; උපදෙස් දෙනවා. අපෙන් මහා වරදක් සිදු වුණු විධියට කථා කරමින්, රජය විසින් මෙහි වගකීම දැරිය යුතු බව කියනවා. එහෙම කියන ප්‍රධාන පුද්ගලයෙක් තමයි, වසංගත රෝග විද්‍යා ඒකකයේ මීට කලින් හිටපු ප්‍රධානියා වන විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහත්මයා. එතුමා පසුගිය මහ මැතිවරණයට කළුතර දිස්ත්‍රික්කයෙන්, මාලිමාව ලකුණින්, අංක 9 යටතේ තරග කරන බව දැක්වෙන දැන්වීමක් මා ළඟ දැන් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ වෘත්තීය සමිති පාරට බැහැලා කෑ ගහනකොට, එතුමා ඒ අයට උපදෙස් ලබා දුන්නේ නැද්ද කියන එකයි අපිට තිබෙන ප්‍රශ්නය. "ඔය විධියට පාරට බහින්න එපා. ඩෙල්ටා ප්‍රභේදය පැතිරෙනවා. එය භයානකයි. මේ වැඩේ කරන්න එපා" කියලා එතුමා උපදෙස් දුන්නේ නැද්ද?

විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපති, විශේෂඥ වෛද්‍ය ලක්කුමාර් ප්‍රනාන්දු මැතිතුමා "පාර්ලිමේන්තු වට රවුමට දසදහස් ගණනක් සෙනඟ ගෙනෙන්න එපා. උද්ඝෝෂණ පැවැත්වීම හොඳ නැහැ. මේ වෙලාවේ උද්ඝෝෂණ පැවැත්වීම වැරැදියි" කියලා සජිත් ප්‍රේමදාස මැතිතුමාට උපදෙස් දුන්නේ නැද්ද කියාත් අපි දැනගන්න කැමැතියි. මොකද, ඩෙල්ටා ප්‍රභේදය ඉක්මනින් පැතිරෙනවා කියා අපි පැහැදිලිව කිව්වා; එහි භයානකකම පෙන්වා දුන්නා. ඒ සියල්ල නොසලකා හැර තමයි මෙතුමන්ලා ජනතාව දහස් ගණනක් පාරට බැස්සුවේ කියන කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. ඒ වෙලාවේ සංචරණ සීමා පනවන්න අපිට බැරි වුණේ, ඔවුන් චෝදනා එල්ල කිරීම නිසා සහ වසංගතය පැතිරීම වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග නිසායි. ඒ විතරක් නොවෙයි, ඒ උද්ඝෝෂණවලට සම්බන්ධ වුණු, ආසාදිත යැයි සැක සහිත අය නිරෝධායනයට යැව්වාම, ඒ අය නිරෝධායනයෙන් නිදහස් කරන්න කියලාත් උද්ඝෝෂණ කළා. සති තුනකට ඉස්සෙල්ලා මෙතුමන්ලා එහෙම කටයුතු කරලායි අද අනික් පැත්තට අපට චෝදනා එල්ල කරන්නේ.

අද උදේ විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා Tocilizumab ඖෂධය ගැන කිව්වා; "ඒ ඖෂධය COVID-19 රෝගීන්ට ලබාදිය යුතුයි; එහි හිඟයක් තිබෙනවා, ඒ සම්බන්ධයෙන් රටේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා" කියා එතුමා කිව්වා. එතුමා මීට ඉස්සෙල්ලාත් මේ වාගේම ඖෂධයක් ගැන කිව්වා. මට මතක විධියට ඒ, Plaquenil කියන ඖෂධය - Hydroxychloroquine - පිළිබඳවයි. මා දන්නේ නැහැ, එතුමා මේවා ගැන පොඩ්ඩක් සොයා බලන්නේ නැත්තේ ඇයි කියලා. කවුරු හරි මොනවා හෝ දෙයක් කිව්ව ගමන් කලබල

වෙලා ඇවිල්ලා කියන්නේ නැතුව මේවා ගැන ගැඹුරින් සොයා බලා පාර්ලිමේන්තුවට කරුණු කාරණා ඉදිරිපත් කරනවා නම් හොඳයි. Tocilizumab කියන ඖෂධයට අපි කියන්නේ, "Toci" කියලා. එහෙම නේද, උපුල් ගලප්පත්ති මන්ත්‍රීතුමා? වෛද්‍ය විද්‍යානුකූලව අපි ඉස්පිරිතාලවලදී මේ ඖෂධය "Toci" කියන නමින් හඳුන්වනවා. එතුමා කියනවා, ඉස්පිරිතාලේ "Toci" නැහැ කියලා. "Toci" කියන ඖෂධය හැම COVID-19 රෝගියෙකුටම දෙන එකක් නොවෙයි. COVID-19 රෝගීන් 100දෙනෙක් ආවොත්, රෝගීන් 40දෙනකුට විතර තමයි උග්‍රම අවස්ථාවේදී ඔක්සිජන් දෙන්නෙත්. ඒ අයගෙනුත් සියයට 2කට, 3කට විතර තමයි Tocilizumab කියන ඖෂධය දෙන්න වෙන්නේ. ඒ, කොවිඩ් නියුමෝනියා රෝගී තත්ත්වය උග්‍ර වුණාමයි. ඒ කියන්නේ ලෙඩ්ඩු 100දෙනකුගෙන් එක්කෙනෙකුට වාගෙයි මේ ඖෂධය දෙන්න වෙන්නේ. එතුමා කියනවා, "මේ ඖෂධය මේ වෙලාවේ රටේ නැහැ." කියලා. ඒක වැරදියි. ඖෂධය තිබෙනවා. හැබැයි, ඉල්ලුම වැඩි වෙලා තිබෙනවා. එතුමා කිව්වා, අපි මේ ඖෂධය ඇණවුම් කළේ නැහැ කියලා. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන ආතරයිටීස් අමාරුව වැඩි වුණාමත් ඒ ඖෂධය තමයි දෙන්නේ. එහෙම නැතුව, එය COVID-19 රෝගයට දෙන්න තිබුණු ඖෂධයක් නොවෙයි. නමුත්, පසුව පර්යේෂණාත්මකව පෙනුණා, කොවිඩ් නියුමෝනියා රෝගී තත්ත්වයට පත් වී අසාධ්‍ය වුණු රෝගියෙකුට මේ ඖෂධය දුන්නාම යම්කිසි ගුණයක් එනවා කියලා. හැබැයි, වෙලාව වරද්දලා දුන්නොත්, ඖෂධය නිසාම රෝගියා නැති වෙන්නත් පුළුවන්.

මෙම Tocilizumab කියන ඖෂධය සම්බන්ධයෙන් මම සංඛ්‍යා ලේඛන ටිකක් කියන්නම්. මේ ඖෂධයේ මිලිග්‍රෑම් 80, 200 සහ 400 කියලා මාත්‍රා තුනක් තිබෙනවා. අපි මේ වෙනකොට මිලිග්‍රෑම් 80න් 1,926ක්, මිලිග්‍රෑම් 200න් 2,471ක්, මිලිග්‍රෑම් 400න් 5,053ක් ඇණවුම් කර තිබෙනවා. අපි මීට මාස තුනකට ඉස්සෙල්ලායි ඇණවුම් කළේ. මිලිග්‍රෑම් 80 vial එකක් රුපියල් 21,000ක් වෙනවා. මිලිග්‍රෑම් 200 vial එකක් රුපියල් 50,507ක් වෙනවා. මිලිග්‍රෑම් 400 vial එකක් රුපියල් 105,267ක් වෙනවා. අතිවිශාල ධනස්කන්ධයක් මේ ඖෂධයට වැය වනවා. මේ ඖෂධය ගුණයි කියූ නිසා, විශේෂඥ වෛද්‍යවරු නිර්දේශ කරපු නිසා අපි මේවා මාස ගණනකට පෙර ඇණවුම් කළා. දැන් ඒවා ක්‍රමානුකූලව ලැබෙමින් පවතිනවා. මුළු ලෝකයම මේ ඖෂධය ඉල්ලනවා. එක සමාගමයි මූලික වශයෙන් මේ ඖෂධය නිෂ්පාදනය කරන්නේ. ඒ, Roche කියන සමාගම. ඔවුන් එක එක රටවලට quota එකක් දෙනවා. අපි මුලින්ම ඉල්ලපු නිසා තමයි මේ ගණනට හරි අපට ඖෂධය ලැබෙන්නේ. ඒවා ගැන කිසි දෙයක් දන්නේ නැතුව, හොයන්නේ නැතුව විපක්ෂ නායකතුමා මෙතැනට ඇවිල්ලා කියනවා, "Toci" නැහැ කියලා. එතුමා Plaquenil ගැන කියලා එදා අමාරුවේ වැටුණා වාගේම තමයි අද "Toci" ගැන කියන්න ගිහිල්ලාත් අමාරුවේ වැටුණේ. අනේ! ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා වාගේ ජ්‍යෙෂ්ඨයෙක් එතුමාට පොඩ්ඩක් කියා දෙන්න, මේ වාගේ දෙයක් කියන්න ඉස්සෙල්ලා විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන්, දන්නා කෙනෙකුගෙන් අහලා පාර්ලිමේන්තුවේ කියන්න කියලා. මම හිතන්නේ එතුමා කවුරුවත් කියන දෙයක් අහන්නේ නැහැ වාගෙයි. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා නම් යම් දෙයක් ගැන කියනකොට ඔයිට වඩා පොඩ්ඩක් හොයලා බලලා, කිරලා මැනලා කියන බව පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගේ ඒ ප්‍රකාශය නිසා වන හානිය ගැනත් මම කියන්නම්. එතුමා ඒ ප්‍රකාශය කළාට පස්සේ මගේ දුරකථනයට නිමක් නැතුව calls එනවා. ඉස්පිරිතාලවල ඉන්න ලෙඩ්ඩුන්ගේ පවුල්වල අය හැමෝම අහනවා, "Toci" කෝ, කියලා. මම කිව්වා, සජිත් ප්‍රේමදාස මහත්තයා දන්නේ නැතුව, වැරදිලායි ඒක කියා තිබෙන්නේ කියලා. එතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. ගරු කිරිඇල්ල මැතිතුමනි, ඔබතුමාවත් එතුමාට කියන්න මේක නිවැරැදි කරගන්න කියලා. මොකද, මේ කියන ඖෂධය හැමෝටම දෙන එකක් නොවෙයි. ලෙඩ්ඩු 100දෙනෙක් ආවා කියා හිතමුකෝ. අමාරු වුණොත්, කොවිඩ් නියුමෝනියාව හැදුණොත්, ඒ සියදෙනාගෙන් එක්කෙනෙකුට වාගේ දෙන්න වන, දුර්ලභ ඖෂධයක්, මේක. පොඩ්ඩක් එහෙ මෙහෙ වුණොත්, ඒ ඖෂධය නිසාම ඒ රෝගියා මිය යන්නත් පුළුවන්. ඒ නිසා ඖෂධ ගැන කියනකොට පරිස්සමෙන් කියන්න. එහෙම නැතිව නිකම් මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එපා කියලා මම එතුමාගෙන් ඉල්ලනවා. මොකද, එහෙම වුණාම, අපට අනික් වැඩ ටික කරගන්න හරි අමාරුයි. මේවාට උත්තර දෙන්න වෙලාව වැය කරන්න වෙනවා.

ඊළඟට, කොවිඩ් මර්දන ක්‍රියාවලිය කරන යුද හමුදාවට දිගින් දිගටම චෝදනා කළා අපි දැක්කා. ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව, අපි සහයෝගයෙන් වැඩ කිරීම පිළිබඳව චෝදනා එල්ල කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සෞඛ්‍ය අංශයට දැන් මහන්සියි. ඒක ඇත්ත. වසර එකහමාරක්, දෙකක් එක දිගට වැඩ කරලා මහන්සිවෙලා, අසීමිත කැප කිරීමක් කරලා වෛද්‍යවරුන්ට, හෙද නිලධාරින්ට, සෞඛ්‍ය අංශයේ අනෙක් සේවකයන්ට - ඒ සියලු දෙනාට - දැන් මහන්සියි. ඒ නිසා තමයි යුද්ධ හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව, පොලීසිය කියන සියලු අංශවලින් ඇවිල්ලා මේ කටයුත්තට උදව් කරන්නේ. ඒ සියලු දෙනා එකතු වෙලා එම කටයුතු කරන නිසා තමයි අද මේ තත්ත්වයෙන් හෝ රට ඉදිරියට ගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා බලාපොරොත්තු වුණා, ඉන්දියාවේ වාගේ මේ රටේත් පාරේ දමා මිනී පුච්චන තත්ත්වයක්; පාරේ ටයර් දමා මිනී පුච්චන තත්ත්වයක්. එහෙම තත්ත්වයක් ඇති කර ගන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වුණාට, අපි මේ අසීරු අවස්ථාවේ වුණත් හැම කටයුත්තක්ම නිසි පරිදි කළමනාකරණය කර ගෙන යනවා. ඔබතුමන්ලා අපට ඒ සඳහා වචනයකින් හෝ උදව් කරන්නයි ඕනෑ. නමුත්, ඒ වෙනුවට ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කලින් හිටපු කැඳවුම්කරු වූ නජිත් ඉන්දික අවිස්සාවේල්ල රෝහලේ ඉඳගෙන Facebook එක හරහා මර ළතෝනි නඟනවා. ඔහු ඉස්පිරිතාලයේ රෝගීන්ට බෙහෙත් කරන්න එපා යැ, Facebook එකේ විවිධ දේවල් දම දමා ඉන්නේ නැතිව. Facebook එකෙන් බැහැ, කොවිඩ්-19 ලෙඩ්ඩු සුව කරන්න. Facebook ඔස්සේ රැල්ලක් ඇති කරලා විවිධ ව්‍යාජ නම්වලින් විවිධ මුහුණු දමාගෙන එළියට ඇවිල්ලා කියනවා, "මම මෙහෙම බලාගෙන හිටියා. කෙනෙක් අර විධියට මළා. කෙනෙකුට මේ විධියට හුස්ම ගන්න අමාරු වුණා" කියලා. අද එලෙස විවිධ දේවල් කියමින්, අපේ රට විසාලා මහනුවරක් බවට පත් කරන්න හදන්නේ වෙන කවුරුත් නොවෙයි. විපක්ෂයේ මෙතුමන්ලාම තමයි ඒක කරන්න හදන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ කරපු දේවල් ගැනත් අපිට ඉතින් කියන්න නම් පුළුවන්.

අද රාජිත සේනාරත්න හිටපු ඇමතිතුමා කිඹුල් කඳුළු හෙළමින් කථා කළා. එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ පිළිකා රෝගීන්ගෙනුත් හොරා කෑවා; පිළිකා බෙහෙතෙනුත් හොරා කෑවා. ඒ කරපු දේවල් ගැන අද ජනාධිපති කොමිෂන් සභා වාර්තාවෙනුත් කරුණු හෙළිදරව් වෙලා තිබෙනවා; අභ්‍යන්තර විගණන පරීක්ෂණවලින් කරුණු අනාවරණය වෙලා තිබෙනවා. ඒවා එසේ මෙසේ ගණන් නොවෙයි, රුපියල් මිලියන 800, 900, 1,000 වාගේ ගණන්. මේ වෙලාවේ මෙතුමන්ලා බලයේ හිටියා

[ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා]

නම් කොවිඩ්-19 මර්දන එන්නත්, බෙහෙත් නොවෙයි ගේන්න වෙන්නේ. එහෙම නම්, කොවිඩ් ලෙඩාගේ මිනියෙනුත් හොරා කනවා; රීරි මාංස උරා බොනවා. එහෙම කණ්ඩායමක් තමයි එදා සිටියේ. රටේ වාසනාවට තමයි මෙතුමන්ලාට පාලන බලය හිමි නොවුණේ.

අද අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් කොවිඩ් මර්දන කාර්ය සාධක බලකාය ක්‍රියාත්මක වෙනවා. මෙතුමන්ලා එම කාර්ය සාධක බලකායට බයයි. ඇයි ඒ? මේ මොහොත වන තෙක් මේ සියලු කටයුතු කළමනාකරණය කරමින් මෙතැනට එන්න පුළුවන් වුණේ ඒ ජනාධිපති කාර්ය සාධක බලකාය නිසා. එහි දේශපාලනඥයෝත් ඉන්නවා. අතිගරු ජනාධිපතිතුමා තේ එහි ප්‍රධානත්වය දරන්නේ. වැරදිලා වත් සජිත් ප්‍රේමදාස මැතිතුමා අද මේ රටේ නායකයා වුණා නම් මොකක්ද වෙන්නේ? එහෙම නම් මේ විධියට බෙහෙත් ගැන එක එක කථා කියන්න ගිහිල්ලා, රටට Plaquenil ගහන්න කියලා උපදෙස් දෙන්න ගිහිල්ලා, මේ කියවන කථා නිසා කාර්ය සාධක බලකායට නොවෙයි, කිසිම meeting එකකට කිසිම වෛද්‍යවරයෙක් එන එකක් නැහැ. මේ සියලු කරුණු කාරණා විමසා බලා බුද්ධි අංශයෙන් තොරතුරු අරගෙන, සෞඛ්‍ය අංශයෙන් තොරතුරු අරගෙන ඒ සියල්ල විශ්ලේෂණය කරලා එකින් එකට එකින් එකට මේ ප්‍රශ්න ලිහාගෙන තමයි අපි තීන්දු තීරණ ගන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විපක්ෂය මුලින්ම අපට කිව්වා, බටහිර රටවලින් සහයෝගයක් නැහැ, ඉන්දියාවෙන් සහයෝගයක් නැහැ, එක රටයි සහයෝගය දෙන්නේ කියලා. අන්තිමට මොකක්ද වෙලා තිබෙන්නේ කියා බලන්න. අද අපේ රටට විවිධ පරිත්‍යාග ලැබෙනවා; එන්නත් තොග ලැබෙනවා. අපට කොවිඩ්-19 මර්දන එන්නත් චීනය දුන්නා, ජපානය දුන්නා, ඇමෙරිකා එක්සත් ජනපදයත් දුන්නා, ඉන්දියාවත් දුන්නා. ඒ සියලු රටවල් අපට සහයෝගය දුන්නා. මෙතුමන්ලා බලයේ සිටියා නම්, මොකක්ද වෙන්නේ? මොකුත් ලැබෙන්නේ නැහැ.

සජිත් ප්‍රේමදාස මැතිතුමා ප්‍රකාශ කළා, පරිත්‍යාග ලබා ගැනීම සඳහා තානාපති කාර්යාලවලට කථා කරලා යම් කිසි වැඩ පිළිවෙළක් හදන්න කියලා; ඇලක් එළන්න කියලා. එතුමා දන්නේ නැහැ, මේ වන කොටත් මිලියන 5,000කට වැඩි වටිනාකමකින් යුක්ත විවිධාකාර පරිත්‍යාග අප ලබා ගෙන තිබෙන බව. ඔක්සිජන් ජනනය කරන යන්ත්‍ර, වෛද්‍යවරුන් අඳින ආරක්ෂිත ඇඳුම්, මුව ආවරණ ඇතුළු බොහෝ දේ රටවල් 30කට වැඩි ප්‍රමාණයකින් අපට පරිත්‍යාග කර තිබෙනවා. ඊළඟට එතුමා කිව්වා, පිට රටවල සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සහයෝගයත් ලබා ගන්න කියලා. එතුමා කියන්න දෙයක් නැහැ, අවුරුද්දක කාලයක සිට අපි ඒ සහයෝගය ලබා ගනිමින් ඉන්නේ. රටට ආදරය කරන මිනිස්සු අපිත් එක්ක එකතු වෙලා ඒ කාර්යය කරනවා. එතුමා ඒක දන්නේ නැහැ නේ. රටට ආදරය කරන මිනිස්සු ජනාධිපතිවරණයේදී එතුමාත් එක්ක සම්බන්ධ වුණේ නැහැ නේ. අපත් සමඟයි ඔවුන්ගේ සම්බන්ධකම තිබෙන්නේ. ඒ නිසා තමයි ඔවුන් අපට විවිධ පරිත්‍යාගයන් කරන්නේ. එතුමා කරන්න ඕනෑ ළදරු කථා, වැඩකට නැති කථා කියන එක නොවෙයි. සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඔය කථා කියලා මිනිසුන් නොමඟ යවන්න එපා කියලා. එක පාරක් Plaquenil ගැන කිව්වා. තව පාරක් "Toci" කියලා Tocilizumab එකක් ගැන කිව්වා. එතුමාට තුන්වෙනි එකක් නම් කියන්න දෙන්න එපා, ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමනි. ඉඩ දුන්නොත් එහෙම, ඊළඟට "ලැසී" ගැන කථා කරන්නත් ඉඩ තිබෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you. Next, the Hon. Lakshman Kiriella, please. You have five minutes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I want a clarification -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

You can get it clarified in your own time. You are supposed to speak now.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I want a clarification from the Hon. State Minister before he leaves; රාජ්‍ය ඇමතිතුමාගෙන් මට පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Yes, Hon. Lakshman Kiriella?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මහනුවර ප්‍රධාන කොටගත් කන්ද උඩරට ප්‍රදේශවල ජනතාවට කොවිඩ් දෙවැනි එන්නත ලබා දෙන්නේ කවදා ද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

We should not go for a debate, Hon. Member.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I just want a clarification. I am entitled to that as the Chief Opposition Whip.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ස්පුට්නික් එන්නතේ පළමු මාත්‍රාව ලබාගෙන දෙවැනි මාත්‍රාව ලබා ගැනීමට නියමිත 150,000ක පමණ පිරිසක් මහනුවර දිස්ත්‍රික්කයේ සිටිනවා. සති තුනේ සිට මාස තුන දක්වා, ඒ කියන්නේ දවස් 21 සිට දවස් 90ක කාලයක් දක්වා එම එන්නතේ දෙවන මාත්‍රාව ලබා දෙන්න පුළුවන්. එහිදී අපට යම් ප්‍රමාදයක් සිදු වුණා. ඒකට හේතුව මෙකයි. තමන්ගේ රටේ ඇති වී තිබෙන තත්ත්වය නිසා දෙවන මාත්‍රාවට අදාළ එන්නත් තොග ලබා දෙන්න යම් ප්‍රමාදයක් ඇති වෙනවා කියා රුසියාව අපට දැනුම් දුන්නා. හැබැයි, අපට පසු ගිය සතියේ මාත්‍රා 15,000ක් එව්වා. අපි මේ වන කොට එම ප්‍රමාණය මහනුවරට යවා තිබෙනවා. මහනුවර කුණ්ඩසාලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාසයේ තමයි අපි මුලින්ම මේ එන්නත

දෙන්න පටන් ගත්තේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන දන්නවා. අපි එහිදී දෙවන මාත්‍රාවත් ලබා දීම ආරම්භ කරනවා. ඒ වාගේම මේ සතියේ අග වන කොට අපට තවත් මාත්‍රා 35,000ක් ලබා දෙනවා කියා රුසියාවේ එම ආයතනය දැනුම් දී තිබෙනවා. දවස් 90 ගෙවෙන්න ඉස්සෙල්ලා ඔබතුමාත් නියෝජනය කරන මහනුවර දිස්ත්‍රික්කයේ 150,000ක් වූ එම ජනතාවට දෙවන එන්නත් මාත්‍රාව අපි අනිවාර්යයෙන් ලබා දෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ලබා ගත්තේ ස්පුට්නික් එන්නත වෙන්න ඇති. එහෙම නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ. මම ලබා ගත්තේ, ඇස්ට්‍රාසෙනෙකා එන්නත. Parliament එකෙන් ලබා ගත්තේ.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
බය වෙන්න එපා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම මේ ප්‍රශ්නය අහන්නේ මේ නිසායි. මට වෛද්‍යවරු කිව්වා කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදය තවම මහනුවරට ඇවිත් නැහැ කියලා. එම නිසා දෙවැනි එන්නත දුන්නොත්, අපට එම ජනතාව බේරා ගන්න පුළුවන්.

**ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சன்ன ஜயசுமன)
(The Hon. (Prof.) Channa Jayasumana)
ඔව්, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි. ඩෙල්ටා ප්‍රභේදය රට පුරා පැතිර යනවා. මට හිතෙන විධියට මහනුවර "ස්ටාලින්" ප්‍රභේදය වැඩියෙන් තිබෙන්නත් ඉඩ තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you, Hon. State Minister. The next speaker is the Hon. Vijitha Herath. You have ten minutes.

[අ.භා. 1.57]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කොරෝනා තත්ත්වය හමුවේ අධිකරණ කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස ගෙන ආ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ එකඟතාව තිබෙනවා. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ වන කොට මුළු රටම බරපතළ තත්ත්වයකට ඇද වැටී තිබෙන බව ඔබතුමා ඇතුළු කවුරුත් දන්නවා. එක පැත්තකින් දවස ගණනේ කොරෝනා රෝගීන් සංඛ්‍යාව වැඩි වෙනවා. ඒ වාගේම, මිය යන සංඛ්‍යාවත් වේගයෙන් වැඩි වනවා. පාර්ලිමේන්තුවේ අද සිදු කළ RAT වාර්තා අනුව සේවකයන් 12දෙනෙකු positive වෙලා තිබෙන බව මීට සුළු මොහොතකට කලින් දැන ගන්නට ලැබුණා. ඉතින්, රටේම තත්ත්වය ඉතාම භයානකයි. ඒ නිසා තමයි ආණ්ඩුවේම ඇමතිවරුන්ට, ඇමතිවරියන්ට කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ, "රටේ තත්ත්වය ඉතාම නරක අතට හැරිලායි තිබෙන්නේ. නව ප්‍රභේද පවා ඇති වෙලා තිබෙන්නේ" කියලා. මේ තත්ත්වය සමනය කිරීමේ, මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ ප්‍රධාන වගකීම තිබෙන්නේ රජයටයි. ඒ නිසා තමයි ආරම්භයේ සිට දිගින් දිගටම විපක්ෂය විධියට අපි ආණ්ඩුවට මේ පිළිබඳව අපට තිබෙන අදහස්, අපට තිබෙන විවේචන ඉදිරිපත් කළේ. එමඟින් රට නිවැරැදි මඟට ගැනීම තමයි අවසානයේ බලාපොරොත්තු වන්නේ. "අපි හොඳට කළා. අපි මෙච්චර vaccines ගැහුවා. අරහෙන් vaccines මෙච්චර ආවා. අපි මේච්චර මෙච්චර කරලා තිබෙනවා" කියමින් මේ ගැන තව දුරටත් පම්පෝරි ගහලා නම් මේ ප්‍රශ්නයට උත්තර සොයා ගන්න බැහැ. දැන්වත් ඔය උද්දච්චකම බිමින් තියන්න; පණ්ඩිතකම බිමින් තියන්න. ඔබතුමන්ලා මේ තත්ත්වය සාර්ථකව පාලනය කරලා නැහැ. ඒක පිළිගන්න. එහෙම සාර්ථකව පාලනය කළා නම්, අද රටේ මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයක් ඇති වන්නේ නැහැ. අද මුළු රටම එකම මළ ගෙයක් වෙලා තිබෙන්නේ. ඒ තත්ත්වයට පත් වුණේ ගත යුතු තීන්දු, තීරණ නිවැරැදි වෙලාවට ගත්තේ නැති නිසා. Vaccines ලබා දීම පිළිබඳ තීන්දුව ගන්න තිබුණේ ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ. ඒ වෙලාවේ කිව්වේ අපට vaccines ගෙනෙන්න හදිසියක් නැහැ කියලා. ඒ වෙලාවේ තමයි පැණි මුට්ටියකුත් උස්සාගෙන ගියේ. සුදර්ශන පැණිය තමයි මේකට උත්තරේ කියලා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය ඇමතිවරයා ප්‍රසිද්ධියේ කිව්වා. ඒ ප්‍රකාශය දැන් ආපසු අහන කොට ලජ්ජා හිතෙනවා. එහෙම රාජ්‍ය ඇමතිවරුන්, සෞඛ්‍ය ඇමතිවරුන් සිටින රටක දැන් vaccines ගැන කථා කරන එක විහිළුවක්. විහිළුවක් බවට පත් වෙලා තිබෙන්නේ, තමුන්නාන්සේලාගේ ප්‍රකාශ. හැබැයි, මේකෙන් විපතට පත් වී සිටින්නේ මේ රටේ සාමාන්‍ය ජනතාවයි.

අපි ඉතා පැහැදිලිව දකිනවා, ආණ්ඩුවට අද නිශ්චිත වැඩ පිළිවෙළක් නැති බව. අද එක ඇමතිවරයෙක් එකක් කියනවා. තව දවසකින් දෙකකින් තව කෙනෙක් තව එකක් කියනවා. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊයේ එක දෙයක් කිව්වා; අද වෙන එකක් කියනවා; හෙට තව එකක් කියාවි. මේ කටයුතු පාලනය කරන තැනක් නැහැ. කොවිඩ්-19 මර්දන කාර්ය සාධක බලකායක් තිබෙනවා තමයි. වෛද්‍යවරුන් එතැනට ගිහින් කොච්චර නම් ඉල්ලීම් කළාද? විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය, රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඇතුළු වෛද්‍ය සංගම් වාගේම මේ රටේ ඒ ක්ෂේත්‍ර පිළිබඳ අත් දැකීම් තිබෙන, හසළ දැනුමක් තිබෙන විශේෂඥයෝ උපදෙස් දුන්නා; ලිඛිතව දැනුම් දීම් කළා. ඔබතුමන්ලා ඒ එකක් වත් ඇහුවාද? නැහැ. පසු ගිය අප්‍රේල් මාසය වන විට ම ඉතා පැහැදිලිව අවශ්‍ය දැනුම් දීම් කළා. Lock down කරන නිවැරැදි තීන්දුව ගන්න තිබුණේ, අප්‍රේල් මාසයේ තුන්වන, හතරවන සතියේ. එය නොකිරීම නිසා තමයි "අලුත් අවුරුදු පොකුර" පටන් ගත්තේ. එදා නුවරඑළියේ ගිහින් සැණකෙළි පැවැත්වූවා. සැණකෙළි පවත්වා කොවිඩ්-19 වයිරසය ව්‍යාප්ත වෙන්න ඉඩ හැරියා. ඒවා රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු වුණේ. ඒවා තමයි පාලනය කරන්න තිබුණේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතකොට, උද්ඝෝෂණ පැවැත්වූයේ?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
උද්ඝෝෂණද? ඔබතුමන්ලා උද්ඝෝෂණ ගැන කථා කරනවා. බැසිල් රාජපක්ෂ මන්ත්‍රීවරයා දිවුරුම් දීම හේතුකොට ගෙන රට පුරාම හන්දියක් හන්දියක් ගණනේ, නගරයක් ගණනේ සුබ පැතුම් උත්සව තිබුණා, රතිඤ්ඤා පත්තු කළා. ඒ වාගේම, ප්‍රාදේශීය සභා

[ගරු විජිත හේරත් මහතා]

සභාපතිවරු සෙනඟත් එක්ක හැසිරුණු ආකාරය මුළු රටම දැක්කා. මොනවාද, ඒවාට ගත්ත ඔය කියන පියවර? නාවලපිටිය නගර සභාවේ සභාපති මාරු වෙනකොට නාවලපිටිය නගරය පුරා පෙළපාළි ගියා. ඒවා කොරෝනාවලට හේතු වුණේ නැද්ද? මේක උද්ඝෝෂණ පිටින්ම දාන්නට යන්න එපා. ගුරුවරුන් උද්ඝෝෂණය කළාම ඒ උද්ඝෝෂණ කළ ගුරුවරුන් මේකට හසු කර ගන්න ඔබතුමන්ලා උත්සාහයක් දැරුවා. ඒක ඉතාම ලජ්ජා සහගත උත්සාහයක්. ගුරුවරු 42ක් අත්අඩංගුවට අරගෙන පරීක්ෂා කරලා බැලුවා, එක් අයෙකු හෝ කොරෝනා positive කර ගන්න පුළුවන්ද කියලා. නැහැ, කවුරුත් නැහැ. සියලුදෙනාම negative. ඒ උත්සාහය අසාර්ථක වුණා. ඊළඟට, ඔබතුමන්ලා විවිධ බලපෑම් කරලා මහෙස්ත්‍රාත් උසාවිවල විනිශ්චයකාරවරුන් ගෙන්වලා, ඒ විනිශ්චයකාරවරුන්ට උපදෙස් දුන්නා, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98වන වගන්තිය සහ 106වන වගන්තිය අනුව මේ උද්ඝෝෂණ නතර කරන්න තීන්දු දෙන්න කියලා. පොලීසිය ඉල්ලනවා, මේ උද්ඝෝෂණ නවත්වන්න නියෝග දෙන්න කියලා. හැබැයි, උසාවිවලින් ඒ ඉල්ලීම්වලට ඉඩ දුන්නේ නැහැ. විනිශ්චයකාරවරු ඉතා පැහැදිලිව කිව්වා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14වන ව්‍යවස්ථාවෙන් ආවරණය වන මූලික අයිතිවාසිකම උල්ලංඝනය කරන්නට ඉඩ තියන්න බැහැ, ඒ අයිතිවාසිකම උල්ලංඝනය කරන්නට අවසර දෙන්න සූදානම් නැහැ කියලා. ඊට පස්සේ මොකක්ද කරන්නේ? විධායකය මැදිහත්වෙලා, අධිකරණ සේවා කොමිෂන් සභාව ඉස්සරහට දාලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙක් හරහා දේශනයක් දෙනවා. ඒ දේශනයෙන් මහෙස්ත්‍රාත් උසාවිවල විනිශ්චයකාරවරුන්ට කියනවා, පොලීසිවල ඉල්ලීමට ඉඩ දෙන්න කියලා. දැන් මේ මොකක්ද කරන්න යන්නේ? ඔබතුමන්ලා තුවාලයට බෙහෙත දෙනවා වෙනුවට වෙන වෙන විකාර කරන්නේ. ඒ නිසා තමයි අද මේ ප්‍රශ්නය මේ තරම් වර්ධනය වෙලා තිබෙන්නේ. එම නිසා දැන්වත් ඔය මෝඩ උද්දච්චකම පැත්තකින් තියලා, "අපි තමයි හොඳටම කළේ, මම තමයි හොඳටම කළේ" කියන පරණ කයිවාරුව පැත්තකට දාලා, දැන් මේ රට පත්වෙලා තිබෙන මහා ව්‍යසනකාරී තත්ත්වය, බැරෑරුම් තත්ත්වය හරියට තේරුම් අරගෙන වහාම ක්‍රියාමාර්ග අරගන්න.

අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා මේ මුළු රටම මළ ගෙයක් බවට පත්වෙලා තිබෙන මේ මොහොතේ; විසාලාවක් බවට පත්වෙලා තිබෙන මේ මොහොතේ; රට ව්‍යසනකාරී තත්ත්වයකට පත්වෙලා තිබෙන මේ මොහොතේ, රටේ ජාතික ව්‍යසනකාරී තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්න කියලා. ඒ වාගේම මුළු රටම ජාතික න්‍යාය පත්‍රයකට වැඩ කරන තැනකට ගේන්න. එක් එක් පුද්ගලයන්ට, සංවිධානවලට පැවරෙන වගකීම නිසියාකාරව හඳුන්වා දෙන්න. දේශපාලන පක්ෂවලට තිබෙන වගකීම, රජයේ නිලධාරින්ට තිබෙන වගකීම, පාර්ලිමේන්තුවට තිබෙන වගකීම, සෞඛ්‍ය අංශවලට තිබෙන වගකීම, ගමේ සාමාන්‍ය සිවිල් පුරවැසියන්ට තිබෙන වගකීම නිසියාකාරව බෙදා හැරෙන විධියට වැඩ පිළිවෙළක් හදන්න. ජාතික න්‍යාය පත්‍රයකට අනුව රට අරගෙන යන්න. අද එහෙම ජාතික න්‍යාය පත්‍රයක් නැහැ, නිකම් අයාලෙ යනවා. මුළු රටේම ජනතාව පසුගිය දවස්වල දැක්කා, දවස ගණනේ රෝගීන් 150ක්, 160ක්, 167ක් විතර මැරෙන හැටි. ඒක බලාගෙන ඉන්න බැරිව ඒ ඒ ප්‍රදේශවල මිනිස්සු ස්වයං තීන්දු ගත්තා. අද බොහෝ නගරවල කඩ සාප්පු වහන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. ආණ්ඩුව තීරණ ගන්නේ නැතිකොට, වෙළෙඳ සංගම් හරහා ස්වයං තීන්දු අරගෙන තමන්ගේ ආයතන වහන තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට සුළු මොහොතකට කලින් නවසීලන්තයේ ඩෙල්ටා ප්‍රභේදය ආසාදනය වූ එක් රෝගියෙක් හඳුනාගෙන, එරට අග්‍රාමාත්‍යවරිය මුළු නවසීලන්තයම lock down කරලා තිබෙනවා. එම නිසා පැහැදිලිව මේක තේරුම් ගන්න. Vaccine එක දීපු පමණටම මේක මර්දනය කරන්නට බැහැ. ලෝකයේ කොහේවත් රටවල එහෙම කරලා නැහැ. Vaccine එක උත්තරයක් තමයි, හැබැයි ඒකෙන් විතරක් රෝගය පාලනය කරන්න බැහැ. රෝගය ව්‍යාප්තවීම පාලනය කිරීමේ ක්‍රියාමාර්ග අනිවාර්යයෙන් ගත යුතුයි. අපි ඒවා නිසි කලට ගත්තේ නැහැ; දැන් පරක්කු වැඩියි. පරක්කුවෙලා හෝ දැන්වත් ඒ දේ හරියට කරන්න. ඒක තමයි මම නැවත අවධාරණය කරන්නේ. රටේ ජාතික ව්‍යසනකාරී තත්ත්වයක් තිබෙන බව ප්‍රකාශයට පත් කරන්න. ඒ ව්‍යසනකාරී තත්ත්වයෙන් රට මුදා ගැනීම සඳහා ජාතික න්‍යාය පත්‍රයකට අනුව වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න. විපක්ෂයේ අපි කවුරුත් ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න සූදානම්. මුළු රටම සූදානම්, ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න. බොරු උද්දච්චකම්, මෝඩකම් පැත්තකින් තියලා ඒ වගකීම හරියාකාරව ඉටු කරන්න.

මුළු රටම බලාගෙන හිටියේ කොරෝනා වසංගතය පාලනය කරන්න කැබිනට් මණ්ඩලය දැඩි තීන්දුවක් ගනීවි කියලා. හැබැයි, මොකක්ද පෙරේදා සිද්ධ වුණේ? ඒ මොකක්වත් නොවෙයි. ජනතාව බලාපොරොත්තු වුණේ නැති විධියට ඇමතිවරු කිහිපදෙනෙක් එහාට මෙහාට කළා; මාරු කළා. මොකක්ද මේ කළ විහිළුව? මිනිස්සු බලාපොරොත්තු වුණේ කොරෝනාවලට උත්තරයක්. දුන්නේ කැබිනට් මණ්ඩලයේ මාරුවීමක්.

ඔබතුමන්ලාට මතක ඇති, එදා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීම අරමුණු කරගෙන දවස් 11ක් රට වහන්නේ නැතිව දිග්ගැස්සුවා. එහෙම කරලායි මේ පාර්ලිමේන්තුවේදී විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තේ.

විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි ඉතා පැහැදිලිව කිව්වා, "විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනුවෙන් අද අත ඔසවන ඔබලාගෙන් ඉස්සෙල්ලාම ගොදුරු බවට පත් වෙන්නේ මේ ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු" කියලා. අද ආණ්ඩුවේ ඇමතිවරු ඒ ගොදුරු බවට පත් වෙලා ඉවරයි. පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය එතැනට යනකල් දන්නේ නැහැ, එතුමියගේ අමාත්‍ය ධුරය වෙනස් වනවා කියලා. එතුමිය කිව්වා, "මට හිතා ගන්න බැරි වුණා. මම පුදුම වුණා. මම බලාපොරොත්තු වුණේ නැහැ, මෙහෙම දෙයක්" කියලා. ඇත්තෙන්ම කිව්වොත් එතුමිය පසුගිය කාලය පුරාවට අමාරුවෙන් හෝ උත්සාහයක් ගත්තා, මෙම වසංගතය පාලනය කරන්න. නමුත්, දැන් මොකක්ද වුණේ? ඇමති මණ්ඩලය මාරු කළා. ගුරුවරුන්ට "කාලකණ්ණි" කියපු ඇමතිතුමාට දුන්නා promotion එකක්. සෞඛ්‍ය සේවයේ ඇත්ත තත්ත්වය පෙන්වන්න වාර්තාව ඉදිරිපත් කරන්න ගිය පවිත්‍රා ඇමතිතුමියව අමාත්‍ය ධුරයෙන් ඉවත් කළා. අන්තිමට වෙච්ච දේ මොකක්ද? හිට්ලර් කෙනෙක් වෙන්න ඕනෑ කියපු කෙනාටත් දුන්නා ප්‍රජා පොලීසිය. ගුරුවරුන්ට "කාලකණ්ණි" කියපු කෙනාට දුන්නා, හොඳ අමාත්‍යාංශයක්. ඒ විතරක් නොවෙයි, කුට්ටම අනලා හොඳම කොළේ දුන්නේ, නාමල් රාජපක්ෂ ඇමතිතුමාට. එතුමාට තවත් ඇමතිකමක් දුන්නා. ඒක තමයි මුඛ්‍ය අරමුණ. ඒ වෙනුවෙන් තමයි කුට්ටම ඇනුවේ. කුට්ටම ඇනුවාට වැඩක් නැහැ, කපෝති ගහන්න බැහැ. කුට්ටම අනලා තවමත් ගහන්නේ බූරුවා. ඒ නිසා බූරුවා ගැහිල්ල නවත්වලා, දැන්වත් මේ ව්‍යසනකාරී තත්ත්වයෙන් රට මුදා ගන්න. රට මුදා ගැනීම සඳහා, ජාතික ව්‍යසනකාරී තත්ත්වයක් ප්‍රකාශයට පත් කරලා ජාතික න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කරන්න වහාම මැදිහත් වන්න කියා ඉල්ලා සිටිමින් මා නතර වනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Udayana Kirindigoda. You have seven minutes.

[අ.භා. 2.07]

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

කොරෝනා රෝගය නිසා අධිකරණ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන ප්‍රශ්න ගණනාවකට ප්‍රායෝගික විසඳුමක් ලබා දීමේ එක් පියවරක් විධියට මේ පනත් කෙටුම්පතින් යම් ප්‍රතිපාදන සලසා තිබෙනවා. මේ රටේ ව්‍යාපාරිකයන් සහ මූල්‍ය සමාගම් සමඟ ගනුදෙනු කරන්නන් ඇතුළු සියලු දෙනාට ඇති වී තිබෙන ප්‍රායෝගික අපහසුතා සරල කිරීමටත්, ඔවුන්ට සහනයක් ලබා දීම සඳහාත් මේ ප්‍රතිපාදන ඉවහල් වන බව මා විශ්වාස කරනවා. සමාගම් නීතිය සම්බන්ධව කටයුතු කරපු නීතිඥවරයෙක් විධියට මම දන්නවා, මේ රටේ ව්‍යාපාර කරගෙන ගිය විදේශීය ව්‍යාපාරිකයන්ට මේ කොරෝනා වසංගතය නිසා අඩු තරමින් තමන්ගේ moratorium facility එක අත්සන් කරන්න ලංකාවට එන්න බැරි වුණු බව. එම නිසා ඔවුන්ගේ ව්‍යාපාර අඩපණ වුණා. ඔවුන්ට ඇති වුණු ඒ තත්ත්ව සමනය කිරීමේ මුඛ්‍ය පරමාර්ථයත් ඇතුව තමයි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබුවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කාරණා සම්බන්ධයෙන් කථා කරනවා වාගේම අපට අද විශේෂයෙන් කථා කරන්න සිදුවෙලා තිබෙනවා, කොරෝනා වසංගතයත් එක්ක අද මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව. ඇත්තටම අද මම කථා කරන්න හිටියේ, pandemic එකට වැඩිය infodemic ගැනයි. මේ වාගේ වසංගත අවස්ථාවක සමාජ මාධ්‍ය හරහා, විද්‍යුත් මාධ්‍ය ඇතුළු ජනමාධ්‍ය හරහා ඉදිරිපත් කරන මේ රටේ තොරතුරු එක් එක් පුද්ගලයන්ගේ මතවාද සහ ඔවුන්ගේ දැක්ම තුළින් මේ සමාජය ගිලගෙන ඇති ආකාරයක් අපි දකිනවා. එම නිසා අපේ ජනමාධ්‍ය අමාත්‍යවරයාටත්, සෞඛ්‍ය අමාත්‍යවරයාටත් මෙහිදී විශේෂ වැඩ කොටසක් තිබෙනවා. ඒ තමයි, infodemic මඟින් වැරදි තොරතුරු ජනගත වීම වළක්වා, ඒ තුළින් ඇති වෙලා තිබෙන මානසික ව්‍යාධියෙන් ජනතාව ගලවා ගැනීම.

මීට මොහොතකට කලින් මගේ මිතුරෙකුගෙන් මට පණිවුඩයක් ලැබුණා. ඒක කියවන්න මම ඔබතුමාගෙන් අවසර ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔහු කියා තිබෙනවා, ඔහුත්, ඔහුගේ බිරිඳත් කොවිඩ් වසංගතයට ගොදුරු වී ඉන්නා අවස්ථාවේ මේ රටේ ජනමාධ්‍ය තුළින් හැම දාම ඔවුන් දැක්කේ කොවිඩ් රෝගීන් මරණයට පත් වීම, ඔවුන්ගේ මළමිනී උස්සා ගෙන ගිහිල්ලා ආදාහනාගාර තුළ ආදාහනය කිරීම, ඒ වාගේම මිනිසුන් මැරී වැටෙන ආකාරය වැනි දර්ශන කියලා. ඒ තුළින් ඔවුන්ට ඇති වුණු මානසික පීඩනය ගැන තමයි ඔහු මේ කියන්න උත්සාහ කර තිබෙන්නේ. ඔහු මාව අමතමින් එවපු ඒ පණිවුඩය මම දැන් කියන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. "පුළුවන් නම් මේ සම්බන්ධයෙන් කථා කරන්න. මම කොවිඩ් රෝගියෙක් බවට පත් වෙලා ඉන්න කොට, ලැබුණු අත්දැකීම් මම මේ කියන්නේ. සියයට දෙකක්, තුනක් පමණ තමයි කොවිඩ් හැදිලා hospitalize වෙන්න තරම් අමාරු වෙන්නේ. හැබැයි, උලුප්පා පෙන්වන්නේ මේ සියයට දෙක ගැනයි. හිටපු ගමන් මැරෙන ඒවා, මිනී දමාගෙන යන ඇම්බියුලන්ස්, ඊළඟට තව කොච්චර පෙන්වනවාද, මිනිසුන් භීතියට පත් කරන ඒවා. කොවිඩ් සමඟ ජීවත් වෙන්නට වෙනවා කියන එක නොවෙයි, මේ ගොල්ලන් පෙන්වන්නේ. කොවිඩ් හැදුණාම හිටපු ගමන් හුස්ම හිර වෙලා මැරෙනවා කියන එක මේ ගොල්ලන් සමාජගත කර ඉවරයි. එහෙම මැරෙන්නේ ඉතාම අල්පයක් වුණාට, කොවිඩ් හැදුණු හැම කෙනෙක්ම භීතියට පත් වෙලා ඉන්නේ, මෙන්න මේ කාරණයට. ඒ දීපු mental agony එක නිසා කොවිඩ් හැදුණු දවස්වල මම සහ මගේ wife රෑ නිදා ගත්තේ මාරුවෙන් මාරුවට. කවුරු හරි මැරෙයි කියලා බයේ සිටියේ. ඒක ඒ තරම් මනසට රිංගා තිබෙන්නේ. කොවිඩ් හැදුණු අති බහුතරයකට මේක තදින්ම තිබෙනවා. මේක නොවෙයි, මිනිසුන් දැනුවත් කරනවා කියන්නේ. කෙනෙකුට තර්ක කරන්නට පුළුවන්, මිනිසුන් බය කළාම පරිස්සම් වෙනවා කියලා. නමුත් මිනිහෙක් කැමැත්තෙන් ගිහිල්ලා කොවිඩ් හදා ගන්නේ නැහැ නේ. කොච්චර පරිස්සම් වුණත් පොඩි ඉඩකින් හරි හැදෙනවා. කිසිම කෙනෙක් කථා කරන්නේ නැහැ, කොවිඩ් හැදුණු අයගේ මානසික තත්ත්වය පිළිබඳව. කිසිම මාධ්‍යයක් ඒ ගැන කථා කරන්නේ නැහැ, වචනයක්වත්. ඒ ආපු mental agony එක තවම තිබෙනවා, මට. කිසිම TV news එකක් බලන්නේ නැහැ. පොඩ්ඩක් මේ ගැන හොයා බලන්න. ගොඩක් අය දැන් TV news බලන්නේ නැහැ." මේක තමයි ඔහු මට එවා තිබෙන පණිවුඩය. මේ මානසික ආතතිය ඇති කරන්නට විශේෂයෙන් විපක්ෂයේ දේශපාලනඥයොත් ඉවහල් වුණා කියන එක මම මතක් කරන්න ඕනෑ. මේ රටේ ජනතාවට එන්නත්කරණය පටන් ගන්නකොට, එන්නත්කරණය ප්‍රමාද කරන්නට සමහර එන්නත්වලට විරුද්ධව සමාජය තුළ මතවාද පතුරුවන්නට විපක්ෂය කටයුතු කළ ආකාරය අපට මතකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වෙනකොට මහනුවර දිස්ත්‍රික්කය තුළ එන්නත්කරණයේ පළමු මාත්‍රාව අටලක්ෂ එකොළොස්දහස් හත්සියදහහතර දෙනෙකුට දීලා තිබෙනවා. හැබැයි, අපේ කිරිඇල්ල මැතිතුමා පසුගිය අවස්ථාවක පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, ගලහ, දෙල්තොට ප්‍රදේශයේ බී.ජී. වීරසිංහ කියන තැනැත්තාගේ උප්පැන්න සහතිකය නැති නිසා ඔහුට එන්නත දුන්නේ නැහැ කියලා. හේවාහැට ආසනයේ සංවිධායකවරයා විධියට මම මතක් කරන්න කැමැතියි, දෙල්තොට කොට්ඨාසයේ තමයි ඉතාම හොඳින් එන්නත්කරණය සිදු වුණේ කියන කාරණය. ඒ නිසා මෙවැනි අසත්‍ය ප්‍රචාර පතුරවමින්, වැඩ කරන මිනිසුන්ගේ, වැඩ කරන අපේ නිලධාරීන්ගේ ශක්තිය හීන කරන්නට කටයුතු කරන්න එපා කියා අපි ඉල්ලනවා. ගරු මන්ත්‍රීතුමනි, බී.ජී. වීරසිංහ කියන්නේ තමුන්නාන්සේට තොරතුරු දුන් අනුර කියන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ගෙදර ඉන්නා තැනැත්තා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා තමන්ගේ යුතුකම ඉටු නොකර, අටලක්ෂ එකොළොස්දහස් දෙනෙකුට ලබා දුන් එන්නත, එක තැනැත්තෙකුට දුන්නේ නැහැ කියා පාර්ලිමේන්තුවේදී කියන්නට තරම් නිහීන වීම ගැන මම ඇත්තටම කනගාටු වෙනවා. ජනතාවගේ ජීවිත සුරැකීම සඳහා මේ අවස්ථාවේ තිබෙන එකම සාධාරණ දෙය එන්නත්කරණයයි කියන එක ඔප්පු කරන්නට, ඒකට සහාය දෙන්නට විපක්ෂයට බැරි නම් මම හිතන විධියට ඒක බොහොම කනගාටුදායක තත්ත්වයක්. නමුත් මේ වසංගතය ලෝකය ගිල ගෙන යන තත්ත්වය තුළ අද වනවිට විපක්ෂය සිදු කරන ප්‍රකාශ තුළ, විපක්ෂය සිදු කරන කතිකා තුළ, විපක්ෂය කරන යෝජනා තුළ ඔවුන් යම් සාධනීය තත්ත්වයකට ඇවිත් තිබෙනවා. මීට කලින්

[ගරු උදයන කිරිඳිගොඩ මහතා]

කථා කළ විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ කොවිඩ් වසංගතය කොහොමද වැඩි වෙලා තිබෙන්නේ කියලා. මම එතුමාට කියන්නට ඕනෑ, අගෝස්තු මාසයේ 16 වැනි දා වෙනකොට ඇමෙරිකාවේ දිනක් තුළ කොවිඩ් වසංගතයට ගොදුරුවූවන් සංඛ්‍යාව දෙලක්ෂ පනස්දහස් තුන්සියහැටනවයක් බව. ඒ වාගේම එක්දහස් දහසයක් මිය යනවා. ඒ වාගේම දවස් හතක average එක එක්ලක්ෂ හතළිස්එක්දහස් තුන්සියහැටපහයි; මරණ සංඛ්‍යාව හත්සියහතරයි.

මේක ලංකාවට විතරක් පොදු වුණු දෙයක් නොවෙයි. මේක ලෝක වසංගතයක්; global pandemic එකක්. ඒ ගැන දැනගෙන ඒ අනුව කටයුතු කරන්න. එහෙම කටයුතු කළොත් රටක් විධියට අපට මේකෙන් ගොඩ එන්නට පුළුවන්; ලෝකයට ආදර්ශයක් දෙන්නට අපට පුළුවන්. එහෙම නැතුව හැම තැනකදීම විවේචනය කරමින්, හැම තැනකදීම මේ කරන කටයුතුවලට විරුද්ධව කටයුතු කරමින් සිටියොත් කොවිඩ් වසංගතයෙන් ජනතාවට සහනයක් ලැබෙන්නේ නැහැ. මොකද, ජනතාව කියන්නේ මන්ත්‍රීවරුන් 150ක් එපා කියලා නොවෙයි, 225 දෙනාම එපා කියලායි. ඒ තත්ත්වය නැති කරගන්න නම් අපි එකතු වෙලා කටයුතු කළ යුතුයි කියා මා හිතනවා. ඒ වාගේම මේ වසංගත තත්ත්වය තුළ විපක්ෂයේ කාර්ය භාරය ආණ්ඩුවත් එක්ක එකතු වෙලා කරන්නට අවශ්‍ය ඥානය, ශක්තිය එතුමන්ලාට පැදේවායි කියාත් මා ප්‍රාර්ථනා කරනවා. තිස් අවුරුද්දක් පැවති යුද්ධය අවසන් කරද්දී කළ දෙය මේ අවස්ථාවේදීත් කරන්න එපා කියා අපි එතුමන්ලාට කියනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please wind up.

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
Sir, please give me one more minute.

කොරෝනා වසංගතය පවතින මේ අවස්ථාවේ අධිකරණයේ කටයුතු සම්බන්ධයෙන් වෙනස්ම මානයකින් බලලා, අධිකරණ කටයුතු තාක්ෂණය ඔස්සේ කිරීම සඳහා වන විධිවිධාන ගෙන ඒම සම්බන්ධයෙනුත් අපි ජනතාවගේ පැත්තෙන් හිතලා සහාය දිය යුතුයි. ඒ සම්බන්ධයෙන් ගන්නා ලද තීන්දු - තීරණ සම්බන්ධයෙන් ගරු අධිකරණ අමාත්‍යවරයාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මගේ නම සඳහන් කළා. මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Lakshman Kiriella, you are due to speak next. You have five minutes. So, you can answer him within your own time.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Am I due to speak next?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
All right.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Hon. Lakshman Kiriella. You have five minutes.

[අ.භා. 2.16]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු උදයන කිරිඳිගොඩ මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. එතුමා කිව්වා, එන්නත ලබා නොගත් කෙනෙකුගේ නම සඳහන් කිරීම නිහීන ක්‍රියාවක් කියලා. අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු. අපි ජනතාව වෙනුවෙන් කථා කරන්න ඕනෑ. මම ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමියට කිව්වා, ඒ පුද්ගලයාට එන්නත ලැබී නැහැයි කියලා. මා එතුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය පැය භාගයක් ඇතුළත ambulance එකක් යවලා ඒ පුද්ගලයාට එන්නත ලබා දුන්නා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපේ යුතුකම තමයි ඒ වාගේ අවස්ථා පෙන්වා දීම. ඒක නිහීන ක්‍රියාවක් කියලා මා හිතන්නේ නැහැ.

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු උදයන කිරිඳිගොඩ මහතා**
(மாண்புமிகு உதயன கிரிந்திகொட)
(The Hon. Udayana Kirindigoda)
It is regarding the statement that the Hon. Member made on the speech that I made. I went through all the details after the speech he made on the last day. I got all the information from the officials of that particular area, and I think the Hon. Lakshman Kiriella has been given some false information by his political supporter.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, we do not need to go into a debate. Thank you very much.

Please continue with your speech, Hon. Member.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I brought to the notice of the Hon. Minister about this person. Then, the Hon. Minister (Mrs.) Pavithradevi Wanniarachchi sent a vehicle within half an hour and that person was vaccinated.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත අපි 2005දී පාර්ලිමේන්තුවේ සම්මත කළා. ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව පිහිටුවීම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම, කාර්මික උපදේශක කමිටුවක් පත් කිරීම, ව්‍යසන කළමනාකරණ සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් ඒ විධියට පාර්ලිමේන්තුවේ සම්මත කරපු පනතක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ව්‍යසනයක් ආවාම ඒ සඳහා සොයා බලන්න ජාතික සභාවක් පත් කරන්න ඕනෑ. එහි සභාපතිවරයා වන්නේ අතිගරු ජනාධිපතිතුමායි. ගරු අගමැතිතුමා, විපක්ෂ නායකවරයා, ඇමතිවරු පහළොස්දෙනෙක් සහ ගරු කථානායකතුමා නම් කළ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පස්දෙනෙක් එහි අනෙකුත් සාමාජිකයන් ලෙස ඉන්නවා. දැන් මේ කොරෝනා ව්‍යසනය පටන් අරගෙන අවුරුදු එකහමාරක් වෙනවා. නමුත් ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වූ මෙම සභාව තවම පත් කරලා නැහැ. අද මෙතුමන්ලා නීති ගෙනෙනවා. නමුත් නීති ක්‍රියාත්මක කරන්නේ නැත්නම් ඇති වැඩේ මොකක්ද? කොවිඩ් වසංගතය මේ රටට ඇවිල්ලා දැන් අවුරුදු එකහමාරක් ගතවෙලා තිබෙනවා, ආපදා කළමනාකරණය සඳහා වූ ජාතික සභාව තවමත් රැස් වෙලා නැහැ. අපට කියනවා, අපි උදව් කරන්නේ නැහැ කියලා. නමුත් අපට උදව් කරන්න අවස්ථාවක් ලැබෙන්නේ මෙවැනි ජාතික සභාවක් හරහායි.

ඇත්ත වශයෙන්ම මෙය දේශපාලන විවාදයක් බවට පත්කර ගන්න මා කැමැති නැහැ. නමුත් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා අද උදේ පැහැදිලිව කිව්වා, "අපේ සහයෝගය දෙන්න සූදානම්" කියලා. නමුත් රජයේ යම් යම් කරීකයෝ එය දේශපාලන කථාවක් බවට පරිවර්තනය කළා. මිනිස්සු පාරට බැස්සාය කිව්වා. අපිද ඒ අය පාරට බැස්සුවේ? මැතිවරණයට කලින් කිව්වා, පොහොර නිකම් දෙනවා කියලා. ස්වාභාවික පොහොර භාවිතය අවුරුදු දහයක් ඇතුළත කොටස් වශයෙන් පටන් ගන්නවා කිව්වා. අවුරුදු දහයකදී ස්වාභාවික පොහොර - natural fertilizer - භාවිතයට යොමු වෙනවා කියලායි "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණේ. නමුත්, ආණ්ඩුව මොකක්ද කළේ? රසායනික පොහොර පැය විසිහතරෙන් තහනම් කළා. අපිද මේවා කළේ? ඔබතුමන්ලායි කළේ. අපි නොවෙයි. "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබෙනවා, ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ප්‍රශ්නය විසඳනවා කියලා. අපි ගුරුවරුන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා. ඒකයි අපේ ආණ්ඩුව කාලයේ ඔවුන් නිහඬව හිටියේ. තමුන්නාන්සේලා ඔවුන්ගේ වැටුප් සතයකින්වත් වැඩි කරලා තිබෙනවාද? තමන්ගේ වැරැදි නිසා තමයි මේ දේවල් වෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman)

Hon. Member, you have one more minute.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I will take some more time from the Opposition.

ආණ්ඩුව ඇවිල්ලා පළමුවැනි මාසයේම වැට් බදු සහනය දීලා රුපියල් බිලියන 800ක් නැති කර ගත්තා. අපිද ඒක කළේ? ඒ රුපියල් බිලියන 800 තිබුණා නම් ආණ්ඩුවට මේ සියලු ප්‍රශ්නවලට උත්තර දෙන්න තිබුණා. පොහොර සහනාධාරය පිළිබඳ ප්‍රශ්නයට උත්තරයත්, ඒ වාගේම ගුරුවරුන්ගේ වැටුප් විෂමතා ප්‍රශ්නයට උත්තරයත් දෙන්න තිබුණා. එතැනයි උත්තරය තිබුණේ. මෙතුමන්ලා පළමුවැනි මාසයේදීම රුපියල් බිලියන 800ක් නැති කරගෙන අපට දොස් කියනවා. අපට දොස් කියන්න එපා. ඒ සෑම දෙයක්ම තමන් විසින් ඇති කරගත් දේවල්.

මගේ දුරකථනයෙන් ලබාගත් දත්ත පිළිබඳවත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ආණ්ඩුවේ මන්ත්‍රීවරු කියනවා, දැන් නිකුත් කරන දත්ත වැරැදියි කියලා. මම ඒ අයගේ නම් කියන්න කැමැති නැහැ. දත්ත එන්නේ දවස් තුන හතරක් ප්‍රමාද වෙලා. එන්නත ගහන්න ඕනෑ කියන එක මම නැවත වරක් කියනවා. ඒක හරි. නමුත්, මේ වසංගතයට එකම විසඳුම ඒක නොවෙයි. කොවිඩ්-19 පාලනය කරපු හැම රටක්ම lockdowns හරහා තමයි ඒක කළේ. නවසීලන්තය දිහා බලන්න. Newswire website එක බලන්න. අද නවසීලන්තයේ ඕක්ලන්ඩ් නුවරින් එක් කොවිඩ් ආසාදිතයෙක් හමුවීම නිසා මුළු නවසීලන්තයම වහලා තිබෙනවා. ඒක තමයි අත්තිවාරම. අවශ්‍ය වෙලාවට lock down කරන්න ඕනෑ. ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාට මෙතුමන්ලා දොස් කියනවා. එතුමා තමයි කොවිඩ්-19 පිළිබඳව ඉස්සෙල්ලාම පාර්ලිමේන්තුවට කිව්වේ. එතකොට තමුන්නාන්සේලා කොවිඩ්-19 ගැන අහලාවත් නැහැ. එතුමා ජනවාරි මාසයේ 24වැනි දා කිව්වා Airport එක වහන්න කියලා. ඒ වාගේම, පෙබරවාරි මාසයේ 5වැනිදා කිව්වා Airport එක වහන්න කියලා. ඔබතුමන්ලා ඇහුවාද? එන්නත දෙන්න අවුරුද්දක් ප්‍රමාද වුණා. එම ප්‍රමාදය නිසා තමයි අද අපි වන්දි ගෙවන්නේ.

ගරු අධිකරණ ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, මට ඔබතුමාට කාරණයක් කියන්න තිබෙනවා. මේක කොවිඩ්-19 වසංගතයට අදාළ දෙයක් නොවෙයි. නමුත්, පාස්කු ප්‍රහාරය පිළිබඳව සොයා බැලීම සඳහා පත් කළ ජනාධිපති කොමිෂන් සභාව ගැනයි මම කියන්නේ. ඔබතුමා දන්නවා, එම ජනාධිපති කොමිෂන් සභාවෙන් වාර්තාවක් දුන් බව. එම වාර්තාවේ තිබෙනවා, මෙන්න මේ අයට නීති මාර්ගයෙන් කටයුතු කරන්න කියලා. නමුත්, රජය මොකද කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක අමතක කරලා ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් සමන්විත Cabinet Subcommittee එකක් පත් කරලා එම Cabinet Subcommittee එකට ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අධ්‍යයනය කරන්න කියලා, ඒ අය ලබා දෙන නිර්දේශ අනුව තමයි නඩු පවරන්නේ. එතකොට Cabinet Subcommittee එකට අවශ්‍ය අය බේරනවා, අනවශ්‍ය අයට නඩු දමන්න කියලා නිර්දේශ කරනවා. වර්තමාන අධිකරණ ඇමතිවරයා ලෙස කටයුතු කරන ඔබතුමා ගරු කටයුතු හොඳ නීතිඥ මහත්මයෙක්. ඔබතුමා මේකට මැදිහත් වෙන්න. මේක බලවත් අසාධාරණයක්. පාස්කු ප්‍රහාරය පිළිබඳව ඉස්සෙල්ලාම තොරතුරු දැනගත් අය තමයි ඒකට වග කියන්න ඕනෑ. ඉස්සෙල්ලාම ඒ තොරතුරු ආවේ කාටද? මම ඒ නම් කියන්න කැමැති නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යයනය කරන්න, ඒ පිළිබඳව ඉස්සෙල්ලාම තොරතුරු ආපු අය නිදහස් කරලා, ඊට පස්සේ තොරතුරු ආපු අයට නඩු දමන්න හදනවා. මේක විහිළුවක්. Do not do this. The people who received the information first are responsible because they did not give that to the country. මේ සම්බන්ධයෙන් මැදිහත්වෙලා අවශ්‍ය පියවර ගන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Sisira Jayakody. You have 18 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Ajith Rajapakse to the Chair?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I propose that the Hon. Ajith Rajapakse do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. AJITH RAJAPAKSE *took the Chair.*

[අ.භා. 2.24]

**ගරු සිසිර ජයකොඩි මහතා (දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சிசிர ஜயகொடி - சுதேச வைத்திய முறைகளின் மேம்பாடு, கிராமிய மற்றும் ஆயுர்வேத வைத்தியசாலைகள் அபிவிருத்தி மற்றும் சமூக சுகாதார இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody - State Minister of Indigenous Medicine Promotion, Rural and Ayurvedic Hospitals Development and Community Health)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා වසංගත තත්ත්වය තුළ අධිකරණ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ විධිවිධාන ඇතුළත් පනත් කෙටුම්පතක් අධිකරණ අමාත්‍යතුමා අද දින ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා. අද මේ කොරෝනා වසංගතය ගැන බොහෝ අය කථා කරනවා. විශේෂයෙන්ම අපේ රටේ පිළිගත් වෛද්‍ය සම්ප්‍රදායයන් කිහිපයක් තිබෙනවා, එම වෛද්‍ය සම්ප්‍රදායයන් පිළිබඳව මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

විශේෂයෙන්ම බටහිර වෛද්‍ය ක්‍රමය වාගේම, දේශීය චිකිත්සක ක්‍රමය මඟින් මෙම රෝගය පාලනයටත්, ප්‍රතිකර්ම විමසීමටත් රටක් විධියට දීර්ඝ උත්සාහයක් දරන බව අපි මතක් කරන්න ඕනෑ.

අපේ දේශීය චිකිත්සක ක්‍රමවල අගය, ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ හා පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ අගය දවසින් දවස තහවුරු වෙමින් පවතින බව අපි මතක් කරන්න ඕනෑ. එම නිසාම කොරෝනා වයිරසය පාලනය සම්බන්ධයෙන්, ප්‍රතිකර්ම ක්‍රම සම්බන්ධයෙන් දේශීය චිකිත්සක ක්‍රමත්, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවත් උපයෝගි කර ගැනීමේ විද්‍යාත්මක වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය විධියටත්, ආයුර්වේද දෙපාර්තමේන්තුව විධියටත් සක්‍රිය කාර්ය භාරයක් අපි සිදු කරන බව මෙම ගරු සභාවට විශේෂයෙන් අපි මතක් කර සිටිනවා.

මෙම රෝගය සම්බන්ධයෙන් ඉදිරිපත් වෙලා තිබෙන විද්‍යාත්මක මත, බටහිර වෛද්‍ය විද්‍යාත්මක මත වාගේම, දැනට අවුරුදු 3,000කට පෙර ක්‍රිස්තු පූර්ව හයසියවැනි සියවසයේ දී ලෝකයේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු සුවිශේෂ ග්‍රන්ථය වන සුශ්‍රැත සංහිතාවෙහි සඳහන් කරන කාරණය පිළිබඳවත් අපි දන්නවා. "රෝගී වූවෙකු සමඟ කායික සම්බන්ධතා ඇති කර ගැනීම, ශරීර අවයව ස්පර්ශ කිරීම, ශරීර තරල ස්පර්ශය, රෝගී වූවෙකුගේ ප්‍රශ්වාස වාතය ආඝ්‍රාණය කිරීම, එක්ව හිඳ ආහාර ගැනීම හා බෙදා හදාගෙන ආහාර ගැනීම, එකම පිඟන් කෝප්ප ආදිය භාවිතය, රෝගී වූවෙකු ඉතිරි කරන ලද ආහාර අනුභව කිරීම, එකම ආසනයක හෝ එකම සයනයක ඉඳ ගැනීම හෝ නිදා ගැනීම, මුහුණට මුහුණ හිඳ ගැනීම, ඇඳුම්, ආභරණ, අලේපන පොදුවේ භාවිත කිරීම වැනි දේවල් මඟින් මෙවැනි වසංගත තත්ත්වයක් හමුවේදී එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට මෙවැනි ශ්වසන, ජ්වර බෝවන රෝග බෝවීම් සිදු වෙනු ලැබේ" යන කරුණු එම ග්‍රන්ථයෙහි සඳහන් වෙනවා. එම කරුණු සඳහන් කර තිබෙන්නේ මීට අවුරුදු 3,000කට ඉස්සෙල්ලා අපේ රටේ සහ ලෝකයේ තිබුණු පළමුවැනි ආයුර්වේද ශාස්ත්‍රීය ග්‍රන්ථයේයි. එම නිසා දේශීය චිකිත්සක ක්‍රම සම්බන්ධයෙන් මහා දැනුම් සම්භාරයක් සහිතව එම ග්‍රන්ථයෙහි අදහස් ඉදිරිපත් කර ඇති බව අපට පෙනෙනවා. එම නිසාම ආයුර්වේද දෙපාර්තමේන්තුව විධියට කොවිඩ් - 19 වසංගතය පාලනය කිරීමට ආයුර්වේද රෝහල් පද්ධතිය එකතු කර ගැනීම සඳහා අපි උත්සාහයක් දැරුවා. මේ වන විට ආයුර්වේද රෝහල් 12ක් අප ක්‍රියාත්මක කරන්න පටන් ගෙන තිබෙනවා. විශේෂයෙන්ම පල්ලෙකැලේ ආයුර්වේද රෝහල, නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතන රෝහල, කුරුණෑගල වෙලගෙදර ආයුර්වේද රෝහල, නාරම්මල ආයුර්වේද රෝහල, බෙලිඅත්ත ඩී.ඒ. රාජපක්ෂ ආයුර්වේද රෝහල, කින්නියා ආයුර්වේද රෝහල, කප්පල්තුරේ ආයුර්වේද රෝහල, අඩ්ඩාලච්චේනෙයි ආයුර්වේද රෝහල, පුතුකුඩියිරුප්පු ආයුර්වේද රෝහල, වව්නියාවේ සිද්ධ ආයුර්වේද රෝහල, දියතලාව ආයුර්වේද රෝහල, රත්නපුර පළාත් ආයුර්වේද රෝහල මේ වන විට ක්‍රියාත්මක කරන්න පටන්ගෙන තිබෙනවා. ආයුර්වේද රෝහල් පද්ධතිය තුළ ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව 4,603ක් වෙනවා. අපි නැවත වතාවක් ඉතා සතුටින් මතක් කරනවා, එම රෝගීන්ගෙන් කිසිම රෝගයෙකු මිය ගොස් නැති බව. රෝගියෙකුට යම් සංකූලතාවක් ඇති වුණොත්, ඒ සඳහා බටහිර වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ වෛද්‍යවරු 9දෙනෙකුගේ සහාය මෙම රෝහල් 12ටම අපි යොදාගෙන තිබෙනවා. ඒ කියන්නේ, ඔවුන්ගේ සහායත් අපට ලැබිලා තිබෙනවා. ඒ වාගේම, ආයුර්වේද රෝහල් පද්ධතිය තුළ අපේ දේශීය වෛදකම්, දේශීය ප්‍රතිකර්ම ක්‍රම, ආයුර්වේද බෙහෙත් ලබා දීමට මේ වන විට අප කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන්ම සංකූලතා නිසා ඇතුළත් කරපු රෝගීන් සංඛ්‍යාව ඉතා අල්පයි. අපට අඩු පහසුකම් තිබෙන්නේ. ආයුර්වේද දෙපාර්තමේන්තුවට බොහෝවිට තාක්ෂණික උපකරණ නැහැ, විද්‍යාත්මක උපකරණ නැහැ. විශේෂයෙන්ම ඒ සඳහා යොදා ගන්නා ශිල්පීන්ගේ හිඟයක් පවතිනවා. ඒ අවම පහසුකම් තුළ පවා අපි ඉදිරි සතිය තුළ තවත් ආයුර්වේද රෝහල් 5ක් ඇතුළත් කරලා, අපේ රටේ ජනතාවගේ නිරෝගිකම සඳහා, ජනතාව මේ වසංගතයෙන් මුදා ගැනීමට හැකි ශක්තියක් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ තිබෙනවා නම් එම සියලු ශක්තීන් එකතු කරන්න අප කටයුතු කරනවා. දේශීය චිකිත්සක ක්‍රමය පිළිබඳ විශ්වාසය තබන සුවිශාල ජනතාවක් අපේ රටේ ඉන්නවා. එම නිසා අපි දන්නවා, අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි අපේ රට තුළ එන්නත්කරණ වැඩසටහන ඉතා සාර්ථකව සිදු වෙන බව. අපේ රට තුළ ලෝකයේ අනෙක් රටවලටත් වඩා ශීඝ්‍ර ලෙස

එන්නත්කරණ වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, අපේ දේශීය ඖෂධ භාවිතයත්, ආයුර්වේද ඖෂධ ක්‍රම භාවිතයත් එවැනිම ආකාරයෙන් ජනතාවගේ නිරෝගීභාවයට හේතු වෙලා තිබෙනවා.

පොදු ස්ථානවලට ගමන් කිරීමේදී, එන්නත්කරණයෙන් පසු ලබා දෙන කාඩ්පත -ලේඛනය- අවසර පත්‍රයක් ලෙස භාවිත කළ යුතු බවට යෝජනා කර තිබෙන බව අපි දන්නවා. දේශීය චිකිත්සක ක්‍රමය පිළිබඳව විශ්වාසය තබා කටයුතු කරන මේ රටේ විසිදහසක් පමණ වන ලියාපදිංචි, පාරම්පරික සහ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ හැඳුනුම්පතට, එන්නත ලබා ගැනීමෙන් පසු ලබා දෙන කාඩ් පතට හිමි වලංගුභාවයම -එන්නත ලබා නොගත්තද- ලබා දෙන්න කියා අපි ඉල්ලීමක් කරනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සහ පාරම්පරික වෛද්‍ය ක්‍රමය පිළිබඳ දැනුමක්, විශේෂඥතාවක් ලැබූ, ඒ ප්‍රතිකර්ම ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් ලැබූ සහ දේශීය ප්‍රතිකර්ම භාවිත කරන වෛද්‍යවරුන්ටත් ඒ වරප්‍රසාදය හිමි විය යුතුයි කියා මේ අවස්ථාවේදී අපි ඉතාම ඕනෑකමින් යෝජනා කරනවා.

විශේෂයෙන්ම නිවෙස්වල සිට නිරෝධායනය කිරීමේ කටයුතු අද වනකොට ආරම්භවෙලා තිබෙනවා. නිවෙස්වල නිරෝධායන කටයුතු සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විධියට ප්‍රජා වෛද්‍ය සේවයේත්, පළාත් සභා රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන්ගේත් සහාය උපයෝගී කරගෙන නිශ්චිත වැඩ සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. ප්‍රජා වෛද්‍යවරු දාහක් මේ වෙනුවෙන් කටයුතු කරනවා. හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම වෛද්‍යවරු පස් හයදෙනා බැගින් තෝරා ගෙන, අවම පහසුකම් මැද්දේ මේ කටයුතු සිදු කරගෙන යනවා. ඔවුන්ට කාර්ය මණ්ඩල නැහැ; වාහන නැහැ; දුරකථන නැහැ. එවැනි අවම පහසුකම් මැද්දේ ඒ ප්‍රජා වෛද්‍ය නිලධාරින් ඉතා ප්‍රශංසනීය වූ කාර්ය භාරයක් සිදු කරනවා. දේශීය ඖෂධ නිවෙස්වලටම ලබා දීමේ වැඩසටහනක් ඔවුන් මේ වනවිට ක්‍රියාත්මක කරගෙන යනවා. බස්නාහිර පළාත තුළ මේ කටයුතු ශීඝ්‍ර කර තිබෙනවා. ආසාදිතයන් බහුල ගම්පහ, කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල ප්‍රතිකර්ම ලබා ගැනීමෙන් පසු විවිධ සංකූලතාවලට ගොදුරු වන රෝගීන් ඉලක්ක කරගෙන, දේශීය වෛද්‍ය විද්‍යාත්මක ප්‍රතිකර්ම ලබා දීමේ වැඩ පිළිවෙළක් අපේ ප්‍රජා වෛද්‍ය සේවයේ නිලධාරින් එකට එකතු කරගෙන කරන්න අපි කටයුතු කරගෙන යනවා. ඊළඟට, දිස්ත්‍රික්ක මට්ටමින් සුව ධරණී සුව තොරතුරු සේවාව අපි ආරම්භ කර තිබෙනවා. අපේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල ලබා දෙන ශක්තියට අමතරව, විකල්ප වෛද්‍ය ක්‍රමවල සේවය යොදා ගනිමින් මේ වසංගත රෝග තත්ත්වය හමුවේ මේ රටේ ජනතාවට වඩා කාර්යක්ෂම සේවයක් සැලසීම සඳහා අපි කටයුතු කරනවා.

චීනය, වියට්නාමය, තායිවානය කියන්නේ මේ රෝගී තත්ත්වයෙන් යම් තරමකින් සහනදායී ගමන් මඟකට අවතීර්ණ වෙච්ච රටවල්. ඒ රටවල් අනුගමනය කරන ක්‍රමවේද පිළිබඳව සොයා බලන්න කියා අපි මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. බටහිර වෛද්‍ය ක්‍රමයත්, දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමත් ඒකාබද්ධ වුණු ප්‍රතිකර්ම ක්‍රමවලට ගමන් කිරීම සඳහා වූ වැඩ පිළිවෙළකට අද අපි මේ ආයුර්වේද රෝහල් පද්ධතිය හරහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ රටක් විධියට ඉදිරියේදී ගෙන ගියොත්, මේ වසංගත රෝග තත්ත්වයෙන් මිදීම සඳහා වූ වඩා ශක්තිමත් ක්‍රියා මාර්ගයකට අවතීර්ණ වීමේ හැකියාව අපට ලැබෙනවා.

පළමු කොවිඩ් රෝගියා IDH රෝහලෙන් එළියට බැහැලා, තමන්ගේ බිරිඳට වාගේම දරුවන්ට මේ රෝගය වැලඳුණේ නැහැ කියලා එදා ප්‍රකාශ කළා. පළමු දවසේ සිට නිසි සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කරමින්, දුම් ඇල්ලුවා, දේශීය ඖෂධ පානය කළා කියලා ඔවුන් කිව්වා. අපි අපේ රටේ ජනතාව දැනුවත් කිරීම සඳහා වූ මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කර තිබෙනවා. ලුණු එකතු කරපු උණු වතුරින් උගුර හෝදන නියමය අපේ ආයුර්වේද රෝහල්වල අද සිදු කරනවා. අද බටහිර වෛද්‍ය විද්‍යාව පවා මේවා පිළිගන්න තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අපේ ජනතාවට ඒ දැනුවත් කිරීම් අපි සිදු කරමින් යනවා. ඒ වාගේම උදේ පාන්දර වතුර උගුරු 21කින් දවස ආරම්භ කිරීම, කහ දියර වැනි ස්වාභාවික විෂබීජ නාශක භාවිත කිරීම වාගේම කොහොඹ තෙල් පහන දැල්වීම වැනි ක්‍රම අනුගමනය කිරීම පිළිබඳවත් අපි ජනතාව දැනුවත් කරනවා.

සිද්ධ වෛද්‍ය ක්‍රමය හා සමීපව කටයුතු කරන උතුරේ ජනතාව මේ වසංගතයෙන් මිය යන ප්‍රමාණය අනුපාතිකව අඩු බව අපිට පෙනෙනවා. ඒ ගැන අපි සතුටු වනවා. ඒ වාගේම නැඟෙනහිර පළාතේ මේ රෝගයෙන් අසාධ්‍ය වී මිය යන්නන්ගේ සංඛ්‍යාව අඩුයි. ඔවුන් සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රම සහ කොහොඹ, කහ, පෙරුම්කායම් වැනි පාරම්පරික අත් බෙහෙත් භාවිත කරනවා. ඒ නිසා අපේ රටේ ජනතාව එක් පැත්තකින් එන්නත කරා ගමන් කරනවා වාගේම අනික් පැත්තෙන් දේශීය අත් බෙහෙත්වලට ගමන් කිරීමේ අවශ්‍යතාව පැන නැඟී තිබෙනවා. ඉඟුරු, කොත්තමල්ලි, වෙනිවැල්ගැට, හීන් අරත්ත එකට එකතු කරපු පානයක් අපි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් "සුව ධරණී" කියලා හඳුන්වා දී තිබෙනවා.

වයිරස් සහ බැක්ටීරියා රෝග සම්බන්ධයෙන් ඉඟුරු, කොත්තමල්ලි බෙහෙත වෙනවා. අපේ බටහිර වෛද්‍ය ක්‍රමයේ බොහෝ වෛද්‍යවරු මේ ඖෂධ භාවිත කරනවා. ප්‍රතිකාර කරන රෝහල්වල රෝගීන්ටත් මේ දේශීය ඖෂධ ලබා දුන්නොත් තමයි අපට ඒ රෝගීන් සුවපත් කරන්න හැකියාව ලැබෙන්නේ කියන එක මා ඉතාම ගෞරවයෙන් කියනවා. දැනටත් බටහිර විශේෂඥ වෛද්‍යවරු දේශීය ඔසු පැන් භාවිත කරනවා. ඒකාබද්ධ වෛද්‍ය ක්‍රම වැඩසටහන තුළින් ඒ දේශීය ඖෂධ අපේ රෝගීන් සඳහාත් ලබා දුන්නොත් එම රෝගීන් සුවපත් කළ හැකියි. එවැනි සාම්පල, නියැදි, ආදර්ශ දැනටමත් අපේ රෝහල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වීම අපට සතුටක් බව මතක් කරනවා.

විශේෂයෙන් අපේ පළමු කොවිඩ් රෝගියා එදා ප්‍රකාශ කරපු දේ අපේ රටේ ජනතාව අද අමතක කර තිබෙනවා. ඒ නිසා මැටි මුට්ටියට දෙහි කොළ, බෙලි කොළ, කොහොඹ කොළ, නික කොළ දමා තම්බා දවසට දෙ වතාවක් දුම් අල්ලන්න කියා මේ ගරු සභාවේ අපි මතක් කරනවා. එය, ශ්වසන රෝග සම්බන්ධයෙන් අපේ දේශීය වෛද්‍ය විද්‍යාවේ අන්තර්ගත නිර්දේශිත වූ විද්‍යාත්මක පදනම වනවා. ඒ වාගේම දිවා රාත්‍රී ප්‍රධාන ආහාරයට අමතරව, විශේෂයෙන් ඉඟුරු, සුදු ලූනු, කොත්තමල්ලි අන්තර්ගත ඖෂධ වර්ග ඇතුළත් තැම්බුම් හොද්ද භාවිතයට ගන්න. මේවා බොහොම සරල දේවල්. මේ දේශීය චිකිත්සක ක්‍රමවලින් කවුරුත් මැරෙන්නේ නැහැ.

අපි දන්නවා, පාරම්පරික වෛද්‍යවරුන්ගේ ඖෂධ වර්ග 14ක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සූත්‍ර කමිටුව විසින් අනුමත කර තිබෙන බව. විශේෂයෙන් අපේ රටේ පාරම්පරික දැනුම හිමි සුවිශේෂ වෛද්‍යවරු, ඔවුන්ගේ සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය උපයෝගී කරගෙන සමහර අනුමත නොවුණු ඖෂධ පවා භාවිත කරමින් රෝගීන් දහස් ගණනක් සුවපත් කරන්න කටයුතු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, "සුදර්ශන පැණිය" පස්සේ ගියා කියලා. අපේ චන්න ජයසුමන රාජ්‍ය ඇමතිතුමාට වෙන්න පුළුවන් එහෙම කිව්වේ. හැබැයි, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේත්, කොළඹ විශ්වවිද්‍යාලයේත්

[ගරු සිසිර ජයකොඩි මහතා]

දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ අංශ ඒකාබද්ධව කරන ලද පර්යේෂණ මඟින් විද්‍යාත්මකව තහවුරු වෙලා තිබෙනවා, උණ රෝගය සම්බන්ධයෙන් සහ ළමා රෝග සම්බන්ධයෙන් සුදර්ශන පැණිය ලබා දීම සුදුසුයි කියන එක. ඒ පිළිබඳ පරීක්ෂණ වාර්තා විසි ගණනක් ඉදිරිපත් වෙලා තිබෙනවා කියන එක මේ ගරු සභාවේ අපි ඉතා ඕනෑකමින් කියනවා. මේ රටේ දේශීයත්වයට විපක්ෂය හැම දාම හිනා වුණා. කොටි එක්ක නාඩගම් නටපු, ඊළම දෙන්න ඕනෑ කියලා කොටි එක්ක නටපු, මේ රටේ රණ විරුවන්ට අපහාස කරපු, අපේ දේශීය දේවල්වලට අපහාස කරන, ආණ්ඩු කරන කාලයේත් රට පාවා දීම සඳහා කටයුතු කළ විපක්ෂයකින්, එහෙම කණ්ඩායම්වලින් මේ රටේ දේශීයත්වයට හෝ දේශීය වෙදකමට, එහෙම නැත්නම් මේ රටට වැදගත් යමක් එකතු කරාවි කියා අපි විශ්වාස කරන්නේ නැහැ.

මේ රටේ දේශීය වෛද්‍ය විද්‍යාව තුළ අද තහවුරු වෙමින් පවතිනවා, අපේ රටේ තිබෙන ස්වාභාවික මී පැණි උපයෝගී කරගෙන හදන ඖෂධ වර්ග මේ කොරෝනා රෝගය සම්බන්ධයෙන් අත්දුටු, ප්‍රත්‍යක්ෂ, ප්‍රතිකර්ම ක්‍රම වන බව. නමුත්, අපට ඒ ගැන සායනික වාර්තා නැහැ; විද්‍යාත්මක පර්යේෂණ වාර්තා නැහැ. තිබෙන එකම විද්‍යාත්මක වාර්තාව වෙන්නේ සුව වන රෝගීන් ප්‍රමාණයයි; ගම්වල සුව වන රෝගීන් ප්‍රමාණයයි. ඒ නිසා මේ වසංගත රෝග තත්ත්වය හමුවේ ඒකාබද්ධ වෛද්‍ය ක්‍රමයකට යා යුතුයි කියා අපි විශ්වාස කරනවා.

රටේ සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයම, බටහිර වෛද්‍ය විද්‍යාත්මක, පුළුල් පර්යේෂණාත්මක දැනුමත්, අත්දැකීම් මත අධ්‍යාත්මිකව ආරම්භ වෙලා, ගොඩනඟා ගත් සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය මත පදනම් වෙච්ච දේශීය චිකිත්සක ක්‍රමත් හා ඒකාබද්ධ වුණොත් පමණයි ඒ සඳහා හැකියාව ලැබෙන්නේ. ඒ නිසා ආයුර්වේද රෝහල්වල ප්‍රතිකාර සඳහා ඉදිරිපත් වන බටහිර වෛද්‍යවරුන්ගෙන් අපි ඉතාම ඕනෑකමින් සහ ගෞරවයෙන් ඉල්ලනවා, ඒ කටයුතුවලින් ඉවත් වෙන්නේ නැතුව, ඒ ආයුර්වේද රෝහල්වල සිටින ආයුර්වේද වෛද්‍යවරු විසින් ලබා දෙන ප්‍රතිකර්ම ක්‍රමවලට සහාය ලබා දෙන්න කියා. බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයේ අපි ඉතාම ගරු කරන, මේ රට වෙනුවෙන් අසීමිත කැපවීම් කරන ඒ වෛද්‍යවරුන්ගෙන් අපි ඉතා ඕනෑකමින් ඒ ඉල්ලීම කරනවා. අපි අද කියනවා සෞඛ්‍ය ක්ෂේත්‍රය තෙහෙට්ටුවට පත් වෙලායි තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේක, මේ වෙලාවේ අපේ රටේ සියලුදෙනාට වැදගත් වන කාරණයක්. අපේ දිස්ත්‍රික්කවල ආයුර්වේද රෝහල් තිබෙනවා. අපේ රටේ රෝහල්වල තදබදයක් තිබෙන මේ වෙලාවේ සමහර ආයුර්වේද රෝහල්වල වාට්ටු නිකම්ම තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, නියමිත වැඩසටහනක් හදලා, ඇඳන් වෙන් කරලා ආයුර්වේද රෝහල් මේ වැඩසටහනට යම් විධියකින් සම්බන්ධ කිරීමේ අවස්ථාවක් හදලා දෙන්න ඔබතුමාට බැරිද?

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නය ඇසීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඇත්තෙන්ම මේ වන විට අපි ඒ කටයුතු ආරම්භ කරමින් තිබෙනවා. අපේ ආයුර්වේද රෝහල් පද්ධතිය පරිසරයට නිරාවරණය වෙච්ච විවෘත රෝහල් පද්ධතියක්. ඒ නිසා ඒවා විශේෂයෙන්ම කොවිඩ් රෝගීන්ට සුදුසු පරිදි සකස් කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ, පළමුවන කාරණය. දෙවන කාරණය මේකයි. ඒ සඳහා බටහිර වෛද්‍යවරුන්ගේ නියාමනයක් සකස් කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම ආදී කටයුතු රාශියකට අයත් ක්‍රමවේදයකුත් සකස් කර ගැනීමට තිබෙනවා. ඒ වාගේම, විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහායත් අපට අවශ්‍ය වනවා. ඒ සහාය ලබා ගනිමින් කටයුතු කිරීම සඳහා අපි උපරිම ශක්තිය යොදා ගන්නවා. ඒ නිසා අපි මේ පාර්ලිමේන්තුවේ ගරු මැති ඇමතිතුමන්ලාට, ගරු මන්ත්‍රීතුමන්ලාට විවෘතව ආරාධනා කරනවා, තමන්ගේ ප්‍රදේශවලදී ඊට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියලා.

අපේ රෝහල් පද්ධතිය එතරම් විශාල නැහැ. ඒවායේ ඇඳන් සංඛ්‍යාව සීමිතයි. ඒවාට අවශ්‍ය බටහිර වෛද්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලය යොමු කිරීමේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පවතින තදබදයත් එක්ක ඇති වෙච්ච ප්‍රායෝගික ප්‍රශ්න රාශියක් තිබෙනවා. එහෙත් අපි මේ සටන අත් හැර නැහැ. රට තුළ තිබෙන ආයුර්වේද රෝහල් පද්ධතිය මේ වැඩසටහනට එකතු කිරීම සඳහා අපි උත්සාහ දරනවා. ඒ උත්සාහය යම්තාක් දුරකට සාර්ථක වෙලා තිබෙනවා. ක්‍රමානුකූලව තවදුරටත් අපේ ප්‍රතිකර්ම ක්‍රමය ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපේ අමාත්‍යාංශය මඟින් කරගෙන යනවා.

අවසාන වශයෙන්, ඔබතුමන්ලා සියලුදෙනාටත්, මේ රටේ ජනතාවටත් මම කියනවා දේශීය වෛද්‍ය ක්‍රමය යටතේ ප්‍රතිකාර ලබා ගැනීමෙන්, දේශීය ඖෂධ භාවිත කිරීමෙන් කිසි කෙනෙකුට හානියක් වන්නේ නැති බව. දේශීය ඖෂධ භාවිතය, අපේ පාරම්පරික ජීවන රටාව, ඒ වාගේම අප අනුගමනය කරපු සාම්ප්‍රදායික දැනුම් පද්ධතිය උපයෝගී කරගෙන මේ රෝගී තත්ත්වයෙන් මිදෙන්න ලක්වාසී සියලුදෙනාට හැකි වේවා කියන ප්‍රාර්ථනය මා මේ අවස්ථාවේ කරනවා.

විශේෂයෙන්ම කොවිඩ් වසංගතය නිසා අධිකරණ ක්ෂේත්‍රයේ කටයුතුවලට පැමිණ ඇති බාධාකාරී තත්ත්වයන් මඟ හරවා ගෙන රටේ ජනතාවට සහ අධිකරණ ක්ෂේත්‍රයේ කටයුතු කරන සියලුදෙනාට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා තාවකාලික විධිවිධාන සැලැස්වීම පිණිස මෙවැනි පනත් කෙටුම්පතක් ගෙන ඒම සම්බන්ධයෙන් අපේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.42]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත ගැන තමයි අද අපි බොහෝදෙනා සාකච්ඡා කරන්නේ. මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙවැනිම පනත් කෙටුම්පතක් ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙනවා, "හදිසි මහජන සෞඛ්‍ය" නමින්. එය, නිරෝධායන නීති-රීති, රෙගුලාසි, ඒ වාගේම සෞඛ්‍ය මාර්ගෝපදේශ, වසංගත රෝග සම්බන්ධයෙන් ආණ්ඩුව ගත යුතු නීතිමය ක්‍රියා මාර්ග ආදිය පිළිබඳව සඳහන් කර

තිබෙන පනත් කෙටුම්පතක්. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ඒ පනත් කෙටුම්පතත් වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කරගෙන ඉදිරියට යන්න කියලා. මොකද, දැන් ආණ්ඩුව ක්‍රියා කරන්නේ නිරෝධායන නීති-රීති කිසිවක් නීති හැටියට සලකා නොවෙයි. ඒවා සම්බන්ධයෙන් බොහෝදුරට වෙන යම් බලපෑම් මත ක්‍රියාත්මක වන තත්ත්වයක් තමයි අපට දකින්න ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද තිබෙන තත්ත්වය දිහා බැලුවාම, රට යන මේ ක්‍රමය දිහා බැලුවාම අපට හැම දාම දකින්න ලැබෙනවා, මේ වසංගතය පැතිරීමේ හා ඒ තුළින් සිදු වන මරණ සංඛ්‍යාවේ වැඩි වීමක්. මේ මස 15වන දා කොවිඩ් මරණ 167ක් සිද්ධ වෙලා තිබෙනවා. අද වන කොට සමස්ත මරණ සංඛ්‍යාව 6,263ක් වෙලා තිබෙනවා. ඊයේ දිනයේ ආසාදිතයන්ගේ සංඛ්‍යාව 3,614ක් බව සඳහන් සටහනක් අද ඉදිරිපත් වෙලා තිබෙනවා.

අද වන කොට නවසීලන්තයේ අගමැතිතුමිය නවසීලන්තය සම්පූර්ණයෙන්ම lock down කර තිබෙනවා. ඒ, කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදය ආසාදිත අයෙකු හමු වීම නිසා. අපේ සමාජය තුළ ඩෙල්ටා ප්‍රභේදය ආසාදනය වූවන්ගේ සංඛ්‍යාව එන්න එන්න වැඩි වී ගෙන යන තත්ත්වයක් තමයි දකින්න තිබෙන්නේ. සෞඛ්‍ය බලධාරීන්ගේ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින උදවියගේ අදහස් අනුව පෙනෙනවා, මෙහි ඉතා ශීඝ්‍ර වර්ධනයක් තිබෙන බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා වන කොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සංගමය ඇතුළු සියලු සංගම්වලින් ඇවිත් ආණ්ඩුවට කිව්වා, lockdown එකකට යන්න කියලා. ආණ්ඩුව එක පැත්තකින් කියනවා, සෞඛ්‍ය බලධාරීන් අපට කියනවා නම්, අපි ඒක කරන්න ලැහැස්තියි කියලාත්. නමුත් මේ රටේ සිටින සෞඛ්‍ය විශේෂඥවරුන්, වෛද්‍යවරුන්, ඒ අයගේ සංගම් තමයි කියන්නේ මේ රට තාවකාලිකව lock down කරන්න කියලා. පෞද්ගලික රූපවාහිනී නාලිකාවක ඊයේ තිබුණු වැඩසටහනකදී විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහත්මයා හොඳ පණිවිඩයක් දෙනවා මම දැක්කා. ආනන්ද විජේවික්‍රම මහත්මයා කිව්වා, "සංවරණ සීමා ලිහිල් කරන්න එපා, තත්ත්වය බරපතළ වෙයි කියලා අපි ආණ්ඩුවට කිව්වා" කියා. එතුමා ඊයේ ඒ රූපවාහිනී වැඩසටහනේදී එහෙම කිව්වා. වෛද්‍ය ආනන්ද විජේවික්‍රම කියන්නේ කවුද? එතුමා IDH රෝහලේ සිටින ප්‍රධාන වෛද්‍යවරයෙකු බව අපි දන්නවා. එතුමා කොවිඩ්-19 මර්දනය සම්බන්ධව වැඩ කරන වෛද්‍යවරයෙක්. එහෙම නම්, රජයට වෛද්‍යවරුන් හැමකෙනාම වාගේ දැනුම් දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් කැඳවූ ස්වාධීන විද්වතුන්ගේ කමිටුවේ සාකච්ඡාවක් 2021 අගෝස්තු මාසයේ 10වන දා පැවැත්වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට ලංකාව වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරු 14දෙනෙක් සහභාගි වුණා. ඒ වාගේම, ලෝක සෞඛ්‍ය සංවිධානය වෙනුවෙන් විශේෂඥ වෛද්‍යවරු 16දෙනෙක් සහභාගි වුණා. එහිදී ලංකාව සම්බන්ධයෙන් ලබා දුන් ප්‍රධාන නිර්දේශයක් තිබෙනවා. කෙටි කාලයකට ඇඳිරි නීතිය පනවන්න, එහෙම නැත්නම් lockdown එකකට යන්න කියන නිර්දේශය ආණ්ඩුවට ඉදිරිපත් කළා. කවුද ඒක ඉදිරිපත් කළේ? ඒ ස්වාධීන කමිටුව මඟින්. ඒ කමිටුව ඉන්නේ ලංකාවේ සිටින විශේෂඥ වෛද්‍යවරුන් වාගේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ සිටින විශේෂඥ වෛද්‍යවරුන්. ඒ සියලුදෙනා එකතු වෙලා ගත් තීන්දුව තමයි, එය. ආණ්ඩුවට එය දැනුම් දීලා තිබෙනවා. නමුත්, ආණ්ඩුව කියනවා, "රට වහන්න කියලා වෛද්‍ය උපදෙස් දෙන්නේ නැහැ" කියලා. ආණ්ඩුව ඇවිත් අපට කියනවා, "වෛද්‍යවරුන් කියනවා නම් අපි රට වහනවා" කියලා. එහෙම නම්, මේ කියන ඔක්කොම කොන්දොස්තරවරු ද? මේ උපදෙස් ලබා දෙන්නේ කොන්දොස්තරවරුන් ද කියලා අපට ආණ්ඩුවෙන් අහන්න වෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානයත් සමඟ පැවැත්වුණු ඒ සාකච්ඡාවට ලංකාව පැත්තෙන් සහභාගි වුණු වෛද්‍යවරුන් කිහිපදෙනෙකුගේ නම් මම කියන්නම්. Dr. Palitha Abeykoon, Dr. Nihal Abeysinghe, Dr. Padma Gunaratne, Prof. Neelika Malavige, Prof. Malik Peiris and Dr. Ananda Wijewickrama. මම කිව්වේ, නම් කිහිපයක් පමණයි. ඊළඟට, WHO එක පැත්තෙන් සහභාගි වුණු අය කවුද? Dr. Alaka Singh. එතුමිය ශ්‍රී ලංකාවේ නියෝජිත. තවත් කෙනෙක්, Dr. Paba Palihawadana. එතුමිය ඔබතුමන්ලා ඉවත් කළ, වසංගත රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක්. එතුමිය පසු ගිය කාලයේ කොවිඩ්-19 මර්දන ජනාධිපති කාර්ය සාධක බලකායේ සිටියා. එතුමිය අයින් කරලා දැම්මා. Dr. Paba Palihawadana ලෝක සෞඛ්‍ය සංවිධානයට බැඳිලා ඉන්දුනීසියාවේ නියෝජිතවරිය හැටියට දැන් වැඩ කරනවා. එහෙම නම්, අපට කාරණය වැටහෙනවා නේ. කොහෙන්ද මේ වැරැද්ද සිදු වන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යා ලේඛන ගැනත් මෙහිදී කියැවුණා. ආණ්ඩුව යන පාර වැරැදියි කියලා දැන් ජනතාවට තේරිලා තිබෙනවා. ජනතාවට ඒක තේරුම් ගිය හින්දා තමයි අද ජනතාව කොවිඩ් වසංගතයෙන් බේරීමට ස්වයං පාලනයකට ඇවිත් තිබෙන්නේ. ජනතාව දැන් ස්වයං පාලනයකට ඇවිත් නීති ක්‍රියාත්මක කරනවා; අද හැම නගරයක්ම වසාගෙන යනවා. අද ප්‍රධාන නගරවල තිබෙන වෙළෙඳ සංගම් තීන්දු කරලා තිබෙනවා, වෙළෙඳසැල් වහන්න. ඇයි ඒ? අද ඒ ගොල්ලන්ට තේරිලා තිබෙනවා, 'ආණ්ඩුව යන්නේ වැරැදි පාරක. ඒ හින්දා ආණ්ඩුව යන පාරේ ගියොත් අපිත් විනාශ වෙලා යාවි' කියලා. ජනතාව අද හරි පාරේ යන්න පටන් අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව යන පාරේ නොවෙයි, ආණ්ඩුව යන පාරට ප්‍රතිවිරුද්ධ පාරේ යන්න පටන් අරගෙන තිබෙනවා. ආණ්ඩුවේ ඇමතිවරු කියනවා "කඩවල් අරින්න" කියලා. ආණ්ඩුවේ ඇමතිවරු කියනවා "පාරවල්වලට එන්න" කියලා. ආණ්ඩුවේ ඇමතිවරු කියනවා "සාමාන්‍ය විධියට ජීවත් වෙන්න" කියලා. නමුත්, ජනතාව ඒක පිළිගන්න ලැහැස්ති නැහැ. ආණ්ඩුව කියන මතයට ප්‍රතිවිරුද්ධ මතයක් දරමින් යන්න ජනතාව අද පටන් අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සංඛ්‍යා ලේඛන ගැනත් කියන්න ඕනෑ. මේ සංඛ්‍යා ලේඛන වැරැදියි කියා අපි නොවෙයි කියන්නේ. මේ ආණ්ඩුවේම මන්ත්‍රීවරයෙක් ඇවිත් කියනවා, "සංඛ්‍යා ලේඛන වැරැදියි" කියලා. එතුමා කියනවා "දවසකට ආසාදිතයන් 5,000ක් හමු වුණා. මේ සංඛ්‍යා ලේඛන වෙනස් කරනවා" කියලා. එතුමා කිව්වා, "හමුදාවේ සිටින දෙදෙනෙක් සහ දොස්තරවරයෙක් තමයි මේ සංඛ්‍යා ලේඛන වෙනස් කරන්නේ" කියලා. අපිද මේ ආණ්ඩුව කරගෙන යන්නේ? ජනාධිපතිතුමා තමයි ආරක්ෂක ඇමතිවරයා. ජනාධිපතිතුමාගේ කොවිඩ්-19 මර්දන කාර්ය සාධක බලකායේ තමයි ඒ සියලුදෙනා ඉන්නේ. එහෙම නම් 'එතැනින් තමයි සංඛ්‍යා ලේඛන වෙනස් වෙන්න ඕනෑ' කියන සැකය අද අපටත් ඇති වී තිබෙනවා. දවසකට 200දෙනෙකුට වඩා මැරෙනවා කියන එක ප්‍රායෝගිකව අද සියලුදෙනාම පිළිගන්නා කාරණයක්. ඒ වාගේම, දවසකට 3,000කට වඩා කොවිඩ් ආසාදිතයන් හමු වෙනවා කියන එකත් අද සමාජය පිළිගෙන තිබෙනවා. ඒක පිළිගත්ත නිසා තමයි අද වෙනකොට ජනතාව ස්වයං නිරෝධායනයකට ගිහින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිටපු සෞඛ්‍ය ඇමතිතුමිය කියපු කථාව ගැන කියලා මගේ කථාව අවසන් කරන්නම්. එතුමියගේ අමාත්‍යාංශය මාරු කළාට පසුව එතුමිය සමුගන්නා අවස්ථාවේ කළ කථාවේ දී රජ කෙනෙකු සහ පුරෝහිතයෙකු ගැන කතන්දරයක් කිව්වා. එතුමියගේ කතන්දරය අවසානයේ කිව්වා, රජතුමාට පුරෝහිත කිව්වා ලු, "ඔබතුමා එක්ක මමත් ගියා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නම් මම තමයි බිලි පූජාවට අහුවෙන්නේ" කියලා. මොකක්ද එතුමිය ඒ කිව්වේ? එතුමිය කිව්වේ, ජනාධිපතිතුමාත් එක්ක යන අය තමයි බිලි පූජාවට අහුවෙන්නේ කියන එකයි. ඒක තමයි හිටපු සෞඛ්‍ය ඇමතිතුමිය කිව්වේ. අන්න ඒක හොඳට මතක තියා ගන්න. ඒ නිසා, ජනාධිපතිතුමාත් එක්ක ඉන්න ඔය උදවියට අපි කියන්න කැමැතියි, පරිස්සමින් ඉන්න, තමුන්නාන්සේලා බිල්ලට දෙනවා කියන එකත් හොඳට මතක තියා ගන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගාමිණී වලේබොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබාදීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම කැමැතියි, මට පෙර කථා කළ විපක්ෂයේ මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කරුණුවලට පිළිතුරු දෙමින් මගේ කථාව ආරම්භ කරන්න. එතුමා මේ සභාවට කරුණු ගෙනහැර පාමින්, නවසීලන්තය ගැන කිව්වා; ඕස්ට්‍රේලියාව ගැන කිව්වා. ජනගහනය අතින් බැලුවොත් නවසීලන්තය කියන්නේ වර්ග කිලෝ මීටරයකට මිනිසුන් 18ක් ජීවත් වන රටක්. මේ ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයකට vaccines ලබාදීමේ හැකියාව ඒ අයට ලැබුණේ ඒ රටේ දළ ජාතික නිෂ්පාදිතයේ හා ආර්ථිකයේ ශක්තිමත්භාවය නිසායි. මිලියන 4.9ක් වන සමස්ත ජනගහනයටම vaccines ලබා දෙන්නට ඒ අයට වියදම් කරන්නට වෙන්නේ තමන්ගේ දළ ජාතික නිෂ්පාදිතයේ වටිනාකමින් ඉතාම අඩු ප්‍රතිශතයක්. නවසීලන්තයේ මුළු ජනගහනය මිලියන 4.9යි. අපේ රටේ දැනට vaccines ලබාදීලා තිබෙන ප්‍රමාණයත් මිලියන 13කට වැඩියි. ඒ වාගේම, එතුමා ඕස්ට්‍රේලියාව ගැන කිව්වා. ඒ අයගේ ජනගහනය මිලියන 25යි, දළ ජාතික නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර් 53,000යි, ඒ වාගේම වර්ග කිලෝ මීටරයකට මිනිසුන් 4යි ජීවත් වෙන්නේ. මේ රටවල තොරතුරුත් එක්ක අපේ රට සංසන්දනය කරලා, අපේ රටේ ක්‍රියාවලිය අකර්මණ්‍ය වෙලා තිබෙනවා, එහෙම නැත්නම් රජයට මේ ගැටලුව නිරාකරණය කර ගැනීමට අවශ්‍යතාවක් නැහැ කියලා එතුමන්ලා කියන්නේ කොහොමද? එතුමන්ලා කථා කරන්නේ හරියට අහහරු ලෝකයෙන් ආවා වාගේයි. ලෝක ආර්ථික ව්‍යසනය හමුවේ අපට මුහුණ දෙන්නට සිදුවෙලා තිබෙන තත්ත්වයත් එක්ක රජයක් විධියට හැකියාවේ උපරිමය පාවිච්චි කරමින්, -අඩු පාඩු නැතිව නොවෙයි.- අපි මේ තත්ත්වය කළමනාකරණය කරගෙන යනවා. එතැනදී සෞඛ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්වරයා හරහා, එහෙම නැත්නම් කොවිඩ් -19 මර්දන මෙහෙයුම් කමිටුව හරහා විටින් විට ප්‍රකාශයට පත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස්, නීති රීති, අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව, ඉදිරිපත් වෙන ඇතැම් තොරතුරු හා නිශ්චිත උපදේශන මාලා පිළිබඳව නීත්‍යනුකූලව කටයුතු කිරීමට අයිතිය ලබාදීම සඳහා අධිකරණ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත අපි සම්මත කර ගත යුත්තේ, විනයක් සහිත රටක් නිර්මාණය කර ගැනීමෙන් පමණක් මේ රෝගය පාලනය කර ගැනීමට විශාල සහායක් ලබා දිය හැකිව පවතින නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට lock down කළ යුතු බව කියමින් විපක්ෂය අද කරුණු කාරණා ගණනාවක් ඉදිරිපත් කළා. ඔවුන් කථා කරන්නේ හරියට මේ රජය කොරෝනා රෝගය රටට ගෙනැල්ලා, සමස්ත සමාජයට බෝ කරලා, සමාජයේ ව්‍යාප්ත කරලා, අනතුරුව රෝගය වළක්වන්න කටයුතු නොකර බලාගෙන සිටින විධියටයි. හැබැයි, මම තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නම් පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා මේ වනකොට මේ කථා කරන පෙරටුගාමී සමාජවාදී පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, සමගි ජන බලවේගය සහ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය ඇතුළු තවත් unions කොපමණ උද්ඝෝෂණ ප්‍රමාණයක් මේ රටේ පවත්වා තිබෙනවාද කියලා. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයෙන් මේ රටේ උද්ඝෝෂණ 230ක් පවත්වා තිබෙනවා. පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ නායකත්වයෙන් උද්ඝෝෂණ 45ක් පවත්වා තිබෙනවා. ඒ වගේම සමගි ජන බලවේගයේ නායකත්වයෙන් උද්ඝෝෂණ 185ක් පවත්වා තිබෙනවා. අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය උද්ඝෝෂණ 32ක් පවත්වා තිබෙනවා. වෙනත් වෘත්තීය සමිති උද්ඝෝෂණ 220ක් පවත්වා තිබෙනවා. හඳුනා ගත්, නම් කළ නොහැකි උද්ඝෝෂණ තව 135ක් පවත්වා තිබෙනවා. ඒ උද්ඝෝෂණවලට සහභාගී වී තිබෙන මිනිසුන් සංඛ්‍යාව ගත්තොත්, මිලියන 3.8ක ප්‍රමාණයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙපමණ ජනගහනයක් පාරට බස්සලා මේ රෝගය ව්‍යාප්ත වීමට පාර කපපු, මග හදපු, නායකත්වය දීපු අය අද අහහරු ලෝකයෙන් ඇවිල්ලා වාගේ මෙතැන කථා කරනවා. ඔවුන් කියනවා, "රජය විසින් මේ වසංගතය මර්දනය කරන්නේ නැහැ. රජය ඒ සඳහා ක්‍රියා මාර්ග ගන්නේ නැහැ" කියලා. මිනී විකුණමින් රජයට මඩ ගහන්න, රජයට එරෙහිව විරෝධතා ගොඩ නඟන්න, රජය පෙරළන්න, හදන මෙහෙම නින්දිත කණ්ඩායමක් අපි තවත් දැකලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම තව කාරණයක් කියන්න ඕනෑ. අද වනකොට කොවිඩ් මර්දන ව්‍යාපෘතිය තුළ අඛණ්ඩව ප්‍රයෝජනයට ගන්න පුළුවන් විශාල සම්පත් ප්‍රමාණයක් තවදුරටත් අපි ප්‍රයෝජනයට නොගෙන තිබෙනවා. අපේ ආයුර්වේද ක්ෂේත්‍රය ගත්තොත්, ප්‍රාදේශීය ආයුර්වේද රෝහල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒවා ප්‍රයෝජනයට ගන්නේ නැහැ. දේශීය වෛද්‍ය දැනුම ප්‍රයෝජනයට ගන්නේ නැහැ. හුමාලය ඇල්ලීම, දුම් ඇල්ලීම සුදුසු බව දේශීය වෛද්‍යවරු පවසනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල අපට දැන ගන්නට ලැබුණා බලංගොඩ ප්‍රදේශයේ දේශීය වෛද්‍යවරයෙක් කොරෝනා රෝගය සඳහා ඖෂධයක් සොයාගෙන තිබෙන බව. එය දවස් හතරක් ඇතුළත මේ රෝගය මර්දනය කරන්න පුළුවන් ප්‍රතිකර්මයක්. මේ වනකොට එතුමා නිශ්චිතව හඳුනා ගත් කොවිඩ් රෝගීන්ට එම ප්‍රතිකාරය ලබා දෙනවා. එම කාරණා පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. අපි මේවා ප්‍රයෝජනයට ගන්නේ නැහැ.

අද ලංකාවේ පළාත් සභා සියල්ල අකර්මණ්‍ය වෙලා තිබෙනවා. අපේ පළාත් සභා සතුව රෝහල් පද්ධතියක් තිබෙනවා. ඒවායේ වෛද්‍යවරු සමූහයක් ඉන්නවා. එම පළාත් සභා රෝහල් සක්‍රිය කරලා, එම වෛද්‍යවරුන්ගේ සේවය ලබාගත හැකියි. මොකද රජය විසින් තීන්දුවක් අරගෙන තිබෙනවා, කොවිඩ් රෝගය වැළඳුණු, ඒත් අමාරු තත්ත්වයට පත් නොවුණු රෝගීන්ට නිවෙස්වලම තබා ප්‍රතිකාර ලබා දීමට. ඒ අනුව, වෛද්‍යවරු තෝරාගෙන, ඒ වෛද්‍යවරුන් දැනුවත් කරලා, ඒ වෛද්‍යවරුන්ට රෝගීන් බෙදා දීලා, ජංගම දුරකථනයක් හා SIM පතක් ලබා දීලා, ඒ අයට අවශ්‍ය උපදෙස් ටිකත් ලබා දෙන ක්‍රමවේදයක් ග්‍රාමීය රෝහල් පද්ධතිය පාවිච්චි කරමින් ක්‍රියාත්මක කරන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු ගාමිණී වලේබොඩ මහතා**
(மாண்புமிகு காமினி வலேபொட)
(The Hon. Gamini Waleboda)
මේ කාරණයත් කියලා මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි කැමැති වුණත්; අකමැති වුණත්, කොරෝනා වයිරසය විසින් අප සියලු දෙනා ගිල ගනිමින් පවතින බව සත්‍යයක්. එයට බිලි වෙන්නේ, විපක්ෂයේ අය වෙන්න පුළුවන්; ආණ්ඩු පක්ෂයේ අය වෙන්න පුළුවන්; සාමාන්‍ය ජනතාව වෙන්න පුළුවන්; මහා ධනපතියෝ වෙන්න පුළුවන්. ඒ නිසා එකිනෙකාට ගල් ගසා ගැනීමෙන්, බැණ අඬගසා ගැනීමෙන් හා චෝදනා කිරීමෙන් තොරව ජනතාව දැනුවත් කරමු. මේ වසංගතයෙන් ජනතාව බේරා ගන්න අපත් සමඟ එක් වන්න කියලා විපක්ෂයෙනුත්, දොස් නඟන අනෙකුත් කණ්ඩායම්වලිනුත් ඉල්ලා සිටිමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.59]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. අපේ ගරු අලි සබ්රි ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කරුණු කාරණා කීපයක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

මට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "මේ රටේ මිලියන 3.8ක් මේ ආණ්ඩුවට විරුද්ධව පාරට බැහැලා තිබෙනවා" කියලා. ඒ කියන්නේ, ලක්ෂ 38ක් පාරට බැහැලා. මේ රට අද හොඳින් පාලනය කරනවා නම්, එතුමන්ලා කියන විධියට එතුමන්ලා නම් හොඳටම ආණ්ඩු කළේ, ලක්ෂ 38ක් කොහොමද පාරට බහින්නේ? මේක තමයි අද අපි අහන්නේ? විපක්ෂයේ අපට මේ රටේ ජනතාවගෙන් ලක්ෂ 38ක් පාරට බස්සන්න බැහැ නේ. අද කවුරු මොනවා කිව්වත්, "අපි තමයි හොඳට රට කරවන්නේ" කිව්වත්, ඒකෙන්ම පෙනෙනවා රට හොඳට කරනවාද, නැද්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අලුත් අවුරුදු කාලයේ ඇති වුණු කොවිඩ් රැල්ලත් එක්ක මේ වනවිට ලක්ෂ ගණනක් කොවිඩ් ආසාදිතයන් බවට පත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රිජ්වේ ආර්යා ළමා රෝහලේ මේ වනවිට කොවිඩ් ආසාදිත පුංචි ළමයින් 150 දෙනෙකු විතර සිටිනවා. කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදයට වයස් සීමාවක් නැහැ. අද වනවිට පුංචි දරුවන් පවා ආසාදිතයන් බවට පත් වෙලා තිබෙනවා. "එන්නත්කරණය අපි හොඳට කළා" කිව්වාට, රටේ සමස්ත ජනගහනයත් එක්ක ගත්තාම, සියයට 18කට වාගේ තමයි මාත්‍රා දෙකම ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ එන්නත ලබා දීමේදී පළමුවැනි මාත්‍රාව ලබා දීලා - [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබෙන කාලය මට ඕනෑ. මොකද, මට තිබෙන්නේ සීමිත කාලයක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සියයට පනහකට වැඩි පිරිසකට එන්නත් මාත්‍රා දෙකම ලබා දීලා තිබෙනවා. ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීමක්]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
අපි කියන්නේ මාත්‍රා දෙකම ගැන. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, මාත්‍රා දෙකම - [බාධා කිරීමක්] නැහැ. මාත්‍රා දෙකම එහෙම දීලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, කලබල වෙන්න එපා. අපි කියන්නේ මාත්‍රා දෙකම ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එන්නතේ පළමුවැනි මාත්‍රාව ලබා දීලා මාසයක් ඇතුළත දෙවැනි මාත්‍රාව ලබා දුන්නොත් තමයි කෙනෙකු රෝගී -ආසාදිත- වුණත් එම එන්නතේ තිබෙන බලය නිසා එම තැනැත්තාට රෝගය සමඟ සටන් කරන්න පුළුවන් වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මට විනාඩි හයක කාලයක් වෙන් වෙලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

වයස අවුරුදු 60ට වැඩි අයට එන්නත ලබා දීම තුළින් තමයි එන්නත්කරණය මුලින්ම පටන් ගත්තේ. එසේ පටන් ගත් එන්නත්කරණය වයස අවුරුදු 30ට වැඩි අය සඳහාත් ක්‍රියාත්මක කළේ තරුණ අයත් මැරෙන්න පටන් ගත්තාට පසුවයි. කොළඹ ඉසිපතන විද්‍යාලයේ ඉගෙන ගත් තරුණ දරුවෙකු රෝහලේදී මිය ගොස් තිබෙනවා. ඔහුගේ වයස අවුරුදු 18යි. ඒ නිසා පාසල් යන වයසේ දරුවනුත් එන්නත්කරණය කිරීම දැන්වත් ආරම්භ කරන්න කියා මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට කොළඹ මහ රෝහලේ කොවිඩ් රෝගීන් 600 දෙනෙකු පමණ ප්‍රතිකාර ලබනවා. ඒ 600 දෙනාගෙන් සියයට 50කට පමණ මේ වනවිට ඔක්සිජන් ලබා දීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එන්නත් මාත්‍රා ගෙනෙන්න පරක්කු වුණා වාගේ ඔක්සිජන් ගෙනෙන එකත් පරක්කු වුණොත් මේ රෝගය මර්දනය කරගනිමින් අපට ඉස්සරහට යන්න බැරි වෙනවා. ඒ නිසා මේ රටේ සිටින රෝගීන්ට අවශ්‍ය ප්‍රමාණයට ඔක්සිජන් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ මේ වනවිට කොවිඩ් රෝගීන් 4,805 දෙනෙකු සිටිනවා. ඒ අතර කුඩා දරුවන් 204 දෙනෙකු සිටිනවා. මේ වනවිට එම දිස්ත්‍රික්කයේ කොවිඩ් මරණ 70ක් සිදු වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න, මම කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ කොවිඩ් පළමුවැනි එන්නත් මාත්‍රාව ලබා ගත් ප්‍රමාණය සියයට 95ක් වෙනවා. හැබැයි, එන්නත් මාත්‍රා දෙකම ගත් ප්‍රමාණය සියයට 11යි. එසේ පළමුවැනි මාත්‍රාව පමණක් ලබා ගත් අයට මේ මාසයේ 23 වැනි දා වනවිට එන්නත ලබා ගෙන මාසයක් කල් පිරෙනවා. ඒ නිසා අපේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනතාවට මේ වනවිට එන්නත් එක්ලක්ෂ විසිපන්දහසක අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අවශ්‍ය වන එන්නත් මාත්‍රා ප්‍රමාණය මේ මාසයේ 23වැනි දා වනවිට ලබා දුන්නොත් අපට සියයට 95 ඉලක්කයට යන්න පුළුවන් වෙනවා, එන්නත් මාත්‍රා දෙකම ලබා දීලා. ඒ නිසා එම මාත්‍රා ප්‍රමාණය ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තව එක කාරණයක් සඳහන් කරන්න කැමැතියි. මුළු ලංකාවම ගත්තොත්, මේ වනවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමයි වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් රඳවා ගැනීමේ හැකියාව ඇති මධ්‍යස්ථාන තිබෙන්නේ. එවැනි මධ්‍යස්ථාන හයක් අපේ දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. හැබැයි, එවැනි පහසුකම් මොනවා තිබුණත්, අපිට ICU පහසුකම නැහැ. ඒ ICU bedsවල තිබෙන අඩු පාඩුව මහ හරවා, අඩුම ගණනේ වැලිකන්ද රෝහලටවත් ඒවා ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු එච්. නන්දසේන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.04]

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය ලංකාවට පමණක් ආවේණික වුණු රෝගයක් නොවෙයි. අද වනවිට එය ලෝකය පුරාම ඉතාම තදබල ලෙස ව්‍යාප්ත වෙලා තිබෙනවා. නමුත් සමහර අය කථා කරද්දී පෙන්වන්න උත්සාහ කරනවා, මෙම රෝගය ලංකාවේ අයට පමණක් හැදිලා, ලංකාව විතරක් ගිල ගෙන තිබෙන රෝගී තත්ත්වයක් විධියට.

අද වනවිට ලංකාවේ කොවිඩ් රෝගීන් තුන්ලක්ෂ හැටදෙදහස් හැත්තෑහතරක් හඳුනාගෙන තිබෙනවා; මිය ගිය සංඛ්‍යාව හයදහස් දෙසිය හැටතුනයි. ලෝකයේ තත්ත්වය බැලුවාම, විසිකෝටි හැත්තෑනව ලක්ෂ අසූහතරදහසකට වැඩි රෝගීන් සංඛ්‍යාවක් හඳුනාගෙන තිබෙනවා; හතළිස්තුන්ලක්ෂ හැත්තෑහතරදහසකට වැඩි සංඛ්‍යාවක් මිය ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ, ඉතාම බරපතළ තත්ත්වයක්. අද මේ කොවිඩ්-19 රෝගය ලෝකය පුරාම ව්‍යාප්ත වෙලා තිබෙනවා. මේ තත්ත්වය පාලනය කිරීම සඳහා රජය ගෙන යන උත්සාහය පිළිබඳව අපි හිතලා බලන්න ඕනෑ. එක එක්කෙනාට ඕනෑ මතයක් ප්‍රකාශ කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ මේ තිබෙන්නේ, කැනඩාවේ ජීවත් වන ආචාර්ය නිමල් රාජපක්ෂ මැතිතුමා විසින් පසුගිය දවස්වල ලෝකයේ කොරෝනා තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන ප්‍රසිද්ධියට පත් කළ වාර්තාවක්. ඒ වාර්තාව අනුව ලෝකයේම ජනගහනයෙන් දස ලක්ෂයකට මිය යන සාමාන්‍ය සංඛ්‍යාව පන්සිය තිස්හතරයි. හැබැයි, බ්‍රිතාන්‍යයේ දස ලක්ෂයකට මිය යන සංඛ්‍යාව එක්දහස් අටසිය අනූවක්. ඇමෙරිකාවේ එය එක්දහස් අටසිය අසූදෙකක්. ප්‍රංශයේ ඒ ප්‍රමාණය එක්දහස් හත්සිය හයක්. ඉන්දියාවේ දස ලක්ෂයකට තුන්සිය දෙකක් මිය යනවා. හැබැයි, ලංකාවේ මිය යන්නේ දස ලක්ෂයකට එකසිය අසූඅටයි. ඒ කියන්නේ මුළු ජනගහනයෙන් නොවෙයි, දස ලක්ෂයකට මිය යන සංඛ්‍යාව. දස ලක්ෂයක කණ්ඩායමක් හැටියට ගත්තාම මිය යන සංඛ්‍යාව එකසිය අසූඅටයි. ඒ අනුව ගත්තාම, අපේ රටේ කොවිඩ් මරණ සංඛ්‍යාව ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ.

එන්නත් කිරීම ගැනත් මම කියන්න ඕනෑ. එන්නත් කිරීම ගත්තාම, ලෝකයේ දසලක්ෂයකට එන්නත් කර තිබෙන සංඛ්‍යාව විසිහතයි. අපේ රටට වඩා ඉහළ මට්ටමේ එන්නත්කරණයක් තිබෙන රටවල් තිබෙනවා. එන්නත්කරණය ඉහළ මට්ටමක පවත්වාගෙන යන රටවල් තිබෙනවා. හැබැයි, පාකිස්තානය ගත්තාම දසලක්ෂයකට එන්නත් කරලා තිබෙන්නේ හයදෙනයි. තායිලන්තයේ දසලක්ෂයකට දහහත්දෙනයි එන්නත් කරලා තිබෙන්නේ. ඉන්දියාවේ විසිහතරදෙනායි. හැබැයි, ලංකාවේ දසලක්ෂයකට තිස්දෙනෙක් එන්නත් කර තිබෙනවා. ඒ අනුව ලංකාවේ ඉතාම ඉහළ මට්ටමක එන්නත්කරණයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අසත්‍ය දේවල් ප්‍රකාශ කරන්න එපා.

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
මා ළඟ තිබෙන මේ වාර්තාවේ ඒ විස්තර තිබෙනවා. [බාධා කිරීම්] කොවිඩ්-19 වසංගතය පිළිබඳ දත්ත පදනම් කරගෙන ආචාර්ය නිමල් රාජපක්ෂ මහත්මයා විසින් සකස් කරන ලද මෙම වාර්තාව මා **සභාගත*** කරනවා. [බාධා කිරීම්]

මේක, ලෝකයේම එන්නත්කරණය පිළිබඳව සකස් කරන ලද වාර්තාවක්. [බාධා කිරීම්] ආචාර්ය නිමල් රාජපක්ෂ මහත්මයා කැනඩාවේ සිට ලෝකයේ- [බාධා කිරීම්] මගේ වෙලාව ගන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එන්නත් කරලා තිබෙනවා කිව්වේ, මාත්‍රා දෙකමද, එකක්ද?

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
එක මාත්‍රාවයි. දෙකම දීලා ඉවර නැහැ නේ. නමුත් අද රෝගීන් හඳුනා ගන්නා ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ රටේ තිබෙන ප්‍රශ්නය ඒකයි. රෝගීන් වැඩි වීමට හේතුවන කාරණය තමයි හොයා ගන්න තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔය ගණන් හදලා දීලා තිබෙන්නේ අන්දරේ.

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
අන්දරේ නොවෙයි, අන්දරේගේ බාප්පා.

ඒක තමයි මේ රටේ තිබෙන ප්‍රශ්නය. ඒක ඉතාම පැහැදිලි කාරණයක්. ගෝලීය ආර්ථික තත්ත්වයත් එක්ක බැලුවාම එක පැත්තකින් අද අපේ අපනයන ආදායම අහිමි වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, අද සංචාරක කර්මාන්තය බිඳ වැටිලා තිබෙනවා. සංචාරක කර්මාන්තයෙන් ලැබුණු ආදායම අහිමි වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ තමයි මේ ආණ්ඩුව කටයුතු කරගෙන යන්නේ. හැබැයි, මේ වසංගතයට වැට බඳින්න තිබුණේ අද නොවෙයි, රෝගය රටට ඇතුළු වුණු වෙලාවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතකොට අපේ ආණ්ඩුවක්ද තිබුණේ?

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)
ඒක තමයි මම මේ කියන්න හදන්නේ. [බාධා කිරීම්] ඒක තමයි මේ කියන්න හදන්නේ. රෝගය මේ රටට ඇතුළු වනකොට අපේ ජනාධිපතිතුමා බලයට පත් වෙලා ඉතාම කෙටි කාලයයි. ජනාධිපතිවරයාගේ වගකීම තමයි- [බාධා කිරීම්] කථාව අහගෙන ඉන්න. ජනාධිපතිවරයාගේ වගකීම තමයි, ශක්තිමත් ආණ්ඩුවක් හදා ගැනීම. ශක්තිමත් ආණ්ඩුවක් හදා ගන්නේ කොහොමද? ඡන්දයක් තියන්න පුළුවන් වුණාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපති ධුරයේ තිබෙන බලය ඉවත් කරලා තිබුණා. එතකොට ආණ්ඩුවක් හදන්න බැහැ. [බාධා කිරීම්] අහගෙන ඉන්න. ආණ්ඩුවක් හදන්න බැහැ. ආණ්ඩුවක් හදන්න බැරි නිසා- [බාධා කිරීම්] කථාව අහගෙන ඉන්න. පාර්ලිමේන්තුව තුළ සුළුතර ආණ්ඩුවක් හදා ගත්තා. [බාධා කිරීම්] මුදල් ඕනෑ. රුපියල් පන්දහස ගණනේ ගෙවන්න, රුපියල් දසදහස ගණනේ ගෙවන්න විශාල මුදලක් ඕනෑ. ආයතන වහන්න වෙන නිසා රුපියල් මිලියන ගණනක මුදල් අනුමත කර ගන්න අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළා, අපේ සුළුතර ආණ්ඩුව. හැබැයි, එදා විපක්ෂයේ හිටපු කට්ටිය මොකක්ද කළේ? අපේ සුළුතර ආණ්ඩුව අතුරු සම්මත ගිණුම පිළිබඳ ගෙන ආ ඒ යෝජනාව පරද්දලා, නැවතත් දේශපාලන පිම්මක් පනින්න ලැහැස්ති වුණා. ඒ නිසා එදා ඒ අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් ගෙන එන ලද යෝජනාව සම්මත කර ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ අනුව ජනාධිපතිතුමාට ඊළඟට කරන්න තිබුණු එකම ක්‍රියාමාර්ගය තමයි මහ මැතිවරණයකට ගිහිල්ලා ආණ්ඩුවක් හදා ගැනීම. මහ මැතිවරණය පවත්වනවා කිව්වාම මේ කෑගහන අය ඔක්කෝම එකතු වෙලා ඡන්දයක් පවත්වනවාට විරුද්ධව කථා කළා. ඊට පස්සේ අධිකරණයට ගියා. ඒ අය ඔක්කෝම එකතුවෙලා අධිකරණයට ගිහිල්ලා ඡන්දය කල් දමනවා, කොරෝනා රට ඇතුළට එනවා. එතකොට, කොරෝනා වසංගතය ගේන්න අවස්ථාව හැදුවේ කවුද? මේ කෑ ගහන විපක්ෂයේ සිටින කට්ටිය තමයි ඒ අවස්ථාව හැදුවේ. ඒ කට්ටියට කියන්න හොඳ වචනයක් තිබෙනවා.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ටිකක් කියලා තමයි කියන්න වෙන්නේ. ඒ නිසා තමයි කොරෝනා වසංගතය රට අභ්‍යන්තරයට එන්න පටන් ගත්තේ.

එදා ඡන්දය නියමිත දිනයේ පවත්වන්න නියම කළා. හැබැයි, ඡන්දය තියන්න දෙන්නේ නැතිව නඩු දැම්මා. ඡන්දය තවත් කල් ගියා. ඡන්දය කල් යන්න යන්න කොරෝනා වසංගතය පැතිර ගියා. ඒකයි වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ රටේ එන්නත්කරණය ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා. අනෙක් රටවල් එක්ක ගත්තාම රටේ කොවිඩ් මරණ සංඛ්‍යාව ඉතාම පහළ මට්ටමක තිබෙන්නේ. හැබැයි, අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, ඒ තත්ත්වය තුළ රට ඉස්සරහට ගෙනියන්න අපි උත්සාහ කරනකොට අනෙකුත් සියලු කාරණා සම්බන්ධයෙන් නම් කථා කරනවා. පොහොර ගැන කථා කළා, පාසල් ගැන කථා කළා. ඊළඟට කට්ටිය අරගෙන පාරට ඇවිල්ලා රැස්වීම් තියනවා. එවැනි රැස්වීම් 847ක් පවත්වා තිබෙනවා. ඒ විධියට, මේ අය ලක්ෂ ගණනක් ජනතාව පාරට දාලා කොරෝනා බෝ කරන්න කටයුතු කළා. ගුරුවරු නොවෙයි ඒක කළේ. ගුරුවරුන්ගේ පඩි වැඩි කරන්න කියන තැන මමත් ඉන්නවා. මමත් 1975 දී ඔය වෘත්තිය කළා. ඒ කාලයේ පඩිය විධියට ලැබුණේ රුපියල් 225යි. එම නිසා අපි කියනවා, ගුරුවරුන්ගේ පඩිය අනිවාර්යයෙන්ම වැඩි කරන්න ඕනෑ කියලා. ඒක නොවෙයි ප්‍රශ්නය. සියලු ම කාරණා සම්බන්ධයෙන්; ඒ කියන්නේ කන්න නැහැ කිව්වාම ඒ කට්ටියත් අරගෙන එනවා, වතුර නැහැ කිව්වාම, ඒ කට්ටියත් අරගෙන එනවා, පොහොර නැහැ කිව්වාම ඒ අයත් පාරට අරගෙන එනවා. එක්සත් ජාතික පක්ෂයයි, ජනතා විමුක්ති පෙරමුණයි එකතුවෙලා තමයි මේ විධියට කටයුතු කරන්නේ. එම නිසා අපි කරන එකම ඉල්ලීම තමයි,- [බාධා කිරීමක්] බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 3.12]

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ අපි යමක් තේරුම් ගන්නට අවශ්‍යයි. තේරුම් ගැනීමට අවශ්‍ය කාරණය මෙකයි. අපේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න ඕනෑ, රටේ ඇතිවෙලා තිබෙන සැබෑ තත්ත්වය මොකක්ද කියලා. අපි පක්ෂ හැටියට බෙදිලා, ජාති හැටියට බෙදිලා, ආගම් හැටියට බෙදිලා කොරෝනා වයිරසය මර්දනය කරන්න උත්සාහ ගන්නවා නම් මතක තියාගන්න, කොරෝනා විසින් අපිව මර්දනය කරන බව. දැන් මේ කථා අහනකොට අපට මොකක්ද හිතෙන්නේ? ආණ්ඩු පක්ෂය කියනවා, "අපි තමයි හරියට කළේ. අපි තමයි හොඳට කළේ" කියලා. විපක්ෂය කියනවා, "නැහැ, ඔබතුමන්ලා මේ මේ වැරදි දේවල් කළා" කියලා. හැබැයි, මතක තියාගන්න, අපි තවම බෙදිලා ඉන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ගරු අලි සබ්රි ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. එතුමාට තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහන්න පුළුවන්, අපි ජාතින් හැටියට බෙදිලා හිටියේ නැද්ද කියලා. කොවිඩ්-19 ආසාදිත මරණ වුණාම භූමදානය කරන්න නොදී ආදාහනය කරමින් මේ ගොල්ලෝ මොන තරම් සෙල්ලමක් දැම්මාද? දැන් අපි ආණ්ඩුවෙන් අහනවා, ඒ ප්‍රශ්නයට මොකද වෙලා තිබෙන්නේ? දැන් බලන්න, ඒ විධියට ජාතීන් හැටියට මේ රට බෙදුවා, පක්ෂ හැටියට බෙදුවා, ආගම් හැටියට බෙදුවා. ඒ විධියට කොරෝනා මර්දනය කරන්න අපට පුළුවන්ද?

විශේෂයෙන්ම රටේ ඇතිවෙලා තිබෙන කොරෝනා වසංගතයේ සත්‍ය තත්ත්වය අපි දැනගන්නට අවශ්‍යයි. විශේෂඥවරු මොකක්ද කියන්නේ? "Sri Lanka is showing a rapid increase in daily reported number of cases and deaths. Bed occupancy rates at all levels of care facilities (over 85 per cent) and ICUs (over 90 per cent)..." කියලා. මතක තියාගන්න, බස්නාහිර පළාතේ තදාසන්න ප්‍රදේශවල විතරයි තවමත් කොරෝනා වසංගතය පැතිරෙමින් යන්නේ. එවැනි තත්ත්වයකදී සියයට 80කින් රෝහල්වල ඇඳන් සහ රෝහල් පද්ධතිය පිරිලා ගිහින් තිබෙනවා. ඒ වාගේම ICU පද්ධතිය සියයට 90කින් පිරිලා තිබෙනවා. ඒ වාගේම ඔවුන් කියනවා, "Many areas of the country show a high PCR test positivity rate of over 20 per cent. As of 31st July, 2021, more than 60 per cent of sequenced samples are Delta variant,..." කියලා. එතකොට, Delta variant එක තමයි රට තුළ දැන් වැඩිපුරම ප්‍රචලිත වෙමින් යන්නේ.

ඒත් එක්කම, අපේ රටේ vaccine එක ලබාදීම පිළිබඳවත් කියනවා. ජනගහනයෙන් සියයට 50කට එන්නත දුන්නා කියනවා. සියයට 40කට ගැහුවා කියලා තව කෙනෙක් කියනවා. තවත් කෙනෙක් කියනවා සියයට 100ක් එන්නත ගැහුවා කියලා. රටේ ජනතාවගෙන් සියයට 15කට විතරයි එන්නත් මාත්‍රා දෙකම ගහලා තිබෙන්නේ. අපි සියයට 20ක් කියලා කියමුකෝ. එතකොට රටේ ජනතාවගෙන් සියයට 80කට එන්නත් ගහලා නැහැ. මේක තමයි ඇත්ත. ඇයි මේ රජයට ඒ ඇත්ත පිළිගන්න බැරි? ඒ වාගේම ඔවුන් කියනවා, "A significant number of health workers are getting infected" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මිනිත්තු 7ක කාලයක් වෙන් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, ඔබතුමාට මිනිත්තු 5ක් පමණයි තිබුණේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
නැහැ නේ, ඔබතුමා අනික් මන්ත්‍රීතුමන්ලාට කාලය දුන්නා වාගේ අපටත් කාලය දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම කරන්නේ නැහැ. කාටත් නියමිත වෙලාව තමයි දෙන්නේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
දවසකට cases 6,000ක් ඇතිවෙනවා කියනවා. ඒ වාගේම මේ රටේ ජීවිත 30,000ක් අහිමි වෙනවා කියන එක තමයි එම විශේෂඥයන් කියන්නේ. විශේෂඥයන් කියනවා, මේ රටට ඇඳිරිනීතිය දමන්න කියලා. ඇඳිරිනීතිය දමන්න කියලා විශේෂඥයන් කිව්වාම, චන්න ජයසුමන මහාචාර්යතුමා මොකක්ද කියන්නේ? එතුමා කියනවා, "අපට සෞඛ්‍ය අංශවලින් කියලා නැහැ, ඒක නිසා ඇඳිරිනීතිය දැමීමේ අවශ්‍යතාවක් නැහැ" කියලා. අපි අහනවා, ඇඳිරිනීතිය දමන්න එපා කියලා තිබෙන්නේ මොන සෞඛ්‍ය අංශයෙන්ද කියලා. ඒ වාගේම Sri Lanka Medical Association එක ඉතාම වැදගත්, මෙන්න මෙහෙම කාරණයක් කියනවා:

> "Vaccination significantly reduces severe disease and death caused by COVID 19 infection. Certain vaccines such as Moderna, Pfizer-BioNTech and AstraZeneca evoke a significant protection following a single dose of the vaccine, while a single dose of Sinopharm provides no protection until two weeks after a second dose is given."

එතකොට second dose එක දෙනතුරු සයිනොෆාම් එන්නතෙහි කිසිම බලයක් නැහැ කියායි මේ අය කියන්නේ. මතක තියා ගන්න, ශරීරයේ antibodies ඇති වෙලා, protection එකක් ඇති වෙන්න මාසයකට වැඩි කාලයක් ගතවන බව. එවැනි තත්ත්වයක් තිබියදී මෙතුමන්ලා මොනවාද කරන්නේ? අද රෝහල්වල ඔක්සිජන් නැහැ, ඇඳන් නැහැ, ICU beds පිරිලා. මේ ආණ්ඩුවට මේ සත්‍යය තේරුම් ගන්න බැහැ. අද ඖෂධ වර්ග 40ක් නැහැ. මම එම ඖෂධ ලැයිස්තුව **සභාගත*** කරනවා.

මේක තමයි ඇත්ත. ඒ වාගේම, අද මිනිසුන් ගෙයින් ගෙට යනවා. තමන්ගේ සහෝදරයන්, තමන්ගේ මිත්‍රයන්, තමන්ගේ ඥාතීන් කොරෝනා වයිරසය ආසාදනය වෙලා ගෙවල්වල තමයි ඉන්නේ. ගෙවල්වල ඉන්න අහිංසක මිනිසුන්ට බෙහෙත් ටිකක් දෙන්න, ඒ අයගේ සැප-දුක බලන්න වෛද්‍යවරයකු නැහැ. මේ රජය මොනවාද කරන්නේ? "හොඳට කළා" කියලා නම් රජය කියනවා. අපි දන්නවා, කොවිඩ් -19 වයිරසයේ ලැම්ඩා ප්‍රභේදය, ඇල්ෆා ප්‍රභේදය සහ ඩෙල්ටා ප්‍රභේදය අපේ රටේ පැතිරුණු බව. තව ටික දවසකින් තවත් කොරෝනා වයිරසය ප්‍රභේදයක් එන්න තිබෙනවා. මේ තත්ත්වය සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියාමාර්ගය මොකක්ද? කිසිම වැඩ පිළිවෙළක් නැහැ. අපි ආණ්ඩුවට කියනවා, ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න කියලා. තත්පර

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

5කට mask එක ගැලවුවොත්, මෙම වයිරසය ශරීරයට ඇතුළු වෙන්න පුළුවන් කියලා විශේෂඥ වෛද්‍ය ආචාර්ය චන්දිම ජීවන්දර මහත්මයා කියනවා. එතකොට රට විවෘත කරගෙන වයිරසය පාලනය කරන්නේ කොහොමද?

රජයේ කාර්යාලවල ඉන්න නිලධාරින් අද අනතුරේ කියන කාරණය තමුන්නාන්සේලා මතක තියාගන්න. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා කියනවා, පාලකයන්ගේ වැරදි තීන්දු නිසා රටම විනාශයි කියලා. එතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. [බාධා කිරීමක්] මම එතුමාගෙන් මෙම කාරණය අහනවා. ගරු හිටපු ඇමතිතුමනි, ඔබතුමාගේ හෘදය සාක්ෂියට තට්ටු කරලා අහලා බලන්න. මේ ආණ්ඩුව අපේ රට අනතුරට පත් කරලා අවසන්. කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමා කිව්වා වාගේ අපේ ජනතාව බේරා ගන්න කියලා දෙවියන්ට තමයි කියන්න තියෙන්නේ.

Facebook එකේ තිබුණු හොඳ පණිවුඩයක් මම දැක්කා. එහි තරුණයෙක් සඳහන් කර තිබුණා, "මේ ආණ්ඩුව කරපු හොඳම දේ තමයි කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාට සෞඛ්‍ය අංශය භාර දීපු එක. මොකද, එතුමාට තමයි දෙවියන් එක්ක direct contact එක තියෙන්නේ" කියලා. අපිටත් දැන් දෙවියන් බුදුන් සිහි කරගන්න කාලය ඇවිත් කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.17]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කොවිඩ් ඩෙල්ටා ප්‍රභේදය දරුණු එකක්. එය දැන් අපේ රට තුළ පැතිර යනවා. මේ අවස්ථාවේදී අඩුපාඩුකම් පෙන්වමින්, හැප්පිලා කටයුතු කරනවාට වඩා දේශපාලන පක්ෂවල නායකයන් එකතු කරලා කොවිඩ් -19 වසංගත තත්ත්වය පාලනය කරන කමිටුවක් පත් කරලා, සෞඛ්‍ය ඇමතිතුමා එක්කත් සහයෝගයෙන් මේ ප්‍රශ්නය පොදු ප්‍රශ්නයක් හැටියට සලකලා කටයුතු කරනවා නම් වඩා හොඳයි කියා මා හිතනවා. විශේෂයෙන් ඩෙල්ටා කියන අලුත් ප්‍රභේදය මතු වුණාට පසුව වයිරසය අප රට තුළ ශීඝ්‍රයෙන් පැතිරී යන බව පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. අපි ඒක පිළිගෙන, මේ වයිරසය පැතිරීම පුළුවන් තරම් පාලනය කරන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. මෙම වයිරසය පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුට බෝ වෙන දෙයක්. එම නිසා ජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් ආණ්ඩුව ක්‍රියාත්මක කළ යුතුයි කියා මා හිතනවා. එය කර තිබෙනවා මදි. මෙම වයිරසය පාලනය කිරීම සම්බන්ධයෙන් ගම් මට්ටම දක්වාම හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ. පුළුවන් නම් කොවිඩ් -19 කමිටු හදලා, සෞඛ්‍ය නිලධාරිනුත් සම්බන්ධ කරගෙන, ඒවා හරහා වයිරසයේ භයානක තත්ත්වය ජනතාවට පැහැදිලි කරලා දෙන්න. එය පැහැදිලි කර දුන්නොත් විතරයි, ජනතාවගේ හැසිරීම වෙනස් වෙන්නේ. දැන් හැමෝම කටයුතු කරන්නේ වසංගත තත්ත්වයක් නැති, සාමාන්‍ය තත්ත්වයක් පවතින රටක ජීවත් වනවා වාගේයි. කොහේ ගියත් අපිට ඒ බව පෙනෙන්න තිබෙනවා. මේ අවස්ථාවේ අපිට දරුණු අභියෝගයක් එල්ල වී තිබෙනවා. ඒ අභියෝගය පරාජය කිරීමට නම් දූරදර්ශීභාවය අපි අතරේ ඇති කරගැනීම පුරුද්දක් හැටියට කරන්න ඕනෑ. අපි සියලු දෙනාම මුව ආවරණ පාවිච්චි කරන්න ඕනෑ. වරින් වර සබන් යොදා දෑත් සෝදන්න ඕනෑ. තමන්ගේ ආරක්ෂාවට මේ වාගේ දේවල් වුවමනාවෙන් කරන්න ඕනෑ. හැම පුද්ගලයාම අනික් පුද්ගලයා ගැන හිතන්න ඕනෑ. මේ වයිරසය දැන් සමාජගතවෙලා තිබෙනවා. මේ වසංගතය ඕනෑම කෙනෙකුගෙන් තව කෙනෙකුට බෝ වෙන්න පුළුවන්. ඒ නිසා තමන්ම ආරක්ෂා වෙන්න ඕනෑ. තමන් ආරක්ෂා වුණොත්, තමන්ට මේ රෝගය හැදෙන්නේත් නැහැ; තමන්ට රෝගය තිබුණොත් අනික් අයට හැදෙන්නේත් නැහැ. මේ කාරණා පිළිබඳව කල්පනා කළොත් තමයි අපිට මේ වසංගතය පාලනය කර ගන්න පුළුවන් වන්නේ. එන්නත් ලබා දීම හොඳයි. නමුත් මා දන්නා හැටියට එක dose එකක් ලබා දීලා මදි. Doses දෙකක් දුන්නොත් තමයි නියම විධියට ආරක්ෂාව ලැබෙන්නේ. ආරක්ෂාව ලබා දෙන කාලය එන්නතින් එන්නතට වෙනස් වනවා. මේ කාරණාත් සලකායි මේ කටයුතු කරන්න ඕනෑ.

අපි පුළුවන් තරම් අපේ ජනතාව එන්නත්කරණය කරන්න ඕනෑ. නමුත්, එන්නත්කරණය කිරීම පමණක් සෑහෙන්නේ නැහැ. එන්නත්කරණය කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නය පාලනය කරන්නත් බැහැ. ඒ වෙනුවෙන් අපිට යම් කාලයක් අවශ්‍ය වනවා. එන්නත් දෙකම ලබා ගත්තත් නියම මට්ටමට ප්‍රතිදේහ ඉහළ නංවන්න තව සති දෙකක් ගත වනවා. මේ නිසා අපේ ජනතාවගේ හැසිරීම් රටාවේ වෙනසක් ඇති කරන්න අවශ්‍යයි. අපේ සියලු මාධ්‍ය පාවිච්චි කර, මුළු රටේම ජනතාව හොඳ සෞඛ්‍ය පුරුදු ඉබේම ක්‍රියාත්මක කරන තත්ත්වයකට පත් කරන්න ඕනෑ. එක් එක් කෙනාගේ අඩු පාඩුකම් ගැන කථා කරනවාට වඩා, ඒ අරමුණ ඇතිව කටයුතු කළොත් වඩා හොඳයි.

අනික, දේශපාලන පක්ෂවල එකතුවෙන් යුත් කමිටුවක් පාර්ලිමේන්තුවේ පත්කර, එම කමිටුව ගරු සෞඛ්‍ය ඇමතිතුමා එක්ක සම්බන්ධ වෙමින්, රට තුළ ගෙනයන වැඩ පිළිවෙළ ගැන අදහස් හුවමාරු කර ගැනීම වැදගත් වෙයි කියා මම හිතනවා. අපි ඒක කරන්න ඕනෑ. ගම් මට්ටම දක්වා ම ඒ කටයුත්ත ව්‍යාප්ත කරන්නත් ඕනෑ. ගම් මට්ටමින් පවත්වාගෙන යන කමිටුවට පත් කරන්නේ දෙතුන් දෙනෙක් වෙන්න පුළුවන්. සෞඛ්‍ය අංශයේ නිලධාරියෙකුත් ඒ කමිටුවට පත් කරන්න පුළුවන්. ප්‍රදේශයේ කවුරු හෝ හොඳ සෞඛ්‍ය පුරුදු පිළිපදින්නේ නැත්නම් ඒ වැරැද්ද පෙන්වා දෙමින්, එය නිවැරදි කිරීමට කමිටුව කටයුතු කරන්න ඕනෑ. ඒ විධියට ගම් මට්ටමේ ජනතාව තුළ හොඳ අවබෝධයක් ඇති කර, හැසිරීම සම්පූර්ණයෙන් වෙනස් කරන්න අපිට පුළුවන් නම්, එය හුඟාක් දුරට ප්‍රයෝජනවත් වෙයි.

අවසාන වශයෙන් මම තව කාරණයක් කියන්න කැමැතියි. ගමේ කවුරු හෝ කෙනෙකුට උණ හැදුණොත්, වෙනත් රෝග ලක්ෂණ මතු වුණොත්, ඒ පුද්ගලයා වහාම වෛද්‍යවරයෙකුට පෙන්වන්න; PCR එකක් කරවන්නත් ඒ Committee එකට පුළුවන්කම තිබෙනවා. ඒ විධියට අපි කල් ඇතිව රෝගියා හඳුනා ගත්තොත්, ඔහු වටා සම්බන්ධකම් තිබුණු අය සමාජයෙන් වෙන් කර, රෝගය පැතිර යාම වළක්වන්න අපට පුළුවන් වනවා. මේ ආකාරයට අපි ක්‍රියා කළොත්, අපට වැඩි වියදමක් නැතිව මේ තත්ත්වය පාලනය කරගන්න පුළුවන්. ඒ නිසා ඒ කාර්යය කිරීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගරු මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න අවස්ථාව උදාවීම ගැන මම සතුටු වෙනවා. අපි දන්නවා, එතුමාට මේ සම්බන්ධව තිබෙන දැනුම සහ අත්දැකීම් ගැන. හැබැයි, මේ ආණ්ඩුව අඩුම තරමින් එතුමාට කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බලකායේ පුටුවක්වත් වෙන් කර නැහැ, එතුමාගේ දැනුම අත්දැකීම් ලබා ගන්න. ඉතින් එහෙම ආණ්ඩුවකින් මේ කොවිඩ් ප්‍රශ්නයට විසඳුම් ලැබෙන්නේ කොහොමද කියන එක ගැන අපට අහන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චන්න ජයසුමන මහත්තයා කථා කරනවා මා දැක්කා. දැන් රෙද්ද පල්ලෙන් බේරිලායි තිබෙන්නේ. හැබැයි, ජයසුමන මහත්තයාගේ කටේ තරිවාදංවල නම් අඩුවක් නැහැ. එතුමා දැන් කියනවා, "සජිත් ප්‍රේමදාස හිටියා නම්, සමගි ජන බලවේගය හිටියා නම්, අරකයි මේකයි" කියලා. හැබැයි, අද වෙනකොට රටේ ජනගහනයට සාපේක්ෂව මරණ සංඛ්‍යාව පෙළගැස්සුවාම අපි ඉන්නේ ලෝකයේ තුන්වැනි තැනට. පළමු තැනට ඉන්නේ මැලේසියාව. දෙවන තැනට ඉන්නේ ඉරානය. තුන්වන තැනට ඉන්නේ අපි.

ඊළඟට, මරණ සංඛ්‍යාව පෙළ ගැස්සුවාම, අපි ඉන්නේ 14වන ස්ථානයේ. හැබැයි, "හොඳටම කොරා" කියනවා. කොරලා තිබෙන කෙරුවාව තමයි මේ. අපි දන්නවා, ඉතාලිය ගැන. එක්ලක්ෂ විසිඅටදහසක් මැරුණා. මුල් කාලයේ කොවිඩ් නිසා ඒ රටේ කොච්චර මැරුණා ද කියලා අපි දැක්කා නේ. නමුත්, දැන් මැරෙන්නේ දිනකට 28දෙනායි. මොකද, ඒ රටවල් ඉක්මනින් vaccines order කරලා රටේ ජනතාවට vaccines ලබා දුන්නා. මේ ගොල්ලන් මොකක්ද, කෙරුවේ? මේ ගොල්ලන් vaccines order කරන්නේ නැතුව, වෙන වෙන දේවල් පස්සේ ගියා. දැන් vaccine පෝලිම පිටුපස්සේ ඉඳගෙන මේක අනලා ඉවරයි. ඉස්සෙල්ලාම අවුරුදු 60ට වැඩි ජනතාවට vaccines දෙන්න කිව්වාම දුන්නේ නැහැ. ලෝකයේ වෙනත් රටවල් ඒ අත්දැකීම ලබනකොට, ඒක ක්‍රියාත්මක කරනකොට අපේ අය කළේ, නන්නත්තාර වැක්සින්කරණයක්. කිසිම ක්‍රමවේදයකට නොවෙයි, දුන්නේ. ඒ නිසා තමයි අපේ රටේ ජනතාවගෙන් 6,000කට වැඩි පිරිසක් මේ වෙනකොට මැරිලා තිබෙන්නේ. හැබැයි, ඒකෙන් මරණ 5,000කට ආසන්න ප්‍රමාණයකට ආණ්ඩුව වග කියන්න ඕනෑ. මොකද, වැක්සින්කරණයේ ප්‍රමාදය හා වැක්සින්කරණයේ ප්‍රමුඛතාවක් නොතිබීම නිසා.

ඊයේ පෙරේදා කොවිඩ් මර්දන ජනාධිපති කාර්ය සාධක බලකාය රැස්වෙලා මොකක්ද, කළේ? තීන්දුවක් ගත්තා, "පළාත් අතර සංචරණය නතර කරනු ලැබේ" කියලා. පළාත් අතර සංචරණයෙන් ලංකාව බේරා ගන්න පුළුවන්ද? අපේ රටේ පළාත් රාජ්‍ය තිබෙනවාද? State councils තිබෙනවාද? අපේ රටේ ප්‍රාන්ත රාජ්‍ය තිබෙනවාද? නැහැ. පළාත් අතර සංචරණය නවතා මේකෙන් අපේ රට බේරා ගන්න බැහැ. මේක බොරු න්‍යායක්. එහෙම නැත්නම් වෙන රටවල තිබෙන දෙයක් මෙහේ ක්‍රියාත්මක කිරීමක්. ඊළඟට, රාත්‍රී 10 සිට උදේ 4 වනතුරු නිරෝධායන ඇඳිරි නීතිය දැම්මා. අපේ රටේ night life එකක් නැහැ. නිශාචරයෝ වාගේ කටයුතු කරන පිරිසක් නැහැ. වෙනත් රටවල නම් රාත්‍රී කාලයේ කටයුතු කරන විශාල පිරිසක් ඉන්නවා. රාත්‍රියට clubs ගානේ යනවා; parks ගානේ යනවා. එහෙම රටක් නොවෙයි, අපේ රට. ඇමෙරිකාවේ, වෙනත් රටවල ක්‍රියාත්මක වන, අපේ රටට නොගැළපෙන දේවල් ක්‍රියාත්මක කරලා තිබෙනවා.

ඒ වාගේම අපි දැක්කා, අසත්‍ය සංඛ්‍යා ලේඛන. මේ අසත්‍ය ලේඛන ඉදිරිපත් කරන්නේ කවුද? සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඒ ගැන සොයා බලනකොට සෞඛ්‍ය අමාත්‍යාංශය නොවෙයි. හමුදාව පැත්තෙන් සොයා බලනකොට අපට තේරෙනවා, යම්කිසි පුද්ගලයෙක් තමයි අදෘශ්‍යමාන විධියට මේ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේ කියලා. ඒ පුද්ගලයාට ඕනෑ දේ ආණ්ඩුවේ චුවමනාව බවට පත් වෙලා. ඒ ආකාරයටයි සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්නේ. සම්පූර්ණයෙන්ම අසත්‍ය සංඛ්‍යා ලේඛනයි ඉදිරිපත් කරන්නේ. ඒ බව අපට බොහොම පැහැදිලියි. වෙනත් රටවල දවසකට කොවිඩ් රෝගීන් 30,000ක් වාර්තා වන කොට කොවිඩ් මරණ වාර්තා වන්නේ 120යි, 130යි. අපේ රටේ කොවිඩ් රෝගීන් 3,000ක් වාර්තා වන කොට කොවිඩ් මරණ 120යි, 130යි. එම නිසා මේ සංඛ්‍යා ලේඛන අසත්‍යයි. මේ ඉදිරිපත් කරන සංඛ්‍යා ලේඛන අනුවත් ජනගහනයට සාපේක්ෂව කොවිඩ් මරණ සංඛ්‍යාව ගත්තාම අපි අද ඉන්නේ ලෝකයේ තුන්වන ස්ථානයේ. අපේ රටේ කොවිඩ් මරණ සංඛ්‍යාව අද වන කොට ජනගහනය මිලියනයකට 7.2 සිට 7.6 දක්වා වැඩි වෙලා තිබෙනවා. එම නිසා අපට බොහොම පැහැදිලියි, මේ ජයසුමන මහත්මයාලා කියන සුන්දර තත්ත්වය නොවෙයි මේ රටේ තිබෙන්නේ කියලා. එතුමන්ලා හොඳටම කළා කියා තමයි තවම හිතාගෙන ඉන්නේ. මේක හොඳටම කරන්න තිබුණා, අනිල් ජාසිංහ මහත්මයා, පබා පලිහවඩන මහත්මිය, පාලිත අබේකෝන් මහත්මයා වැනි අය යොදාගෙන ඒ අයට ප්‍රමුඛස්ථානය දුන්නා නම්. හැබැයි, මෙහිදී ප්‍රමුඛස්ථානය දුන්නේ සෞඛ්‍ය අංශවලට නොවෙයි. මේ කොවිඩ්-19 මර්දන බලකායේ attendant රාජකාරිය සෞඛ්‍ය අංශවලට දුන්නා.

ඊයේ අපි දැක්කා නේ, අන්තිමට කළේ මොකක්ද කියලා. සෞඛ්‍ය ඇමතිතුමිය මාරු කළා. හැබැයි, එතුමිය හොඳ කථාවක් කිව්වා. මොකක්ද, එතුමිය කිව්වේ? "මම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇමතිකමේ සිටියත් මේවා කළේ අපි නොවෙයි. ජනාධිපතිතුමා තමයි තීන්දු තීරණ ගත්තේ. ජනාධිපතිතුමායි මේවා ක්‍රියාත්මක කළේ" කියන එක එතුමිය බොහොම පැහැදිලිව කිව්වා. රජතුමාගේ

උද්ධච්ච මෝඩකම ගැන අප නොවෙයි, පවිත්‍රා නෝනා තමයි කිව්වේ. එම නිසා අපට බොහොම පැහැදිලියි, මේ ආණ්ඩුව දැන් වැඩේ අනාගෙන ඉවරයි කියලා. දැන් හෝ බුද්ධිමත්ව කටයුතු නොකළොත් ඉදිරි මාස එකහමාර, දෙක, තුන ඇතුළත අපේ රටේ විශාල පිරිසක් මැරෙනවා. ඒ මැරෙන්නේ, අපේ වැඩිහිටියෝ; අපේ දෙමව්පියෝ, අපේ ඥාතීන්, අපේ නැන්දලා, මාමලා. ඒ අය තමයි අතිබහුතරය මැරෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ආණ්ඩුව දැන් හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ, අවුරුදු 60ට වැඩි අය මේ රටේ ජීවත් වන්න ඕනෑ නැහැ කියලා. එහෙම හිතලාද ආණ්ඩුව මේ තීන්දු තීරණ ගන්නේ? හැබැයි අපි දන්නවා, මේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයෙන් බාගයට බාගයක්ම අවුරුදු 70 පැනපු අය බව. එතුමන්ලාට නම් හොඳයි. හැබැයි, රටේ ජනතාව -අපේ අහිංසක අම්මලා, තාත්තලා- ජීවත් වන්න ඕනෑ නැහැ, මැරුණාට කමක් නැහැ කියා හිතාගෙන තමයි ආණ්ඩුව මේ ආකාරයට vaccinate කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහා ලොකුවට කයිය ගැහුවාට තවම Vaccine දෙකම ලබා දී තිබෙන්නේ රටේ ජනතාවගෙන් සියයට 20කට පමණයි. පළමුවන vaccine dose එක ලබා දී තිබෙනවා, ජනතාවගෙන් සියයට 54කට පමණ. හැබැයි, ලෝකයේ vaccine මාත්‍රා එක සහ දෙක ලබා දුන් රටවල් අතර ඒ කටයුත්ත සම්බන්ධයෙන් ලොකුම පරතරය තිබෙන රටත් අපේ රටයි. ඒක තමයි මේ එන්නත්කරණයේ අසාර්ථකභාවය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් වැඩිපුර කාලයකුත් ගෙන තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. ඉන් පසුව මම කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා නිවැරැදිව කිව්වා, කරන්න ඕනෑ දේ. පක්ෂවලින් වැඩක් නැහැ, දේශපාලනය වැඩක් නැහැ, සියලුදෙනා එකතු වෙලා කටයුතු කරමු කියලා එතුමා කිව්වා. හැබැයි, එතුමා එහෙම යෝජනා කරද්දී අර ජයසුමන මහත්මයා එතුමාට නිකරුණේ මඩ ගැහුවා. [බාධා කිරීමක්] අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු දැන් මේ ගරු සභාවේ ඉන්නවා. අනුරාධපුරයේ අය දන්නවා, ජයසුමන මහත්මයා ගැන. එතුමා කරපු දේවල් ඉදිරියේදී බලාගන්න පුළුවන් බව මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. ඔබ වහන්සේට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.33]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොරෝනා වසංගතය සම්බන්ධයෙන් පවතින හදිසි තත්ත්වය යටතේ අපි අද පනත් කෙටුම්පතක් සම්මත කරගැනීමට නියමිතයි. මේ අවස්ථාවේදී මා කියන්න කැමැතියි, කොවිඩ් වසංගතය හමුවේ අප ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත්ව සිටින බව. කොවිඩ් වසංගතය හේතුවෙන් දවසකට 100ක්, 200ක් අතර ප්‍රමාණයක් මිය යන තත්ත්වයක අප ඉන්නේ. එම සංඛ්‍යාව පැය 24න් බෙදුවොත්, හැම පැයකටම බොහෝ දෙනෙක් මිය යන තත්ත්වයක අප ඉන්නේ. මේක ඉතාම කනගාටුදායක - ශෝචනීය - තත්ත්වයක්. මේ වාගේ තත්ත්වයක් තුළ රටක් විධියට අප කටයුතු කරන්න ඕනෑ කොහොමද? ආණ්ඩුවක් විධියට, ආණ්ඩුවේ වගකීම මොකක්ද? අපි නිවැරැදි ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවාද? අපි මේවා ගැන පසු විපරමක් කරන්න ඕනෑ.

මා මුලින්ම කියන්න කැමැතියි, කොවිඩ්-19 වයිරසය සම්බන්ධයෙන් විශේෂඥයන්ගෙන් සැදුම් ලත් මණ්ඩලයක් තිබිය යුතුම බව. එහි තීරණ ක්‍රියාවට නඟන්නේ ත්‍රිවිධ හමුදාවද, වෙනත් කෙනෙකුද කියන එක නොවෙයි වැදගත්. හමුදාව නොවෙයි, මේ සම්බන්ධයෙන් තීරණ ගත යුත්තේ. හමුදාව මේ වෙලාවේ මේකට මැදිහත් විය යුතුයි. මේ සඳහා ඒ අයගේ සේවය අවශ්‍යයි. නමුත්, තීරණ ගත යුත්තේ විශේෂඥ කණ්ඩායමක් මඟින්.

මා ආණ්ඩුවේ සිටියත් කියන්න ඕනෑ, මේ ප්‍රශ්නය තුළ අපි අද නිරීක්ෂකයන්ගෙනුත් ඔබ්බට ගිහින් තිබෙන බව. මේ රටේ රාජ්‍ය නායකයා ජනාධිපතිවරයායි. එහෙම නම්, අපට මේ සම්බන්ධයෙන් කථා කරන්න පුළුවන්, සංවාදයක යෙදෙන්න පුළුවන්, වගකිව යුතු තැනැත්තා කවුද? අපි දන්නවා, දැන් කැබිනට් මණ්ඩලය සංශෝධනය කර තිබෙන බව. ආණ්ඩුවේ සිටියත් මා කනගාටුවෙන් වුවත් කියන්න ඕනෑ, අපේ මේ කැබිනට් මණ්ඩලය හදපු විධියේ කිසිම විද්‍යාත්මක පදනමක් නැති බව.

අමාත්‍යාංශ හතර අතේ. ඇමතිවරයෙකුට තීරණයක් ගන්න බැහැ, රාජ්‍ය ඇමතිවරුන්ට විෂයයන් බෙදී ගිහින්. ඒ නිසා අපි මේ අවස්ථාවේ විශේෂයෙන් කියන්න කැමැතියි, මෙවැනි තත්ත්වයක් යටතේ කැබිනට් සංශෝධනවලට වඩා රටට අවශ්‍ය වන්නේ විද්‍යාත්මක පදනමක් මත කැබිනට් එක ඉක්මනින් සකස් කර ගැනීමයි කියලා.

මම මේ කොවිඩ්-19 වයිරස් තත්ත්වය ගැන විද්‍යාත්මක කාරණා කථා කරන්න යන්නේ නැහැ. මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා මට කලින් කථා කළා. එතුමා වයිරස් රෝග පිළිබඳ විශේෂඥයෙක්. නමුත්, මම එක කාරණයක් කියන්න කැමැතියි. කොවිඩ්-19 මර්දනය සම්බන්ධයෙන් පිහිටුවා තිබෙන කමිටුවට ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සහ පාරම්පරික වෛද්‍යවරුන්ගේ දායකත්වය ඉතාම අඩුවෙන් තමයි අප යොදා ගන්නේ. මාස ගණනක පටන් කොවිඩ් රෝගීන් සිය ගණනින් නාවින්න ආයුර්වේද රෝහලේ -කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ- ප්‍රතිකාර ලබනවා. මගේ දැනුමේ හැටියට මේ වන කොට රෝගීන් තුන්සිය ගණනක් එහි නේවාසිකව සිටිනවා. සමහර අය ප්‍රචාරය කරනවා, එතැන ඉන්නේ එච්චර අමාරු අය, දුර්වල අය නොවෙයි කියලා. මේ අවස්ථාවේ නාවින්න ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඉතා බරපතළ තත්ත්වයේ පසු වන ලෙඩුන්ටත් ප්‍රතිකාර කරනවා. ඒ රෝගීන් එතැනින් සනීප වෙනවා. එහි රෝගීන්ට ප්‍රධාන කසායක් ලබා දෙනවා. ඒ කසාය තමයි ඒ අය රෝගීන්ට ප්‍රධාන වශයෙන් දෙන්නේ. සියලුදෙනාට ප්‍රයෝජනවත් වන නිසා මම මේ අවස්ථාවේ එහි නම කියන්න කැමැතියි. එහි නම "ගුඩුච්චාදී කසාය". එහි රසකිඳ, අතිවිඩයම්, කොත්තමල්ලි, ඉඟුරු, බෙලිගැට මද ආදී දේවල් තිබෙනවා. මෙහි අතිවිඩයම් කියන බෙහෙත අපි ඉන්දියාවෙන් ගෙන්වන්නේ. ඒක රුපියල් හාරපන්දහසක් විතර වෙනවා. ඒ ගැටලුව අද ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ තිබෙනවා. ආයුර්වේද ප්‍රතිකාර ක්‍රමය තුළ කරන විශේෂ දේ තමයි ප්‍රතිශක්තිකරණය වර්ධනය කිරීම. අද චීනය ප්‍රකාශ කර තිබෙනවා, "මේ රෝගයට ඔරොත්තු දෙන්න පුළුවන් එන්නත්වලින් නොවෙයි. මිනිසුන් තුළ ප්‍රතිශක්තිකරණය ඇති කිරීමෙන්" කියලා. එහෙම නම්, ප්‍රතිශක්තිය ඇති කිරීමට බලපාන්නේ මොනවාද? හැමෝම තමන්ගේ ප්‍රතිශක්තිය පිළිබඳ පරීක්ෂණයක් කර ගත යුතුයි. මේක මම නොවෙයි කියන්න ඕනෑ; සෞඛ්‍ය අමාත්‍යාංශයයි. මෙය WHO එක පවා පිළිගෙන තිබෙනවා. ශරීරය තුළ ප්‍රතිශක්තිකරණය තිබෙනවා නම්, ලෙඩේ හැදුණත් ලෙඩේ දැනෙන්නේ නැහැ; මැරෙන්නේ නැහැ. ආයුර්වේදය සහ පාරම්පරික වෙදකම හා සම්බන්ධ විශේෂඥයන් කොවිඩ්-19 මර්දන ජාතික කමිටුවට ඇතුළත් කරගන්න ඕනෑ.

බොරැල්ලේ තිබෙන ආයුර්වේද ශික්ෂණ රෝහල තමයි ලංකාවේ තිබෙන එකම ආයුර්වේද ශික්ෂණ රෝහල. ඒ ශික්ෂණ රෝහලට අද මොකක්ද වෙලා තිබෙන්නේ? එහි තට්ටු හයක බිල්ඩින් එකක් හදලා තිබෙනවා. එහි එක තට්ටුවක් වත් ප්‍රතිකාර කිරීම සඳහා ආයුර්වේද වෛද්‍යවරුන්ට ලබා දී නැහැ. අද ආයුර්වේද වෛද්‍යවරු ඒ ගැන හුඟක් කනගාටු වෙනවා.

අද ලෝකයේ පිළිගත් වෛද්‍ය ක්‍රමයක් තමයි integrative medicine කියන එක. ඒ කියන්නේ, ඒකාබද්ධ වෛද්‍ය ක්‍රමය. මම කියන්නේ නැහැ, කොවිඩ්-19 ප්‍රශ්නයට උත්තරය ආයුර්වේදයේ තිබෙනවා කියලා හෝ බටහිර වෛද්‍ය ක්‍රමයේ තිබෙනවා කියලා. මේ දෙකේ ඒකාබද්ධතාවක් ඇති කරන්න ඕනෑ. අද ලෝකයේ කිසිම විද්‍යාඥයෙකු ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. චීන පාරම්පරික වෛද්‍ය ක්‍රමය කවුරුවත් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. එම ක්‍රම නීත්‍යනුකූලව පිළිගෙන තිබෙනවා. එහෙම නම්, බොරැල්ල ආයුර්වේද රෝහලේ හදපු තට්ටු හයේ ගොඩනැඟිල්ලෙන් අඩු ගණනේ තට්ටු දෙකක් වත් නාවින්නේ ආයුර්වේද මධ්‍යස්ථානයේ වාගේ -නාවින්න

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ප්‍රතිකාර කිරීම සාර්ථක වෙලා තිබෙනවා නම්- කොවිඩ් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ආයුර්වේද වෛද්‍යවරුන්ට දෙන්න අපට බැරි ඇයි?

අපේ රට විශේෂයෙන් නිවර්තන කලාපීය රටක්. ප්‍රතිශක්තිය වඩන බෙහෙත් පැළෑටි අපේ රටවල හැදෙනවා. අපේ රටේ බළලුන්ට ලෙඩක් හැදුණාම උන් කුප්පමේනිය කනවා. ඒ වාගේම අපට වැලඳෙන රෝගවලටත් උත්තර අපේ රටේ අපේ ස්වභාව ධර්මය තුළ, අපේ මහ පෙළොව මත තිබෙනවා. පසු ගිය කාලයේ වල් නාශක ගහපු නිසාත්, විවිධ සංවර්ධන කටයුතු නිසාත්, තවත් විවිධ ක්‍රම නිසාත් පසට වූ බලපෑම හේතුවෙන් ඒ ඖෂධ පැළෑටි සුලබව සොයා ගන්න අද අමාරුයි. ප්‍රතිශක්තිය වඩන ඖෂධ ලෙස අපේ ආයුර්වේදය කියන ඉඟුරු, කොත්තමල්ලි ටික පවා අද අපි වගා කරන්න ඕනෑ. ඒ සඳහා අපේ ජනතාව දැනුවත් කිරීමක් අද කෙරෙන්නේ නැහැ. ඒ නිසා අපි අද විශේෂඥ ජාතික කමිටුවක් ස්ථාපිත කරන්න ඕනෑ. ඒ ජාතික කමිටුවේ වැඩ පිළිවෙළට ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන්, විපක්ෂය වෙන්න පුළුවන්, එනම් ජේවීපී එක වෙන්න පුළුවන්, සමගි ජන බලවේගය වෙන්න පුළුවන්, TNA එක වෙන්න පුළුවන්, වෙනත් පක්ෂ වෙන්න පුළුවන් ඒ සියලුදෙනා ඒ ඒ පළාත්වල සිටින මන්ත්‍රිවරුන් ගැටගහ ගන්න ඕනෑ. මහජන නියෝජිතයන්ට ඒ පිළිබඳ වගකීමක් තිබෙනවා. ඒ සියලුදෙනා සහභාගී වීමෙන් මිස තනිවම විසඳන්න පුළුවන් ප්‍රශ්න නොවෙයි රාජ්‍ය කියන පුළුල් ඒකකය තුළ තිබෙන්නේ. මේ බරපතළ අනතුර ඉදිරියේ ඉතාම හොඳ ජාතික සම්මුතියක්, ජාතික සංහිඳියාවක් අප ඇති කර ගත යුතුයි කියන එක මා මේ අවස්ථාවේ ආණ්ඩුවට ඉතාම ආදරයෙන්, කරුණාවෙන් අවධාරණය කර කියන්න කැමැතියි. කොවිඩ් වසංගතය නිසා අපේ රටේ තරුණයන් මැරෙනවා; මිනිස්සු මැරෙනවා. තත්ත්වය ඉතාම බරපතළයි. රට ගැන හැඟීමක්, ආදරයක් තිබෙන අපට ඒ ගැන දුකයි. රෝහල්වල ඉඩ නැහැ. අපි දුක් වෙවී ඉඳලා බැහැ. අපි මේ මිනිසුන් වෙනුවෙන් යමක් කරන්නට ඕනෑ. මම ඉන්නේ ඔබේසේකරපුර අවට. එක පැත්තකින් වනාතමුල්ල, අනෙක් පැත්තෙන් බණ්ඩාරනායකපුර. එදිනෙදා ආහාර වේල සොයා ගැනීමත් ඒ ප්‍රදේශවල මිනිසුන්ට අමාරුයි. මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ, කන්න නැහැ. ඉස්සර නම් ඒ වාගේ ප්‍රශ්නවලදී මිනිසුන් එකතු වුණා. සුනාමි ව්‍යසනය සිදු වූ අවස්ථාවේ වාගේ, කරදරයක් සිදු වුණු අවස්ථාවල මිනිසුන් එකතු වෙනවා. අද මේ කොරෝනා වයිරස් තත්ත්වය නිසා සාමූහික සහභාගිත්ව වැඩසටහනක් දියත් කර ගන්න බැරිවෙලා තිබෙනවා. මේ වාගේ ව්‍යසන අවස්ථාවකදී ඒ වාගේ වැඩසටහනක් සකස් කර ගන්නේ කොහොමද කියන එක තමයි අපට තිබෙන ප්‍රශ්නය.

අද අපට මේ පාර්ලිමේන්තු සභා ගර්භයේදී ඉතාම ආදරයෙන් ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්න සිදුවෙලා තිබෙනවා, රූපවාහිනී නාළිකාවල ටෙලි නාට්‍ය, නාඩගම්, ක්‍රිකට් මැච් පෙන්වන්නේ නැතිව "ජාතික රූපවාහිනිය" හෝ "අයිටීඑන්" නාළිකා දෙකෙන් එක නාළිකාවක් අරගෙන මේ පිළිබඳව ජනතාව දැනුවත් කරන්න යොදා ගන්න කියලා. දැනට රජයේ ව්‍යාපෘති දෙකක් යනවා, වස විසෙන් තොර ගොවිතැන ගැන. ඒකත් මේ කොවිඩ් වසංගතයටම සම්බන්ධ එකක්. මොකද, වස විස නැති ආහාර ගත්තොත් අපේ ප්‍රතිශක්තිකරණය ඇති වෙනවා. ඒ නිසා මේ රූපවාහිනී නාළිකාවලින් එකක් මිනිසුන් දැනුවත් කිරීම සඳහා යොදා ගනිමු. කලාකරුවෝ, ක්‍රීඩකයෝ වාගේ සියලුදෙනාම ඒ වැඩසටහන්වලට සම්බන්ධ කර ගනිමු. අද අන්තර්ජාල පහසුකම් තිබෙනවා. "Zoom" technology වෙන්න පුළුවන්, වෙනත් ක්‍රමවේද වෙන්න පුළුවන්, ඒවා පාවිච්චි කරලා අපට ඒ අයව මේ වැඩසටහන්වලට සහභාගි කරවා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ලෝක සෞඛ්‍ය සංවිධානය කියන්නේ මොකක්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න අපේ හාමුදුරුවනේ, කාලය අවසන්.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වසංගතයෙන් ආරක්ෂා වීමට ඉර එළිය අවශ්‍යයි කියනවා; ව්‍යායාම අවශ්‍යයි කියනවා; ඇවිදීම අවශ්‍යයි කියනවා. නමුත්, මිනිස්සු ඒවා කරන්නේ නැහැ. එහෙම නම් අපි මෙය පාලනය කරන්නේ කොහොමද? අපේ නාසයේ තිබෙන සෙම සහ විෂබීජ ගලවා ගන්න තිබෙන සරල ක්‍රම මොනවාද? ඒවා ගැන මිනිසුන් දැනුවත් වෙන්නේ නැහැ. එම නිසා විධිමත් දැනුවත්කමක් මාධ්‍ය මඟින් ඇති කරමු. මේ විපතට අපි රටක් විධියට, ජාතියක් විධියට සාමූහිකව මුහුණ දෙමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් ඉල්ලන්නේ ආයුර්වේදයයි, පාරම්පරික වෙදකමයි, බටහිර වෙදකමයි කරුණාකරලා එකතු කරන්න කියන එකයි. බොරු පැණියකට ගිහිල්ලා අපේ ආයුර්වේදයට තිබුණු නමත් නැති වුණා. ඒ වාගේ විකාර කරන්නේ නැතිව විශේෂඥ වෛද්‍යවරු එකතු කරලා මේ සාකච්ඡාව කිරීමේ වැදගත්කම මම මේ අවස්ථාවේදී ආණ්ඩුවට අවධාරණය කරන්නට කැමැතියි. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්. උදයකුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.42]

**ගරු එම්. උදයකුමාර් මහතා**
(மாண்புமிகு எம். உதயகுமார்)
(The Hon. M. Udayakumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, உலகிலுள்ள கடைசி மனிதன் வரை அனைவருக்கும் 2 தடுப்பூசிகள் செலுத்தும்வரை கொரோனாத் தொற்றின் அபாயம் தொடருமென ஐக்கிய நாடுகள் சபையின் பொதுச் செயலாளர் அன்டோனியோ குட்டரஸ் சுட்டிக்காட்டிய எச்சரிக்கையினைச் சுட்டிக்காட்டி இந்தச் சபையிலே எனது கருத்துக்களை முன்வைக்கலாமென நினைக்கின்றேன். அத்துடன், இலங்கையிலே கொரோனா மரணங்கள் நாளுக்கு நாள் அதிகரித்துச் செல்வதால் எதிர்வரும் ஜனவரி மாதமளவிலே சுமார் 18,000 மரணங்கள் பதிவாகலாம் என்று உலக சுகாதார தாபனம் எச்சரித்துள்ளது. அந்த நிலையிலிருந்து மீள்வதற்காக 30 வைத்திய நிபுணர்கள் இணைந்து முன்வைத்துள்ள யோசனைகளில் சிலவற்றை இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். பயணத் தடையை வலுப்படுத்துதல், மாகாணங்களுக்கிடையிலான பயணத்தடைக்குப் பதிலாக மாவட்டங்களுக்கிடையிலான பயணத்தடையை அமுல்படுத்துதல், குறுகிய காலத்திற்காவது ஊரடங்குச் சட்டத்தை அமுல்படுத்துதல், மக்கள் ஒன்றுகூடுதலைத் தவிர்த்தல், சுகாதார அதிகாரிகளைப் பாதுகாத்தல், கொரோனாத் தொற்று மற்றும் கொரோனா மரணங்களின் உண்மைத் தகவல்களை வெளியிடல் மற்றும் 60 வயதிற்கு மேற்பட்டவர்களுக்கு விரைவில் 2 தடுப்பூசிகளையும்

செலுத்தி முடித்தல் போன்றன அதில் முக்கியமான பரிந்துரை களாகும். இத்தகைய பரிந்துரைகளை நடைமுறைப் படுத்தாமலும் நாட்டை முடக்காமலும் இருந்தால் எதிர்வரும் ஜனவரி மாதமளவில் நாட்டில் கொரோனா மரணங்கள் சுமார் 30,000ஐ எட்டும் நிலை ஏற்படும் என்றும் அதில் சுட்டிக் காட்டப்பட்டுள்ளது. இவ்வாறு எச்சரிக்கை விடுக்கப்பட்டும் நாட்டை முடக்குவது தொடர்பாக அரசாங்கம் அறிவிக்காமல் இருக்கின்றது. குறிப்பாக, சுகாதார அதிகாரிகள் நாட்டை முடக்குமாறு தொடர்ந்து வலியுறுத்தி வருகின்றார்கள். ஆனால், அரசாங்கம் இதனைக் கண்டுகொள்ளாமல் மக்களை கொரோனாவுக்குப் பலிகொடுத்துவிட்டு வேடிக்கை பார்த்துக் கொண்டிருக்கின்றது. அதற்கு மாறாக, கடவுள்தான் மக்களைக் காப்பாற்றவேண்டும் என்று அறிவித்து அரசாங்கம் தனது இயலாமையை நிரூபித்துக் காட்டியிருக்கின்றது. இந்த அரசாங் கத்தை நம்பி வாக்களித்த மக்கள் வெட்கித் தலைகுனிந் துள்ளதுடன், ஏமாற்றமும் அடைந்துள்ளார்கள்.

இந்த கொரோனாத் தொற்றின் காரணமாக அதிகமான சிறுவர்கள் பாதிக்கப்பட்டுள்ளதாக Castle Street Hospital for Women பொறுப்பாளர் கூறியுள்ளார். அத்தோடு, 700இற்கும் மேற்பட்ட கர்ப்பிணித் தாய்மார்கள் கொரோனாவினால் பாதிக்கப்பட்டுள்ளதாகவும், அவர்களில் 23பேர் உயிரிழந்துள்ள தாகவும், மேலும் சிலர் அபாய நிலையில் இருப்பதாகவும் Lady Ridgeway Hospital for Children பொறுப்பாளர் கூறியிருக் கின்றார். மேலும், 600இற்கும் மேற்பட்ட தொற்றாளர்கள் ஒக்சிஜன் வசதியுடன் சிகிச்சை பெற்று வருகிறார்கள். அத்துடன், ஒட்சிசன் உடைய தேவை அதிகரித்துள்ளதாகவும், ஒட்சிசன் தட்டுப்பாடு நிலவுவதாகவும் தெரிவிக்கப்படுகிறது. மேலும், வைத்தியசாலைகள் நிரம்பி வழிகின்றன. வைத்திசய சாலைகளில் கட்டில் வசதி இல்லாமல் நோயாளிகள் திண்டாடுகின்றார்கள். களுபோவில மற்றும் ராகம வைத்திய சாலைகளின் நிலைமைகளை நாங்கள் காணொளிமூலம் பார்த்தோம். இரத்தினபுரி மற்றும் கராபிட்டிய வைத்திய சாலைகளில் அவசரநிலை பிரகடனப்படுத்தப்பட்டுள்ளது. இவற்றைப் பார்க்கும்போது நாட்டின் சுகாதாரத்துறை முழுமை யாக வீழ்ச்சியடைந்துள்ளமை தெட்டத்தெளிவாகத் தெரி கின்றது. இது தொடர்பாக மக்கள் மத்தியில் விமர்சனங்கள் எழுந்துள்ள நிலையில், சுகாதாரத்துறையிலுள்ள குறைபாடுகள் மற்றும் தேவைகளைப் பூர்த்தி செய்யாமல் அமைச்சுப் பதவிகளில் மாற்றங்களைச் செய்திருக்கின்றார்கள். அதிலும், மக்களைக் கடவுள்தான் காப்பாற்ற வேண்டுமென்று கூறிய வரிடமே சுகாதாரத்துறையை ஒப்படைத்திருக்கிறார்கள்.

நாளாந்த கொரோனா தொற்றாளர்களின் மற்றும் கொரோனா மரணங்களின் எண்ணிக்கையை அரசாங்கம் மறைப்பதாக விசேட வைத்தியர்களும் சுகாதாரத் தரப்பினரும் தெரிவித்துள்ளனர். அதனை நிரூபிக்கும் வகையில், ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள்கூட தரவுகள் மறைக்கப் படுவதாக பகிரங்கமாக அறிவித்துள்ளனர். இந்தத் தொற்றின் மூலம் நாளாந்தம் 200இற்கும் அதிகமான மரணங்கள் ஏற்படுவ தாகவும் 5,000 இற்கும் மேற்பட்டவர்கள் பாதிக்கப்படுவ தாகவும் அரச வைத்திய அதிகாரிகள் சங்கம் தெரிவித்துள்ளது. 'டெல்டா' வைரஸானது மோசமானதும் மிக வேகமாகப் பரவக்கூடியதுமான ஒரு வைரஸ் என்பதால் ஒட்சிசன் தேவைப்பாடு குறித்தும் தெளிவுபடுத்தப்பட்டிருந்தது. ஆனால், அரசாங்கம் இதையும் காலதாமதப்படுத்தியது. தற்போதுதான் இந்தியாவிலிருந்து ஒட்சிசன் இறக்குமதி செய்தவற்கான நடவடிக்கைகளை அரசாங்கம் மேற் கொள்கின்றது. மேலும், எமது நாட்டில் PCR பரிசோதனைகள் கூட குறைந்தளவில் தான் மேற்கொள்ளப்படுகின்றன. அதிலும், 25 சதவீதமானவர் களுக்கு கொரோனாத் தொற்று உறுதிசெய்யப்படுகின்றது. இதன்மூலம் கொரோனா தாக்கம் மேலும் அதிகரித்துக் கொண்டு செல்வதை உணரலாம்.

கொரோனா தொற்றாளர்களில் 5 சதவீதமானவர்களுக்கு மரணம் ஏற்படுவதாகப் பதிவாகியுள்ளது. ஏனைய நாடுகளில் அது 1 அல்லது 2 சதவீதமாகத்தான் காணப்படுகின்றது. இலங்கையில் தற்போதுவரை கொரோனா தொற்றினால் 6,263 பேர் உயிரிழந்துள்ளனர். கொரோனா முதலாவது அலையில் 13 பேர் மாத்திரமே உயிரிழந்துள்ளனர். அதன் இரண்டாவது அலையிலே 596 பேர் உயிரிழந்துள்ளனர். ஆனால், இந்த மூன்றாவது அலையின்போது நான்கு மாதங்களில் மாத்திரம் 5,654 பேர் உயிரிழந்துள்ளார்கள். இந்த ஓகஸ்ட் மாதத்தின் முதல் 15 நாட்களிலே மாத்திரம் 1,755 உயிரிழப்புகள் ஏற்பட்டுள்ளன. அந்த வகையில், பாரிய பிரச்சினைக்கு எமது நாடு முகங்கொடுத்துக் கொண்டிருக் கின்றது. இந்த நாட்டிலே 20 சதவீதமானவர்கள்தான் கொரோனாவுக்கு எதிரான முழுமையான எதிர்ப்புச் சக்தியை - 2 தடுப்பூசிகளையும் - பெற்றிருக்கிறார்கள். இதில் பாரிய இடைவெளி காணப்படுகின்றது. கொரோனாவிலிருந்து மக்களை மீட்டெடுக்க வேண்டிய தேவை அரசாங்கத்திற்கு இருக்கிறது. இந்நாட்டிலுள்ள பொறுப்புவாய்ந்த அமைச்சர் களின் கருத்துக்களை அரச உயர் மட்டம் செவிமடுப்பதில்லை; சுகாதாரத்துறையினரின் பரிந்துரைகளை அமுல்படுத்துவது மில்லை. அரசாங்கம் தங்களைக் காப்பாற்றும் என்ற நம்பிக்கையை இழந்து தங்களைத் தாங்களே காப்பாற்ற வேண்டிய துர்ப்பாக்கிய நிலைக்கு இந்த நாட்டு மக்கள் தள்ளப்பட்டிருக்கிறார்கள்.

இந்தச் சபையிலே உரையாற்றிய எதிர்க்கட்சித் தலைவர் அவர்கள் மிகத் தெளிவாக தனது கருத்தினைக் கூறினார். இது பொதுவான பிரச்சினையாகும். எனவே, எம்மிடமும் பொறுப்புக்களை ஒப்படையுங்கள்! ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற வேறுபாடு இல்லாமல், இந்த இடரிலிருந்து நாட்டை மீட்டெடுப்பதற்கு நாங்கள் அனைவரும் ஒன்றுபட்டு அர்ப்பணிப்போடு செயற்பட வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ප්‍රේමනාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.48]

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි. අද ඉදිරිපත් කර තිබෙන 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත ගැන තමයි බොහෝ දෙනෙකු අද කථා කළේ. මුලින්ම, මම මේ කාරණය කියන්න ඕනෑ. අද උදේ ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා කිව්වා මේක ඉංග්‍රීසියෙන් විතරක් මුද්‍රණය කළ පනත් කෙටුම්පතක් කියලා. එතුමාට මා විශේෂයෙන්ම කියන්න ඕනෑ, එහෙම නොවෙයි, මේ පනත් කෙටුම්පත පැහැදිලිවම භාෂා තුනෙන්ම මුද්‍රණය කර තිබෙන බව. හැබැයි, ඒ එක්කම කිව යුතු කාරණයක් තිබෙනවා. අපි දන්නවා, අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් නඩු තීන්දු ලියන්නේ සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් බව.

[ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා]

ශ්‍රේෂ්ඨාධිකරණය ඉංග්‍රීසි භාෂාවෙන් ලියන නඩු තීන්දු තීරණ පාර්ලිමේන්තුවට ද එහෙමපිටින් එනවා. මේ සම්බන්ධයෙන් මා පැහැදිලිවම කියන්න ඕනෑ කරුණක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වැඩිදෙනෙකුගේ -නීතිඥයෙකු වුණත් මගේ පවා- වැඩි කැමැත්ත, වැඩි භාෂා ශක්‍යතාව තිබෙන්නේ සිංහල භාෂාවට. මම සිංහලෙන් හිතන කෙනෙක්. අප ඇතුළු අනෙකුත් මන්ත්‍රීවරුන්ට එම තීන්දු තීරණ සිංහල සහ දමිළ භාෂාවලිනුත් ලැබෙනවා නම් වඩා හොඳයි. පාර්ලිමේන්තුවට නඩු වාර්තා එන හැම වෙලාවකම වාගේ අපි ඒ ප්‍රශ්නය නඟනවා. හැබැයි, ඒ ප්‍රශ්නය එහෙමම අපට මඟ හැරී යනවා. මා ඒ කාරණය කෙරේ ගරු කථානායකතුමාගේ අවධානය යොමු කරවනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට එවනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු තීරණ පාර්ලිමේන්තුව හරහා සිංහල සහ දමිළ භාෂාවලට පරිවර්තනය කරලා, මන්ත්‍රීවරුන්ට අවශ්‍ය භාෂාවකින් පරිශීලනය කරන්න අවස්ථාව ලබා දීම අනිවාර්යයෙන් කළ යුතුයි කියන කාරණය මම මේ අවස්ථාවේ විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

අධිකරණ ක්‍රියාවලියට කොරෝනා වයිරස් රෝගයෙන් වන බලපෑම ගැන ද මා යමක් කිව යුතුයි. අප අසා තිබෙන ආකාරයට සාම්ප්‍රදායික ව්‍යවහාරය තුළත් කියන්නේ, "නඩු යන්නෝ වැනසෙන්නෝ" කියලායි. අද කොරෝනා වසංගතය තුළ අපට පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා, නඩු කටයුතුවලට සම්බන්ධ වන අපේ රටේ ජනතාව විශාල වශයෙන් අගතියට පත් වෙලා තිබෙන බව. නඩු කල් යෑම තුළ පැමිණිල්ල ද, විත්තිය ද, වින්දිතයා ද කියා අදාළත්වයක් නැතිව හැම පාර්ශ්වයක්ම අද විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා.

ඒ එක්කම නීතියේ තිබෙන සමහර ප්‍රතිපාදන නිසාත් ගැටලු ඇති වනවා. විශේෂයෙන්ම ඉදිරිපත් කරන අභියාචනය -ඇපැල- හා නඩුවක් පැවරීමට ඇති අවම කාල සීමාව වාගේ කාරණා බැලුවාම කොවිඩ් වසංගතය නිසා ඒ කාරණාවලට බොහෝ ගැටලු ඇති වෙලා තිබෙනවා. නමුත්, මේ පනත් කෙටුම්පත තුළින් ඒ සියල්ලම ආවරණය කරලා ඒ සඳහා වැඩි කාලයක් ලබා දී තිබෙනවා. ඒ අනුව මෙය සම්මත විය යුතු පනත් කෙටුම්පතක්. මේ පනත් කෙටුම්පත සම්බන්ධව අපට චෝදනා කළා. අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රතිපාදන අනුව යම් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් අධිකරණයකට යාමේ අයිතිය තිබෙනවා. ඒ ප්‍රතිපාදනය තුළ මේ පනත් කෙටුම්පත අධිකරණය ඉදිරියේ සලකා බලා යම් යම් වගන්ති සංශෝධනය වෙලා නැවත අපේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එය තමයි විය යුත්ත. හැබැයි, පැහැදිලිව කිව යුතු කරුණක් තිබෙනවා. මම දැක්කා, අද ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයේදී කියනවා, "අපේ රටේ විනිශ්චයකාරවරුන්ට විශාල බලපෑමක් එල්ල වෙලා තිබෙනවා. විනිශ්චයකාරවරුන්ට එහෙම බලපෑම් එල්ල කරන්න බැහැ" කියලා. අපිත් ඉන්නේ ඒ අදහසේ බව අපි පැහැදිලිව කියනවා. හැබැයි මට මතකයි, එදා යහ පාලන ආණ්ඩුව කාලයේ මේ වාගේම උද්ඝෝෂණ තියද්දී මොකක්ද වුණේ කියලා. එදා ජන සටන පාද යාත්‍රාව තියද්දී නුවර ඉඳලා කොළඹ දක්වා වූ හැම අධිකරණයකටම මම ගියා; එදා හිටපු ප්‍රාදේශීය නීතිඥවරු එක්ක ගියා. මේ විධියටම පොලීසිය ගිහින් ඒ ජන සටන පාද යාත්‍රාව කොළඹට එන්න දෙන්නේ නැතුව වැළැක්වූවා. හැබැයි, අපි උසාවියෙන් උසාවියට ගිහින් ඒ තහනම් නියෝගය වියුක්ත කර ගත්තා. එදා අපි ඒ ක්‍රියාවලිය සිද්ධ කළා. අපි අදත් ඉන්නේ ඒ මතයේ.

එදා කෑගල්ලේදී ධර්මසිරි සේනානායක මහත්මයාගේ පිළිරුවට මල් මාලාවක් දැම්මා කියලා පොදු දේපළ පනත යටතේ ඒ සේවකයන්ව රිමාන්ඩ් කළා. එදාත් මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට ගිහින් අපි ඇප ලබාගත්ත ආකාරය මට මතකයි. ඒ වාගේ සමහර විත්තිකරුවන්ට FCID එකෙන් පැමිණිලි ගොනු කළා; ඒ අයට ඇප දුන්නා කියලා අතිරේක මහෙස්ත්‍රාත්වරුන්ව ගෙදර යවපු අවස්ථාත් එදා අපි දැක්කා. එහෙම කාරණා අපි එදාත් අනුමත කළේ නැහැ. අදත් අනුමත කරන්නේ නැහැ. ඒ නිසා මෙය පැහැදිලිව කියන්න ඕනෑ. විනිශ්චිත නඩු තීන්දුවල තිබෙනවා, පොලීසිය කියන කාරණයම මහෙස්ත්‍රාත්වරයෙක් පිළිගත යුතු නැහැ කියලා. මහෙස්ත්‍රාත්වරයෙක් පොලීසියේ නිල මුද්‍රාව වෙන්න ඕනෑ නැහැ කියලා විනිශ්චිත නඩු තීන්දුවල තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, මහෙස්ත්‍රාත්වරු අදීනව කටයුතු කරයි කියලා.

එදා කටයුතු කරපු ආකාරය ගැන අපට හොඳ උදාහරණ තිබෙනවා. එදා යෝෂිත රාජපක්ෂ මහත්මයාට ඇප දුන්නා කියලා, ඒ ඇප නියෝගය දීපු විනිශ්චයකාරතුමාට විශ්‍රාම අරගෙන ගෙදර යන්න වුණා. හැබැයි, අද එහෙම කරන්නේ නැහැ. එදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට දඬුවම් කරන්න හදපු විශේෂ මහාධිකරණවලට පත් කරපු විනිශ්චයකාරවරු දෙදෙනා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු විධියට පත් කර තිබෙනවා. දැන් එහෙම භය වෙන්න හේතුවක් නැහැ. ඒ වාගේම යම් අධිකරණයක පක්ෂග්‍රාහිත්වයක් ඇති වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් මුලින්ම විරුද්ධ වෙන්නේ අපි බවත් පැහැදිලිව කියනවා.

අද මේ තිබෙන තත්ත්වය දැක්කාම මට පෙනෙන්නේ, විපක්ෂයේ සියලු දෙනා වෙඩි නූල පත්තු කරලා සාමදානයට කථා කරන ස්වරූපයකුයි. උගුල අටවලා සාමදානයට කථා කරන ස්වරූපයක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. මේ උද්ඝෝෂණවලට, තමන්ගේ අදහස් පළ කිරීම්වලට අපේ විරුද්ධත්වයක් නැහැ. නිරෝධායන නීති කඩ කිරීම් සම්බන්ධයෙන් මේ ආණ්ඩුව එක් අවස්ථාවක දේශපාලන සගයෝ රිමාන්ඩ් කරද්දි අපි කිව්වා, "ඒක වැරදියි" කියලා. හැබැයි "ඒක වැරදියි" කියා අපි කිව්වේ, ලිබරල් විධියට හිතලා; උද්ඝෝෂණ කිරීමේ අයිතිය ගැන කල්පනා කරලා. හැබැයි, ඒකේ ප්‍රතිවිපාක අද අපට පෙනෙන්න තිබෙනවා. මොකක්ද ප්‍රතිවිපාකය? වෙඩි නූල පත්තු කරලා සජිත් ප්‍රේමදාස මහත්තයා පැත්තකට වෙලා ඉන්නවා කියලා මම කිව්වේ ඇයි? උද්ඝෝෂණ රැල්ලක් දිගින් දිගටම අරගෙන ගිහිල්ලා අද මේ රට පුපුරණ තත්ත්වයට පත් කර තිබෙනවා. කොරෝනා වසංගතයේ රැලි තුනක් පාලනය කරලා මේ වසංගතය යම් තත්ත්වයකට පාලනය කරලා තිබුණේ. අද රෝග ව්‍යාප්තියේ යම් වැඩි වීමක් තිබෙන බව ඇත්ත. හැබැයි, මේ තත්ත්වයට පත් වෙන්න මූලික දායකත්වය දුන්නේ කවුද? ඒකට මූලිකත්වය දුන්නේ අපිද, ඔබතුමන්ලාද කියන එක නොවෙයි ප්‍රශ්නය. නමුත්, ඒ උද්ඝෝෂණ රැල්ල තුළ ක්‍රියා කරපු ආකාරය අපි පැහැදිලිව දැක්කා.

එන්නත්කරණ ක්‍රියාවලිය ආරම්භ කළ මුල් කාලය පුරාම තමුන්නාන්සේලා ජනතාවට සැක සංකා ඇති කළා. එන්නත ලබා ගන්න කිව්ව නිසි වෙලාවේ එන්නත විද ගත්තේ නැහැ. සෞඛ්‍ය සේවකයින්ට පස්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එන්නත ලබා දුන්නා. ඇයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එන්නත් ලබා දුන්නේ? අපි මළ ගෙවල්වලට සහභාගි වනවා. සංවර්ධන ව්‍යාපෘතිවලට සහභාගි වනවා. පාක්ෂිකයන්ගේ ගෙවල්වලට යනවා. විවාහවල සාක්ෂියට අත්සන් කරන්න යනවා. අපි ජනතාවත් එක්ක ගැටෙන නිසා තමයි සෞඛ්‍ය සේවකයන්ට එන්නත ලබා දුන්නාට පසුව අපට එන්නත ලබා දුන්නේ. තමුන්නාන්සේලා මොකද කළේ? ඒ වෙලාවේ එන්නත විද ගත්තේ නැහැ. හැබැයි, අපි එන්නත විද ගත්තා. තමුන්නාන්සේලා දැන් භය වෙලා, එන්නත විදගෙන තිබෙනවා. දැන් හෝ එන්නත ලබාගත් එක ලොකු දෙයක්. හැබැයි, තමුන්නාන්සේලා ඒ වගකීම ඉෂ්ට කළාද? එන්නත ලබා දුන් වෙලාවේ මහජන නියෝජිතයෝ හැටියට එන්නත විද

ගත්තාද? නැහැ. තමුන්නාන්සේලා නිසා කොවිඩ් පොකුරු කොච්චර ඇති වුණාද? තමුන්නාන්සේලාගේ නායකයාට කොවිඩ් රෝගය හැදුණා. එතුමාට කොවිඩ් රෝගය හැදීම තුළ කොච්චර පතුරුවන්න ඇතිද? ඒ වාගේම තමුන්නාන්සේලාගේ උද්ඝෝෂණ නිසා කොච්චර රෝගය පැතිරෙන්න ඇතිද? අසරණ මිනිස්සු කොච්චර මැරෙන්න ඇතිද? ඒ නිසා තමුන්නාන්සේලාට මේ පාප කර්මයෙන් මිදෙන්න බැහැ. අපි කාටවත් ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. අපි කියන්නේ, සදාචාරාත්මක අතින් මේ ගැන කථා කරන්න තමුන්නාන්සේලාට යුතුකමක් නැහැ කියන එකයි. උද්ඝෝෂණ කරන්න එපා කියලා අපි කවදාවත් තමුන්නාන්සේලාට කියන්නේ නැහැ. හැබැයි, උද්ඝෝෂණ කළ යුතු තත්ත්වයක් නොවෙයි, දැන් තිබෙන්නේ. දැන්වත් තැනකට එන්න. අපි සුමාන දෙකකට, මාසයකට උද්ඝෝෂණ පැවැත්වීම නතර කරමු. උද්ඝෝෂණ නවත්වලා ඇවිත් අපි කථා කරමු. අද ආණ්ඩු පක්ෂයේ රැස්වීම් පැවැත්වුයේ නැහැ. හැබැයි, ආණ්ඩු පක්ෂ රැස්වීමේදී කියන්න තිබුණු දෙයක් මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වැඩිමහල් සහෝදරයා ගම්පහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරයෙක්. අද වනවිට ඔහුගේ පුතාට කොවිඩ් හැදිලා. මගේ අම්මයි, තාත්තයි ඉන්නේත් ඔහුගේ ගෙදර. මමත් රජයෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් සුමාන දෙකකට මේ රට lock down කරන්න කියලා. හැබැයි, මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. පසුගිය කාලයේ රට lock down කර තිබියදී මිනිසුන් තමන්ගේ පවුලේ අයත් සමඟ පුළුවන් තරම් ගමන් බිමන් ගියා; පාරේ ඇවිද්දා. නමුත් මේ පවතින තත්ත්වය තුළ අපි ජනතාවට පැහැදිලිව කියන්න ඕනෑ, ජනතාව ස්වයං තීරණයක් ගත යුතුයි කියා. සියලු ජනතාව තම-තමන් ගැන හිතා කටයුතු කරන්න ඕනෑ. එය අපි ඔක්කෝම එකතු වෙලා කරන්න ඕනෑ දෙයක්. විපක්ෂයද, ආණ්ඩුවද කියන එක නොවෙයි, මෙතැන තිබෙන්නේ. හැබැයි, විපක්ෂය කරලා තිබෙන්නේ මොකක්ද? වෙඩි නූල පත්තු කරලා සාමදානයට කථා කිරීමක් තමයි දැන් කරන්නේ.

මේ කටයුතු කරන්නේ හමුදාවද, ආණ්ඩුවද කියා නොවෙයි බැලිය යුත්තේ. සමහර වේලාවට හමුදාව වැඩ කටයුතු කරන එක හොඳයි කියනවා. සමහර වේලාවට හමුදාව කරනවා කියලා ආණ්ඩුවට ගරහනවා. නමුත් මෙතැනදී එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන එක නොවෙයි, කරන්න තිබෙන්නේ. අපි සියලු දෙනා එකතු වෙලා මේ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ. කොවිඩ් මරණ සංඛ්‍යාව වැඩි වෙනකොට, තමුන්නාන්සේලා රූපවාහිනිය වටා එක් රොක් වෙලා ඒකෙන් බොහොම තිරිසන් ආස්වාදයක් ලබන ස්වරූපයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. කවුරුත් කියන්නේ මේ වේලාවේ අපි ඔක්කෝම එකතු වෙලා මෙම රෝගය මර්දනය කිරීමේ කටයුතු සිද්ධ කළ යුතු බවයි. එදා තමුන්නාන්සේලා සියලු උද්ඝෝෂණ නැවැත්වූවා නම්, අද මේ තත්ත්වය නිර්මාණය වෙන්නේ නැහැ. ආණ්ඩුව තුළ සිටින අපි කියන්නේ, සුමානයකට හෝ මේ රට වසා තබමු කියන එකයි. හැබැයි, ප්‍රශ්නයක් තිබෙනවා. දුප්පත්, පොඩි මිනිහා ජීවත් වෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. රට වහන්න ඕනෑය කියා "මුහුණු පොත" තුළ වැඩියෙන්ම කථා කරන මිනිසුන් රජයේ සේවකයන්; යමක් කමක් තිබෙන මිනිසුන්. මම එම සහෝදර-සහෝදරියන්ගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ගෙවල්වලට වෙලා ඉන්න කියලා; ඇවිදින්න එපා කියලා. පසුගිය lockdown කාලයේ ඒ අය තමයි අපෙන් වැඩිපුර ඉල්ලීම් කළේ, "එහාට යන්න තිබෙනවා, මෙහාට යන්න තිබෙනවා, පුළුවන් නම් උදව්වක් කරන්න" කියලා. අපි ඒ අයගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර ඒ තත්ත්වයෙන් මිදෙන්න කියලා.

මේක අපි ඔක්කෝම එකතු වෙලා මුහුණ දිය යුතු තත්ත්වයක්. ආණ්ඩුව හරියට කළාද, ආණ්ඩුව වැරදියට කළාද නොවෙයි, අපි ඔක්කෝම එකතු වෙලා මේ තත්ත්වයෙන් මිදුණේ නැත්නම් අපි රටක් හැටියට අසාර්ථක තත්ත්වයට පත් වෙනවා. මොකද, අපි වන්දි ගෙවන්නේ ජීවිතවලින් නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් පැහැදිලිව කියන්න කැමැතියි. අධිකරණ කටයුතු සම්බන්ධයෙන් මම මුලින් සඳහන් කළා. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ සිටිනවා. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, අද වනවිට මේ රට තුළ වාහනවල මිල ගණන් විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලවල සංචාරක ක්ෂේත්‍රය තුළින් සහ නොයෙක් ව්‍යාපාර තුළින් වැඩිපුර මුදල් ඉපයූ අපේ රටේ ජනතාව, වාහන lease කරලා ගත්තා. ඔවුන් ඒ මුදල මූල්‍ය ආයතනවලට ගෙව්වා. එම වාහනයේ lease එක ගෙවා අවසන් වෙන්න එනකොට ඔහු තවත් වාහනයක් ගත්තා. මොකද ඔහුගේ ආර්ථිකය හොඳයි; ඔහුට හොඳ අනාගතයක් පෙනුණා. එහෙම වාහන අරගත්තු අවස්ථාවල මූල්‍ය සමාගම් හත-අටක් මොකක්ද කළේ? ඒ මූල්‍ය සමාගම්වලින් ණය ගන්න කොට, දෙන ගිවිසුම දෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒක සිංහල භාෂාවෙන් දෙන්නේත් නැහැ. ඒ ගිවිසුම දෙනකොට ඔවුන් මොකද කරන්නේ? ඔවුන් අර පුද්ගලයා මුල් වාහනයේ lease එක ගෙවා අවසන් වේගෙන එනකොට ඒක merge කරනවා; වාහන දෙකක ගිවිසුම් එක්කාසු කරනවා.

එම පුද්ගලයා එක වාහනයක් ගත්තේ 2015දී නම්, 2019 වෙනකොට එම වාහනයට අදාළ ණය ගෙවා අවසන් වෙන්න ආසන්න නිසා ඔහු තව වාහනයක් ගන්නවා. පළමුවැනි ණය අරගෙන ගෙවාගෙන ගියාට, අද මේ පවතින තත්ත්වය තුළ දෙවැනියට ගත්තු ණය ගෙවා ගන්න බැරි තත්ත්වයකට ඔවුන් පත් වෙලා තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රය තුළ වාගේම හැම ක්ෂේත්‍රයක් තුළම අද මිනිසුන්ට අමාරු තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. හැබැයි, මේ මූල්‍ය සමාගම් හතර-පහ legal charges කියා වෙනම අය කළත්, ඔය එකම ගිවිසුමක්වත් ලියාපදිංචි කරන්නේ නැහැ. මම ඒ ගැන හොඳටම දන්නවා. ඔය ගිවිසුම්වලට අලුතින් ලේඛන පවා එකතු කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එහෙම වෙන්න විධියක් නැහැ. ඒ අය ණය දෙන්නේ එක වාහනයකට නම්, එම වාහනයේ වටිනාකම තක්සේරු කරලා ඒකට අදාළව සියයට 70ක් හෝ සියයට 50ක් තමයි ණය විධියට දෙන්නේ. හැබැයි, දැන් මොකද කරන්නේ? මුල් වාහනයට අදාළව අවුරුදු හතරක්-පහක් ණය ගෙවාගෙන ගිහිල්ලා එම පුද්ගලයා තවත් වාහනයක් ගන්නකොට, ආපසු ණයක් දීලා ඒ ණය පහසුකම් දෙක එකතු කරනවා. අද වෙනකොට සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටි අය, පාසල් ප්‍රවාහන සේවා පවත්වාගෙන ගිය අය, බස් රථ හිමියන්, ත්‍රි-රෝද රථ හිමියන් කියන සියලු දෙනාම විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඔවුන් මුලින්ම ණය ගෙවා ගෙන ආපු වාහනයට අදාළ කාල සීමාවෙන් දැන් වනවිට අවුරුදු ගණනක් අවසන් වෙලායි තිබෙන්නේ. ඒ අයට තව මාස ගණනයි ඒකට අදාළව ණය වාරික ගෙවන්න තිබෙන්නේ. ඒ අය කනකර හෝ උකස් කරලා එම වාහනය බේරා ගෙන එම වාහනය විකුණන්න උත්සාහ කරන කොට, අර මහ අධිපති මූල්‍ය සමාගම් කියන්නේ මොකක්ද? "කරුණාකර තමුන්නාන්සේට මේ වාහනය release කරන්න බැහැ. අපි අර වාහනය එක්ක මේක merge කර තිබෙනවා" කියනවා. ඒක වැරදියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව කොපමණ වේලාවක් තිබෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි ජනතාව ගැන හිතන ආණ්ඩුවක්. ඒ නිසා කරුණාකර මේ ක්‍රමය වෙනස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ අය ණය මුදල් ගන්නේ අවස්ථා දෙකකදී. එම ණය ගිවිසුම් ලියාපදිංචි කරන්න කියා එම මූල්‍ය සමාගම්වලට කියන්න. මොකද, මූල්‍ය සමාගම් ලියාපදිංචි ගාස්තු ගන්න නිසා. එතකොට අර අසරණ මිනිසුන්ට එක වාහනයක් release කරගෙන ඒක විකුණලා ඉතුරු ණය මුදලින් ගැලවෙන්න පුළුවන්. වාහන හත-අට ගත් මිනිසුන්ගේ ණය ගෙවා අවසන් වුණු වාහනයවත් release කරන්නේ නැහැ, මේ මූල්‍ය සමාගම්. මෙවැනි මූල්‍ය සමාගම් හත-අටයි තිබෙන්නේ. දහස් සංඛ්‍යාත, ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් මේ මූල්‍ය සමාගම් නිසා බොහෝ පීඩාවට පත් වෙනවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ මොහොතේ ජනතාවට ලැබිය යුතු එම ප්‍රතිලාභය ලබා දෙන්න කියලා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.00]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கொரோனா வைரஸ் தொற்று (கொவிட்-19) (தற்காலிக ஏற்பாடுகள்) சட்டமூல விவாதம் இங்கே நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இந்த விவாதத்துக்குள் செல்வதற்கு முன்னதாக நான் இங்கு ஒரு விடயத்தைப் பதிவுசெய்ய விரும்புகின்றேன். கொவிட் தொற்று காரணமாக மரண ஓலத்துடன்கூடிய மிகப் பயங்கரமானதொரு சூழல் நிலவிக் கொண்டிருக்கின்ற இச்சந்தர்ப்பத்திலே, இராணுவத் தினரின் வெறியாட்டமும் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. நேற்று முன்தினம் ஞாயிற்றுக்கிழமை அதிகாலை 2.00 மணியளவிலே யாழ்ப்பாண மாவட்டத்திலுள்ள பொன்னாலைப் பகுதியில் வீடுகளுக்குள் திடீரெனப் புகுந்த படையினர், அங்கிருந்த பொதுமக்கள் மீதும் இளைஞர்கள் மீதும் காட்டுமிராண்டித்தனமான தாக்குதல்களை நடாத்தி, வெறியாட்டம் ஆடியிருக்கின்றார்கள். இதற்கு எங்களுடைய வன்மையான கண்டனத்தைத் தெரிவித்துக்கொள்கின்றோம்.

அடுத்ததாக, தற்போது கொவிட் சூழல் மிகப் பயங்கரமானதாக மாறியிருக்கின்றது. நாளும் பொழுதும் மரணங்களின் எண்ணிக்கையும் தொற்றாளர்களின் எண்ணிக்கையும் அதிகரித்துக்கொண்டு செல்கின்றன. இந்த வேளையில், சிறைகளிலே அடைத்துவைக்கப்பட்டிருக்கின்ற தமிழ் அரசியல் கைதிகள் விடுதலை செய்யப்பட வேண்டும் என்பது எங்களுடைய அவசரமானதும் அவசியமானதுமான கோரிக்கையாக இருக்கின்றது. சிறைகளில் இருக்கின்ற தமிழ் அரசியல் கைதிகள் அப்பாவிகள்! அவர்கள் எந்தவிதமான குற்றங்களையும் செய்யாதவர்கள்! உங்களுடைய கொடிய பயங்கரவாத தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு, இரும்புக் கம்பிகளுக்கிடையில் அடைத்து வைக்கப்பட்டிருக்கின்றவர்கள்! கிட்டத்தட்ட ஒன்றரை ஆண்டுகளாக நிலவுகின்ற கொரோனா நெருக்கடி நிலைமை காரணமாக அவர்களை அவர்களுடைய உறவினர்கள் சென்று பார்க்க முடியாத நிலைமை இருக்கின்றது. அவர்களுடைய ஊர்களுக்கு அண்மையில் இருக்கின்ற சிறைகளுக்கேனும் சென்று, உறவினர்களைப் பார்ப்பதற்கான வாய்ப்புக்களும் அவர்களுக்கு மறுக்கப்பட்டிருக்கின்றன. இதனால், அந்தக் கைதிகளும் அவர்களுடைய உறவினர்களும் மிகவும் மன உளைச்சலுக்கு உள்ளாகியிருக்கிறார்கள். ஆகவே, தயவு செய்து இந்த அரசியல் கைதிகளுக்கு பிணை வழங்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, கொரோனா பரவல் மோசமடைந்து வருகின்ற இவ்வேளையில், இந்தியாவிலிருந்து ஒட்சிசனைக் கொண்டு வருவதற்கு ஒரு கப்பலை அனுப்பியிருப்பதாக செய்திகள் வெளியாகியிருக்கின்றன. யாழ்ப்பாண போதனா வைத்திய சாலையில் ஒட்சிசனை உற்பத்தி செய்வதற்கான ஒரு plantஐ அமைப்பதற்கு அனுமதி கோரியிருக்கிறார்கள். தயவுசெய்து, அந்த oxygen plantஐ அங்கு அமைப்பதற்கு நீங்கள் உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டும். கொரோனா நெருக்கடி நிலவுகின்ற இந்நேரத்திலும்கூட, நீங்கள் இராணுவத்தினருக்கு கொடுக்கின்ற முக்கியத்துவத்தை வைத்தியத்துறையினருக்கு வழங்குவதில்லை என்பது மிகவும் வேதனைக்குரிய விடயமாக இருக்கிறது. ஆகையால், வைத்தியத்துறையினருடைய ஆலோசனைகளைக் கேட்டு, அதன்படி உடனடியாக நடவடிக்கை எடுங்கள்! இந்த நிலைமையைக் கட்டுப்படுத்த வேண்டுமாக இருந்தால், அமைச்சர்களை மாற்றிப் பிரயோசனமில்லை. மாறாக, இராணுவத்தினரிடம் இருக்கின்ற கொவிட் செயலணியின் பொறுப்பை -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு அஜித் ராஜபக்ஷ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. AJITH RAJAPAKSE *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
இராணுவத்தினரிடம் இருக்கின்ற கொவிட் தடுப்புச் செயலணிப் பொறுப்பைச் சுகாதாரத்துறையினரிடம் கையளித்து, கொரோனாவைக் கட்டுப்படுத்துவதற்கான நடவடிக் கைகளை மேற்கொண்டால் மாத்திரம்தான் உங்களால் இதனை வெற்றிகொள்ள முடியும். இல்லையென்றால், ஒரு பொழுதும் உங்களால் கொரோனாவை வெற்றிகொள்ள முடியாது.

இப்பொழுது கொரோனா மரணங்கள் அதிகரித்து வருகின்றது. இந்த நிலையில், வட மாகாணத்தில் யாழ். மாவட்டத்தில் ஓரிடத்தில் மாத்திரம்தான் கொரோனாவால்

மரணித்தவர்களது உடல்களை எரிப்பதற்கான இடம் இருக்கின்றது. அங்கே ஒரு நாளைக்கு 3 உடல்கள்தான் தகனஞ் செய்யப்படுகின்றன. இப்பொழுது நான்கு உடல்களைத் தகனஞ் செய்வதற்குரிய முயற்சி நடைபெறுகின்றது. மருத்துவமனையிலே நாளாந்தம் கிட்டத்தட்ட 10 உடல்கள் தேங்கி வருகின்றன. அவற்றை வவுனியாவுக்கு மாற்று வதற்கான முயற்சிகள் நடைபெறுகின்றன. புதைக்க விரும்புகின்றவர்களது உடல்களைத் தீவினுடைய ஒருசில பகுதிகளில் மட்டும்தான் புதைக்கலாமென்று ஏற்கெனவே நீங்கள் உத்தரவிட்டிருக்கின்ற காரணத்தினால் பல்வேறுபட்ட அசௌகரியங்களை மக்கள் எதிர்நோக்கி வருகின்றார்கள். இந்த நிலைமையில் எரிப்பதற்குக்கூட வவுனியாவுக்குக் கொண்டுசெல்ல வேண்டும் அல்லது வேறு மாவட்டங்களுக்குக் கொண்டுசெல்ல வேண்டுமென்றால், அவர்களுடைய இறுதிக் கிரியைகள், மத நம்பிக்கையோடு சம்பந்தப்பட்ட விடயங்களில் அவர்கள் பெரும் சிரமங்களை எதிர்நோக்குவார்கள். ஆகவே, அந்த மாவட்டத்திலே உடல்களை எரிப்பதற்கான வசதிகளை நீங்கள் அதிகரிக்க வேண்டும். மின்சாரத்திலே எரிப்பதற்கு அப்பால், விறகைப் பயன்படுத்தி கொரோனாவால் இறந்தவர்களது உடல்களை எரிப்பதற்கு அனுமதி வழங்குவது தொடர்பாக நீங்கள் பரிசீலிக்க வேண்டுமென இந்த இடத்திலே நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அத்தோடு, இந்தக் கொரோனாச் சூழலிலே பணிகளுக்காக அழைக்கப்படுபவர்களுடைய எண்ணிக்கையைத் தீர்மானிக்கின்ற ஒழுங்குகள் பற்றிய அதிகாரம் நிறுவனத் தலைவர்களிடம் கையளிக்கப்பட்டிருக்கின்றது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
நான் எனது பேச்சை முடித்துக்கொள்கின்றேன். ஒரு நிமிடம் தாருங்கள்!

திணைக்களத் தலைவர்களிடம் அந்த அதிகாரம் ஒப்படைக்கப்பட்டிருக்கின்றது. அதாவது, பணிக்கு யாரை அழைப்பது? எத்தனை பேரை அழைப்பது? என்பன தொடர்பான அதிகாரம் அவர்களிடம் வழங்கப்பட்டிருக்கின்றது. அங்கே அதிகாரத் துஷ்பிரயோகங்கள் நடைபெறுகின்றன. வடக்கு, கிழக்கிலும் அதிகாரத் துஷ்பிரயோகங்கள் நடைபெறுகின்றன. அவை நிறுத்தப்பட வேண்டும். தாங்கள் விரும்புகின்றவர்களைச் சுற்று அடிப்படையில் கூப்பிடுவதும், தங்களுக்கு விருப்பமில்லாதவர்களை ஒவ்வொருநாளும் பணிக்கு வரவேண்டும் என்று வற்புறுத்துவதும், ஒரு நிறுவனத்திலே ஒருவருக்குத் தொற்று ஏற்பட்டால் சில இடங்களிலே நிறுவனத்தை மூடுவதும், சில இடங்களிலே குறிப்பிட்ட நபரை வெளியேற்றிவிட்டு நிறுவனத்தை நடத்துவதுமான செயற்பாடுகள் தொடர்ந்து நடைபெற்று வருகின்றன. இந்த முகாமைத்துவம் மிகத் தவறானது. எனவே, இதனைச் சீர் செய்ய வேண்டுமென்று கேட்டுக்கொண்டு விடைபெறுகின்றேன்.

[பி.ப. 4.06]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, தற்போது நாட்டில் சுமார் 8 இலட்சத்துக்கும் அதிகமான வழக்குகள் நீதிமன்றங்களில் விசாரணைகளின்றித் தேங்கியுள்ளன. கொவிட் காலப் பகுதியில் வழக்குகள் மேலும் காலந்தாழ்த்தப்படாதிருப்பதற்கு இந்தச் சட்டமூலம் துணையாக இருக்கின்றது. நீதிமன்றங்களில் தேங்கியிருக்கின்ற வழக்குகளைத் துரிதமாக விசாரிக்க வேண்டிய ஒரு நிலைமை ஏற்பட்டிருக்கின்றது. கொவிட் தொற்று ஏற்பட்டாலும் நீதிமன்றங்களில் உள்ள வழக்குகளை விரைவாக முடிக்கவேண்டிய ஒரு காலகட்டத்தில் நாங்கள் இருக்கின்றோம். ஏனென்றால், தொடராக ஏற்படுகின்ற இவ்வாறான நிலைமைகளைச் சந்தர்ப்பமாக வைத்துக் கொண்டு சிலர் சட்டவிரோதமான செயற்பாடுகளில் ஈடுபடுகின்றனர். எனவே, இந்தச் சட்டமூலம் மிகவும் பொருத்தமான காலகட்டத்தில் கொண்டுவரப்பட்டிருக்கின்றது.

கொரோனாவைக் கட்டுப்படுத்தக்கூடிய பொறிமுறையை அரசு சரியான முறையில் கையாளவில்லை என்று எதிர்க் கட்சியினர் அரசைப்பார்த்துக் கூறுகின்றார்கள். எதிர்க் கட்சியைப் பொறுத்தளவில் அவர்கள் எதையுமே விமர்சிக்கின்ற நிலையைத்தான் இதிலும் காட்டுகின்றார்கள். கொரோனாவின் ஆரம்பகாலகட்டத்திலே முதலாவது அலை எவ்வாறு கட்டுப்படுத்தப்பட்டதோ அதேபோல் ஏனைய காலகட்டங்களிலும் ஏனைய அலைகளையும் கட்டுப்படுத்தக் கூடிய நிலைமைகள் இருந்தாலும், தவறான புள்ளிவிபரங்கள், எடுகோள்கள் மற்றும் மிகைப்படுத்தப்பட்ட ஊடகச் செய்திகள் போன்றன பிரச்சினைக்குச் சரியான தீர்வு காண்பதில் அரசையும் அதிகாரிகளையும் திசை திருப்பிவிட்டன என்பதைத்தான் நாங்கள் இங்கு கூறவேண்டும். ஒரு சிறிய புள்ளியாக இருந்த கொரோனா இன்று 19 மாதங்களில் நாட்டையே ஆக்கிரமித்துள்ளது. இந்த நிலைமை ஏற்படுவதற்குக் காரணம் ஊடகங்களுடைய சில தவறான கணிப்பீடுகளும் தவறான விளக்கங்களுமாகும்.

கௌரவ சபாநாயகர் அவர்களே, கொவிட் சூழ்நிலையைச் சரியாக கையாளாததாலும், இத்தொற்று பற்றிய சரியான விளக்கத்தை மக்களுக்கு வழங்காததாலும் தேவையற்ற பிரச்சினைகள் ஏற்படுகின்றன. குறிப்பாகச் சொல்வதென்றால், தரைக்கீழ் நீரிலும் மண்ணிலும் தரையிலும் காட்டிலும் மேட்டிலும் இந்த நோய்க் கிருமிகள் பரவி, நீண்ட காலத்தின் பின்னரும் கொரோனா தொற்று ஏற்படும் என்ற தவறான கருத்தும் மிகையான கணிப்பீடுகளும் மக்களைக் குழப்பிவிட்டன. நிலைமை இவ்வாறு இருந்தாலும் எமது அரசாங்கத்தின் செயற்பாடுகள் மிகவும் சிறப்பாகக் காணப்படுகின்றன. கொரோனா தொற்றுக்கு எதிரான vaccine ஏற்றும் செயற்பாடானது நாட்டின் சகல பகுதிகளிலும் சிறப்பாக இடம்பெற்று வருகின்றது. குறிப்பாக, வட மாகாணத்தில் இதுவரை 30 வயதுக்கு மேற்பட்டவர்களில் கிட்டத்தட்ட 79 சதவீதமானவர்களுக்கு முதலாவது தடுப்பூசி ஏற்றப்பட்டிருக்கின்றது. வன்னித் தேர்தல் மாவட்டத்தில் நோய்த் தொற்று வீதம் குறைவு என்றபடியால், அப் பிரதேசத்துக்கு கடைசியாகத்தான் vaccine வழங்கப்பட்டது. குறிப்பாக, அங்கு கிட்டத்தட்ட 80 சதவீதமானவர்களுக்கு vaccines வழங்கப்பட்டிருக்கின்றன. ஏனைய நாடுகளுடன் ஒப்பிடும்பொழுது, இந்த நோய்த் தொற்றிலிருந்து மக்களைப் பாதுகாப்பதற்கு அரசாங்கத்தால் மேற்கொள்ளப்பட்டு வருகின்ற vaccine ஏற்றும் நடவடிக்கையானது எமது நாட்டில் அனைத்து மாவட்டங்களிலும் விரைவாக இடம்பெற்று வருவதைக் காணலாம். எமது அரசாங்கத்தைப் பொறுத்தளவில், வீடுவீடாகச் சென்று நோய்வாய்ப்பட்டவர் களுக்கும் வயதானவர்களுக்கும் vaccine ஏற்றுகின்ற செயற்பாட்டைச் செய்து வருகின்றது.

இன்னொரு விடயத்தையும் இங்கு கூற வேண்டும். கொவிட் காரணமாக இறக்கின்றவர்களின் உடல்களை

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

அடக்கம் செய்வதற்கென இப்பொழுது ஓர் இடத்தைத் தெரிவுசெய்திருக்கிறார்கள். எனக்கு முன்னர் பேசிய உறுப்பினர் குறிப்பிட்டதுபோல, ஒவ்வொரு மாவட்டத்திலும் அத்தகைய உடல்களை அடக்கம் செய்வதற்கான இடங்களைத் தெரிவு செய்யவேண்டும். அந்த வகையில், அனைத்து மாவட்டங்களிலும் அந்த ஏற்பாட்டைச் செய்வதற்கு அரசாங்கம் ஆலோசித்து வருகின்றது. அதனை விரைவாக நடைமுறைப் படுத்த வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன். எனவே, வீண் பிரசாரங்களையும் குற்றச்சாட்டுக்களையும் முன் வைப்பதை விடுத்து, அனைவரும் ஒற்றுமையாக இந்த கொரோனா தொற்றிலிருந்து எமது மக்களைப் பாதுகாப் பதற்காக ஒன்றிணைந்து செயற்பட வேண்டுமென்று கூறி விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 4.10]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ මාතෘකාව ගැන කථා කරන්න මට ලැබී තිබෙන වේලාව මදි. ඒ නිසා කරුණු කිහිපයක් විතරක් කියන්න පුළුවන් වෙයි කියා මා හිතනවා.

ගරු කථානායකතුමනි, අපි දැක්කා, ඊයේ-පෙරේදා Cabinet reshuffle එකක් කරලා තිබුණා. ඒ reshuffle එක දැක්කාම මට මතක් වුණේ, අපි ගෙවල්වල යහළුවොත් එක්ක "ඕම්" කියන game එක සෙල්ලම් කරන ආකාරයයි. කාඩ්පැක් එකක් අරගෙන ඕම් සෙල්ලම් කරනවා වාගෙයි මේ Cabinet reshuffle එක කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඕම් සෙල්ලම් කරනකොට කාඩ් කුට්ටමේ ඉන්න ජෝකර්ලා දෙන්නා ඉවත් කරලා තමයි කැට බෙදන්නේ. මේ Cabinet reshuffle එක ඕම් අතක් වාගේ කියලා මට කියන්න හිතුණේ මේ නිසායි. මා දැක්කා, අපේ පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය ගිහිල්ලා හඬා වැලපුණා, අමාත්‍යාංශය එතුමියගෙන් ගලවනවා කියා එතුමිය දන්නේවත් නැහැ කියලා. මේක ඕම් අතක් වාගේ කියලා මා කිව්වේ ඒකයි. මොකද, එතැනදීත් randomly තමයි කාඩ් බෙදන්නේ. එතුමියගේ අමාත්‍යාංශය වෙනත් කෙනෙකුට දෙනවා කියලා එතුමිය දන්නේ නැත්නම්- එතුමිය කැමැතිද, නැද්ද කියලාවත් දන්නේ නැහැ.- එතුමියට ඒ සුදුසුකම් තිබෙනවාද කියලාවත් දන්නේ නැතුව ඔහේ නිකම් කැබිනට් අමාත්‍යාංශයක් දීලා තිබෙනවා කියලායි අපට පෙනෙන්නේ. ජෝකර්ලා දෙන්නාත් පැත්තකට දමලා කැට බෙදනවා කියා මා කියන්න හේතුව මේකයි. අද මේ රට පාලනය කරද්දී, රටේ තීන්දු තීරණ ගන්නේ මේ ජෝකර්ලා. ඒක තමයි එහෙම කියන්න හේතුව.

ගරු කථානායකතුමනි, හිටපු සෞඛ්‍ය ඇමතිතුමිය කියා තිබුණා, බිල්ලට දෙන එකක් ගැන. එතුමිය බිල්ලට දෙන එකයි, ජනාධිපතිතුමා බිල්ලට යන එකයි ගැන කියා තිබුණා. ඇත්තටම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, සියලු දෙනාම එකතු වෙලා ලංකාවේ ජනතාවයි බිල්ලට දීලා තිබෙන්නේ කියන එක. කොවිඩ් -19 වසංගතයත් එක්ක ජනාධිපතිතුමා හෝ පවිත්‍රාදේවි වන්නිආරච්චි ඇමතිතුමිය හෝ වෙන කවුරුවත් නොවෙයි බිල්ලට දෙන්නේ. මේ ශ්‍රී ලංකාවේ ඉන්න සියලු ජනතාව තමයි බිල්ලට දීලා තිබෙන්නේ.

ඇෆ්ගනිස්තානයේ කාබුල් නුවර සිට මිනිස්සු plane එකකින් ගියා අපි දැක්කා. ඒ මිනිස්සු plane එක උඩ නැඟලා ගියා; ඒ සමහර මිනිස්සු වැටුණා. තව ටික කලක් මේ ආණ්ඩුව මෙහෙම රට පාලනය කළොත් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවේ ජනතාවටත් ඒ වාගේ යන්න අවස්ථාවක් උදාවෙයි කියලා මා කියන්න ඕනෑ. කාලයක් තිබුණා, ද්‍රවිඩ ජනතාව විතරයි refugeesලා හැටියට ලංකාවෙන් ගියේ. හැබැයි, මේ යන විධියට ගියොත් අනාගතයේදී plane එකක් ආවොත් සිංහල, දෙමළ, මුස්ලිම් සියලු ජනතාව refugeesලා වශයෙන් වෙන රටකට යන්න සූදානම් වෙයි. මොකද, මේ රටේ පාලනය එච්චරට අසාර්ථකයි කියා මා කියන්න ඕනෑ.

ඊළඟට, මා තවත් ඉතාම ශෝකජනක කථාවක් කියන්න ඕනෑ. මා මේ කියන දරුවා refugee කෙනෙක් හැටියට ගිය කෙනෙක් නොවෙයි. ඒ දරුවා ඉගෙන ගන්නයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ දරුවාගේ නම විශ්මා සඳමාලි. දරුවෙක් නොවෙයි, ඇත්තටම මටත් වඩා වයසින් වැඩි අයෙක්. ඒ සහෝදරියට අවුරුදු 33යි. විශ්මා සඳමාලි කියන ඒ සහෝදරිය ජපානයට ගිහිල්ලා තිබෙනවා ඉගෙන ගන්න. ජපානයේ ඉගෙන ගන්න ගමන් යම්කිසි අපහසුතාවකට පත්වීම නිසා එ් දරුවා ජපානයේ detention centre එකක සිරගත කර තිබෙනවා, ගිය අවුරුද්දේ අගෝස්තු මාසයේ සිට මේ අවුරුද්දේ මාර්තු මාසයේ හය වැනිදා තෙක්. මාස හයකට පසුව එ් සහෝදරිය මිය ගොස් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඇය මිය යාම පිළිබඳව ජපානය සමාව ඉල්ලා තිබෙනවා. හැබැයි, අද වෙනකල් ජපානයේ තිබෙන ශ්‍රී ලංකාවේ Embassy එකෙන් මේ පිළිබඳව කිසිදු පණිවුඩයක් දීලා නැහැ. ඒ පවුලේ කට්ටියට අසත්‍ය කාරණාත් කියා තිබෙනවා. ඒ දරුවා මැරෙන්න කලින් ලියුමක් ලියා තිබෙනවා. ඒකේ කියනවා, "These people do not take me to the hospital because I am in custody of ..."

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Yes, Hon. Dinesh Gunawardena?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, වගකීමක් නැතිව ප්‍රකාශ කරන්න එපා. ඒ දරුවා මිය ගියාට පසුව සහ ඒ කාලය පුරාම විදේශ අමාත්‍යාංශය, ජපාන තානාපති කාර්යාලය සමඟ ඉතාම ඕනෑකමින්, මැදිහත්වීමෙන් කටයුතු කර තිබෙනවා. ජපානය හා ශ්‍රී ලංකාව අතර තිබෙන මිත්‍රත්වය තුළ ඉතාම ඕනෑකමින් ඒ ගැන සොයමින්, එම පරීක්ෂණයෙන් පසුව ඒ පිළිබඳව සමාවත් අරගෙන තිබෙනවා. ඒ නිසා ඔබතුමා වෙනදා වාගේ වෙන වෙන ඒවා ගැන ප්‍රකාශ කරන්න. රටවල් අතර තිබෙන ගෞරවය හා මිත්‍රත්වය ඉතාම වැදගත්. ජපානය මේ ළඟදී ලංකාවට මිලියන ගණනක එන්නත් ලබා දුන්නා. අපි පාර්ලිමේන්තුවේ වග කීමෙන් කථා කළ යුතුයි. ඔබතුමා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයෙක්. ඔබතුමා ගැඹුරෙන් හිතා බලලා පාර්ලිමේන්තුවේදී කටයුතු කරන්න කියන එකයි මා දෙන උපදෙස.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, ඒ වෙලාව මගේ වෙලාවෙන් අඩු කරන්න එපා.

ගරු ඇමතිතුමනි, I am quoting from the online edition of today's "Daily Mirror" which states, "Japanese officials ignore a dying woman's cries for help". ඒ පවුලේ කට්ටියත් කියා තිබෙනවා,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මම ජපානයට ඇඟිල්ල දිගු කළේ නැහැ. මම ඇඟිල්ල දිගු කළේ ජපානයේ සිටින ශ්‍රී ලංකා තානාපතිටයි, ශ්‍රී ලංකාවේ නිලධාරින්ටයි. ඒ අය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්න. මොකද, ඒ සහෝදරියගේ පවුලේ කට්ටිය ඉන්නවා, ඔවුන්ගෙන් අහලා බලන්න පුළුවන්. ඒ සම්බන්ධව මා ළඟ තිබෙන සියලු ලිපි ලේඛන මම **සභාගත*** කරනවා.

ඒ සහෝදරිය මැරෙන්න කලින් ලියුමක් ලියා තිබෙනවා. මාස 6ක් ප්‍රතිකාර නැතිවයි ඒ සහෝදරිය මිය ගිහිල්ලා තිබෙන්නේ. මේ සිද්ධිය මැද පෙරදිග රටක වුණා නම්, රිසානා නෆීක්ගේ සිද්ධිය වගේ මේකත් ලොකු දෙයක් විධියට පෙන්නලා, ලංකාවේ උද්ඝෝෂණ කරලා මේ වෙද්දී ඒ සම්බන්ධයෙන් ගත හැකි නීතිමය තත්ත්වය ගැනත් සොයනවා. මට කථා කරන්න තිබෙන කාලය සීමිත නිසා මම ඒ ගැන වැඩිදුර කියන්නේ නැහැ. කෙසේ හෝ මේ refugee විධියට යන ළමයින් අතර, ශ්‍රී ලංකාව තුළ ජීවත් වෙන්න ඕනෑයි කියලා හිතන ළමයින් කොටසකුත් ඉන්නවා. ඒ ළමයින් වෙනුවෙන් මම Examinations Department එකෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි.

2008දී, 2009දී A/L කරපු ළමයින් අද Sri Lanka Audit Service, Sri Lanka Administrative Service, Sri Lanka Planning Service, Sri Lanka Education Administrative Service, Sri Lanka Accountants' Service සහ SLAS Grade III වාගේ විභාග ලියන්න බලාගෙන ඉන්නවා. ඒ අය, 2008-2009 යුද්ධය කාලයේ බොහොම අමාරුවෙන් ඉගෙනගෙන, A/L සමත් වුණු මගේ වයසේ සිටින ළමයින්. ඒ අයට ඒ examinationsවලට ඉල්ලුම් කළ හැකි වයස් සීමාව extend කරන්න. Examinations Department එකෙනුයි මම මේ ඉල්ලීම කරන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ළමයින්ටත් මේක වැදගත්. මේක ශ්‍රී ලංකාවේ සියලුදෙනාට අදාළ ප්‍රශ්නයක්. සමහර විභාග සඳහා ඉල්ලුම් කළ හැකි වයස් සීමාව අවුරුදු 32 ඉඳලා අවුරුදු 35 දක්වා පමණයි. සමහර විභාග සඳහා ඉල්ලුම් කළ හැකි වයස් සීමාව අවුරුදු 28 ඉඳලා 30 දක්වා වනවා. එම කාලය දීර්ඝ කර දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ කොරෝනා වසංගතය කාලයේ ඒ ළමයි ඉතාම අමාරුවෙන් ඉන්නේ. ඒ ළමයි බොහොම අමාරුවෙන් ඉගෙනගෙන,- [බාධා කිරීමක්] මට නියමිත කාලය අවසන්ද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, කාලය අවසන්වෙලා තිබෙන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට විනාඩියක කාලයක් දෙන්න, කථාව අවසන් කරන්නම්.

ඒ ළමයින්ට මේ exams ටික ලියන්න තිබෙන වයස් සීමාව තව අවුරුදු දෙකකින් දීර්ඝ කරලා දෙන්න. මොකද, ඒ ළමයින් 2007-2008 යුද්ධය කාලයේ A/L විභාගය ලියපු ළමයින්. එම නිසා ශ්‍රී ලංකාවේ සියලු ජනතාව වෙනුවෙන් මම කාරුණිකව මේ ඉල්ලීම කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අවසාන වශයෙන්, Sri Lanka Broadcasting Corporation - SLBC - එක අරගෙන තිබෙන තීරණයක් ගැන මම කියන්න ඕනෑ. මේක හඩ්සන් සමරසිංහ මැතිතුමාගේ තීරණයක් වෙන්න ඇති. SLBC එක යටතේ channels හයක් තිබෙනවා. දෙමළ channels දෙකක් සහ සිංහල channels හතරක් විධියටයි දැනට ඒ channels හය තිබෙන්නේ. දැන් ඒ දෙමළ channels දෙකෙන් එකක, දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදෙන programme එකක් විකාශය කරන්න යනවා කියලා අපට දැනගන්න තිබෙනවා. දෙමළ ජනතාවට කථා බහ කරන්න අයිතියක් සමහර වෙලාවට පාර්ලිමේන්තුවේදීවත් නැති වුණාට, දෙමළ ජනතාවට සින්දුවක් හෝ අහගෙන ඉන්න තිබෙන්නේ ඒ channels දෙක විතරයි. එම නිසා ඒ channels දෙකට අත තියන්නේ නැතුව දැනට තිබෙන සිංහල channels හතරෙන් එකක් අරගෙන ඒ සඳහා මාරු කරන්න. ඒ කියන්නේ, දෙමළ channels දෙක තිබෙන විධියටම තියන්න කියන ඉල්ලීම කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ මම මේ කියපු කාරණා කෙරෙහි ඔබතුමා පෞද්ගලිකව අවධානය යොමු කරයි කියලා මම හිතනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මම උපදේශක කාරක සභා රැස්වීමට එනකොට කලින් කියපු සිද්ධියට අදාළ දරුවාගේ පවුලේ කට්ටිය මාත් එක්ක සම්බන්ධවෙලා සිටියේ නැහැ. එහෙම වුණා නම් උපදේශක කාරක සභාවේදීත් මම ඒ ප්‍රශ්නය මතු කරනවා. ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, මම මේ document එක එවන්නම්. මම වග කීමක් නැතිව නොවෙයි මේ ප්‍රකාශය කරන්නේ. ඒ පවුලේ කට්ටිය මට කියපු දේ තමයි මම කියන්නේ. එම නිසා ජපානයේ සිටින ශ්‍රී ලංකාවේ මහ කොමසාරිස් සම්බන්ධයෙන් හෝ එම අදාළ නිලධාරින් සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරලා ඒ දරුවාගේ පවුලේ කට්ටියට සහනයක් ලබා දෙන්න කියලා මා ඉල්ලා සිටිනවා. ස්තුතියි.

[பி.ப. 4.18]

**ගරු රිෂාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் கொரோனா தொற்று பாரியதோர் ஆபத்தை ஏற்படுத்தி யிருப்பதனால், அரசாங்கம் தன்னுடைய பொறுப்பைச் சரியாகச் செய்ய வேண்டுமென்றும் வைத்திய நிபுணர்களின் ஆலோசனைகளின் பிரகாரம் நாட்டை முன்னெடுத்துச் செல்லவேண்டுமென்றும் முதலிலே வேண்டிக்கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, எந்தவித குற்றச்சாட்டும் இல்லாமல் போலி குற்றச்சாட்டின் அடிப்படையில் CIDயினரால் கைதுசெய்யப்பட்டு 116 நாட்களாக நான் சிறையில் இருப்பது உங்களுக்குத் தெரியும். கடந்த 2020 ஏப்பிரல் மாதம் என்னுடைய சகோதரர் ரியாஜ் பதியுதீன் கைதுசெய்யப்பட்டு, அவர்மீது சுமத்தப்பட்ட எந்தவொரு குற்றச்சாட்டும் நிரூபிக்கப்படாமையால் ஐந்தரை மாதங்கள் கழித்து, அவரை Colombo Fort Magistrateஊடாக CIDயினர் விடுதலை செய்தார்கள். அதன்பிறகு, இந்த வருடம் ஏப்பிரல் மாதம் 24ஆம் திகதி நடுநிசியிலே CIDயினர் எனது வீட்டுக்கு வந்து, என்னையும் என்னுடைய சகோதரரான ரியாஜ் பதியுதீனையும் அழைத்துச் சென்று, எம்மீது எந்தவித குற்றச்சாட்டும் நிரூபிக்கப்படாத நிலையில் இன்றுவரை தடுத்து வைத்திருக்கிறார்கள். அண்மையில் சனாதிபதி

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

அவர்கள் பாராளுமன்றத்துக்கு விஜயம் செய்தபொழுது நான் இது சம்பந்தமாகக் கூறியிருந்தேன். அதன்பிறகு, அவசர அவசரமாக என்னைக் கொண்டுபோய் remand பண்ணினார்கள். CIDயினர் கோட்டை நீதவானிடம் என்மீது சுமத்தியுள்ள குற்றச்சாட்டைச் சமர்ப்பித்தபொழுது, "பாராளு மன்ற உறுப்பினர் என்ன தவறு செய்திருக்கிறார்? என்று கௌரவ நீதிபதி அவர்கள் கேட்டார். அதற்கு, "அவர் வகித்த அமைச்சின் மேலதிகச் செயலாளராக இருந்த எஸ். பாலசுப்பிரமணியம் அவர்களோடு 80 செக்கன்கள் - ஒரு நிமிடமும் 20 செக்கன்களும் - பேசியிருக்கிறார்" என்று அவர்கள் பதில் சொன்னார்கள். இந்தப் பதிலைக் கேட்டு நீதிபதி அவர்கள் ஆச்சரியப்பட்டார். இவ்வாறு அநியாயம் இழைக்கப்பட்ட ஒருவனாக இப்பொழுது நான் இருக்கிறேன்.

அன்று பாராளுமன்ற Select Committee விசாரணைகளை மேற்கொண்டது. இனவாத அரசியல்வாதிகள் சிலர் துவேச உணர்வோடு, என்னுடைய அமைச்சுப் பதவியை இராஜினாமா செய்யுமாறு சொன்னபொழுது, நான் உடனடியாக அந்தப் பதவியை இராஜினாமா செய்துவிட்டு விசாரணைகளுக்குப் பூரண ஒத்துழைப்பு வழங்கியவன் என்பது உங்களுக்குத் தெரியும். எனக்கெதிராக ஏதாவது குற்றச்சாட்டுக்கள் இருந்தால் பொலிஸிலே முறைப்பாடு செய்யுமாறு பொலிஸார் அறிவித்தனர். உலகத்திலே எந்தவோர் அமைச்சருக்கு எதிராகவும் அவ்வாறு அறிவித்த வரலாறு கிடையாது. ஆனால், எனக்கு மட்டும் அவ்வாறு அறிவித்தார்கள். தற்போதைய IGP விக்ரமரட்ண அவர்களின் கடிதம் பாராளுமன்றத்திலே சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. "றிஸாட் பதியுதீனுக்கு ஐஸ்கூ பயங்கரவாதச் செயற்பாட்டுடனோ அல்லது வேறெந்தப் பயங்கரவாதச் செயற்பாட்டுடனோ எந்தவித சம்பந்தமும் இல்லை" என்று CIDஇன் Senior DIG ரவி செனவிரத்ன அதிலே சொல்லியுள்ளார். நான் நிரபராதி என்று எழுத்துமூலம் அறிவிக்கப்பட்ட பிறகுதான் நான் மீண்டும் அந்த அமைச்சுப் பதவியைப் பொறுப்பெடுத்தேன்.

அதன்பிறகு, ஜனாதிபதியினால் நியமிக்கப்பட்ட ஆணைக் குழுவிலே நான் விசாரணை செய்யப்பட்டேன். அந்த ஆணைக்குழுவும் என்னைக் குற்றவாளியாகக் காணவில்லை. அதன் அறிக்கை வெளிவந்த பிறகுதான் என்னைக் கைது செய்தார்கள். அதுவும் ஒரு பயங்கரவாதியைக் கைது செய்வதுபோல நடுநிசியிலே என்னுடைய வீட்டுக்குவந்து என்னைக் கைது செய்தார்கள். அன்றிலிருந்து இன்றுவரை 116 நாட்களாக நான் சிறைவாசம் அனுபவிக்கின்றேன். இவ்வாறு எனக்கு அநியாயம் செய்திருக்கிறார்கள். இன்று ஆளுங் கட்சியில் இருப்பவர்கள் நாளை எதிர்க்கட்சியில் இருப்பார்கள்! அப்படியான ஒரு காலம் வருகின்றபோது இதேபோல PTAஇற்குக்கீழே யாரையும் கைதுசெய்யலாம்! எனவே, இங்கிருக்கின்ற அரசியல்வாதிகளுக்குத் தார்மீகப் பொறுப் பிருக்கின்றது. மனச்சாட்சியோடு நீங்கள் நடந்துகொள்ளுங்கள்! இல்லையென்றால், உங்களுடைய பிள்ளைகளாவது எதிர்காலத்திலே பாராளுமன்ற உறுப்பினராக வரும்போது அவர்கள் இவ்வாறான பாதிப்புக்குள்ளாக்கப்படுவார்கள் என்பதை விளங்கிக்கொள்ளுங்கள்! என்று நான் உங்களுக்குச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அதுமாத்திரமல்ல, இவ்வாறு குற்றச்சாட்டுக்களைச் சுமத்து பவர்களுக்கும் ஊடகவியலாளர்களுக்கும் அண்மையிலே என்னுடைய வீட்டில் வேலைக்காக இருந்த சகோதரி இஷாலினியுடைய மரணம் ஒரு jackpotஆக அமைந்தது. அந்தச் சகோதரி மரணித்த வேதனையிலே நாங்கள் எல்லோரும் இருக்கின்றோம். தன்னுடைய உயிரை அர்ப்பணம் செய்து அந்தச் சகோதரியைக் காப்பாற்ற முயன்ற என்னுடைய மாமனார் - மனைவியினுடைய தந்தை - இன்று சிறையிலே அடைக்கப்பட்டிருக்கின்றார். அந்தச் சகோதரி 14 நாட்களாக வைத்தியசாலையிலே இருந்தபொழுது, ஒரு தாயைப்போல இருந்து ஒவ்வொருநாளும் வைத்தியசாலைக்குச் சென்ற அவரைப் பார்த்து வந்த, அவருடைய உயிரைக் காப்பாற்ற முயற்சி செய்த என்னுடைய மனைவி இன்று சிறையிலே அடைக்கப்பட்டிருக்கின்றார். அதேபோல, இந்தச் சம்பவம் நடந்து 5 நாட்களுக்குப் பிறகு என்னுடைய வீட்டுக்கு வந்த என்னுடைய மைத்துனர் இஸ்மத்தீன் என்பவரையும் கைதுசெய்து சிறையிலே அடைத்தார்கள். அதுமாத்திரமல்ல, எனது வீட்டில் வேலைசெய்த ஒரு சகோதரியை அவர் ஏற்கெனவே இரண்டுமுறை பாலியல் வல்லுறவுக்குட்படுத்திய தாக பொலிசார் சொன்ன செய்தி ஊடகங்களிலே வேகமாகப் பறந்தது.

கௌரவ சபாநாயகர் அவர்களே, நான் ஒரு விஷயத்தைச் சொல்ல வேண்டும். மாத்தறையிலே இருக்கின்ற CI வருணி என்ற police officer கொழும்புக்கு அழைக்கப்பட்டு, அவரிடம் இந்த விசாரணை ஒப்படைக்கப்பட்டது. அக்குரஸ்ஸ பிரதேச சபைத் தவிசாளர் ஒரு சிறுபிள்ளையை பாலியல் வல்லுறவுக் குட்படுத்தினார் என்று போலியாக ஒரு வழக்கை அவர் தொடர்ந்ததாக Supreme Courtஇலே SC (FR) Application No. 677/2012 -

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, ගරු සභානායකතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, this is a matter before court; it is a *sub judice* matter.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
නැහැ, නැහැ. මේක ඉවර වෙච්ච නඩුවක්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Member, you had your say. So, let me also make my statement.

ගරු මන්ත්‍රීතුමා, මේක අධිකරණයේ විමර්ශනයට භාජන වී තිබෙන පරීක්ෂණයක් කියලා- [බාධා කිරීමක්] මේ දැනුත් ඒ වචනය කිව්වා. [බාධා කිරීමක්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
දැන් කිව්වේ, ඉවර වෙච්ච නඩුවක්- [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩ්ඩක් ඉන්න කෝ. කලබල වෙන්න එපා. කලබල වෙලා නේ ඔය තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මොකුත් වෙලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එම නිසා පොඩ්ඩක් ඉවසීමෙන් කටයුතු කරන්න, ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. අවුරුදු 25කට, 30කට වැඩි කාලයක් තිස්සේ මේ ගරු සභාව නියෝජනය කරන අපිත් ඔබතුමාත් මේ ගරු සභාවේ කටයුතු කළ යුතු ආකාරය ගැන දන්නවා නේ. අපි මේ සභාවේ ගෞරවය ආරක්ෂා කළ යුතුයි. Matters under inquiry and matters before court cannot even be discussed here. The Hon. Member has been reading a document which is directly concerning an inquiry before court. ගරු කථානායකතුමනි, මම ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ගරු කථානායකතුමාගේ පූර්ව අවසරයක් ලබාගෙන මිස මෙවැනි statement එකක් කරන්න බැහැ. Statement එකක් කරන්න ඕනෑ නම් ගරු කථානායකතුමාගේ පූර්ව අනුමැතියක් ලබාගෙන එය කිරීම වඩා හොඳයි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුහුණ දෙන තත්ත්වය අපි කවුරුත් දන්නවා. ඒක වෙනම තත්ත්වයක්. ඔබතුමා පක්ෂ නායක රැස්වීමට කැඳවීම සඳහාත් අපි සහයෝගය දක්වා තිබෙනවා. ගරු කථානායකතුමාත් ඔබතුමා කැඳවා තිබෙනවා. ඔබතුමා පාර්ලිමේන්තුවට එන්න කළ සියලු ඉල්ලීම් ඉටු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, නමුත්, ඔබතුමා අධිකරණය හමුවේ දැනට කරගෙන යන පරීක්ෂණයට අදාළ හවුල්කරුවකු හැටියට- [බාධා කිරීමක්] හවුල්කාරයකු නොවුණත් අධිකරණය හමුවේ පරීක්ෂණයක් කෙරීගෙන යන විට- [බාධා කිරීමක්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු කථානායකතුමනි, මම අද උදේ කථා කරලා කිව්වා නේ. ගරු ඇමතිතුමා, ඔබතුමන්ලාගේ පක්ෂයේ අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපතිට විරුද්ධව අසත්‍ය නඩුවක් දමලා, වරුණි බෝගහවත්ත කියන පොලිස් නිලධාරිනිය සම්බන්ධයෙන් වන FR එකක තීන්දුවක් තිබෙනවා. එම නඩුවේ අංකය තමයි මා කිව්වේ. මා එම FR එකේ තීන්දුව **සභාගත*** කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් ඒක අරගෙන බලන්න. ඒ වාගේ අසාධාරණයක් කරපු මාතර police officer කෙනෙකු ගෙනැල්ලා තමයි මගේ ගෙදර වෙච්ච සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්න යොදවා තිබෙන්නේ. ඒ නිසා තමයි මම එහෙම කිව්වේ. වරුණි බෝගහවත්ත කියන්නේ මාතර police station එකේ නිලධාරිනියක්. මම table කරපු FR එකේ තීන්දුව ඔබතුමා අරගෙන බලන්න.

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු කථානායකතුමනි, මට තව වචන කීපයක් කියන්න විනාඩියක කාලයක් ලබා දෙන්න. මගේ මස්සිනාට එදා කිව්වා- මම ඒක දෙමළ භාෂාවෙන් කියන්නම්. என்னுடைய மைத்துனர் பல வருடங்களுக்கு முன்னர் எங்களுடைய வீட்டிலே பணிபுரிந்த ஒரு பெண்ணை துஷ்பிரயோகம் செய்ததாகக் கூறினார்கள். ගරු ඇමතිතුමා, මේක පොඩ්ඩක් අහගන්න. මේක very important කාරණයක්. මම දෙමළ භාෂාවෙන් කියන්නම්.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මේකට ඉඩ දෙන්න එපා. [බාධා කිරීමක්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
එහෙම නොවෙයි, ගරු ඇමතිතුමා-

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මෙතුමා මෙතුමාගේ මස්සිනා ගැන කියන්න හදනවා. මෙතුමාගේ නිවස තුළ තමයි ළමයෙකු මරණයට පත් වෙලා තිබෙන්නේ. ඒ ළමයා දූෂණය කළා කියන ප්‍රශ්නයකුත් තිබෙනවා. නමුත්, මෙතුමා පාර්ලිමේන්තු වරප්‍රසාද පාවිච්චි කරමින් කියන්න හදනවා, 'තමා බොහොම නිදහස් පුද්ගලයෙක්, මේ ආණ්ඩුව දේශපාලන පළිගැනීම් කරන්නයි හදන්නේ' කියලා. එහෙම කරන්න ඉඩ දෙන්න බැහැ, පාර්ලිමේන්තුවේ. ගරු මන්ත්‍රීතුමා, වෙන්න තිබෙන අපරාධ ඔක්කොම තමුන්නාන්සේගේ නිවස ඇතුළේ සිදු වෙලා තියෙද්දී මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්න එපා- [බාධා කිරීමක්] තමුන්නාන්සේ බේරෙන්න. ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්න. [බාධා කිරීමක්] තමුන්නාන්සේ අධිකරණයට යන්න. අධිකරණයේදී කියන්න ඕනෑ ඒවා මෙම ගරු සභාවට ඇවිල්ලා කියන්න එපා. [බාධා කිරීමක්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඔබතුමා,- [බාධා කිරීමක්]

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
අනේ, නිකම් ඉන්න! තමුන්නාන්සේ කරපු දේවල් අපි දන්නවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
අපිත් දන්නවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, මෙතුමාට මේ ආකාරයට පාර්ලිමේන්තුවේ කටයුතු කරන්න කිසිසේත් ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීමක්] කරන්න තිබෙන වැරැදි වැඩ ඔක්කොම කරලා- [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ නැතිව ඔබතුමා අධිකරණයට ගිහිල්ලා උත්තර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. අපට කාලය මදි. [බාධා කිරීම්]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට වෙනම වෙලාවක උත්තර දෙන්න. [බාධා කිරීමක්] වෙනම වෙලාවක පැහැදිලි කරන්න. [බාධා කිරීම්] ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්.

මීළඟට, ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.27]

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, අධිකරණයේ කථා කරන්න ඕනෑ දෙයක් මන්ත්‍රී වරප්‍රසාද පාවිච්චි කරලා කියමින් මෙම ගරු සභාව හැල්ලුවට ලක් කරන්න ඉඩ ලබා දීම ඉතාම වැරැදි ක්‍රියාවක් කියලායි මා පෞද්ගලිකව විශ්වාස කරන්නේ. ඒ වාගේම, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා සඳහන් කළ වරුණි බෝගහවත්ත කියන පොලිස් නිලධාරිනිය අපේ පොලිස් සේවයේ සිටින කීර්තිමත් නිලධාරිනියක්. එතුමිය, ළමා හා කාන්තා විෂය සම්බන්ධයෙන් ඉතාම වැදගත් සේවයක් කරන නිලධාරිනියක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාගේ නඩුව සම්බන්ධයෙන් එතුමාට තවම චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර නැහැ. "B" Report විතරයි ඉදිරිපත් කර තිබෙන්නේ. "B" Report එකක් ඉදිරිපත් කර තිබෙන විට Parliament එකේ ඒ ගැන කථා කරන්න පුළුවන්. හිටපු ගරු කථානායකවරුන් ඒ බව කියා තිබෙන අවස්ථා ගණනාවක් තිබෙනවා. එතුමාට විරුද්ධව තවම චෝදනා ඉදිරිපත් කර නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා කථා කරපු එක නොවෙයි- [බාධා කිරීම්] එතුමාට නියමිත කාලය අවසන්.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මට මිනිත්තුවක් දෙන්න කෝ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
එතුමා කථා කරන්නේ "B" Report එක ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා, ඔබතුමාත් මේ සභාවේ කාලය නාස්ති කරන්න සූදානම් වෙන්න එපා. ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීමක්] තවත් කාලය දෙන්න බැහැ. එහෙම දෙන්න කාලයක් නැහැ. ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
ගරු කථානායකතුමනි, මගේ වෙලාව මට ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීම මම කරනවා.

අපේ රටේ පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශයට සම්බන්ධව කටයුතු කළ, පසුගිය කාලයේ ගෞරවයට ලක් වුණු කීර්තිමත් පොලිස් නිලධාරිනියක් තමයි ඒ පරීක්ෂණයට යොමු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ ගරු සභාවේ වරප්‍රසාද පාවිච්චි කරලා, එතුමියට අසාධාරණයක් වීම වළක්වන්න කියන කාරණය ගරු කථානායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. ගරු කථානායකතුමනි, වරුණි බෝගහවත්ත කියන්නේ මාතර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාවේම කීර්තිමත් පොලිස් නිලධාරිනියක් බව ඔබතුමාත් දන්නවා.

අපේ හිතවත් ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඇෆ්ගනිස්ථානයේ සිදුවීම සම්බන්ධව සඳහන් කළා. අද මිලියන 75ක් -කෝටි හත හමාරක්- ලෝකයේ රටවල සරණාගතයන් හැටියට ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දින වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

ගරු කථානායකතුමනි, අද ලෝකය පුරා මිලියන 75ක් -කෝටි හතහමාරක්- සරණාගතයන් විධියට ඉන්නවා. හැබැයි, ඇෆ්ගනිස්ථානයේ ඊයේ-පෙරේදා සිදු වුණු සිදුවීම දැවැන්ත ඛේදවාචකයක් හැටියට අපි දැක්කා. ඇෆ්ගනිස්ථානයේ සිදුවීම් සම්බන්ධව කථා කරපු අපේ මඩකලපුවේ ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා සඳහන් කළා, තව ටික දවසක් යනකොට ලංකාවේ මිනිස්සුන්ටත් එහෙම යන්න වෙයි කියලා. වැරැදිලාවත් එතුමන්ලාගේ යහ පාලන ආණ්ඩුව තිබුණා නම්, මේ කොවිඩ් අර්බුදයත් එක්ක ඇත්ත වශයෙන්ම අපිට සරණාගතයන් විධියට තමයි රටින් යන්න වෙන්නේ කියන කාරණය මම එතුමාට මතක් කරන්න ඕනෑ. ඒ සිදුවීම එක්ක අපිට ඉතිහාසයේ සිදු වුණු තවත් කාරණයක් මතක් වනවා. අද දහස් ගණනක් ඇෆ්ගනිස්ථාන පුරවැසියන් තමන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා රටින් පිටව යනවා. මේ වාගේම සිදුවීමක් 2009 මැයි මාසයේ සිදු වනවා අපි දැක්කා. ඇෆ්ගනිස්ථානයේ සිදු වුණු සිදුවීම් එක්ක මේ මොහොතේ දී අපට මතක් වෙනවා, අපේ රටේ උතුරේ ජීවත් වුණු අහිංසක මිනිස්සු එදා තමන්ගේ ජීවිතය යදින්න හමුදාව ළඟට ආපු ආකාරය. තිස් අවුරුදු සාපලත්, කාලකණ්ණි යුද්ධය 2009 අවසන් කරන්න එවකට හිටපු ජනාධිපති ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට හා අපේ රජයට පුළුවන්කම නොලැබුණා නම් අද ඇෆ්ගනිස්ථානයේ ඉරණම තමයි ශ්‍රී ලංකාවටත් අත් වෙන්නේ. ඒ ඉතිහාසයත් මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු කථානායකතුමනි, අද ඉතා වැදගත් විවාදයක් පැවතුණත්, මට ලැබී ඇති වේලාව ඉතා සීමිතයි. කොවිඩ් අර්බුදය පවතින මේ අවස්ථාවේ දී, අධිකරණ අමාත්‍යාංශය විසින් 2019 කොරෝනා වෛරස් රෝගය (කොවිඩ් - 19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පතට ඉතා වැදගත් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ කොවිඩ් අර්බුදයත් එක්ක ක්ෂේත්‍ර ගණනාවක අර්බුද මතුවෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)

මම කථාව පටන් ගත්තා විතරයි නේ, ගරු කථානායකතුමනි. අනුන්ගේ කුණු කන්දල් අපේ පිටින් යන්නේ. අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමතියි. කොවිඩ් අර්බුදයත් එක්ක අර්බුද ගණනාවක් නිර්මාණයවෙලා තිබෙනවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරන්න කටයුතු කිරීම සම්බන්ධව මම මේ අවස්ථාවේදී ගරු අධිකරණ ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම අධිකරණ ක්ෂේත්‍රය තුළ තිබෙන ප්‍රශ්න ගණනාවක් විසඳන්න මේ සංශෝධන හේතු වනවා කියන කාරණය සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය.:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]***
*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [ மாண்புமிகு எம்.யூ.எம்.அலி சப்ரி]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. M.U.M. Ali Sabry]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
[THE HON. SPEAKER *in the Chair.]*

***1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1, ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (නියම කරනු ලැබ ඇති කාලසීමාවන්ට අනුකූල වීමට නොහැකි වීම සඳහා වන සහනය)

### வாசகம் 2.- (விதித்துரைக்கப்பட்ட காலத்துடன் ஒத்திசைவதற்கான இயலாமை தொடர்பிலான நிவாரணம்)

CLAUSE 2. - (*Relief in respect of inability to comply with prescribed time periods*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'තිබිය යුතු අතර, 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම තැනැත්තා එම කොවිඩ්-19 සම්බන්ධිත' "

(2) "3 වන පිටුවේ, 7 වන පේළියේ සිට 10 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'2020 අභියාචනාධිකරණ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණ වෙතින් ඉදිරිපත් වන අභියාචන සඳහා වූ කාර්ය පටිපාටිය) (තාවකාලික විධිවිධාන) රීති; හෝ' "

(3) "3 වන පිටුවේ, 20 වන සහ 21 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'දෙමින්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

## 3 වන වගන්තිය.- (කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් මඟින් බලපෑමට ලක් වූ අධිකරණ වෙනුවට විකල්ප අධිකරණ නම් කිරීම)

වාසகம் 3.- (கொவிட்-19 சூழ்நிலையினால் பாதிக்கப்பட்ட நீதிமன்றங்களின் இடத்தில் மாற்று நீதிமன்றங்களின் பெயர் குறித்தல்)

CLAUSE 3. - (*Designation of alternative courts in place of courts affected by Covid - 19 circumstances*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "4 වන පිටුවේ, 16 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,' "

(2) "4 වන පිටුවේ, 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කිරීමෙන් අනතුරුව එම විකල්ප අධිකරණයේ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එම මුල් අධිකරණය වෙත මාරු කරනු ලැබිය' "

(3) "5 වන පිටුවේ, 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ඉදිරියේ දී සිදු කර අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක දී,' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 3, as amended, ordered to stand part of the Bill.*

## 4 වන වගන්තිය.- (දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම)

வாசகம் 4.- (தொலை தொடர்பாடல் தொழிநுட்பத்தினைப் பயன்படுத்தி நீதிமன்ற நடவடிக்கை முறைகளை நடாத்துதல்)

CLAUSE 4. - (*Conducting court proceedings using remote communication technology*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "5 වන පිටුවේ, 8 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'4. (1) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මුල්' "

(2) "5 වන පිටුවේ, 17 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කටයුත්ත, දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් නිර්මාණය කරනු ලබන සජීවී වීඩියෝ හෝ සජීවී රූපවාහිනී සබැඳියක් මඟින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් මුල් අවස්ථා අධිකරණයක් ඉදිරියේ සිදු කරනු ලබන යම් නඩුවක්, ඉල්ලීමක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක දී -

(අ) 2021 ජනවාරි මස 29 වන දිනැති අංක 2212/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 ශ්‍රේෂ්ඨාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම සහ හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල;

(ආ) 2021 පෙබරවාරි මස 23 වන දිනැති අංක 2216/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අභියාචනාධිකරණ (ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම හා හදිසි ඩිජිටල් අතථ්‍ය නඩු විභාග) (විශේෂ විධිවිධාන) රීතිවල; සහ

(ඇ) දුරස්ථ සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් අධිකරණ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන්, මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව තුළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි වෙනත් යම් ශ්‍රේෂ්ඨාධිකරණ රීතියක හෝ

අභියාචනාධිකරණ රීතියක, විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, හැකිතාක් දුරට අදාළ කරගනු ලැබිය යුතු ය.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, as amended, ordered to stand part of the Bill*

## IV වන කොටස

பாகம் 1V

PART 1V

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ,22 වන පේළිය සහ 23 වන පේළිය ඉවත් කරන්න;"

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

## 5 වන වගන්තිය.- (උපලේඛනගත ගිවිසුම්)

வாசகம் 5.- (அட்டவணைப்படுத்தப்பட்ட ஒப்பந்தங்கள்)

CLAUSE 5. - (*Scheduled contracts*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 24 වන පේළියේ සිට 27 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***5* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*5ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 5, as amended, ordered to stand part of the Bill.*

## 6 වන වගන්තිය.- (ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට හෝ ගිවිසුම්ගත අයිතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් වන සහනය)

வாசகம் 6.- (ஒப்பந்தஞ்சார் கடப்பாடுகளை செயல்நிறைவேற்றுதலுக்கு அல்லது ஒப்பந்தஞ்சார் உரிமைகளைப் பிரயோகிப்பதற்கான இயலாமை தொடர்பான நிவாரணம்)

CLAUSE 6. - (*Relief in respect of inability to perform contractual obligations or exercise contractual rights*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "6 වන පිටුවේ, 1 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(2) "7 වන පිටුවේ, 1 වන පේළියේ සිට 4 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***6* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*6ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, as amended, ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (6 වන වගන්තිය යටතේ වන ඉල්ලීමක් මඟින් නඩු පැවරීමේ අයිතිය වළක්වනු නොලැබිය යුතු බව)

வாசகம் 7.- (6இன் கீழான விண்ணப்பம் வழக்குகளைத் தொடுப்பதற்கான உரிமையைத் தடுத்தலாகாது)

CLAUSE 7. - (*Application under section 6 not to prevent the right to institute actions*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 5 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(2) "8 වන පිටුවේ, 1 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(3) "9 වන පිටුවේ, 1 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***7* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7, as amended, ordered to stand part of the Bill.*

## 8 වන වගන්තිය.- (සැක දුරු කිරීම)

வாசகம் 8.- (ஐயத்தைத் தவிர்த்தல்)

CLAUSE 8. - (*Avoidance of doubt*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 17 වන පේළියේ සිට 23 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***8* වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*8ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8, as amended, ordered to stand part of the Bill.*

## V වන කොටස

பாகம் V

PART V

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"9 වන පිටුවේ, 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'IV වන කොටස' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

***සංශෝධනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*திருத்தம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Amendment, ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (මේ පනත යටතේ වන සහනය මත වන සීමා)
### வாசகம் 9.- (இச்சட்டத்தின் கீழான நிவாரண வரையறைகள்)
CLAUSE 9. - (*Limitations on relief under this Act*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "9 වන පිටුවේ, 26 වන පේළිය සහ 27 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'9. මේ පනතේ 2 වන වගන්තිය යටතේ සහනයක් ලෙස බැහැර කරන ලද යම්' "

(2) "10 වන පිටුවේ, 11 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 9, as amended, ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (ඔප්පු කිරීමේ භාරය)
### வாசகம் 10.- (எண்பிக்கும் பொறுப்பு)
CLAUSE 10. - (*Burden of proof*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 17 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'10. 2 වන වගන්තියේ කාර්යය සඳහා නියම කරන ලද කාලසීමාවන්ට අනුකූලවීමට නොහැකි වීම' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 10, as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (නියෝග)
### வாசகம் 11.- (ஒழுங்குவிதிகள்)
CLAUSE 11. - (*Regulations*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "10 වන පිටුවේ, 26 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(2) "11 වන පිටුවේ, 1 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11, as amended, ordered to stand part of the Bill.*

## 12 වන වගන්තිය.- (අර්ථ නිරූපනය)
### வாசகம் 12.- (பொருள்கோடல்)
CLAUSE 12. - (*Interpretation*)

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "11 වන පිටුවේ, 11 වන පේළියේ සිට 13 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

(2) "11 වන පිටුවේ, 21 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) කොවිඩ් - 19; හෝ

(ආ) (අ) ඡේදයේ සඳහන් තත්ත්වයන්ගෙන් පැන නගින හෝ ඊට ආනුෂංගික වෙනත් යම් තත්ත්වයක්,' "

(3) "12 වන පිටුවේ, 4 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***12 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*12ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 12, as amended, ordered to stand part of the Bill.*

***13 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*13 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 13, ordered to stand part of the Bill.*

## අලුත් වගන්තිය
### புதிய வாசகம்
NEW CLAUSE

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් අලුත් වගන්තිය ඉදිරිපත් කරනවා:

"10 වන පිටුවේ, 25 වන පේළියට ඉක්බිතිව ව පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යම් කොවිඩ් 19 සම්බන්ධිත තත්ත්වයක් පිළිබඳව වන මාර්ගෝපදේශ ආදිය බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස සලකනු ලැබිය යුතු බව

11. (1) යම් කොවිඩ් - 19 සම්බන්ධිත තත්ත්වයක් පිළිබඳව රජය විසින් සාදන ලද, මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වන යම් මාර්ගෝපදේශයක්, විධානයක්, චක්‍රලේඛයක්, දැන්වීමක් හෝ තීරණයක් මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක දී, ඉල්ලීමක දී, අභියාචනයක දී හෝ වෙනත් නඩු කටයුත්තක දී තවදුරටත් ඔප්පු කිරීමකින් තොරව බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(2) ඒ නඩුවේ, ඉල්ලීමේ, අභියාචනයේ හෝ වෙනත් නඩු කටයුත්තේ පාර්ශ්වයක් විසින් ඒ මාර්ගෝපදේශයේ, විධානයේ, චක්‍රලේඛයේ, දැන්වීමේ හෝ තීරණයේ ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන අවස්ථාවක දී එය ඔප්පු කිරීමේ භාරය එහි ආවේශ්‍යතාව අභියෝගයට ලක් කරන පාර්ශ්වය වෙත විය යුතුය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "රජය" යන්නෙන්, (222 වන අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ කොවිඩ්-19 රෝගය සම්බන්ධයෙන් සාදන ලද යම් නියෝගයක අර්ථ නිරූපනය කර ඇති පරිදි වන යම් නිසි බලධරයකු අදහස් වේ.' "

***ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.***
*கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.*
*Brought up, and read the First time*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, "අලුත් වගන්තිය දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*புதிய வாசகம் சட்டமூலத்தில் சேர்க்கப்பட வேண்டுமென்ற வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Question, that the New Clause be added to the Bill, put and agreed to.*
*New Clause ordered to stand part of the Bill.*

## පළමුවන උපලේඛනය
## முதலாம் அட்டவணை
## FIRST SCHEDULE

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"12 වන, 13 වන, 14 වන 15 වන සහ 16 වන පිටුවල 'පළමුවන උපලේඛනය ඉවත් කරන්න' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***පළමුවන උපලේඛනය, පනත් කෙටුම්පතින් ඉවත් කළ යුතුයයි නියෝග කරන ලදී.***
*முதலாம் வாசகம் சட்டமூலத்திலிருந்து நீக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*First Schedule, ordered to be left out of the Bill.*

## දීර්ඝ නාමය
## விரிவுப் பெயர்
## LONG TITLE

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 'කොවිඩ් -19 සම්බන්ධිත තත්ත්වයන් හේතුවෙන් ගිවිසුම්ගත

වගකීම් ඉටු කිරීමට නොහැකි වූ ඇතැම් ගිවිසුම්වල

පාර්ශ්වයන් සම්බන්ධයෙන් සහනයක් ලබා දීම සඳහා ද;' යන වචන ඉවත් කරන්න."

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*விரிவுப் பெயர் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Long Title, as amended, ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported with Amendments.*

**ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වර වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා හා මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

[ගරු එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம்முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill, as amended, accordingly read the Third time, and passed.*

## නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත : නියමය
## உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம்: கட்டளை
## EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 05 දිනැති අංක 2222/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 අප්‍රේල් 22 දිනැති අංක 2224/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.08.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රේගු ආඥා පනත : යෝජනාව
## சுங்கக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## CUSTOMS ORDINANCE: RESOLUTION

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021. 08. 04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2021 අප්‍රේල් 22 දිනැති අංක 2224/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ, ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021. 08. 04 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2021 මැයි 17 දිනැති අංක 2228/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ විශේෂ කාරක සභාව
## தற்போதுள்ள அமைச்சுக்களின் கீழ் உள்வாங்கப்படாத அரச நிறுவனங்களால் பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்படுகின்ற விடயங்கள் தொடர்பில் ஆராய்வதற்கான தெரிகுழு
## SELECT COMMITTEE TO CONSIDER THE GOVERNMENT BUSINESS PRESENTED TO PARLIAMENT BY THE PUBLIC INSTITUTIONS THAT DO NOT COME UNDER THE PURVIEW OF THE EXISTING MINISTRIES

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

දැනට පවතින අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) එහි සභාපතිවරයා අග්‍රාමාත්‍යවරයා විය යුතු ය.

(ආ) එම කාරක සභාව තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතු ය.

(ඇ) පාර්ලිමේන්තුව විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම කාරක සභාවේ කර්තව්‍යය විය යුතු ය.

(ඈ) එහි සාමාජික මන්ත්‍රීවරයන්ට අමතරව ඕනෑම මන්ත්‍රීවරයකුට කාරක සභාවේ සභාපතිවරයාගේ අවසරය ඇතිව රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.

(ඉ) කාරක සභාව අවශ්‍යතාවය මතුවන පරිදි රැස්විය යුතු අතර, රැස්වීමේ දින සිට හැකිතාක් ඉක්මනින් ඊට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

(ඊ) කාරක සභාවේ රැස්වීම් කැඳවීම අග්‍රාමාත්‍ය ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කරනු ලැබිය යුතු ය.

3. එකී කාරක සභාවට,-

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවනු ලැබීමට සහ ප්‍රශ්න කරනු ලැබීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද; සහ

(ඇ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද

බලය තිබිය යුතු ය. "

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කල්තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මන්ත්‍රීතුමා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)

ගරු කථානායකතුමනි, ගරු මුදල් අමාත්‍යතුමාගෙන් මා මේ ප්‍රශ්නය අසනු ලබනවා.

01. කිරි පිටි මිල වැඩි නොකිරීම සඳහා රජය විසින් ලබා දුන් බදු සහනය හේතුවෙන් ජනතාව වෙනුවෙන් රජය දරා ගනු ලබන වැය බර කොපමණද?

02. දේශීය කිරි පිටි නිෂ්පාදනය සහ දියර කිරි ජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද?

03. දේශීය ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීම සඳහා දේශීය කිරි නිෂ්පාදන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද? එසේ නම් එම වැඩ පිළිවෙළේ ප්‍රගතිය කුමක්ද?

**ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා (මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் நிவாட் கப்ரால் - நிதி, மூலதனச் சந்தை மற்றும் அரச தொழில்முயற்சி மறுசீரமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith Nivard Cabraal - State Minister of Money and Capital Market and State Enterprise Reforms)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඇසීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින්, මම ගරු මුදල් ඇමතිතුමා වෙනුවෙන් පිළිතුර ලබා දෙනවා.

01. 2020 වසරේදී ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 2,969ක් වැනි පහත මට්ටමක පැවතුණි. කෙසේ වුවද, 2021 වර්ෂයේ ලොව පුරා රටවල් අගුළු ලා තැබීම ලිහිල් කිරීමත් සමඟ 2021 ජනවාරි මාසය වන විට කිරි පිටි මෙට්‍රික් ටොන් එකක මිල ඇමෙරිකානු ඩොලර් 3,338ක් දක්වා වැඩි වුණා. 2021 මැයි මාසය වන විට එම මිල මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 4,150ක් දක්වා ශීඝ්‍රයෙන් වැඩි වුණා. අපේ රටේ කිරි පිටි අවශ්‍යතාවෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් ආනයනය කරන බැවින් ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මිල ගණන් වැඩිවීම දේශීය සිල්ලර මිල ගණන් වැඩි කිරීම සඳහා වූ ඉල්ලීම් ඇඩි කිරීමටත් හේතු වුණා. මෙලෙස ලෝක වෙළෙඳ පොළේ කිරි පිටි මිල ගණන් වැඩි වීමත්, විනිමය අනුපාතිකයට වූ පීඩනයත් නිසා දේශීය කිරි පිටි මිල වැඩි නොකර පවත්වා ගැනීම සඳහා රජය විසින් බදු සහන ලබා දීමට 2021 අගෝස්තු මස 11 දින අමාත්‍ය මණ්ඩලය තීරණය කළා. ඒ අනුව කිරි පිටි සඳහා පැවති කිලෝග්‍රෑම් එකකට රුපියල් 15ක් වූ රේගු බද්ද සහ සියයට 2.5ක් වූ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද - PAL - යන බදු දෙවර්ගයම 2021 අගෝස්තු මස 11වෙනි දින සිට රජය විසින් ඉවත් කරනු ලැබුවා. එමඟින් කිරි පිටි මිල දැනට පවතින මිල මට්ටමේ පවත්වා ගනිමින් පාරිභෝගිකයින් ආරක්ෂා කර ගැනීමට රජය කටයුතු කළා. මෙමඟින් මසකට රුපියල් මිලියන 572ක පමණ රාජ්‍ය ආදායමක් අපට අහිමි වෙනවා. කිරි පිටි කිලෝ එකකට රුපියල් 945ක් සහ ග්‍රෑම් 400ක පැකට්ටුවක් රුපියල් 380ක මට්ටමක තබා ගැනීම සඳහා වූ රජයේ කැපවීම මෙමඟින් තවදුරටත් පැහැදිලි වෙනවා.

[ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා]

ගරු කථානායකතුමනි, කොවිඩ්-19 වසංගතය අපේ රටට පමණක් නොව මුළු ලෝක ආර්ථිකයටම දැඩි අහිතකර බලපෑමක් එල්ල කරමින් පවතිනවා. එය අප රටට පමණක් මග හරින්න බැහැ. රටේ ජනතාවට දුන් පොරොන්දු ඉටු කරමින් භාණ්ඩ මිල ගණන් අඩු මට්ටමක තබා ගනිමින් හා කොවිඩ් වසංගතය පාලනය කරමින් ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම රජයේ අරමුණයි.

කුඩා සහ මධ්‍ය පරිමාණ කිරි ගොවිපොළ ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් රුපියල් මිලියන 450ක ආයෝජනයක් 2021 වසරේ පළාත් මට්ටමින් රජය ලබා දී ඇත. මෙමඟින් සත්ව අභිජනන ගොවිපොළ - animal breeding farms - පිහිටුවීම, සත්ව ආහාර නිෂ්පාදනය, කල් තබා ගැනීම සහ ගොවිපොළ කළමනාකරණය හා අපද්‍රව්‍ය කළමනාකරණය - waste management - තුළින් උසස් තත්ත්වයේ කිරි නිෂ්පාදනය, පුහුණු වැඩසටහන් ආදී කාර්යයන් නඟාසිටුවීමට අපේක්ෂා කෙරේ.

ගරු කථානායකතුමනි, එයට අමතරව පළාත් මට්ටමින් අභිජනන ගොවිපොළවල් සංවර්ධනය, දියර කිරි ප්‍රචලිත කිරීම පිළිබඳ වැඩසටහන් සඳහා 2021 වසරේදී පිළිවෙළින් රුපියල් මිලියන 100ක් සහ රුපියල් මිලියන 136ක් ලබා දී තිබෙනවා. කෙසේ නමුත්, දියර කිරි ප්‍රචලිත කිරීම සඳහා වන පාසල් වැඩසටහන් කොවිඩ්-19 හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එනමුත්, එම රුපියල් මිලයන 136 අරමුදල් යොදා ගනිමින් කිරි විශ්ලේෂක යන්ත්‍ර මඟින් කිරිවල ප්‍රමිතිය මැනීම සහ එමඟින් උසස් තත්ත්වයෙන් යුත් කිරි නිෂ්පාදනය දිරිගැන්වීම, කිරි කල් තබා ගැනීමේ යන්ත්‍ර සැපයීම ආදිය සිදු කිරීමටත් රජය කටයුතු කර තිබෙනවා.

02. කුඩා පරිමාණ කිරි නිෂ්පාදනාගාර වැඩසටහන යටතේ රුපියල් මිලියන 3,400ක් කිරි සැකසුම් කර්මාන්තය සඳහා රජය ආයෝජනය කර තිබෙනවා. මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රාදේශීය කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීම සහ කිරි සැකසුම්කරණය තවදුරටත් විධිමත් කිරීමට හා ව්‍යාප්ත කිරීමට රජය අපේක්ෂා කරනවා. මෙමඟින් සමුපකාර සමිති 4ක් -පොළොන්නරුව, අත්තනගල්ල, වෙන්නප්පුව හා වාරියපොළ- සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මේ වන විටත් ආනයනය කර තිබෙනවා. ඒ අතර, අදාළ යන්ත්‍රෝපකරණ සවි කිරීමද සිදු වෙමින් පවතී. මෙම ඒකකවල නිෂ්පාදන ලබන වසර මුලදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

03. දේශීය කිරි ගවයින්ගේ ජානමය විභවතාව සහ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ අරමුණින් අදියර කීපයක් යටතේ උසස් ගණයේ කිරි දෙනුන් ආනයනය කර තිබෙනවා. මේ හරහා, කිරි ගවයින් 9,500ක් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ආනයනය කරන ලදී. ඒ අතර ජාතික පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළවල මෙන්ම පෞද්ගලික ව්‍යවසායකයින් අතරද කිරි ගවයින් බෙදා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය හරහා දේශීය කිරි නිෂ්පාදනය සියයට පහකින් පමණ වැඩි වීමක් දැනට දක්නට ලැබේ. මීට අමතරව, උසස් තත්ත්වයේ අභිජනන පැටවුන් 1,000කට අධික ප්‍රමාණයක් මේ වන විටත් බෙදා දී තිබෙනවා. එමෙන්ම, ඉතිරි පැටවුන් පශු සම්පත් මණ්ඩලයේ අදාළ ගොවිපළවල පැටවු ගහනය ස්ථායීව තබා ගැනීමටද උපකාරී වී තිබෙනවා.

04. දේශීය කිරි සහ අගය එකතු කළ නිෂ්පාදන ඉහළ නැංවීමේ අරමුණ ඇතිව මිල්කෝ ආයතනය යටතේ බඩල්ගම නවීන කිරි සැකසුම් කර්මාන්තශාලාවක් පිහිටුවා තිබෙනවා. ඒ යටතේ දිනපතා කිරි ලීටර 200,000ක පමණ අගය එකතු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි නිෂ්පාදනය ලබන වසර මුලදී ආරම්භ කිරීමටත් අරමුණු කර ඇත.

05. මහා පරිමාණ කිරි ගොවිපළ සඳහා ආයෝජනය කිරීම, ආයෝජන මණ්ඩල - BOI - ව්‍යාපෘතීන් යටතේ මහා පරිමාණ ආහාර නිෂ්පාදන සැකසීම සහ පශු සම්පත් මණ්ඩලයේ ගොවිපළ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ සඳහා දැනට ප්‍රතිලාභීන් සහ ආයෝජකයින් හඳුනා ගනිමින් පවතී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමාගෙන් මා මේ ප්‍රශ්නය අසනු ලබනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, කොළඹ, මරදාන දුම්රිය පොළේ සිට දෙමටගොඩ දුම්රිය පොළ දක්වා දිවෙන දුම්රිය මාර්ගය මාලිගාවත්ත ආර්. ප්‍රේමදාස රෝහල ඉදිරිපිටින් ගමන් කරන විට පාසල් මාවත කියලා පටුමගක් තිබෙනවා. ඒ පාසල් මාවත ඉහළින් තමයි රේල් පාලම තිබෙන්නේ. ඒක අවුරුදු 100ක් විතර පැරණි රේල් පාලමක්. අද වනකොට ඒ රේල් පාලම ඉතා අබලන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, විකල්ප මාවතක් හැටියට පාවිච්චි කරපු පාසල් මාවත මේ වනකොට වසා දමා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම මාලිගාවත්ත ප්‍රදේශයට හා දෙමටගොඩ ප්‍රදේශයට ගමන් කිරීමට ඒ පාර භාවිත කළා. නමුත්, අවුරුද්දක් වැනි කාලයක සිට ඒ පාර වසා දමා තිබෙනවා. ඔවුන්ට එතැනින් පයින් ගමන් කිරීම පවා තහනම් කර තිබෙනවා. මොකද, ඒ පාලම ඒ තරමටම අබලන් තත්ත්වයක තිබෙන බව කොළඹ නගර සභාවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරුත් පවසා තිබෙනවා. ඒ වාගේම පොලීසිය මැදිහත් වෙලා එම පාලම වසා දමා තිබෙන නිසා, එම ප්‍රදේශයේ සිටින විශාල ජනතාවකට ඔවුන් එදිනෙදා පාවිච්චි කළ එම මාවත, ඒ පාර අද වෙනකොට භාවිත කරන්න නොහැකි වෙලා තිබෙනවා. මේ නිසා එම ප්‍රදේශයේ සිටින ජනතාවට විකල්ප පාරවල් සොයන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ හේතුවෙන් අද වනවිට එම ප්‍රදේශයේ ජනතාව විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා.

මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි, එම රේල් පාලමේ නඩත්තු කටයුතු සිදු වනවාද කියලා. ඒ වාගේම එම පාලම යථා තත්ත්වයට ගෙන ඒමට කටයුතු කර තිබෙනවාද, ඒ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද, එසේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් එය යථා තත්ත්වයට පත් කරන්න කටයුතු කරන්නේ කවදාද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු දිලුම් අමුණුගම මහතා (වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය සහ ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலும் அமுனுகம - வாகன ஒழுங்குறுத்துகை, பேருந்துப் போக்குவரத்துச் சேவைகள் மற்றும் புகையிரதப் பெட்டிகள் மற்றும் மோட்டார் வாகன கைத்தொழில் இராஜாங்க அமைச்சரும் சமூகப் பொலிஸ் சேவைகள் இராஜாங்க அமைச்சரும்)
(The Hon. Dilum Amunugama - State Minister of Vehicle Regulation, Bus Transport Services and Train Compartments and Motor Car Industry and State Minister of Community Police Services)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා. එය යථා තත්ත්වයට පත් කරන්න අපි කටයුතු කරනවා. මේ වෙනකොට ආසියානු සංවර්ධන බැංකුව යටතේ තරගකාරී ටෙන්ඩර් කැඳවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. එම ටෙන්ඩර් කැඳවීමේ අවසාන දිනය - close කරන දිනය - වෙන්නේ, 2021 සැප්තැම්බර් මාසයේ 16 වැනි දා. මෙම ටෙන්ඩර් කැඳවීම close කළ විගස එහි වැඩ කටයුතු ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව, ගරු සුදත් මංජුල මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

පාර්ලිමේන්තුව සැප්තැම්බර් 06වන සඳුදා පූ.භා. 10.00 දක්වා කල් තබනු ලබනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 4.59ට අද දින සභා සම්මතිය අනුව, 2021 සැප්තැම්බර් 06 වන සඳුදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේ ය.***

*அதன்படி, பி.ப. 4.59 மணிக்கு பாராளுமன்றம், அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2021 செப்ரெம்பர் 06, திங்கட் கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.59 p.m. until 10.00 a.m. on Monday, 06th September, 2021, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.